# අප තුළ අරඹූ යහපත් වැඩය දෙවියන්වහන්සේ සම්පූර්ණ කරනසේක



# පිලිප්පි අධ්‍යයනය 01

# අප තුළ අරඹූ යහපත් වැඩය
# දෙවියන්වහන්සේ සම්පූර්ණ කරනසේක

## පිලිප්පි 1:6

**<u>හැඳින්වීම</u> :-**

පාවුල්තුමා විසින් පිලිප්පිවරුන්ට ලියන ලද ලිපිය ඔහු විසින් ලියන ලද්දේ හිර අඩස්සියේ සිට බව, **පිලිප්පි 1:13** තුළින් පැහැදිලිව පෙනේ.

**පිලිප්පි 1:13 :- ''<u>මෙසේ මාගේ බැඳුම්</u> ක්‍රිස්තුස්වහන්සේ නිසා පැමුණුණ බව …''**

පාවුල් මෙසේ හිරගත කරනු ලැබුවේ කොතැනද? ඔහු මෙම ලිපිය ලිව්වේ කුමන වසරේද? යන ප්‍රශ්න ගැන විචාරකයෝ මත තුනක් දරති. ඒවා නම් ක්‍රි.ව. 53 - 55 අතර, එපීසියේ සිට ක්‍රි.ව. 57-59 අතර කායිසාරියේ සිට සහ ක්‍රි.ව. 61 දී රෝමයේ සිට යන මත තුනයි.

හිරකාරයෙකු ලෙස රෝමය වෙත ගෙනයන ලද පාවුල්ව ඉන් අනතුරුව **'නිවාස අඩස්සියට'** පත් කරනු ලැබ, **'කිසිම භයක්වත් තහනමක්වත් නැතුව, දෙවියන්වහන්සේගේ රාජ්‍යය දේශනාකරමින්, ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන කාරණා ඉගැන්වූ බව' (ක්‍රියා 28:31)** දේව වචනයේ සඳහන් වෙයි. එබැවින් සියළු කරුණු සලකා බලන විට, පාවුල්තුමා විසින් මෙම ලිපිය ලියන ලද්දේ ක්‍රි.ව. 61 දී බවත්, ඔහු රෝමයේ නිවාස අඩස්සියේ සිටි කාලය තුළ බවත් නිගමනය කිරීම නිවැරදි යයි සිතමි. (කරුණාකර **ක්‍රියා 28:14-31** කියවා බලන්න).

පිලිප්පි නම් වූ නුවර, රෝමයේ යටත් විජිතයක් වූ අතර, ඉතා දියුණු වූ පිලිප්පිය නම් කරන ලද්දේ මහා ඇලෙක්සැන්ඩර් රජතුමාගේ පියවූ 2නි පිලිප්පි රජතුමාගේ නම අනුවය. එබැවින් පිලිප්පියේ වැසියන්ට රෝම පුරවැසිකම ලැබුනු අතර, ඔවුන් බොහෝ විට රෝමවාසීන් ලෙස අඳින්ටද, ලතින් භාෂාව භාවිතා කිරීමටද පුරුදුව සිටියහ.

පාවුල්තුමා විසින් ලියන ලද ඉතා අලංකාර ලිපියක් වන මේ ලිපිය ඔහු අරඹන්නේද, අවසාන කරන්නේද **'දෙවියන් - වහන්සේගේ කරුණාව'** සඳහන් කරමිනි.

**පිලි. 1:2 :- "අපගේ පියවූ දෙවියන්වහන්සේගෙන්ද ස්වාමීවූ යේසු ක්‍රිස්තුස්වහන්සේගෙන්ද කරුණාවත් සමාදානයත් නුඹලාට වේවා."**

**පිලි. 4:23 :- "ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාව නුඹලාගේ ආත්මය සමග වේවා."**

පිලිප්පිවරුන්ට පාවුල්තුමා විසින් ලියන ලද මෙම ලිපිය අධ්‍යයනය කිරීම මා අරඹන්නේද, **'දෙවියන්වහන්සේගේ කරුණාව උන්වහන්සේ අධිකලෙස ඔබ කෙරෙහි වගුරුවන සේක්වා '** කියා ප්‍රාර්ථනා කරමිනි.

**අධ්‍යයනය :-**

**1. පිලිප්පි සභාව / පොත ගැන සමහර පසුබිම් කාරනා**

(i) 'හැඳින්වීමේ' සඳහන් කරනු ලැබූ ආකාරයට පිලිප්පිය රෝමයේ යටත් විජිතයක් වූ අතර, එහි පදිංචිව සිටි බොහෝ දෙනෙක් හමුදාවේ සේවයකර තිබුනාවූද, විශ්‍රාම ගැනීමෙන් පසු පිලිප්පියේ ඉඩම් ලබාදෙන ලද්දාවූද අය විය. එබැවින් පිලිප්පියේ යුදෙව් සිනගෝගයක් ගොඩනැගීමට තරම් යුදෙව්වරුන් නොවිසූ බව පෙනේ. මෙම හේතුව නිසා **පරණ ගිවිසුමෙන් උපුටා ගන්නා ලද කොටස්** මෙම පොතේ පාවුල්තුමා සඳහන් නොකරයි.

(ii) මෙම පොත පාවුල්තුමා විසින් රෝමයේ සිට ලියන ලද්දේ **'හිරකාරයෙක් '** ලෙස වන නමුත්, මෙහි නැවත නැවතත් පාවුල්තුමා සඳහන් කරන දෙයක් වන්නේ, **'ප්‍රීතියයි'.**

**පිලි 1:3 :- "නුඹලා මට සිහිවෙන හැම වේලේම ..... නුඹලා උදෙසා ප්‍රීතියෙන් යාච්ඤාව ඔප්පුකරමින් ....."**

**පිලි 1:18 :- "..... ක්‍රිස්තුස්වහන්සේ ප්‍රකාශකරනු ලබනසේක ; ඊට ප්‍රීතිවෙමි, එසේය තවත් ප්‍රීතිවන්නෙමි."**

**පිලි 2:2 :- "....... එක්සිත්ව සිටීමෙන් මාගේ ප්‍රීතිය සම්පූර්ණ කරන්න."**

**පිලි 2:17,18:- "[17] .... නුඹලා සියල්ලන් සමඟ ප්‍රීතිවෙමි. [18] එසේම නුඹලාත් සන්තෝෂ වෙන්න, මා සමඟ ප්‍රීතිවෙන්න."**

**පිලි 2:28, 29:- " [28]...... නුඹලා ඔහු නැවත දැක ප්‍රීතිවෙන පිණිසත්...." ......[29]..... සියලු ආකාර ප්‍රීතියෙන් ඔහු පිළිගනිල්ලා."**

**පිලි 3:1 :- "..... ස්වාමීන්වහන්සේ තුළ ප්‍රීතිවෙන්න....."**

**පිලි 4:4 :- "ස්වාමීන්වහන්සේ තුළ නිතරම ප්‍රීතිවෙන්න. ප්‍රීතිවෙන්නැයි නැවතත් කියමි."**

**පිලි 4:10 :-.....ස්වාමීන්වහන්සේ තුළ බොහෝසෙයින් ප්‍රීතිවෙමි."**

(iii) පිලිප්පිය වනාහි යුරෝපයේ පිහිටවන ලද ප්‍රථම සභාව වන අතර, පිලිප්පි සභාව ආරම්භවීම පිළිබඳව **ක්‍රියා 16:6-34 දක්වා** සඳහන් වේ.

(iv) මෙම ලිපිය මගින් අපට උගතහැකි ඉතාමත් වැදගත් දෙයක් වන්නේ, **ප්‍රායෝගික ලෙස කිතුනු ජීවිතයක් ගතකරන්නේ කෙසේද,** යන්නයි.

එබැවින් කිතුනුවකගේ ජීවත්වීම, දුක්/පීඩා විඳීම, යාච්ඤාවේ යෙදීම, සේවය කිරීම, ප්‍රේමකිරීම සහ තවත් බොහෝ දේ ගැන ප්‍රායෝගික ඉගැන්වීම් මෙහි සඳහන් වේ.

(v) අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ප්‍රමුඛත්වය දෙන්නාවූ මෙම ලිපියෙහි උන්වහන්සේව නමින් හෝ වෙනත් අයුරින් 70 වතාවක් සඳහන් කරනු ලැබේ.

## 2. <u>පිලිප්පි සභාව ආරම්භකිරීම උදෙසා දෙවියන්වහන්සේ විසින් කරනු ලැබුවාවූ දේ - ක්‍රියා 16:6-34</u>

**පිලිප්පි 1:6** හි සඳහන් වන්නාවූ දේව පොරොන්දුව දෙස ඔබගේ අවධානය ප්‍රථමයෙන්ම යොමු කිරීමට කැමැත්තෙමි.

**පිලි 1:6 :- "නුඹලා තුල යහපත් වැඩක් පටන්ගත් උන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දවස දක්වා ඒක සම්පූර්ණ කරනසේකැයි යන මේ විශ්වාසය ඇතුව සිටිමි."**

පාවුල්තුමා මේ පිලිප්පි සභාවට ප්‍රකාශ කරන්නේ,

(i) පිලිප්පියේ සභාවේ සාමාජිකයන් තුළද, පිලිප්පියේ සභාවේද යහපත් දෙයක් ආරම්භ කරනු ලැබුවේ දෙවියන්වහන්සේ විසින් බවත්,

(ii) දෙවියන්වහන්සේ විසින් මෙසේ ආරම්භ කරනු ලැබුවාවූ යහපත් දේ උන්වහන්සේ සම්පූර්ණකිරීමට යන බවත්, ඔහු (පාවුල්තුමා) විශ්වාස කරන බවයි.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ මගපෙන්වීම අනුව පාවුල්තුමා මෙසේ ප්‍රකාශකරන්නාවූ දේ **'දේව පොරොන්දුවක්'** ලෙස සැලකීම, නිවැරදි යයි සිතමි.

එබැවින් පිලිප්පියේ සභාව පිහිටුවීම උදෙසා, දෙවියන්වහන්සේ විසින් කරනු ලැබුවාවූ දේ ගැන දැනගැනීම උදෙසා **ක්‍රියා 16 : 6-34** දෙස බලමු.

### (i) පිලිප්පියේ විසූ ස්ත්‍රීවරුන් කණ්ඩායමක් තුළ යාච්ඤාකිරීමේ හදවතක් ඇතිකිරීම - ක්‍රියා 16:13

**පිලි 16:13 :- "සබත් දවසේදී අපි පිටත්වී නුවර දොරටුවෙන් පිට යාච්ඤා ස්ථානයක් ඇතැයි අපට කල්පනාවුණ ගංගාවක් අද්දරට ගොස් හිඳ, රැස්ව සිටි ස්ත්‍රීන්ට කථාකෙළෙමුව."**

ක්‍රියා පොත කියවන අප දකින්නේ, පාවුල්තුමා බොහෝ ස්ථානවල ඔහුගේ ශුභාරංචි සේවය ආරම්භ කළේ සබත් දවසේ යුදෙව් සිනගෝගයක් වෙත යමින් බවයි.

අප මීට ප්‍රථමයෙන් සඳහන් කළ ආකාරයට, පිලිප්පිය රෝමයේ යටත් විජිතයක් වීම හේතුකොටගෙන, පිලිප්පියේ විසුවේ යුදෙව්වරුන් ස්වල්ප දෙනෙක් පමණක් විය. එමනිසා එහි යුදෙව් සිනගෝගයක් නොවීය.

**මෙනමුත් භක්තිවන්ත යුදෙව් ස්ත්‍රීන් පිරිසක් සබත් දවසේදී, දෙවියන්වහන්සේට යාච්ඤා ඔප්පුකිරීම උදෙසා, ගංගාවක් අද්දර රැස්වූහ.**

ප්‍රේමවන්ත දේව දරුව, මේ බලවත් සත්‍යය තේරුම් ගන්න. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සෙනඟ අතරේ සේවයක් ආරම්භ කිරීම උදෙසා ගන්නාවූ ප්‍රථම පියවරක් වන්නේ, **එය ගැන යාච්ඤා කිරීමට, එක් පුද්ගලයෙක් හෝ එක් පවුලක් හෝ කුඩා කණ්ඩායමක් හෝ එක් සභාවක් පෙළඹවීමයි.** එබැවින් **'සැබෑ යාච්ඤාව'** ඇරඹෙන්නේ, යාච්ඤා කරන්නාටත් වැඩියෙන් දෙවියන්වහන්සේගේ ක්‍රියාකිරීම තුළිනි.

**රෝම 8 : 26, 27 :-**

**" 26 එලෙසම ආත්මයාණන්වහන්සෙත් අපගේ දුර්වලකම්වලදී උපකාරකරනසේක. මක්නිසාද යුතුලෙස යාච්ඤාකරන්ට අපි නොදනිමුව ; නුමුත් ආත්මයාණන්වහන්සේම ...... අප උදෙසා මැදහත්කම්කරනසේක.**

**27 ඒ ආත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස ශුද්ධවන්තයන් උදෙසා මැදහත්කම් කරන බැවින්, සිත් විමසන තැනන්වහන්සේ උන්වහන්සේගේ අදහස කුමක්දැයි දන්නාසේක."**

දේව දරුවෙනි, ඕනෑම සේවයක් ඔබගේ සභාවේ ආරම්භ කිරීමට ප්‍රථමයෙන්, එය ගැන දෙවියන්වහන්සේගේ පාද පාමුල වැඳවැටී, උන්වහන්සේට කන්නලව් කරන්නාවූ කිහිපදෙනෙක් ආනිවාර්ය වන බව සැමවිටම මතක තබාගන්න. දෙවියන්වහන්සේ ඔවුන්ට තමන්වහන්සේගේ අදහසත් /මඟ - පෙන්වීමත් ලබාදෙනතෙක් ඉවසීමෙන්ද යාච්ඤාවෙන්ද සිටින්න.

(ii) **උන්වහන්සේගේ දාසයන්ගේ මාර්ගය වෙනස්කිරීම - ක්‍රියා 16:6,7**

**ක්‍රියා 16:6,7 :- "[6] ඔව්හු ආසියාවේදී වචනය කියාදෙන්ට ශුද්ධාත්මයාණන් විසින් තහනම් කරනු ලැබ, පිරිගිය සහ ගලාතිය පළාත මැදින් ගියෝය ; [7] ඔව්හු මිසිය ඉදිරියට ඇවිත්, බිතිනියට යන්ට උත්සාහකළෝය ; නුමුත් යේසුස්වහන්සේගේ ආත්මයාණෝ ඔවුන්ට ඉඩ නුදුන්සේක."**

ඉහත සඳහන් පද දෙකෙහි අප දකින්නේ, ආසියාවේ දේව වචනය බෙදා ගැනීමට අදහස් කළාවූ, පාවුල්ට සහ සීලස්ට, එසේ කිරීමෙන් වැලකී සිටීම උදෙසා, ශුද්ධාත්ම-යාණන්වහන්සේ ක්‍රියාකිරීමයි.

මෙසේ කිරීමට හේතු වූයේ, **යුරෝපයේ පිහිටි පිලිප්පියේ විසූ දේව භක්තික ස්ත්‍රීවරුන් කීපදෙනෙකුගේ යාච්ඤාවයි !!**

ඔවුන්ගේ කන්නලව්වට සවන්දුන් දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ දාසයන් දෙදෙනාවූ පාවුල්ව සහ සීලස්ව යොදවාගත්තේ, **යුරෝපයේ ප්‍රථම කිතුනු සභාව ආරම්භ කිරීමටයි.**

(iii) **උන්වහන්සේගේ දාසයන්ට දර්ශනයක් දීම - ක්‍රියා 16:8,9**

**ක්‍රියා 16:8,9 :- "[8] එවිට ඔව්හු මිසිය පසුකර ත්‍රෝවසට බැස ආවෝය.[9] පාවුල්ට රාත්‍රියෙහි දර්ශනයක් පෙනුණේය ; එනම් : මකිදෝනියට ඇවිත් අපට උපකාරකරන්නැයි කියමින් මකිදෝනියේ මනුෂ්‍යයෙක් නැගිට සිට ඔහුගෙන් අයැද සිටියේය."**

දේව දරුව, **ක්‍රියා 16:6-9** දක්වා සඳහන් සැමදේ සිදුවූයේ ඇදහිලිවන්තවූ ස්ත්‍රීන් කීප දෙනෙක් දෙවියන්වහන්සේට කන්නලව් කළ නිසා වන අතර, අප විසින් තේරුම් ගතයුතු ඉතා වැදගත් කරුණක් වන්නේ, **ඔවුන්ගේ යාච්ඤා ඉල්ලීම දෙවියන්වහන්සේගේ කැමැත්ත සමඟ එකඟ වූ ඉල්ලීමක්** වූ බවයි.

**1 යොහන් 5:14 :- "උන්වහන්සේ ඉදිරියෙහි අපට තිබෙන නිසැකකම නම්, අප උන්වහන්සේගේ කැමැත්ත ලෙස යමක් ඉල්ලුවොත් උන්වහන්සේ අපේ ඉල්ලීම අසන බවය."**

**යෙසායා 65 : 24,25 :- " [24] ඔවුන් යාච්ඤාකරන්ට පළමුවෙන් මම උත්තරදෙන්නෙමි, [25] ඔවුන් කථාකරද්දීම අසන්නෙමි..... ස්වාමීන්වහන්සේ කියනසේක."**

(iv) **උන්වහන්සේගේ දාසයින්ට වහාම උන්වහන්සේගේ කැඳවීමට කීකරු වීමට සැලැස්වීම - ක්‍රියා 16:10**

**ක්‍රියා 16:10 :- "ඔහු දර්ශනය දුටු කල, ඔවුන්ට ශුභාරංචිය දේශනාකරන්ට දෙවියන්වහන්සේ අඬගැසූ බව තේරුම්ගෙන, එකෙණෙහිම මකිදෝනියට යන්ට අපි උත්සාහකෙළෙමුව. "**

මේ අයුරින් ක්ෂණිකව දෙවියන්වහන්සේ දුන් දර්ශනයට කීකරුවීමට පාවුල් හා සීලස්ව පෙළඹුවේ දෙවියන් - වහන්සේයි. දේව දරුව, දෙවියන්වහන්සේ ඔබට ඔබ ගත යුතු මාර්ගය ගැන මඟපෙන්වූ විට, විවිධ හේතු ඉදිරිපත් කරමින් උන්වහන්සේගේ මඟපෙන්වීම අනුව ක්‍රියා කිරීම මගහැරීමට තැත් නොකරන්න.

**උන්වහන්සේගේ හඬට කීකරුවන්න. පමා නොවී කීකරුවන්න.**

(v) **රත්නිල් පිළි විකුණූ ලිදියාගේ සිතේ ඇදහිල්ල ඇතිකිරීම - ක්‍රියා 16:14,15**

**ක්‍රියා 16:14 :- "තියාතිරා නුවර විසූ රත්නිල් පිළි විකුණන්නාවූ ලිදියා නම් දේවභක්ති ස්ත්‍රියෙක් අපේ වචන අසාගන සිටියාය. පාවුල් විසින් කියනලද කාරණා සලකන ලෙස ස්වාමීන්වහන්සේ ඇගේ සිත විවර කළසේක."**

අන්‍යජාතික ස්ත්‍රියක්වූ ලිදියා (කොර්නේලියස් මෙන්) **ක්‍රියා 10:2** දේව භක්තික ස්ත්‍රියක් වූ අතර පාවුල්තුමා විසින් ප්‍රකාශකරන ලද ශුභාරංචිය ඇ දැන නොසිටියාය. නුමුත් දෙවියන්වහන්සේ පාවුල් විසින් ප්‍රකාශ කරන ලද කාරණා සලකන ලෙස ඇයගේ සිත විවර කරමින්, ඈ තුළ ඇදහිල්ල ඇතිකළසේක. **ක්‍රියා 16:15** තුළින් අද දකින්නේ එම දවසේදීම ලිදියා සහ ඇගේ ගෙයි වැසියන් බොහෝ විට එදිනම බව්තීස්ම කරනු ලැබූ බවයි. තව දුරටත් එම පදයෙන් පෙනීයන්නේ පාවුල් සහ සීලස් ඇයගේ නිවසේ නවාතැන් ගත් බවයි.

පාවුල් සහ සීලස් හිරගෙයින් නිදහස්වූ පසු, ඔවුන් ලිදියාගේ නිවසට ගොස් **'සහෝදරයන් '** දුටු බව දේව වචනයේ සඳහන් වෙයි **(ක්‍රියා 16:40).**

එබැවින් ලිදියාගේ නිවස, යුරෝපයේ ප්‍රථම සභාව ආරම්භ වූ ස්ථානය ලෙස විස්තර කිරීම නිවැරදි යයි සිතමි.

(vi) **අශුද්ධ ආත්මයක් දුරු කිරීම උදෙසා පාවුල් තුළින් ක්‍රියාකිරීම - ක්‍රියා 16:16-18**

ශාස්ත්‍ර කියන ආත්මයක් ඇත්තාවූ තරුණියක්, පාවුල් සහ සීලස් පසුපස එමින්, ඔවුන් දෙදෙනා, **'මහෝත්තම දෙවියන්වහන්සේගේ දාසයෝ බව මොර ගැසුවාය' (ක්‍රියා 16:17).**

එම අවස්ථාවේදී පාවුල් **'යේසුස්වහන්සේගේ නාමයෙන් ඇයගෙන් පිටත්ව යෑමට එම ආත්මයට අණකළේය' (ක්‍රියා 16:18).**

මේ අයුරින් යක්ෂයාගේ බලයට වඩා දෙවියන්වහන්සේගේ බලය අධික බව, පිලිප්පියේ සෙනඟට ප්‍රකාශවීමට ක්‍රියා කළේ දෙවියන්වහන්සේයි.

(vii) **හිරගෙදර දොරවල් අරිමින්, හිරකාරයන්ගේ බැඳුම් ලිහමින්, හිරගෙදර මුලාදෑනියා තුළ ඇදහිල්ල ඇතිකිරීම - ක්‍රියා 16:22-34**

පිලිප්පියේදී පාවුල්ට සහ සීලස්ට විරුද්ධව බොරු චෝදනා ඉදිරිපත් කරමින්, ඔවුන්ව හිර ගෙදර දැමීමට ඔවුන්ගේ විරුද්ධ වාදීන් සමත් විය.

මෙසේ ඔවුන් දෙදෙනා, ඇතුල් හිරගෙයි දමා, ඔවුන්ගේ පාද දඬුගසන ලදී. ඔවුන් බොහෝ සේ පහර කා ඉමහත් වේදනාවෙන් සිටි නමුත්, ඔවුන් මෙම අවස්ථාවේදී කළේ දෙවියන්වහන්සේට යාච්ඤා කරමින් ප්‍රශංසා කිරීමයි.

එවිට මහත් පොළෝ කම්පාවක් ඇතිවී, හිරගෙදර සියලු දොරවල් ඇරී, සියලුම හිරකාරයින්ගේ බැඳුම්ද මිදුනේය. නමුත් කිසිම හිරකාරයෙක් පලා යෑමට තැත් නොකළේයී

**දෙවියන්වහන්සේගේ බලය, පාවුල් සහ සීලස්ගේ පුදුමාකාර ඇදහිල්ල / අභ්‍යන්තර ප්‍රීතිය / නීති විරෝධි දේ කිරීම ප්‍රතික්ෂේප කිරීම** දුටු හිරගෙදර මුලාදෑනියාගේ ප්‍රතිචාරය වූයේ, **'ගැළවෙන පිණිස මා විසින් කුමක් කළ යුතුද?' (ක්‍රියා 16:30)** කියා ඔවුන්ගෙන් විමසීමයි. මෙලෙස හිරගෙදර මුලාදෑනියාද ඔහුගේ ගෙදර සියලු වැසියෝද එදිනම ගැළවීම ලැබ බව්තීස්ම කරනු ලැබුවෝය.

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, ඉහත සඳහන් අයුරින් ක්‍රි.ව. 50 දී ආසියාවේ ශුභාරංචිය තවත් පතල කිරීමේ අරමුණින් පාවුල් ආරම්භ කළ, ඔහුගේ දෙවැනි මිෂනාරි ගමන සහමුලින් වෙනස් කරමින්, **යුරෝපයේ ප්‍රථම සභාව පිලිප්පියේ ආරම්භ කිරීම උදෙසා, ක්‍රියා කළේ දෙවියන්වහන්සේයි.**

පිලිප්පියේ සභාව ආරම්භ කිරීම උදෙසා එහි ගිය පාවුල් සහ සීලස් තුළින් ක්‍රියා කරමින්, **එම සභාව ගොඩනැගුවේත්, වර්ධනය කළේත් දෙවියන්වහන්සේය.** මේ අයුරින් යුරෝපයේ ප්‍රථම සභාව **ආරම්භ කිරීමට සහ වර්ධනය කිරීමට ක්‍රියා කළාවූ දෙවියන්වහන්සේ,** එම යහපත් ක්‍රියාව **සම්පූර්ණ කරනසේක (පිලි 1 : 6 ).**

### 3. <u>කිතුනු සභාව තුළ දෙවියන්වහන්සේගේ ක්‍රියා කිරීම</u> - <u>මතෙව් 16 : 16-18</u>

(නව ගිවිසුමේ) සභාව ප්‍රථම වරට සඳහන් වන්නේ **මතෙව් 16:18** වන පදයේය. සභාව සම්බන්ධයෙන් දෙවියන්-වහන්සේගේ සහ යේසුස්වහන්සේගේ ක්‍රියාකිරීම් තේරුම් ගැනීම පිණිස **මතෙව් 16:16-18** වෙත ඔබගේ අවධානය යොමුකරමි.

**මතෙව් 16:16-18:- " [16]…. <u>ඔබ ක්‍රිස්තුස්වහන්සේය, ජීවමාන දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝයයි කීවේය</u>." [17]"යේසුස්වහන්සේ උත්තරදෙමින් : ….ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේ මිස මාංසය හා රුධිරය මේක නුඹට එළිදරව් නොකෙළේය. [18] මම නුඹට කියමි ; නුඹ පේත්‍රුස්ය, තවද <u>මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි; පාතාලයේ දොරටු ඒක පරාජය නොකරන්නේය</u>."**

මෙම පද දෙස අප විමසිල්ලෙන් බලන විට අපට පෙනීයන්නේ, **මතෙව් 16:16** හි සඳහන් වන්නේ, දෙවියන්වහන්සේ විසින් පේත්‍රුස්ට ලබාදුන්නාවූ එළිදරව් කිරීමක් වන අතර **මතෙව් 16:18** හි සඳහන් වන්නේ, යේසුස්වහන්සේ විසින් පේත්‍රුස් ඇතුලු මුළු සභාවට ලබාදුන්නාවූ එළිදරව් කිරීමක් බවයි.

මෙම එළිදරව් කිරීම් දෙකෙන් යේසුස්වහන්සේ කළ එළිදරව් කිරීම දෙස පමණක් අප බලන්ට යන්නෙමු.

- **'නුඹ <u>පේත්‍රුස්ය</u>'** - පෙට්‍රොස් (ග්‍රීක්), කේපස් (ඇරමික්) යන්නෙහි අරුත නම් **නුඹ ගල් කෑල්ලකි** යන්නයි.

- **'මේ <u>පර්වතය</u>'** - පෙට්‍රා (ග්‍රීක්), එනම් නොසෙල්විය හැකි දැවැන්ත පර්වතයක් යන්නයි. මෙසේ **'මේ <u>පර්වතය</u>'** ලෙස සඳහන් වන්නේ, යේසුස්වහන්සේ ගැනයි. දේව වචනයේ ඉතා පැහැදිලිව සඳහන් වන ආකාරයට යේසුස්වහන්සේ පමණක් සභාවේ එකම අත්තිවාරමයි.

  **1 කොරි 3:11 :- "මක්නිසාද දමා තිබෙන අත්තිවාරම ඇර වෙන අත්තිවාරමක් දමන්ට කවරෙකුටවත් නුපුළුවන, ඒ අත්තිවාරම නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේය."**

  **යෙසායා 28:16 :- ".... බලව, මම අත්තිවාරමක් පිණිස ගලක් එනම් පරීක්ෂාකරන ලද ගලක්, සවි අත්තිවාරමක්වූ අනර්ඝ කොනේ ගලක් සියොන්හි තබමි."**

  **ගීතා 118:22 :- "ගෙය සාදන්නන් විසින් එපාකළ ගලම කොනේ ප්‍රධාන ගල විය."**

- **'මාගේ සභාව'** - ඇත්තේ එකම සභාවක් පමණකි. එය වන්නේ සියලු **අලුතෙන් උපන්නාවූ, (යොහන් 3:3)** නොහොත් **දේව දරුකම ලැබුවාවූ (යොහන් 1:12)** අයගෙන් සමන්විතවූ ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයයි.

  **1 කොරි 12:13 :- ".....<u>අපි සියල්ලෝ එකම ආත්මයාණන්-වහන්සේ තුළ එකම ශරීරයට බව්තීස්ම කරනු ලැබ</u>, සියල්ලෝ එකම ආත්මයාණන්ගෙන් පොවනු ලැබීමුව."**

- **'ගොඩනගන්නෙමි'** - ඔයිකොඩොමියෝ (ග්‍රීක්) එනම් ගොඩනගන්නෙමි නොහොත් ඔසවන්නෙමි.

  (කරුණාකර **එපීස 1:20-23, 2:20-22, 4:13, 5:25-32, 1 කොරි 3:9, 12:13-31, කොලො 1:18, 1 පේත්‍රුස් 2** කියවා බලන්න).

- **'පාතාලයේ දොරටු'** - ෂියොල් (හෙබ්‍රෙව්), හේඩීස් (ග්‍රීක්) යන වචන **පාතාලය** ලෙස පරිවර්තනය කර ඇති අතර, එහි අරුත වන්නේ, **නොපෙනෙන්නාවූ ලෝකයටයි. දොරටු** යන්නෙන් අදහස් කරනු ලබන්නේ, පාතාලයට ඇතුල්වීමේ දොරටුව නොහොත් **නොපෙනෙන්නාවූ ලෝකයට ඇතුල්වීමේ දොරටුව එනම් මරණයටයි.'**

එබැවින් **මතෙව් 16:18 තුළින්** යේසුස්වහන්සේ සභාවට දෙන්නාවූ එළිදරව් කිරීම වන්නේ, **උන්වහන්සේ ගොඩනගන සභාව මරණය තුළින් පරාජය නොවන බවයි. උන්වහන්සේ මරණය පරාජයකොට නැවත නැගිටුනාසේ, <u>සභාවට අයිති අප සැමදෙනද, මළවුන්ගෙන් නැගිටින්ට යන බවයි</u>.**

දේව දරුව, ක්‍රිස්තුස්වහන්සේ සභාව ගොඩනගමින් සිටින අතර උන්වහන්සේ අප සැමදෙන කැඳවන්නේ, එසේ කිරීම උදෙසා උන්වහන්සේට එකතු වෙන්ටයි. එනම් -

  - ශුභාරංචිය ප්‍රකාශ කරන්ටයි.
  - විනාශ වන්නාවූ මනුෂ්‍යයන් මුදවා ගන්ටයි.
  - ලෝකයේ ආලෝකය වෙන්ටයි.
  - පොළොවේ ලුණු වෙන්ටයි.

අප සැම දෙන, අදම මේ සේවය උදෙසා අපගේ ජීවිත කැපකරමු.

**උන්වහන්සේ පෙන්තකොස්තදා සභාවේ ආරම්භ කළාවූ දේ, අන්තිමය දක්වා සම්පූර්ණ කරන සේක.**

ඔබ එය උදෙසා උන්වහන්සේ සමඟ එකතුවීමට සූදානම්ද?

## 4. <u>අපගේ ජීවිතවල දෙවියන්වහන්සේගේ ක්‍රියාකිරීම</u>

දේව දරුව, එදා පිලිප්පියේ යහපත් වැඩක් ආරම්භකර එය ගොඩනැගුවාවූ, පෙන්තකොස්තදා කිතුනු සභාව බලයෙන් ආරම්භ කර යේසුස්වහන්සේ මගින් එය ගොඩනගමින් සිටින්නාවූද අපගේ ස්වාමීන්වහන්සේ වෙනස්වී නොමැති සේක. උන්වහන්සේ අපට **'ආත්මයාණන්ගෙන් අලුත් උපතක් ලබාදී,'(යොහන් 3:3,5**) යේසුස්වහන්සේ මගින් එය සම්පූර්ණත්වය කරා ගෙනයනසේක.

**හෙබ්‍රෙව් 12:1 :- ''..... <u>ඇදහිල්ලේ කර්තෘවරයාද සම්පූර්ණ කරන්නාවූද යේසුස්වහන්සේ</u> දෙසම බලමින්, අප ඉදිරියේ තබා තිබෙන දිවීම ඉවසිල්ලෙන් දුවමු. ''**

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, මෙය පැහැදිලිව තේරුම් ගන්න. **<u>මනුෂ්‍යයෙකු 'සැබෑ කිතුනුවකු' බවට පරිවර්තනය කළ හැක්කේ, දෙවියන්වහන්සේට පමණි</u>.**

❖ <u>සැබෑ කිතුනුවකු තුළ සිදුවී ඇති/ සිදුවිය යුතු දේ</u>

(i) ඔහු තුළ <u>තමාගේ පාපය ගැන හැඟීමක්</u> ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ලබා තිබිය යුතුයි.
**(යොහන් 16:8**).

(ii) ඔහු <u>අලුතෙන් උපන්නාවූ</u> කෙනෙක් විය යුතුයි.

**යොහන් 3:3 :- ''.....යමෙක් අලුතෙන් නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යය දකින්ට නොහැකියයි ඔහුට කීසේක.''**

**යොහන් 3:5 :- ''.... යමෙක් වතුරෙන්ද ආත්මයාණන් - ගෙන්ද නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වෙන්ට බැරිය.''**

(iii)ඔහු <u>පාපයේ දඬුවමින් මිදීම</u> ලැබිය යුතුයි.

**එපීස 1:7 :- ''.....උන්වහන්සේගේ කරුණාවේ සම්පතේ ප්‍රකාරයට, උන්වහන්සේගේ ලේ කරණකොටගෙන අපේ මිදීම වන අපේ වරදවලට කමාව අපට ඇත්තේය.''**

(iv) ඔහු ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨකම ලබා තිබෙන්නාවූ කෙනෙක් විය යුතුයි.

**රෝම 5:1 :- "එබැවින් අපි ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨකරනු ලැබ, අපේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණ - කොටගෙන දෙවියන්වහන්සේ හා සමඟ සමාදානය ඇතුව සිටිමු."**

(v) ඔහු දේව රාජ්‍යයට පැමිණ සිටිනවා.

**කොලොස්සි 1:13 :- "පියාණන්වහන්සේ අන්ධකාරයේ බලයෙන් අප මුදා, තමන් ප්‍රේමයේ පුත්‍රයාණන්ගේ රාජ්‍යයට අප පමුණුවාගත්සේක."**

(vi) ඔහුව ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් මුද්‍රා කර තිබේ.

**එපීස 4:30 :- "දෙවියන්වහන්සේගේ ශුද්ධාත්ම - යාණන්වහන්සේට දුක් නොදෙන්න; මක්නිසාද උන්වහන්සේ තුළ නුඹලා මිදීමේ දවසට මුද්‍රා කරනු ලැබුවහුය."**

(vii) ඔහුව දේව ස්වභාවයේ පංගුකාරයෙක් කර තිබේ.

**2 පේත්‍රුස් 1:4 :- ".... ඒ පොරොන්දු කරණකොටගෙන දේව ස්වභාවයට පංගුකාරයන් වන පිණිසය."**

එබැවින් මාගේ ප්‍රේමවන්ත සහෝදර සහෝදරියෙනි, අප විසින් තිර වශයෙන්ම අවබෝධකර ගත යුතු කරුණු තුනක් ඔබ ඉදිරියේ තැබීමට කැමැත්තෙමි.

(a) පළමුවෙනි කරුණ, ප්‍රශ්නයක් ලෙස ඔබ ඉදිරියේ තබමි. එම ප්‍රශ්නය නම්,

- **දෙවියන්වහන්සේ මෙම යහපත් වැඩය ඔබගේ ජීවිතයේ අරඹා තිබෙනවාද? එනම් ඔබ ගැළවීම ලබා තිබෙනවාද?**

(කරුණාකර **රෝම 10:9,10** කියවා බලන්න)

(b) ඉහත සඳහන් ප්‍රශ්නයට ඔබගේ පිළිතුර **'එසේය'** කියා වන්නේ නම්, නිසැකවම දෙවියන්වහන්සේ විසින් ආරම්භ කරනු ලැබුවාවූ දේ, උන්වහන්සේ ඔබගේ ජීවිතයේ කරගෙන යනසේක.

(කරුණාකර **යොහන් 6:37; 10:27-29; 17:12; යූදස් 24 2 තිමෝති 1:12;** යන පදයන් කියවා බලන්න)

(c) උන්වහන්සේ ඒ වැඩය සම්පූර්ණ කරනසේක.

(කරුණාකර **පිලි 1:6; 1 යොහන් 3:2; ගීතා 138:8** කියවා බලන්න).

**ගීතා 138:8 :-**
**"ස්වාමීන්වහන්සේ මා සම්බන්ධ කාරණය සම්පූර්ණ කරනසේක...."**

දෙවි පියාණන්වහන්සේ, ඔබ තුළ ඇරඹූ යහපත් වැඩය සම්පූර්ණ කරනසේක. එසේ කිරීම දේව කැමැත්ත වේ. අප සැමද අපගේ ජීවිත උන්වහන්සේට භාර දෙමින්, උන්වහන්සේගේ අතේ මැටි පිඬක් වෙමින්, එසේ කිරීමට උන්වහන්සේට ඉඩ හරිමු.

**එසේ කිරීමට දෙවි සමිඳුන්**

**ඔබට පිහිටවනසේක්වා !!!**

# ශුභාරංචිය ප්‍රකාශ කිරීම



# පිලිප්පි අධ්‍යයනය 02

# ශුභාරංචිය ප්‍රකාශකිරීම

## පිලිප්පි 1:4

**<u>හැඳින්වීම</u> :-**

පසුගිය අධ්‍යයනයෙහිදී අපගේ අවධානය යොමු වූයේ **පිලි 1:6** වන පදය වෙත වන අතර, එමගින් අප ඉගෙන ගත්තාවූ ඉතා වැදගත් සත්‍යයක් වූයේ, **'අපගේ ජීවිතවල යහපත් වැඩක් පටන්ගත් දෙවියන්වහන්සේ, එය සම්පූර්ණ කිරීමට යන බවයි '.**

ඉහත සඳහන් අයුරින් එම යහපත් වැඩය සම්පූර්ණකිරීමට දෙවියන්වහන්සේ පොරොන්දු වී ඇති අතර, අපගේ සිතේ නැගී එන ප්‍රශ්නයක් වන්නේ, එම වැඩය උන්වහන්සේ අරඹන්නේ කෙසේද? යන්නයි. මෙම ප්‍රශ්නයට මාගේ පිළිතුර වන්නේ, බොහෝ විට උන්වහන්සේ එසේ කරන්නේ, යම් කෙනෙකුට **'ශුභාරංචිය ඇසීමට'** සැලැස්වීම තුළින් කියායි.

දේව දරුව, මෙය තේරුම් ගන්න. බොහෝ සේ මනුෂ්‍යයාට ප්‍රේම කරන්නාවූ දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ, **සෑම කෙනෙක්ම පසුතැවිලි වී ගැළවීමට පැමිණීමයි.**

**2 පේත්‍රුස් 3:9 :- "....නුමුත් <u>සියල්ලන්ම පසුතැවිලි වෙනවාට මිස කිසිවෙක් විනාශවෙනවාට උන්වහන්සේ නොකැමතිව</u>, නුඹලා කෙරෙහි බොහෝ කල් ඉවසනසේක."**

**1 තිමෝති 2:3,4 :- " 3මෙය <u>සියලු මනුෂ්‍යයන් ගළවනු ලැබ සැබෑව දැනගැනීමට පැමිණෙනවාට කැමතිවූ</u>, 4අපගේ ගැළවුම්කාරයාණන් වන දෙවියන්වහන්සේ ඉදිරියෙහි යහපත්ව ප්‍රසන්නව තිබේ."**

මෙසේ සියලු මනුෂ්‍යයන් ගැළවීම කරා ගෙන ඒම දෙවියන්වහන්සේගේ කැමැත්ත වන අතර, එය උදෙසා බොහෝවිට දෙවියන්වහන්සේ ගන්නා ප්‍රථම පියවර වන්නේ, ඔවුන්ට **'ශුභාරංචිය ඇසීමට'** සැලැස්වීමයි. <u>නොහොත් බොහෝ මනුෂ්‍යයන්ගේ ජීවිත තුළ යහපත් වැඩක් දෙවියන්වහන්සේ අරඹන්නේ, **දේව දරුවන් වන්නාවූ අප සැම ශුභාරංචිය ප්‍රකාශකිරීම මඟිනි**</u>.

**රෝම 10:17 :- "මෙසේ ඇසීමෙන් ඇදහිල්ලද, ක්‍රිස්තුස්වහන්සේගේ වචනයෙන් ඇසීමද පැමිණෙන්නේය."**

**රෝම 10:15 :- "..... මේ සම්බන්ධව : යහපත් දේ ගැන ශුභ ආරංචිය ගෙනෙන්නාවූ තැනැත්තන්ගේ පාද කොපමණ අලංකාරද ? කියා ලියා තිබේ."**

(මෙහි සඳහන් වන්නේ **යෙසායා 52:7 හි** කොටසකුයි)

ශුභාරංචිය ප්‍රකාශකිරීම ගැන යේසුස්වහන්සේ කී වචන දෙස බලමු.

**මාර්ක් 16:15:- "උන්වහන්සේ ඔවුන්ට කියනසේක් : නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශකරන්න."**

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, අපගේ ස්වාමීවූ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ හඬට කීකරුවෙමින්, **ශුභාරංචිය ප්‍රකාශකිරීමට අපගේ ජීවිතවල ප්‍රමුඛ ස්ථානයක් දෙමු.**

**අධ්‍යයනය :-**

**1. අප විසින් ප්‍රකාශකලයුතු ශුභාරංචිය කුමක්ද ?**

(a) ශුභාරංචිය යනු ශුභ සහ ආරංචිය යන වචන දෙක එකතුකිරීමෙන් ලැබෙන්නකි. එනම් අප ප්‍රකාශකළයුතු ශුභාරංචිය සැබවින්ම ඉතාමත්ම ශුභ නොහොත් යහපත් පුවතකි. මෙම පුවත කෙටියෙන් **යොහන් 3:16** හි සඳහන් වෙයි.

**යොහන් 3:16 :- "මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේමකළසේක. එසේ කළේ, උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය."**

(b) **යොහන් 3:16** හි ශුභාරංචිය කෙටියෙන් සඳහන් කරනු ලබන අතර, **1 කොරි 15:1-4** දක්වා ශුභාරංචිය මීට වඩා විස්තරාත්මකව ඉදිරිපත් කරනු ලැබේ.

**1 කොරි 15:1-4 :- "[1] තවද සහෝදරයෙනි .... [2] නුඹලා ගැළවීමට පැමිණෙවුවාවූ ශුභාරංචිය නුඹලාට දන්වමි. ....[3]..... එනම්, ලියවිලිවල ප්‍රකාරයට අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවත්, [4] උන්වහන්සේ තැන්පත්කරනු ලැබූ බවත්, ලියවිලිවල ප්‍රකාරයට තුන්වෙනිදා උන්වහන්සේ නැගිටුවනු ලැබූ බවත්."**

අප විසින් සකල ජනතාව වෙත ප්‍රකාශකළ යුතුව තිබෙන්නාවූ මේ ශුභාරංචිය ගැන තව වැදගත් කරුණු කිහිපයක් දෙස දෑන් බලමු.

- **ශුභාරංචිය ගැන වැදගත් කරුණු**

(a) යක්ෂයා ශුභාරංචියට අතිශයින් ද්වේශ කරමින් සැමවිටම එයට විරුද්ධව ක්‍රියා කරයි. දේව දරුවන් නොවන්නාවූ බොහෝ මනුෂ්‍යයෝද ශුභාරංචියට එරෙහිව බොහෝ දේ කරති.

එබැවින්, ඔබ යේසුස්වහන්සේගේ හඬට කීකරුව, එනම් **මාර්ක් 16:15** අනුව ක්‍රියාකරන විට ඔබට නොයෙක් බාධා, පීඩා සහ විරෝධතා පැමිණීමට ඉඩ ඇත. එය ගැන මවිතයට පත් නොවන්න. ඒවා නිසා නොසැලෙන්න, අධෛර්‍යයට පත් නොවන්න. **ඇදහිල්ලෙන් දේව නියෝගයට කීකරුවන්න.**

(b) ශුභාරංචිය තුළ හදවත / සිත / ජීවිත පරිවර්තනය කිරීම උදෙසා බලය ගැබ්වී තිබේ.

**ක්‍රියා 16:14 :- "රත්නිල් පිළි විකුණන්නාවූ ලිදියා නම් දේවභක්ති ස්ත්‍රියෙක් අපේ වචන අසාගන සිටියාය. පාවුල් විසින් කියන ලද කාරණා** (ශුභාරංචිය) **සලකන ලෙස ස්වාමීන්වහන්සේ ඇගේ සිත විවරකළසේක."**

එබැවින් දේව දරුව, ශුභාරංචිය ඕනෑම කෙනෙකුට ප්‍රකාශ කිරීමට භය නොවන්න. සමහරවිට ඔබ පවසන දේ යම් කෙනෙක් නොසලකන බව ඔබ සිතන්ට පුළුවන. මෙනමුත් අප ශුභාරංචිය යාච්ඤාවෙන්ද, ඇදහිල්ලෙන්ද ප්‍රකාශ කරන අතර, සවන් දෙන්නාගේ සිත තුළ, **දෙවියන්වහන්සේ ක්‍රියාකරනසේක.**

(c) ශුභාරංචිය තුළ යක්ෂයාගේ බලය බිඳීමට මෙන්ම යක්ෂයා පලවා හැරීමට බලය ගැබ්වී තිබේ.

**ක්‍රියා 16:18 :-"..... පාවුල් ..... ආත්මයට කථාකොට : යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් ඇගෙන් අහක්වී යන්ට නුඹට අණකරමියි කීවේය. ඒ පැයේදීම ආත්මය අහක්ව ගියේය."**

එබැවින් දේව දරුව, ඔබ ශුභාරංචිය ප්‍රකාශකරන විට, යම්කිසි තැනැත්තෙක් අශුද්ධ ආත්මයක් විසින් කළඹවනු ලැබුවොත් කලබල නොවන්න. **1 කොරි 15:1-4** දක්වා ලියැවී ඇති ශුභාරංචියේ කොටසක් වන්නේ යේසුස්වහන්සේ අපේ පව් උදෙසා මැරුණු බවත්, උන්වහන්සේ තුන්වෙනිදා **(මරණය පරාජය කොට)** නැගිටුවනු ලැබූ බවත්ය.

එමනිසා මෙවැනි අවස්ථාවක් ඇතිවුවහොත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් එම තැනැත්තාගෙන් පිටත්වී යන ලෙස **ඇදහිල්ලෙන් අශුද්ධ ආත්මයට අණකරන්න.**

(d) ශුභාරංචිය තුළ මනුෂ්‍යයන්ව ගැළවීමටද, පරිවර්තනය කිරීමටද බලය ගැබ්වී තිබේ.

**ක්‍රියා 16:31 :- "ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහා ගන්න, එවිට නුඹ ගැළවෙන්නෙහිය, නුඹද නුඹේ ගෙයි වැසියෝද එසේමයයි කීවෝය."**

**ක්‍රියා 16:33,34 :- " [33] ඔහු රාත්‍රියේ ඒ පැයේදීම ඔවුන් රැගෙන, ඔවුන්ගේ තුවාල සේදුවේය ...... [34] ඔහු ඉහළ තමාගේ ගෙට ඔවුන් කැඳවාගෙන ගොස්, ඔවුන් ඉදිරියෙහි කෑම මේසයක් තබා, තමාගේ ගෙයි වැසි සියල්ලන් සමග දෙවියන්වහන්සේ අදහමින් බොහෝසේ ප්‍රීතිවූයේය."**

**ක්‍රියා 16 : 33,34** හි අප දකින්නේ, ගැළවීමට පැමිණි පිලිප්පියේ හිරගෙදර මුලාදෑනියාගේ ජීවිතයේ ඇතිවුනාවූ මහත් පරිවර්තනයයි.

## 2. <u>ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ පංගුකාරකම</u>

**පිලි 1 : 4,5 :-**

**"[4] පළමුවෙනි දවස පටන් දැන් දක්වා <u>ශුභාරංචියේ වර්ධනය සඳහා තිබෙන</u>,**

**[5] <u>නුඹලාගේ පංගුකාරකම</u> ගැන මාගේ දෙවියන්වහන්සේට ස්තූතිකරමි."**

මෙහි 'පංගුකාරකම' ලෙස සිංහල බසින්ද, ' Fellowship' ලෙස ඉංග්‍රීසි බසින්ද (KJV) සඳහන් වන වචනය, 'Koinonia' යන ග්‍රීක් වචනයේ පරිවර්තනයයි. මෙම ග්‍රීක් වචනයේ අර්ථය වන්නේ, '**පොදුවේ තබාගැනීම**' යන්නයි.

පාවුල්තුමා, මෙහි **'ශුභාරංචියේ පංගුකාරකම'** ගැන සඳහන්කරන අතර ඔහු එමගින් පංගුකාරකමට වඩා ගැඹුරු අරුතක් ඉදිරිපත් කරයි.

Koinonia යන වචනය පළමුවෙනි ශතවර්ෂයේ නිතර භාවිතා වුනු වචනයක් වූ අතර, එයින් අදහස්කරනු ලැබුවේ ඇදහිලිවන්තයින් එකිනෙකාගේ ජීවිත බෙදාගැනීම උදෙසා එකතුවීමටයි. පාවුල් මෙය තවත් ඉහල තලයකට ගෙනයමින්, **ශුභාරංචිය බෙදා ගැනීමේ අරමුණාත් සහිතව,** මෙසේ එකතුවීම හඳුන්වාදෙයි.

එබැවින් **පිලි 1:4,5** හි පාවුල්තුමා ප්‍රකාශ කරන්නේ **'පළමුවෙනි දවස පටන් අද දක්වා'** පිලිප්පිවරුන් තුළ ශුභාරංචිය ප්‍රකාශකිරීම උදෙසා දීමට තද ඇල්මක් / ආශාවක් / කැපවීමක් තිබුනු බවයි. මෙම කැපවීම **පිලි 4:15,16** හි පැහැදිලිව පෙනේ.

**පිලි 4:15,16 :-**

**"[15] පිලිප්පිවරුනි, ශුභාරංචියේ පටන්ගැන්මේදී මා මකිදෝනියෙන් ගිය කල, නුඹලා මිස වෙන කිසි සභාවක් දීමත් ලැබීමත් යන කාරණය ගැන මට හවුල්නුවු බව නුඹලාත් දනිහුය.**

**[16] මක්නිසාද තෙසලෝනිකයට පවා නුඹලා මාගේ ඕනෑකම් ගැන වරක් දෙවරක් මට දීලා එවූහවූය."**

ප්‍රේමණීය සහෝදර සහෝදරියනි, **පිලි 1:4,5** සහ **පිලි 4:15,16** අප එකට කියැවූ විට අප දකින්නේ පිලිප්පියේ සභාව තුළ, ශුභාරංචිය ප්‍රකාශ කිරීම උදෙසා, සභාවේ ආරම්භයේ පටන්ම තිබුනාවූ දැඩි ආශාව සහ උනන්දුවයි. එම ආශාව නිසා, ශුභාරංචි සේවයේ යෙදී සිටියාවූ පාවුල්-තුමාගේ සේවය වැඩියෙන් ශක්තිමත් කිරීම උදෙසා ඔවුන් දායකවෙමින්, **එය උදෙසා දීමයි.**

අප වැඩි දුරටත් දකින්නේ, **'ශුභාරංචියේ වර්ධනය සඳහා' (පිලි 1:4)** පිලිප්පියේ සභාවේ **'පංගුකාරකම'** ගැන පාවුල් - තුමා දෙවියන්වහන්සේට ස්තුති කිරීමයි.

❖ **මාර්ක් 16:15 හි සඳහන් නියෝගයට කීකරුවීම**

අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, අපට නියෝගකර ඇත්තේ, **'සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරන්න'** කියාය. මෙනමුත් උන්වහන්සේ දුන්නාවූ මේ නියෝගයට අනුකූලව ක්‍රියා කිරීමට උත්සාහ කරන්නාවූ සභාවන් ඇත්තේ ඉතාමත්ම කුඩා සංඛ්‍යාවකි.

මෙයින් මා අදහස් කරන්නේ, වර්තමාන කිතුනු සභාව මේ නියෝගය ගැන කිසි තැකීමක් නොදක්වන බව නොවේ. මට පෙනීයන්නේ සෑම කිතුනු සභාවක්ම පාහේ, ශුභාරංචිය ප්‍රකාශ කිරීම උදෙසා, යම්කිසි සේවයක් කරන අතර එම සේවයට බොහෝ සභාවන් දෙන්නේ වැදගත් ස්ථානයක් නොවන බවයි.

මේ අතරම කිතුනු සභාවේ අප දකින තවත් දෙයක් වන්නේ, බොහෝ ප්‍රාදේශීය සභාවන්, තම සභාවේ ඇත්තාවූ එක්සත්කම, සහභාගිකම සහ පංගුකාරකම වර්ධනය කිරීම උදෙසා බොහෝ සැලකිලිමත් වන බවයි. පහත සඳහන් දේ මේ අරමුණත් සහිතව බොහෝ විට කරනු ලැබේ.

1. දේව මෙහෙයෙන් පසුව දේව මෙහෙයට සහභාගි වුන සැමදෙනාට සුළු සංග්‍රහයක් සංවිධානය කිරීම සමග, සැමදෙනාම එයට සහභාගි කරගැනීමට උත්සාහ කිරීම.
2. සභාව කුඩා කොට්ඨාශවලට කඩා, කොට්ඨාශ ලෙස ගෘහ රැස්වීම් / යාච්ඤා ශෛල ස්ථාපනය කිරීම.
3. මුලු සභාව එක්වී, විනෝද චාරිකා හෝ පවුල් කඳවුරු පැවැත්වීම.

ඉහත සඳහන් සෑම දෙයක්ම සභාවේ සාමාජිකයන්ගේ සහභාගිකම වැඩිදියුණු කිරීමට උපකාරී වන බව අප කවුරුත් පිළිගන්නා අතර, **පිලිප්පි 1:5** හි පිලිප්පි සභාවේ තිබුනු බවට පාවුල්තුමා සඳහන් කරන්නාවූදේ, වර්තමාන සභාව තුළ ඇතිකිරීමට සභාව සමර්ථ වුවහොත්, එයින් අති සුවිශේෂ කාරණා කිහිපයක් ඉටුවේ. ඒවානම්,

(a) Koinonia (ග්‍රීක්) Fellowship (ඉංග්‍රීසි - KJV) **නොහොත් පංගුකාරකම ගැඹුරු මට්ටමක සභාව තුළ ගොඩනැගේ.**

(b) **අන් සභාවන් සහ අන් සේවයන් උදෙසා දීමට සභාව පුරුදුවීම හේතුකොටගෙන, සභාවන් අතර පංගුකාරකම ඇතිවී, වර්ධනය වේ.**

(c) **ඉහත සඳහන් දේ හේතුකොටගෙන, සභාව පරිත්‍යාග-ශීලීව දීම නිසා, සභාවට දෙවියන්වහන්සේ ආශිර්වාද කරුණු ඇත.**

**2 කොරි 9:6 :- ''මසුරුලෙස වපුරන්නා මසුරු ලෙස කපාගන්නේය; නොමසුරුව වපුරන්නා නොමසුරුව කපාගන්නේය.''**

(d) **මාර්ක් 16:15 හි සඳහන් අයුරින් ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ නියෝගයට සභාවන්ද, ඒවාහි සාමාජිකයන්ද පුරුදුවෙති.**

(e) **ශුභාරංචියේ වර්ධනය ඇතිවීම උදෙසා සභාවන් තුළ ශුභාරංචිය ප්‍රකාශකිරීම උදෙසා කුඩා කණ්ඩායම් පත්කිරීම මගින්, එම කණ්ඩායම් තුළ ගැඹුරු ආත්මික සම්බන්ධකම් සහ පංගුකාරකම් අධිකව වර්ධනය වීම.**

(f) **ඉහත සේවය උදෙසා මෙම කුඩා කණ්ඩායම් එකතු වී යාච්ඤා කිරීම හේතුකොටගෙන, සභාවේ යාච්ඤා ජීවිතය බලවත්වීම.**

මෙම ලැයිස්තුවට තවත් කාරණා එකතුකල හැකි අතර, එසේ කිරීම අනවශ්‍ය යයි සිතමි.

දේව දරුවෙනි, කිතුනු සභාව ශුභාරංචිය ප්‍රකාශ කිරීම අනිවාර්යයී වේ. එලෙසම කිතුනු සභාවේ එක්සත්කම සහ සහභාගිකම වර්ධනයවීම අතිශයින් වැදගත් වේ. මේ සහභාගිකම වර්ධනය කරගැනීම උදෙසා වඩාත්ම යහපත්වූද, ඵලබරවූද, අපගේ කැඳවීමට අනුකූල වන්නාවූ මාර්ගය වන්නේ, **එකතුවී දෙවියන්වහන්සේගේ සේවයේ යෙදීමයි. අප සැමට මෙසේ එකතුවී කළ හැකි සේවයක් වන්නේ, ශුභාරංචි සේවයයි.**

එබැවින් මා ඉතා ආදරයෙන් සහ යටහත්කමින්, මෙය කියවන ඔබ සැමදෙනාට යෝජනා කරන්නේ, පහත සඳහන් අයුරින් ක්‍රියා කිරීමටයි.

(i) ඔබ නමස්කාර කරන්නාවූ සභාවට අයිති සාමාජිකයන්ගේ සංඛ්‍යාව සහ ඔවුන් වෙසෙන පෙදෙස් අනුව, ප්‍රාදේශීය **'ශුභාරංචිය බෙදා ගැනීමේ කුඩා කණ්ඩායම් අරඹන්න.'**

(ii) එම පෙදෙස් අනුව, ඒවාහි වෙසෙන ජනතාවට ඇත්තාවූ ප්‍රශ්න/ අමාරුකම් යනාදිය හඳුනාගන්න.

(iii) කුඩා කණ්ඩායමක් ලෙස එකතුවී, එම ප්‍රදේශය උදෙසාද එහි වෙසෙන මනුෂ්‍යයන්ගේ ගැළවීම උදෙසාද සතියකට වතාවක්, බරක් ඇතිව දෙවියන්වහන්සේට කන්නලව් කරන්න.

(iv) මසකට වරක් සියලු ප්‍රාදේශීය කණ්ඩායම් සියල්ල එක්රැස්වී, දෙවියන්වහන්සේට ස්තුති ප්‍රශංසා පුදන්න, සාක්ෂි බෙදාගන්න, එකිනෙකා ගැන යාච්ඤා කරන්න, ඔබ සැම පාවිච්චි කරන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

ඔබ මෙසේ දෙවියන්වහන්සේට කන්නලව් කරන විට,

(a) පිලිප්පියේ සභාව ආරම්භ කිරීම උදෙසා, බලවත් ලෙස ක්‍රියා කළාවූ දෙවියන්වහන්සේ ඔබ තුළින් ක්‍රියාකරනවා ඇත. (කරුණාකර **ක්‍රියා 16:6-34** දක්වාද, මෙම අධ්‍යයන මාලාවේ පළමුවෙනි අධ්‍යයනයද කියවා බලන්න)

(b) මනුෂ්‍යයන් ගැළවීමට පැමිණෙනු ඇත.

(c) දේව රාජ්‍යය වර්ධනය වනු ඇත.

(d) කුඩා කණ්ඩායම් තුළ ගැඹුරු සහභාගිකමත්, පංගුකාර - කමත් **සහෝදර ප්‍රේමයත් හටගනු ඇත.**

(e) මුලු සභාවම එක්සත්වූ, එක්සිත්වූ, දෙවියන්වහන්සේටද එකිනෙකාටද ප්‍රේමකරන්නාවූ, ආශිර්වාදලත්, ආදර්ශමත් බලවත් සමූහයක් වනු ඇත.

## 3. <u>අප විසින් ශුභාරංචිය ආරක්ෂාකළ යුතුවේ (පිලි 1:7,16)</u>

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, **'අන්තිම දවස්වලදී'** බොහෝ මනුෂ්‍යයන්ගේ ක්‍රියාකිරීම, බොහෝසේ පිරිහීමට පත්වී **'අන්තරා සහිත කාලවල්'** පැමිණෙන්ට යන බව දේව වචනය ප්‍රකාශ කරයි.
(කරුණාකර **2 තිමෝති 3:1-8** දක්වා කියවා බලන්න)

මේ සමගම ඇතිවන්නාවූ ඉතා භයානක සිදුවීමක් වන්නේ, **'බොරු ගුරුවරුන්'** මගින් දේව සභාව තුළට වැරදි ඉගැන්වීම් ඇතුලත් කිරීම උදෙසා, සමහරුන් ක්‍රියා කිරීමයි.

**2 තිමෝති 4:3-4 :- " [3] මක්නිසාද ඔවුන් සාරවත් ඉගැන්වීම නොඉවසා, කසන කන් ඇතුව, තමුන්ගේ ආශාවල් ලෙස තමුන්ටම ගුරුවරුන් රැස්කරගෙන, [4] සත්‍යයට කන් නොදී, ප්‍රබන්ධවලට හැරී යන කාලය පැමිණෙන්නේය."**

ගලාති පොත කියවන අප දකින්නේ, එම ලිපිය පාවුල්තුමා විසින් ලියන ලද කාලයේදී පවා ගලාතිවරුන් සමහරෙක් **'අන්‍ය ශුභාරංචියක්'** දේශනා කිරීම හේතුකොටගෙන, **'අන්‍ය ශුභාරංචියක් වෙත හැරීයාම'** සිදුවෙමින් පැවතුන බවයි. **(ගලාති 1:6).** මෙම තත්ත්වය ගැන පාවුල්තුමාගේ දැඩි විරෝධය **ගලාති 1:8** නි පදයේ අප දකිමු.

**ගලාති 1:8,9 :- " [8] නුමුත් <u>අප විසින් නුඹලාට ප්‍රකාශ කළ ශුභාරංචිය හැර වෙන ශුභාරංචියක් අපවත් ස්වර්ගයෙන් දේවදූතයෙක්වත් නුඹලාට ප්‍රකාශ කරතොත්, ඔහු ශාපලද්දෙක් වේවා</u>. [9] නුඹලා පිළිගත් ශුභාරංචිය හැර වෙන ශුභාරංචියක් යමෙක් නුඹලාට දේශනාකරතොත් ඔහු ශාපලද්දෙක් වේවයි අප වරක් කී හැටියටම මම දැන් නැවතත් කියමි."**

මෙසේ ඉහත සඳහන් අතිශයින් දැඩි ස්ථාවරයක් ගත්තාවූ පාවුල්තුමා, පිලිප්පියේ සභාවට මෙන්ම අපටද ප්‍රකාශකරන්නේ, අප විසින් **'ශුභාරංචිය ගැන උත්තර'** දිය යුතු බවයි.
(කරුණාකර **පිලිප්පි 1:7,16** වන පද කියවා බලන්න)

බයිබලයේ සිංහල පරිවර්තනයේ **'උත්තර දීම'** ලෙස පරිවර්තනකර ඇති වචනය, ඉංග්‍රීසි පරිවර්තනයේ සඳහන් වන්නේ ' Defence ' කියායි.

**Philippians 1:16:- ".... I am put here for the defence of the gospel ." (NIV)**

අප කවුරුත් හොඳහැටි දන්නා ආකාරයට 'defence' යන වචනයේ අර්ථය වන්නේ, 'ආරක්ෂා කිරීම' යන්නයි.

දේව දරුවෙනි, වර්තමානයේදී කිතුනු නම දරන සමහරුන් මෙන්ම කිතුනු ලෙස හැඳින්වෙන සමහර **'සභාවන්ද'** වෙනත් ශුභාරංචියක් ප්‍රකාශකරනු දැකීම අතිශයින් ඛේදජනක වේ. මෙවැනි කාලයක ජීවත්වන්නාවූ අප සැවොම දෙවියන්-වහන්සේ සලකන්නේ, **'ශුභාරංචිය භාරගැනීමට සුදුස්සන්** ලෙසයි **(1 තෙස 2:4)**.

**1 තෙස 2:4 :- "නුමුත් ශුභාරංචිය භාරගැනීමට අපි සුදුස්සෝයයි දෙවියන්වහන්සේ අප ඒත්තුගත් ප්‍රකාරයටම, <u>මනුෂ්‍යයන් නොව අපේ සිත් විමසන දෙවියන්වහන්සේව සතුටුකරන ලෙස කථාකරමුව</u>."**

එබැවින් අප සැම, දෙවියන්වහන්සේ විසින් අපට දෙන ලද්දාවූ ශුභාරංචිය ආරක්ෂා කරමු, වැරදි ඉගැන්වීම් වලින් ආරක්ෂා කරමු.

**1 තිමෝති 6:20,21 :- " [20] තිමෝතියස්නි, දැනගැන්මයයි බොරුවෙන් කියන දැනගැන්මේ අපහාසිකවූ හිස් දෙඩවිලිවලින්ද විරුද්ධකම්වලින්ද අහක්ව සිට, නුඹට භාරදුන් දෙය ආරක්ෂා කරපන්න ; [21] සමහරු ඒ දැනගැන්ම තමුන්ට ඇත්තේය කියා ඇදහිල්ලෙන් මුළාවුණෝය."**

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, දේව වචනය අපට ලබාදුන්නේ මැවුම්කාර දෙවියන්වහන්සේය.

**2 තිමෝති 3:16 :- "දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස, <u>දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල</u> ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ."**

**2 පේත්‍රුස් 1:21 :- "මක්නිසාද කිසි අනාගතවාක්‍යයක් මනුෂ්‍ය කැමැත්තෙන් කිසි කලක නොපැමිණියේය. නුමුත් <u>මනුෂ්‍යයෝ ශුද්ධාත්මයාණන් විසින් පොළඹවනු ලැබ, දෙවියන්වහන්සේගෙන් ලැබූ ලෙස කථාකළෝය</u>."**

මෙනමුත් අද දවසේ සභාව තුළ නැගී සිටින්නාවූ **'ලිබරල්වාදීහු'** දේව වචනය ප්‍රශ්නකරති. ශුභාරංචිය විකෘති කරති. මොවුන්ගෙන් සමහරෙක් ප්‍රකාශ කරන්නේ, **'ඕනෑම ආගමක් අවංකව අදහමින්, ඒ අනුව ජීවත්වුවහොත් දේව රාජ්‍යයට ඇතුල්විය හැකි බවයි.'** මෙය දෙවියන්වහන්සේගේ වචනයට හාත්පසින්ම විරුද්ධ වේ.

**යොහන් 14:6 :- "<u>යේසුස්වහන්සේ ඔහුට කියනසේක්</u> : මාර්ගයද සැබෑවද ජීවනයද මමය. <u>මා කරණකොටගෙන මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත</u>."**

දේව දරුවෙනි, අප සැම නිර්භීතව ශුභාරංචිය ආරක්ෂා කරමු. එසේ කිරීම උදෙසා අපට දෙවි සමිඳුන් ලබා දෙන්නාවූ සැම අවස්ථාවකදීම යාච්ඤාවෙන් යුක්තව ශුභාරංචිය ප්‍රකාශ කරමු.

### 4. <u>ශුභාරංචියට ඔබින ලෙස හැසිරීම - පිලි 1:27</u>

**පිලි 1:27 :- "මම ඇවිත් නුඹලා දක්නෙම් නුමුත්, ඈත්ව සිටින්නෙම් නුමුත්, <u>නුඹලා එකම ආත්මයෙන් ස්ථිරව, එක සිතකින් ශුභාරංචියේ ඇදහිල්ල ගැන වීර්යකරමින්,</u> විරුද්ධව සිටින්නන්ට කිසිවක් ගැන භීත නොවී සිටින බව මට අසන්ට පුළුවන්වන පිණිස, ක්‍රිස්තුස්වහන්සේගේ <u>ශුභාරංචියට ඔබින ලෙසම හැසිරෙන්න</u>."**

ශුභාරංචි ප්‍රකාශකිරීම ගැන පාවුල්තුමා මෙහිදී අතිශයින් වැදගත් කරුණු තුනක් පිලිප්පියේ සභාව ඉදිරියේ තබයි.

අප මීට ප්‍රථමයෙන්, **'ශුභාරංචිය බෙදාගැනීමේ කුඩා ප්‍රාදේශීය කණ්ඩායම්'** ස්ථාපනය කරන ලෙස යෝජනා කෙළෙමු. පාවුල්තුමා **පිලි 1:27** හි පිලිප්පියේ සභාවට දෙන්නාවූ උපදෙස් මෙම කුඩා කණ්ඩායම් වලට බොහෝ සේ අදාල වේ. ඒවා නම්,

(i) **'නුඹලා එකම ආත්මයෙන් ස්ථිරව'**

ශුභාරංචිය ප්‍රකාශකරන්නාවූ අප සැම අනිවාර්යයෙන්ම **'ස්ථිරව'** සිටිය යුතු අතර, එම ස්ථිරකම ඇතිවීමට මූලික සාධකයක් වන්නේ **'එකම ආත්මයෙන්'** අප සැම ක්‍රියාකිරීමයි.

(ii) **'එක සිතකින් ශුභාරංචියේ ඇදහිල්ල ගැන වීර්යකරමින් '**

මෙහිදී පාවුල්තුමා පෙන්වාදෙන්නේ, එක්සිත්ව සහ එක්සත්ව ක්‍රියාකිරීම වන අතර, **සැම දෙනාම එය උදෙසා වීර්යකිරීමේ වැදගත්කමද,** මෙහි සඳහන් වෙයි.

(iii) **'ශුභාරංචියට ඔබින ලෙසම හැසිරෙන්න'**

පාවුල්තුමා මෙසේ දෙන්නාවූ අනුශාසනා පිලිපැදීම, මා දකින්නේ අනිවාර්ය දෙයක් ලෙසයි. මා මෙසේ කියන්නේ, **ශුභාරංචිය ප්‍රකාශකරන්නාවූ අපගේ වචනවලට පටහැනිව අප ජීවත්වන්නේ නම්, අපගේ ජීවිතාදර්ශය ශුභාරංචියට බාධාවක් වන බැවිනි.**

මෙහි වැදගත්කම ඔබට වඩා පැහැදිලිව දක්වීම උදෙසා **2 කොරින්ති අධ්‍යයනය 03** හි මා ලිවුවාවූ වදන් සමහරක් උපුටා දක්වීමට කැමැත්තෙමි.

"<u>**උපුටා දැක්වීම -2 කොරින්ති අධ්‍යයන 03 (පිටු 6,7,8 න්)**</u>

**2 කොරි 3 : 2-3 :-**

**" [2] <u>අපගේ පත්‍රය නම් නුඹලාය</u> .... [3] .... නුඹලා ........ මාංසවූ <u>සිත් නැමැති ලෑලිවලද ලියා තිබෙන ක්‍රිස්තුස්වහන්සේගේ පත්‍රයක් බව ප්‍රකාශව තිබේ</u>."**

ප්‍රේමණීය සහෝදරයා සහෝදරී, මෙහි පාවුල්තුමා ප්‍රකාශකරන දෙයින් පෙනීයන්නේ, කොරින්ති සභාවේ නොයෙක් ප්‍රශ්න තිබුන නමුත්, සභාවේ බොහෝ දෙනෙක් **"ආදර්ශමත්වූ, ආලෝකමත්වූ, සාක්ෂිකාර ජීවිත ගත කළ බවයි.** එබැවින් ඔවුන්ගේ ජීවිත **ක්‍රිස්තුස්වහන්සේගේ පත්‍රයක් ලෙස ප්‍රකාශවූ බවය."**

දේව දරුවෙනි, මොහොතකට මෙය ගැන සිතා බලන්න. අප රටේ සෑම කිතුනුවෙකුගේම ජීවිතය, මේ ආකාර වූවා නම්, අපගේ රට තුළ කුමක් සිදුවෙයිද?

❖ දෙවියන්වහන්සේ අප සෑම කැඳවා තිබෙන්නේ, **ශුභාරංචියට ඔබින ලෙස හැසිරෙන්ටයි, ජීවත්වෙන්ටයි, ජීවමාන ලිපි වෙන්ටයි.**

මෙම **'ජීවමාන ලිපි'** මනුෂ්‍යයන් කියැවූ විට▫

- දෙවියන්වහන්සේගේ ප්‍රේමය ගැන
- යේසුස්වහන්සේගේ යටහත්කම ගැන
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය ගැන
- සහෝදර ප්‍රේමය ගැන

සහ වෙනත් බොහෝ කිතුනු ගුණාංග, ඔවුන් දැකිය යුතුයි.

දේව දරුවෙනි, අප සෑමදෙන, **අපගේ වචනයෙන් සහ ක්‍රියාවෙන් ශුභාරංචිය ප්‍රකාශකරමු.**

**එසේ කිරීමට**

**දෙවිස්වාමීන්වහන්සේ**

**ඔබට පිහිටවනසේක්වා !!!**

# සටහන්

# සෑම අවස්ථාවකදීම දෙවියන්වහන්සේ ක්‍රියාකරමින් සිටිනසේක



## පිලිප්පි අධ්‍යයනය 03

# සෑම අවස්ථාවකදීම දෙවියන්වහන්සේ ක්‍රියාකරමින් සිටිනසේක

## පිලිප්පි 1:1 - 20

**හැඳින්වීම** :-

මා ගැළවීමට පැමිණි දා පටන්, බොහෝසේ ආශාකරන්නාවූ දේව පොරොන්දුවක්, නොහොත් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනයේ අපට දී ඇත්තාවූ සහතිකයක්, **රෝම 8:28** හි සඳහන් වෙයි.

**රෝම 8:28 :- "තවද දෙවියන්වහන්සේට ප්‍රේමකරන්නන්ට, එනම් උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබූවන්ට, සියලු දේම යහපත පිණිස එකට ක්‍රියාකරන බව අපි දනිමුව."**

පිලිප්පි පොතේ අප දකින්නේ ඉහත සඳහන් දේව සහතිකය අපට ලබා දීම උදෙසා දෙවියන්වහන්සේ විසින් පාවිච්චි කරනු ලැබුවාවූ පාවුල්තුමා මේ පොරොන්දුව අල්ලාගෙන ජීවත්වීමයි. එබැවින් මෙම සහතිකය ඇතිව ජීවත්වූ ඔහු විසින් මේ ලිපිය ලියන ලද්දේ රෝමයේ හිර අඩස්සියේ සිට නමුත්, ඔහු **"ප්‍රීතියෙන් ජීවත්වෙමින්"** නැවත නැවතත් **"ප්‍රීති වෙයල්ලා"** යන අනුශාසනාව පිලිප්පිවරුන්ට ලබාදීමයි.

දේව දරුවනි, මෙම පොත කියවන්නාවූ ඔබ සැමද, මේ පොරොන්දුව අල්ලාගෙන ඉතා ප්‍රීතිමත්, ආශිර්වාදලත් ජීවිතයක් ගත කිරීම අපගේ යාච්ඤාවයි.

**අධ්‍යයනය** :-

**1. පාවුල්තුමාව හඳුන්වාදෙන ආකාරය - පිලි 1:1**

**පිලිප්පි 1:1 :- " ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ දාසයන්වූ පාවුල් ද තිමෝතියස්ද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ පිලිප්පියෙහි සිටින ශුද්ධවන්තයන්ටත් නායකයන් හා උපස්ථායකයන්ටත් ලියා එවන වග නම් :"**

(a) ලිපියේ කතුවරයා තමා **'පාවුල්'** ලෙස හඳුන්වා දෙන අතර ඔහුගේ නම ක්‍රියා පොතේ මුලින් සඳහන් වන්නේ **'සාවුල්'** ලෙසයි. **(ක්‍රියා 9-12)** මේ අතර **ක්‍රියා 13:9** හි සඳහන් වන්නේ පාවුල් යන නමක් ද සාවුල්ට තිබුණු බවයි.

සාවුල් යන නම හෙබ්‍රෙව් නොහොත් යුදෙව් නමක් වූ අතර, **(සාවුල් රජතුමා මෙන්)** පාවුල් යන්න 'අන්‍යජාතික' නමකි.

එබැවින් අන්‍යජාතිකයන් උදෙසා අපොස්තලුවරයෙක් ලෙස පත්කරනු ලැබුවාවු සාවුල් ඔහුගේ හැරීමෙන් පසු ඔහුට තිබුණාවු පාවුල් යන නම භාවිත කළ බව අපට පෙනේ. (පාවුල් යන නම අන්‍යජාතීන් හා සමඟ සමීපවීමට ඔහුට රුකුලක් වූ බව අපට උපකල්පනය කළ හැකිවේ) .

(b) **''ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ දාසයන්වූ පාවුල්ද තිමෝතියස්ද''** මෙහි **'දාසයන්වූ'** ලෙස සඳහන් වන්නාවූ වචනය Duolos යන වචනයේ සිංහල පරිවර්තනය වන අතර Duolos යන වචනයේ අර්ථය වන්නේ **'වහලෙකු'** යන්නයි. මෙහිදී වහලෙක් (දාසයෙක්) ලෙස තමාව විස්තර කරන්නාවු පාවුල් එයින් අදහස් කරන්නේ තම ස්වාමියා ඉදිරියේ **'බියෙන් වෙව්ලන වහලෙක්'** යන්න නොවේ. එයින් ඔහු අදහස් කරන්නේ, තමා යේසුස්වහන්සේ විසින් මිලේට ගනු ලැබුවාවු උන්වහන්සේගේ වහලෙක් බවයි.

**1 කොරි 6:20 :- '' නුඹලා නුඹලාටම අයිති නැත, මක්නිසාද නුඹලා මිලේටගනු ලැබූවහුය. එබැවින් නුඹලාගේ ශරීරයෙන් දෙවියන්වහන්සේට ගෞරව කරන්න. ''**

පාවුල් මෙහි පෙන්නුම් කරන අදහස වන්නේ දේව දරුවන් වන්නාවූ අප සැවොම අතීතයේ සිටියේ **'පාපයට වහල්වූ අය ලෙස බවත් යේසුස්වහන්සේ අප සැම උන්වහන්සේගේ ලේ යන මිලය ගෙවා පාපයේ වහල්කමින් මුදවාගත් බවත්ය.'** එබැවින් ඔහු තම කැමැත්තෙන්ම පාපයේ වහල්කමින් ඔහුව මුදවාගත් යේසුස්වහන්සේගේ වහලෙක් ලෙස ජීවත්වන බවයි.

දේව දරුව, ඔබ මෙය ගැන මොහොතක් සිතා බලන්න. අප යේසුස්වහන්සේගේ වහලෙක් (දාසයෙක්) වන්නේ නම් **උන්වහන්සේ අපගේ ස්වාමීන්වහන්සේ වනසේක.**

මෙනමුත් අප,

- අප රැකියාව කරන්නවාවූ ස්ථාන වල අපට ඉහලින් සිටින නිලධාරින්ට (ස්වාමීවරුන්ට) එකහෙලා කීකරුවන අප, අපගේ ස්වාමීන්වහන්සේට අකීකරු වන අවස්ථා නිතර තිබෙනවා නොවේද?

- උන්වහන්සේගේ කැමැත්තට බොහෝවිට අකීකරුවන්නා වූ අප, උන්වහන්සේට කන්නලව් කරන්නේ, අපගේ කැමැත්තට ඉඩ දෙන්ට කියා නොවේද?

- මේ අයුරින් උන්වහන්සේගේ වහලුන් විය යුතු අප නිතර ක්‍රියාකරන්නේ උන්වහන්සේගේ **'ස්වාමියෙක්'** ලෙස නොවේද?

දේව දරුවනි, <u>**අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට අපගේ ජීවිතයේ ස්වාමීත්වය භාරදෙමු.**</u> (පාවුල්තුමා මෙන්) **සෑම විටම උන්වහන්සේට කීකරුවෙමු. සෑම විටම දේව වචනය අනුව ජීවත්වෙමු. සෑම විටම ශුද්ධාත්මයාණන්-වහන්සේගේ මඟපෙන්වීම අනුව ක්‍රියා කරමු.**

(c) **'පිලිප්පියේ සිටින <u>ශුද්ධවන්තයන්ටත්'</u>**

මෙහි පාවුල් 'ශුද්ධවන්තයන්' ලෙස අමතන්නේ පිලිප්පියේ සභාවට අයිතිවූ සුවිශේෂ ජීවිත ගත කල ස්වල්ප දෙනෙක් පමණක් නොවේ. ඔහු ශුද්ධවන්තයන් ලෙස අමතන්නේ පිලිප්පියේ සභාවට අයිතිවූ සියළු දෙනාටයි.

ග්‍රීක් භාෂාවෙන් **Hagios** යන වචනය මෙසේ **'ශුද්ධවන්තයන්'** ලෙස පරිවර්තනය කර ඇති අතර, එයින් අදහස් කරනු ලබන්නේ, ඔවුන් **'සම්පූර්ණයෙන් පව් රහිතවූ'** ජීවිත ගත කල බව නොවේ.

**Hagios** නොහොත් ශුද්ධවන්තයන් යන වචනයේ මෙහිදි අදහස් කරනු ලබන්නේ **'දෙවියන්වහන්සේ උදෙසා වෙන් කරනු ලැබුවාවු අය'** යන්නයි.

ඕනෑම මනුෂ්‍යයෙක් යේසුස් ක්‍රිස්තුස්වහන්සේව තම පුද්ගලික ගැළවුම්කාරයා ලෙස පිළිගන්නේද, එම මොහොතේම ඔහු දෙවියන්වහන්සේ උදෙසා වෙන්කරනු ලැබුවාවූ කෙනෙක් **(ශුද්ධවන්තයෙක්)** බවට පත්වෙයි.

මාගේ ප්‍රේමවන්ත දේව දරුවනි, මෙම අධ්‍යයනය කියවන්නාවූ ඔබගෙන් අති බහුතරයක්, ඔබගේ ජීවිතය අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට භාරදී **'ශුද්ධවන්තයෙක්'** බවට පත්වී සිටින බව මාගේ විශ්වාසයයි.

- එසේ නොවන්නේනම් නොපමාව ඔබගේ පුද්ගලික ගැළවුම්කාරයා ලෙස යේසුස්වහන්සේව භාරගෙන දේව දරුවෙක් **(ශුද්ධවන්තයෙක්)** බවට පත්වෙන්න **(යොහන් 1:12)**

- ශුද්ධවන්තයින් බවට පත්වී සිටින අප සැමදෙන, **දෙවියන්වහන්සේගේ ගෞරවය සහ මහිමය උදෙසා ජීවත්වෙමු.**

## 2. පිලිප්පිවරුන් වෙත පාවුල්ගේ ආචාරය - පිලිප්පි 1:2

**පිලිප්පි 1:2 :- "අපගේ පියවූ දෙවියන්වහන්සේගෙන්ද ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන්ද කරුණාවත් සමාදානයත් නුඹලාට වේවා."**

### (a) 'කරුණාවත් සමාදානයත් නුඹලාට වේවා'

පිල්ප්පි සභාවට ආචාර කරමින්, පාවුල් යොදාගෙන ඇති ප්‍රථම වචනය, බයිබලයේ ඉංග්‍රීසි පරිවර්තනයේ **'Grace'** ලෙසද සිංහල පරිවර්තනයේ **'කරුණාව'** ලෙසද සඳහන්වේ. මේ අතර **'Grace'** යන වචනයෙන් අදහස්කරනු ලබන්නේ, දෙවියන්වහන්සේ වෙතින් කිසිම සුදුසුකමක් නැත්තාවු

මනුෂ්‍යයා වෙත ගලා එන්නාවූ දයානුකම්පාවටයි. දේව දරුවෙනි, අප සැම **'පාපයේ දඬුවමින් ගැළවීම'** ලබා ඇත්තේ අපගේ කිසි සුදුසුකමක් නිසා නොව, දෙවියන්වහන්සේගේ 'දයානුකම්පාව' නිසයි. පව්කාරවූ අපට **'ගැළවීම'** ගෙන දෙන දෙවියන්වහන්සේගේ දයානුකම්පාව දේව වචනයේ බොහෝවිට සඳහන් වන්නේ **'අනුග්‍රහය'** ලෙසයි.

**එපීස 2:8 :-"මක්නිසාද ඇදහිල්ල කරණකොටගෙන ඒ <u>අනුග්‍රහයෙන් නුඹලා ගැළවී සිටින්නහුය</u>. එය නුඹලාගෙන්ම නොව දෙවියන්වහන්සේගේ දීමනාවය. කිසිවෙක් පාරට්ටුකර නොගන්න පිණිස ඒක ක්‍රියාවලින් නොවේ."**

(b) පාවුල්තුමා පිලිප්පිවරුන්ට ආචාර කරමින් **සාමදානය** යන වචනයද ඇතුළත් කිරීම ඉතාමත් උචිත වේ.

එයට හේතුව වන්නේ, යමෙක් ඇදහිල්ලෙන් දෙවියන්-වහන්සේගේ දීමනාවක් වන ගැළවීම ලබාගැනීම සමඟම හෙතෙම දෙවියන්වහන්සේ සමඟ සමදානයට ඇතුලත් වන හෙයිනි.

**රෝම 5:1 :- "එබැවින් අපි ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨකරනු ලැබ, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන <u>දෙවියන්වහන්සේ හා සමඟ සමාදානය ඇතුව සිටිමු</u>. "**

ඉහත සඳහන් අයුරින්, දේවදරුවන් වන්නාවූ අප සැමව දෙවියන්වහන්සේ කැඳවන්නේ, **දෙවියන්වහන්සේ සමඟ සමාදානය අපගේ සිත් තුළ අත්දකින්ටයි**. මෙම සමාදානය අත්දැකීමේ මාර්ගය **පිලිප්පි 4:6,7** හි මෙසේ සඳහන්වෙයි.

**පිල්ප්පි 4:6,7 :- "[6]නුඹලා <u>කිසිවක් ගැන කනගාටු නොසිතා, සියල්ලෙහිදී ස්තුතිදීම සමඟ යාච්ඤාවෙන්ද කන්නලව්වෙන්ද</u> නුඹලාගේ ඉල්ලීම් දෙවියන්වහන්සේට දන්වන්න."**

[7] **<u>එවිට කිසි නුවණකින් දැනගත නොහැකිවූ දෙවියන්වහන්සේගේ සාමාදානය ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ නුඹලාගේ සිත්ද සිතිවිලිද ආරක්ෂා කරනවා ඇත</u>.**"

දේව දරුවනි, කිසි නුවණකින් දනගත නොහැකිවූ දෙවියන්වහන්සේගේ සමාදානය අත්දකිමු. මෙම සමාදානය අත්දැකීම උදෙසා,

- කිසි දෙයක් ගැන කරදර නොවෙමු .

- සෑම අවස්ථාවකදීම, දෙවියන්වහන්සේට ස්තුතිදෙමින්, යාච්ඤාවෙන් සහ කන්නලව්වෙන්, අපගේ අවශ්‍යතාවයන් උන්වහන්සේට දන්වා සිටිමු.

අප මෙසේ කරන විට, බොරු නොකියන්නාවූ පොරොන්දු ඉටුකරන්නාවූ අපගේ දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සමාදානයෙන් අපගේ සිත් සහ සිතුවිලි ආරක්ෂා කරන සේක.

දේව දරුව, ඔබ කෙතරම් දුෂ්කර අවස්ථාවක සිටිතත්, මෙම සත්‍යතාවන් තේරුම් ගන්න.

(i) ඔබ සිටින්නාවූ අවස්ථාව පාලනය කරන්නේ, ඔබට ප්‍රේම කරන්නාවූ, ඔබ වෙනුවෙන් තම ඒක ජාතක පුත්‍රයා පූජාකළ දෙවි ස්වාමීන්වහන්සේය.

(ii) උන්වහන්සේට නොහැකි දෙයක් නොමැත.
**ලූක් 1:37, 18:27**

(iii) උන්වහන්සේට වරදින්නේ නැත.

(iv) උන්වහන්සේට ප්‍රේමකරන්නන්ට, සියලු දේම ඔවුන්ගේ යහපත උදෙසා උන්වහන්සේ ක්‍රියා කරනසේක. - **රෝම 8:28**

මෙම සත්‍යතාවල් තේරුම් ගනිමින් සෑම ප්‍රශ්නයක් මැදදී, ඇදහිල්ලෙන් **පිලිප්පි 4 :6** අනුව ක්‍රියාකරන්න.

## 3. <u>පිලිප්පිවරුන් ගැන පාවුල් දෙවියන්වහන්සේට ස්තූතිදීම පිලි 1:3-5</u>

**පිලිප්පි 1:3 :- "නුඹලා මට සිහිවෙන හැම වේලේම නිතරම මාගේ සියලු යාච්ඤාවලදී නුඹලා සියල්ලන් උදෙසා ප්‍රීතියෙන් යාච්ඤාව ඔප්පු කරමින්."**

පාවුල් විසින් මෙම ලිපිය පිලිප්පිවරුන්ට ලියන ලද්දේ, ඔවුන්ව මුණගැසී වසර දහයකට පමණ පසුවයි. මෙනමුත් ඔහු ප්‍රකාශකරන්නේ

- ඔහු ඔවුන්ව **සිහිවන හැම වේලේම** ඔවුන් ගැන යාච්ඤා කළ බවයි.

(a) දේව දරුවෙනි, **පිලි 1:1** නි පදයෙන් අප ඉගෙනගත් එක දෙයක් වූයේ, අප සැම අපගේ ජීවිතවල **ස්වාමීත්වය යේසුස්වහන්සේට භාරදීය යුතු බවයි.** අප මෙසේ කළ විට උන්වහන්සේ අනිවාර්යයෙන්ම ආත්ම දිනාගැනීම උදෙසා අපව පාවිච්චි කරනවා ඇත. අපව ස්වල්ප දෙනෙකුගේ හෝ ආත්මික පියා/මව බවට පත්කරනු ඇත. එම ආත්මික දරුවන්ව ශක්තිමත් කිරීමට, ආත්මිකව වර්ධනය කිරීමට, දේව වචනයෙන් පෝෂණය කිරීමට, ඔවුන් ගැන යාච්ඤා කිරීමට සහ ඔවුන්ට ප්‍රේම කිරීමට උන්වහන්සේ අපව කැඳවනු ඇත.

ඔබ අද එසේ කරමින් සිටිනවාද? නොඑසේ නම් අප සැම නොපමාව අපගේ **ස්වාමිවූ** යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කැමැත්තට යටත්වෙමින් ශුභාරංචිය ප්‍රකාශ කරමු. එවිට උන්වහන්සේ ඔබට ආත්මික දරුවන් දෙනසේක.

(b) **පිලි 1:3-5** හි අප දකින්නේ, පාවුල්තුමා දෙවියන්වහන්සේ ඔහුට පිලිප්පියේ ලබාදුන් ආත්මික දරුවන් සිහිවූ සැම විටම **ප්‍රීතියෙන් දෙවියන්වහන්සේට ස්තුති කල බවයි.**

ප්‍රේමණීය දේව දරුව, දෙවියන්වහන්සේ අපට ලෞකික දරුවන් දෙන අතර අප නිසැකවම මහත් සතුටට සහ ප්‍රීතියට පත් වෙමු.

ඔබට දෙවියන්වහන්සේ ලබා දී ඇති ආත්මික දරුවන් ගැන, ඔබ ප්‍රීතියෙන් උන්වහන්සේට තුති පුදනවාද? සැබවින්ම එම ආශිර්වාදය අපට ලබාදීම ගැන අප උන්වහන්සේට නිතරම තුති පිදිය යුතුවේ. මා මෙසේ ප්‍රකාශ කරන්නේ, එම ආත්මික දරුවන් හේතුකොටගෙන දෙවියන්වහන්සේ මෙළොව අපට ලබා දෙන්නාවූ ප්‍රීතිය , සතුට සහ තෘප්තිය ගැන පමණක් නිසා නොවේ. මා එසේ ප්‍රකාශ කරන්නේ ඒ සමඟම උන්වහන්සේ අපට අනාගතයේදී ලබා දීමට යන්නාවූ ඉමහත් ආර්ශිර්වාදද සිහි කරමිනි.

**දානියෙල් 12:3 :- ''....... බොහෝ දෙනෙකු ධර්මිෂ්ඨකමට හරවා ගන්නෝ තාරකාවන් මෙන්ද සදාකාලේටම බැබළෙන්නෝය.''**

(c) පිලිප්පි සභාව ස්ථාපිත කිරීම උදෙසා, පාවුල් එහි ශුභාරංචිය ප්‍රකාශකිරීම සිදුකිරීමේ කාලයේදි, පාවුල්තුමාට බොහෝ පීඩාවලට මුහුණදීමට සිදුවිය. නමුත් ඒ සැමදේ මැදදී ඔහු දෙවියන්වහන්සේට ස්තූති කළේය.

**ක්‍රියා 16:22-24 :- ''එවිට සමූහයා ඔවුන්ට විරුද්ධව එක්ව නැගුටුණෝය. නඩුකාරයෝද ඔවුන්ගේ වස්ත්‍ර ඉරාදමා, ඔවුන්ට කෝටුවලින් තලන්නට අණකළෝය ............... ඔවුන්ට බොහෝ පහර දුන්නායින් පසු.......... ඔවුන්ගේ පාද සවිලෙස දඬුගැසුවේය.''**

මේ අන්දමින් පිලිප්පියේදී බොහෝ පහර ලැබ දඬු ගසා ඇතුල් හිරගෙයි දමන ලද්දාවූ පාවුල් සහ සීලස් **'යාච්ඤාරමින් දෙවියන්වහන්සේට ගී කීවෝය.'(ක්‍රියා 16:25)**

මෙහිදි  අප දකින්නේ **පිලි 4:7** හි පොරොන්දුව ලියැවු පාවුල් **පිලි 4:6** අනුව දෙවියන්වහන්සේට ප්‍රශංසාකරමින් ගී ගැයීමයි. පාවුල් සහ සීලස් මෙසේ මහත් වේදනා සහ පීඩා මැද දෙවියන්වහන්සේට ප්‍රශංසා කළ විට, දෙවියන්වහන්සේ ඔවුන්ට ප්‍රතිචාර දක්වූයේ, මහත් පොළෝකම්පාවක් ඇතිකර හිර ගෙදර සියලු දොරවල් අරිමින්, හිර ගෙදර මුලාදෑනියා සහ ඔහුගේ ගෙයි වැසි සියල්ලන් ගැළවීමට ගෙන එමිනි. **(ක්‍රියා 16:26-33)**

මාගේ ප්‍රේමවන්ත දේව දරුවනි , මෙම සිද්ධියෙහිදී ද අප දකින්නේ, **රෝම 8:28** හි සඳහන් සත්‍යතාවයයි. අප සැමද සැමවිටම, **රෝම 8:28** විශ්වාස කරමින් **පිලි 4:6** අනුව ක්‍රියාකරමින් **දෙවියන්වහන්සේගේ සමාදානය අපගේ සිත් සහ සිතුවිලි තුළ අත්දකිමු.**

## 4. <u>පිලිප්පිවරුන් කෙරෙහි පාවුල් තුළ තිබුනාවූ ප්‍රේමය - පිලි 1:7,8</u>

**පිලි 1:7,8 :- "නුඹලා මාගේ සිතේ දරමි. එසේය, ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ ඇලුම්කමින් මට නුඹලා සියල්ලන් කෙරෙහි කොපමණ ආශා ඇත්තෙම්ද කියා දෙවියන්වහන්සේ මට සාක්ෂි වනසේක. "**

### (a)**'නුඹලා මගේ සිතේ දරමි'**

මේ වචනවලින් අප දකින්නේ, පිලිප්පිවරුන් කෙරෙහි පාවුල් දක්වුවාවූ, ඉතා ගැඹුරු **'පවුල් සම්බන්ධකමයි'** පියෙක් සහ දරුවන් අතර තිබෙන්නාවු ආදරයයි , බැඳීමයි.

### (b) **'ක්‍රිස්තුස්වහන්සේගේ ඇලුම්කමින් ...... කොපමණ ආශා ඇත්තෙම්ද '**

පාවුල් මෙහි පෙන්නුම් කරන්නේ, එලෙස පිලිප්පිවරුන්ට ප්‍රේම කිරීමේ උල්පත වන්නේ, ඔහු තුළ වැඩ වසන යේසුස්වහන්සේ බවයි.

**ගලාති 2:20 :- ''මම ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි ; එසේවී නමුත් මම ජීවත්වෙමි ; නමුත් තවත් <u>මා නොව ක්‍රිස්තුස්වහන්සේ මා තුළ ජීවත්වනසේක</u>.''**

එබැවින් පිලිප්පිවරුන් වෙත පාවුල් තුළින් ගලායන්නේ, ඔහු තුළ වැඩ විසූ යේසුස්ගේ ප්‍රේමයයි.

මීට අමතරව **රෝම 5:5** අපට පෙන්වා දෙන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපගේ හදවත් වල වගුරා ඇති බවයි.

**රෝම 5:5 :- '' ........මක්නිසාද අපට දෙනලද ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන දෙවියන්-වහන්සේගේ ප්‍රේමය අපගේ හෘදවල වගුරුවනලද්දේය.''**

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, කිතුනු පවුලට අයිති වන්නාවූ ඔබගේ **'සහෝදර සහෝදරියන්ට'** ඔබ සැබවින්ම ප්‍රේම කරනවාද?
ඔබ තුළ වැඩවසන්නාවූ ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය අන් මනුෂ්‍යයන් දකිනවාද? නොහොත් ඔවුන් වෙත ක්‍රිස්තුස්-වහන්සේගේ ප්‍රේමය ඔබ තුළින් ගලා යනවාද?

## 5. <u>කිතුනුවන් උතුම් වූ දේවල් හඳුනාගැනීමේ වැදගත්කම - පිලි 1:9,10</u>

**පිලි 1:9,10 :- ''[9]යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේට ගෞරවය හා ප්‍රශංසාව සඳහා නුඹලා ධර්මිෂ්ඨකමේ ඵලවලින් පූර්ණව, [10]<u>උතුම්වූ දේවල් ඒත්තුගන්ට නුඹලාට</u> පුළුවන්වෙන්ටත්, ක්‍රිස්තුස්වහන්සේගේ දවස දක්වා අවංකව නිදොස්ව සිටින්ටත්, ''**

(a) **'උතුම්වූ දේවල් එත්තුගන්වන්ට '**
මෙම වචන ඉංග්‍රීසි පරිවර්තනයේ සඳහන් වන්නේ 'Discern What is Best' කියායි. එනම් 'වඩාත්ම හොඳදේ හඳුනාගැනීමට හැකිවේය' කියායි.

දේව දරුවනි, මෙය තදින් අල්ලා ගන්න .

- දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතය උදෙසා අති අනගි සැලස්මක් සකසා තිබෙන සේක. **(එපීස 2:10)**

- උන්වහන්සේගේ සැලැස්මට වඩා යහපත් සැලැස්මක් ඔබගේ ජීවිතය උදෙසා සකසන්නට කිසිම කෙනෙකුට නොහැකිවේ.

එබැවින් අප සැමදෙනාටම ලබාගත හැකිවූ වඩාත්ම තෘප්තිමත්, ආශිර්වාදලත් වාසනාවන්ත ජීවිතය අපට ලබාගත හැක්කේ, **දෙවියන්වහන්සේගේ සැලැස්ම / කැමැත්ත අනුව ජීවත් වෙමිනි.**

එබැවින් පාවුල් පිලිප්පිවරුන් ගැන යාච්ඤා කරන්නාවූ මූලික කරුණු දෙකක් වන්නේ -

(i) **ඔවුන් වඩාත්ම හොඳදේ හඳුනා ගැනීම,**
(ii) **ඔවුන් අවංකවූ නිදොස් ජීවිත ගතකිරීම,**
යන කරුණු දෙකයි.

මෙම කරුණු දෙකේ ඇති වැදගත්කම නිසා ඒවා ඉතා කෙටියෙන් තව දුරටත් විස්තර කිරීමට කැමැත්තෙමි.

❖ **'වඩාත්ම හොඳදේ ඒත්තු ගැනීම (හඳුනා ගැනීම)'**

අප ඉහත සඳහන් සත්‍යයන් මගින් වටහාගන්නේ, අපගේ ජීවිත වඩාත්ම තෘප්තිමත් වන්නේ, දේව සැලැස්ම අනුව ජීවත්වීම මගින් බවයි.

එබැවින් පාවුල් පිලිප්පිවරුන් උදෙසා දෙවියන්වහන්සේට කරන ප්‍රථම ඉල්ලීම වන්නේ, **'ඔවුන්ට ඔබවහන්සේගේ කැමැත්ත හඳුනා ගැනීමට උපකාර වෙන්න ස්වාමීනි'** කියා ප්‍රකාශ කිරීම නිවැරදි යයි සිතමි.

❖ **'අවංකවූ නිදොස් ජීවිත ගත කිරීම '**

මෙහි **'නිදොස් '** ලෙස සඳහන් වන වචනය ඉංග්‍රීසි පරිවර්තනයේ සඳහන් වන්නේ ' Blameless ' ලෙසයි. එහි අරුත පැහැදිලි කරගැනීම උදෙසා දේව වචනයේ මෙම වචනය සඳහන් තවත් අවස්ථා දෙකක් දෙස බලමු.

**උත්පත්ති 6:9 :-''........නෝවා ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක්ව තමාගේ පරම්පරාවන්හි සම්පූර්ණව සිටියේය. නෝවා දෙවියන්වහන්සේ සමඟ හැසුරුණේය.''**

**උත්පත්ති 17:1 :-''ආබ්‍රම් අනූනව අවුරුදු වයසට පැමිණි කල ස්වාමින්වහන්සේ ආබ්‍රම්ට පෙනී : මම සර්වපරාක්‍රමවූ දෙවියන්වහන්සේය ; මා ඉදිරියෙහි හැසිරෙමින් සම්පූර්ණ වෙයන්න.''**

**පිලිප්පි 1 :10** හි **'නිදොස්ව '** යන වචනයද **උත් 6:9 , 17:1** හි **'සම්පූර්ණ'** ලෙස සඳහන් වචනයද ඉංග්‍රීසි බයිබලයේ සඳහන් වන්නේ, 'Blameless' (NIV) කියායි.

මෙහි පාවුල් දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්නේ පිල්ප්පිවරුන්ට **'පව් රහිත'** (Sinless) ජීවිත ගතකිරීමට සලස්වන්න කියා නොවේ, ඔවුන්ට **'දැන දැන පව් නොකරන ජීවිතයක් '** (Blameless) ගත කිරීමට උපකාරීවන්න කියායි.

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, අපගේ ජීවිතවලද, පාවුල්ගේ මෙම යාච්ඤා ඉල්ලීම් දෙක අපගේ අති ප්‍රමුඛ යාච්ඤා ඉල්ලීම් දෙකක් ලෙස දෙවියන්වහන්සේ ඉදිරියට නිතරම ගෙනෙමු. එම ඉල්ලීම් දෙක වන්නේ -

- ''ස්වාමීනි මාගේ ජීවිතයේ **සැමදා, සැමවිටම ඔබවහන්සේගේ කැමැත්ත අනුව ජීවත්වීමට මට උගන්වා, එසේ ජීවත්වීමට මට උපකාර කළ මැනව.''**

- "ස්වාමීනී මාගේ ජීවිතයේ සැමදා, සැමවිටම ඔබවහන්සේ ඉදිරියේ හැසිරෙමින් නිදොස් ජීවිතයක් ගතකිරීමට මට උපකාර කළ මැනව."

යන යාච්ඤා ඉල්ලීම් දෙකයි.

❖ **'දේව කැමැත්ත අනුව ජීවත්වීම'** ගැන දේව දරුවන් වන අප සැමදෙනාට බොහෝසේ වැදගත් වන්නාවූ කරුණක් මතක්කිරීමට කැමැත්තෙමි.

අප සැමට අපගේ ජීවිතයේ **තීරණ ගැනීමේදී** දේව වචනයට එකඟනොවන්නාවූ තීරණ කිසිසේත් ගත නොහැකිවේ. අපට ගැනීමට ඇත්තාවූ **තීරණය වන්නේ** දේව වචනය සමඟ එකඟ වන්නාවූ ක්‍රියාමාර්ග දෙකක් හෝ කිහිපයක් අතුරින් **වඩාත්ම උතුම්වූ දේ කුමක්ද කියා තීරණය කිරීමයි.**

<u>**නිදසුනක් වශයෙන් :-**</u>

දේව දරුවෙක් විවාහ ජීවිතයකට ඇතුල්වන අතර හෙතෙම **'නොඇදහිලිකාරයෙක්'** සමඟ විවාහවනවාද යන ප්‍රශ්නය පැන නැගෙන්නේ නැත. එසේ වන්නේ දේව වචනය එවැනි අසම සම්බන්ධකම් වලට ඇතුල්වීම නොකළ යුතු බව පැහැදිලිව ප්‍රකාශ කරන හෙයිනි. (**2 කොරි 6:14,15**)

දේව දරුවෙක් ඉදිරියේ තිබෙන ප්‍රශ්නය වන්නේ **'ඇදහිලිවන්ත'** කීපදෙනෙක් අතුරින් දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ කොයි තැනැත්තාද? කියන්නාවූ ප්‍රශ්නයයි.

## 6. <u>පාවුල් හිර අඩස්සියේ සිටීම හේතුකොටගෙන ශුභාරංචිය පැතිරයාම - පිලි 1 : 12-14</u>

පාවුල්තුමා හිර අඩස්සියට පත්වීම ගැන පිලිප්පිවරු බොහෝසේ දුක්වන්නට ඇත. කලකිරෙන්නට ඇත. අධෛර්යට පත්වන්නට ඇත.

එවැනි තත්ත්වයක සිටි පිලිප්පි සභාවට පාවුල් ඔහු මෙහි අමතන්නේ **'සහෝදරයෙනි'** කියා වන අතර එයින් පෙන්නුම් කරන්නේ, පාවුල් සහ සභාව අතර තිබුනාවූ එක්සත්කම සහ ආත්මික බැඳීමයි.

**පිලි 1:12-14 :-" [12] සහෝදරයෙනි, මට සිදුවූ කාරණා වැඩි වශයෙන් ශුභාරංචියේ දියුණුවීමටම හැරී තිබෙන බව නුඹලා දැනගන්නවාට කැමැත්තෙමි. [13]මෙසේ මාගේ බැඳුම් ක්‍රිස්තුස්වහන්සේ නිසා පැමුණුණ බව මුළු රජගෙදර අනිකුත් සියල්ලන්ටද ප්‍රකාශවී තිබේ.[14]ස්වාමීන්වහන්සේ තුළවූ සහෝදරයන්ගෙන් වැඩිදෙනාද මාගේ බැඳුම් නිසා ධෛර්ය ලැබ, දෙවියන්වහන්සේගේ වචනය භය නැතුව කියාදෙන්ට ඉතා වැඩිලෙස නිර්භීතවී සිටිති."**

නමුත් පාවුල්තුමා මහත් ඇදහිල්ලෙන්ද, ප්‍රීතියෙන්ද පිලිප්පිවරුන්ට පවසන්නේ, ඔහුගේ හිර අඩස්සිය නිසා ශුභාරංචියේ එම මාර්ග දෙක දෙඅයුරකින් ඉදිරියට ගමන්ගත් බවයි.

එම මාර්ග දෙක වූයේ ,

(i) පාවුල් මුරකිරීමට පැවැරුනු රෝම භටයෝ, පාවුල්ගේ බැඳුම් ක්‍රිස්තුස්වහන්සේ නිසා ඔහු සතුටින් භාරගත් බව ඇසීම සහ ඔහු ප්‍රකාශ කල ශුභාරංචිය ඔවුන්ගේ සවනට වැටීම.

(ii) රෝමයේ විසූ ඇදහිලිවන්තයන්ගෙන් බොහෝ දෙනෙක්, පාවුල්ගේ ආදර්ශය නිසා. බොහෝසේ නිර්භීතවී, ශුභාරංචිය ප්‍රකාශකිරීමෙහි නිරතවීම.

නැවත වරක් අප මෙහි දකින්නේ **රෝම 8:28** හි සත්‍යතාවයයි. **පිලිප්පි 4:6,7** හි අප කියවන්නාවූ දේව පොරොන්දුවේ ඉටුවීමයි. පිලිප්පියේ පාවුල් සහ සීලස් හිර අඩස්සියට පත්කරනු ලැබීම නිසා, හිරගෙදර මුලාදෑනියා සහ ඔහුගේ ගෙදර වැසි සියල්ලෝම ගැළවීමට පැමිණියා-සේම, රෝමයේ පාවුල් නිවාස අඩස්සියට පත්කරනු ලැබීම

නිසා, ශුභාරංචිය රජගෙදර භටයන් වෙත යෑම සහ ඇදහිලිවන්තයෝ බොහෝසේ ශුභාරංචිය නිර්භීතව ප්‍රකාශ කිරීමට පෙළඹීමයි.

දේව දරුවනි, අප සෑමද දෙවි සමිඳුන් අපව තබන්නාවූ සෑම ස්ථානයකම ශුභාරංචිය ප්‍රකාශ කරමු.

**එසේ කිරීමට දෙවි සමිඳුන්**

**ඔබට ඇදහිල්ලද ශක්තියද නිර්භීතකමද**

**දෙන සේක්වා !!!**

# සටහන්

# සටහන්

# සටහන්

# ක්‍රිස්තුස්වහන්සේ උදෙසා දුක් විඳීම



## පිලිප්පි අධ්‍යයනය 04

# ක්‍රිස්තුස්වහන්සේ උදෙසා දුක් විඳීම

**පිලිප්පි 1:15 - 30**

**<u>හැඳින්වීම</u> :-**

මෙම අධ්‍යයනෙහිදී අපගේ අවධානය විශේෂයෙන් යොමුවන්නාවූ පදය වන්නේ **පිලි 1:29** වන පදයයි.

**පිලිප්පි 1:29 :- "මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහන්ට පමණක් නොව, උන්වහන්සේ උදෙසා දුක්විඳින්ටත් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා නුඹලාට වරප්‍රසාදය දෙන ලද්දේය."**

බොහෝ කිතුනුවන් ඔවුන් අපේක්ෂා නොකළාවූ. බලාපොරොත්තු නොවූවාවූ අවස්ථාවක්, බාධාවක් හෝ ගැටලුවක් මුහුණදීමට සිදුවුන විට අසන්නාවූ ප්‍රශ්නයක් වන්නේ **"ඇයි දෙවියන්වහන්සේ මට මෙසේ සිදුවීමට ඉඩහැරියේ ? "** යන ප්‍රශ්නයයි. මෙවැනි ප්‍රශ්නයක් ඔවුන් ඇසීමට හේතුවන්නේ, ඔවුන් සිටින්නාවූ තත්ත්වය **'මහත් පුදුමයක් '** හෝ **'විස්මවීමට කරුණක් '** හෝ දේව දරුවෙකුට **'විය නොහැකි දෙයක් '** ලෙස ඔවුන් සිතීම විය හැක.

මේ අතර **පිලිප්පි 1:29** අපට පෙන්වා දෙන්නේ, **ක්‍රිස්තුස්වහන්සේ උදෙසා දුක් විඳීම** අප මුහුණදෙන්නාවූ **වරප්‍රසාදයක්** මිස විස්මයට පත්වීමට කරුණක් නොවන බවයි.

දේව දරුවනි, මෙය තේරුම් ගන්න. දුක අත්දැකීම මෙළොව සෑම මනුෂ්‍යයෙකුටම පොදුවූ දෙයකි. එය කිතුනුවන්සේම කිතුනු නොවන සැමදෙනාටද පොදු වූ අත්දැකීමකි.

යමෙක් අත්දකින්නාවූ දුක හෝ වේදනාව ශාරීරික හෝ මානසික හෝ අධ්‍යාත්මික විය හැක. එය ඉතාමත් සුළු හෝ දරාගත නොහැකි තරම් අධිකවූ වේදනාවක් විය හැක.

මේ අතර කිතුනුවන් පමණක් අත්දකින්නාවූ, යමෙක් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ජීවත්වන නිසා ඔවුන් අත්දකින්නාවූ , දුක් විඳීම් තිබේ.

**1 පේත්‍රුස් 4:16 :- "නුමුත් යමෙක් ක්‍රිස්තියානිකාරයෙකු මෙන් දුක් විඳී නම්, ඔහු ලජ්ජා නොවී, ඒ නාමය සම්බන්ධයෙන් දෙවියන්වහන්සේට ගෞරවකරාවා."**

ඔබ මෙලෙස **'ක්‍රිස්තුස්වහන්සේ උදෙසා දුක් විඳින්නේ නම්'** ඔබ ආශිර්වාදලත් තැනැත්තෙක් වේ. වරප්‍රසාද ලත් තැනැත්තෙක්වේ. එබැවින් ඔබ ක්‍රිස්තුස්වහන්සේ උදෙසා දුක්විඳින්නේ නම්, දෙවියන්වහන්සේට ස්තුති කරන්න, ප්‍රශංසා කරන්න. දෙවියන්වහන්සේගේ නාමය ගෞරවය සහ මහිමයට පත්කරන්න. මෙසේ කරමින් දෙවියන්වහන්සේ ඔබට ලබාදෙන්නාවූ සැනසුම, ශක්තිය සහ සතුට අත්දකිමින් උන්වහන්සේට වඩ වඩා කීකරුවී ඇදහිල්ලෙන් ජීවත්වන්න.

**අධ්‍යයනය :-**

**ක්‍රිස්තුස්වහන්සේ උදෙසා දුක්විඳීම**

1. **වැරදි අරමුණු සහිතව සේවයේ යෙදෙන්නවුන් මගින් පැමිණෙන පීඩා - පිලි 1:14-18**

පාවුල්තුමා රෝමයේ **'නිවාස අඩස්සියේ '** ගතකල කාලය පිළිබඳව ක්‍රියා පොතේ මෙසේ සඳහන්වෙයි.

**ක්‍රියා 28:16:- "අප රෝමයට ඇතුල්වුණ කල පාවුල්ට තමා මුරකළ හේවායා සමඟ තනියම සිටින්ට අවසර ලැබුණේය."**

**ක්‍රියා 28:30,31 :- " [30] ඔහු තමා විසින් කුලියට ගත් ගෙයි දෑවුරුද්දක්ම වාසය කොට, තමා වෙත පැමිණි සියල්ලන් පිළිගෙන, [31]කිසිම භයක්වත් තහනමක්වක් නැතුව, දෙවියන්වහන්සේගේ රාජ්‍යය දේශනාකරමින් ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන කාරණා ඉගැන්නුවේය."**

පාවුල්තුමා පිලිප්පිවරුන්ට මෙම ලිපිය ලිව්වේ ඔහු රෝමයේ හිරකාරයෙකු ලෙස සිටි කාලයේය. ඔහු මෙසේ රෝමයේ සිටි කාලයේ කණ්ඩායම් දෙකක් පරස්පර විරෝධී අරමුණු දෙකක් සහිතව **'ක්‍රිස්තුස්වහන්සේ දේශනා කළහ' (පිලි 1:15)** .

රෝම රාජ්‍යයේ හිරකාරයෙකුව සිටි පාවුල්ට ඉහත සඳහන් අයුරින් ශුභාරංචිය දේශනාකිරීමට නිදහස තිබීම හේතුකොටගෙන, **(ක්‍රියා 28:30,31)** රෝමයේ සිටි සහෝදරයන්ගෙන් වැඩිදෙනෙක්ද භය නැතිව වචනය කියා දෙන්ට පටන්ගත්හ. **(පිලි 1:14)** මෙසේ ඔවුන් ශුභාරංචිය දේශනා කළ අතර, ඔවුන් අරමුණු දෙකක් සහිතවූ කණ්ඩායම් දෙකක් ලෙස එසේ කළහ.

**පිලි 1:15-17 :- "[15]සමහරු ඊර්ෂ්‍යාවෙන්ද විවාදයෙන්ද සමහරු හොඳ සිතින්ද ක්‍රිස්තුස්වහන්සේ දේශනාකරති. [16] එක පක්ෂයක් මා ශුභාරංචිය ගැන උත්තරදෙන්ට සිටින බව දැන ප්‍රේමයෙන්ද, [17]අනික් පක්ෂය මාගේ බැඳුම්වලදී මට පීඩා උපදවන්නට සිතා පිරිසිදුලෙස නොව පක්ෂවාදිකමෙන්ද, ක්‍රිස්තුස්වහන්සේව ප්‍රකාශකරති."**

පාවුල් මෙම පදවල ප්‍රකාශ කරන්නේ, එක කණ්ඩායමක් පාවුල් කෙරෙහි **'හොඳ සිතින් සහ ප්‍රේමයෙන් '** දේශනා කළ අතර, අනික් කණ්ඩායම එසේ කළේ පාවුල්ගේ සේවය ගැන **ඊර්ෂ්‍යාවෙන් , සහ ඔහුගේ සිත රිදවීමේ** අරමුණින් බවයි.

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, පාවුල්ගේ ප්‍රකාශය අප ඉදිරියේ තබන්නේ, අප සැම විසින් පිළිතුරු දිය යුතු ඉතා වැදගත් ප්‍රශ්න කිහිපයකි. එම ප්‍රශ්න සමහරක් වන්නේ, ඔබ දේව සේවයේ යෙදී සිටින අතර, එම සේවය ඔබ කරන්නේ,

(i) දෙවියන්වහන්සේගේ කැඳවීම අනුවද?

(ii) දෙවියන්වහන්සේ ඔබට පැවරූ ස්ථානයේද?

(iii) කුමන අරමුණක් ඇතිවද?

(iv) ඔබ සේවය කරන්නේ **'තරඟකාරී, ඊර්ෂ්‍යාකාරී'** මනසක් සහිතවද?

(v) ඔබ සේවය කරන්නේ, වෙනයම් කෙනෙකුගේ සේවය හෙළාදැකීමේ හෝ පහත හෙළීමේ අරමුණකින්ද?

යන ප්‍රශ්නවේ.

වර්තමාන සභාවේ අප සමහරවිට දකින ඉතා කණගාටුසහිත සිදුවීමක් වන්නේ, **'ඉවැන්ජලිස්ත සභා'** ලෙස පිළිගැනීමක් ඇති සභා අතර පවා ඊර්ෂ්‍යාව සහ තරඟකාරීකම ඇති වීමයි. එබැවින් එකම ශුභාරංචිය එකම ක්‍රිස්තුස්වහන්සේද දේශනාකරන්නාවූ සභා, සමහරවිට වැරදි අරමුණු සහිතව එසේ කිරීමයි.

දේව දරුවනි, අපගේ පුද්ගලික සේවයන්හිදීද, සභාවන් තුළින් කෙරෙන්නාවූ මේ බාධාවන් / පරීක්ෂාවන් වලින් ජය ගනිමු.

යේසුස්වහන්සේ කෙරෙහිද, විනාශවන්නාවූ මනුෂ්‍යයන් කෙරෙහිද අප තුළ ඇති ප්‍රේමය නිසා දෙවියන්වහන්සේ අපට දී ඇති ප්‍රේමයේ **ශුභාරංචිය ප්‍රකාශකිරීමටද, ක්‍රිස්තුස්වහන්සේ දේශනාකිරීමටද කැපවෙමු.** තරඟකාරීකමෙන් සහ ඊර්ෂ්‍යාවෙන් තොරව දෙවියන්වහන්සේ අපට ලබා දෙන සැම අවස්ථාවකදීම එසේ කරමු.

**පිලිප්පි 1:18** හි අප දකින්නේ, සභාව තුළ උද්ගතවී තිබුනාවූ ඉතා කණගාටු සහිත තත්ත්වය ගැන පාවුල් දක්වන්නාවූ ඉතා අලංකාර ප්‍රතිචාරයයි.

**පිලි 1:18 :- " වංචාවෙන් වේවා, සැබෑකමෙන් වේවා, ඒ කොහොම වෙතත් සියලු ආකාරයෙන් ක්‍රිස්තුස්වහන්සේ ප්‍රකාශකරනු ලබන සේක, ඊට ප්‍රීතිවෙමි, එසේය, තවත් ප්‍රීතිවන්නෙමි."**

පාවුල්ගේ මේ වචනවලින් පෙනෙන්නාවූ එක් දෙයක් වන්නේ පාවුල්ගේ පරාර්ථකාමි භාවයයි. ඔහුට වඩා වැදගත්වූයේ ඔහු කෙරෙහි සමහරුන් දක්වුවාවූ අකරුණාවන්ත ආකල්පය නොවෙයි. ඔහුට වැදගත්වූයේ, විනාශ වෙන්නාවූ මනුෂ්‍යයන් වෙත ශුභාරංචිය ප්‍රකාශ කරනු ලැබීම, නොහොත් ක්‍රිස්තුස්වහන්සේ දේශනාකරනු ලැබීම ගැන යහපත් ආරංචියයි.

පාවුල්ගේ ආකල්පය මෙසේ වීම හේතුකොටගෙන, ඔහුට රිදවීමට සමහරුන් කළ දේ පවා ඔහු තුළ ඇති කලේ ප්‍රීතියකි.

දේව දරුවෙනි, ඔබ සේවයේ යෙදෙන අතර සභාව ඇතුලෙන් පවා ඔබ වෙත බාධා සහ පීඩා ඇතිවිය හැකිවේ. එම හේතුව නිසා දුකට, වේදනාවට සහ අධෛර්යට පත් නොවෙමු. යේසුස්වහන්සේ අපට ඉගැන්වූ ආකාරයට ඔවුන් උදෙසා යාච්ඤාකරමු.

**මතෙව් 5:44 :- "නුමුත් මම නුඹලාට කියමි : නුඹලාගේ සතුරන්ට ප්‍රේම කරපල්ලා, නුඹලාට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරපල්ලා."**

ඔබ මෙසේ කරන විට දෙවියන්වහන්සේ ඔබගේ සිත තුළ අධෛර්යමත්කම නොව, මහත් ධෛර්යක්ද සමාදනයද, ප්‍රීතියද ඇතිකරනසේක. අප දෙවියන්වහන්සේගේ පුත්‍රයන් වන බව උන්වහන්සේම සනාථකරන සේක.

**මතෙව් 5:45 :- "මෙසේ නුඹලා ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේගේ පුත්‍රයෝ වන්නෝය....".**

## 2. <u>හිර අඩස්සියේ සිටීම හේතුකොටගෙන පාවුල්ට මුහුණදීමට තිබුනාවූ පීඩා - පිලි 1:19-26</u>

පාවුල් හිරගතවීම හේතුකොටගෙන ඇතිවුනාවූ යහපත් ප්‍රතිඵල දෙකක් අප දුටුවෙමු. ඒවා වන්නේ **'මුළු රජගෙදර'** ශුභාරංචිය ප්‍රකාශවීම **(පිලි 1:13)** සහ බොහෝ දෙනා **'ධෛර්ය ලැබ දෙවියන්වහන්සේගේ වචනය කියා දීම'** යන **(පිලි 1:14)** මේවායි.

මෙනමුත් පාවුල්තුමා හිරගතවීම නිසා, ඔහු කැමති අන්දමට සේවයේ යෙදීමට ඔහුට නොහැකිවිය. මෙම හේතුව නිසා පාවුල්, මානසිකව පීඩා වින්දබව අපට සිතන්නට පුළුවන. එබැවින් ඔහුගේ මනස තුළ සමහරවිට ඇතිව තිබුනාවූ පොරබැදීම තේරුම් ගැනීමට උත්සාහ කරමු.

**පිලි 1:19 :- "......... නුඹලාගේ ඉල්ලීමෙන්ද ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මයාණන් ලැබීමෙන්ද මාගේ ගැළවීමට හැරෙන බව දනිමි."**

මෙහි පාවුල්තුමා **'ගැළවීම'** යන්නෙන් අදහස් කරන්නේ පාපයේ දඬුවමින් ගැළවීම නොවේ. ඔහු එයින් අදහස් කරන්නේ **'හිරෙන් නිදහස් කරනු ලැබීම '** හෝ **මරණය මඟින් ඇදහිලිවන්තයෙකු ලෙස ඇතුල් වන්නාවූ නිදහසයි'** (**පිලි 1:21-23** මේ අදහස පෙන්නුම් කරයි.)

❖ <u>**'හිරෙන් නිදහස් කරනු ලැබීම'**</u>

**පිලි 1:25 :- ......... මා ජීවත්වී, ඇදහීමෙහි <u>නුඹලාගේ දියුණුවීමද ප්‍රීතියද සඳහා නුඹලා සියල්ලන් සමග සිටින්ට යෙදන බව දනිමි</u>."**

**පිලි 2:24 :- ''<u>මටත් නොබෝ කලකින් එන්ට ලැබේය කියා ස්වාමීන්වහන්සේ තුළ විශ්වාසය ඇතුව සිටිමි</u>. ''**

ඉහත සඳහන් **පිලි 1:25** සහ **පිලි 2 :24** යන පද දෙකෙන් ඉතා පැහැදිලිව පෙනීයන්නේ, තමා හිරෙන් නිදහස් කරනු ලැබීමට යන බව පාවුල් විශ්වාස කළ බවයි.

මෙනමුත් පාවුල්තුමා මින්පසු කිසි දිනක සම්පූර්ණ නිදහස නොලැබූ බව අප දන්නේමු. එබැවින් පාවුල් රෝමයේ හිරගතව සිටි කාලය ඔහු එක්තරා ප්‍රමාණයකට මානසිකව දුක් වින්ද කාලයක් ලෙස හැඳින්වීම නිවැරදි යයි සිතමි.

එසේ ඔහු මානසිකව දුක් විඳීමට හේතු වුයේ ඔහු ආශාකල අන්දමට ශුභාරංචිය ප්‍රකාශ කිරීමට නොහැකිවීම කියා ප්‍රකාශ කිරීමද නිවැරදියැයි සිතමි.

## ❖ <u>පාවුල් ශාරීරික මරණය දෙස බැලූ අන්දම</u>

**පිලිප්පි 1:21:- ''මක්නිසාද මාගේ ජීවත්වීම නම් ක්‍රිස්තුස්වහන්සේ (උදෙසා)ය, මරණයද මට ලාභයක්ය.''**

පාවුල්ගේ මෙම වචන තෙරුම් ගැනීම උදෙසා **පිලිප්පි 1 : 20** දෙස බලමු.

**පිලි 1:20 :- ''................. මාගේ ශරීරය කරණකොටගෙන ජීවිතයෙන් වේවා, මරණයෙන් වේවා, නිතරම වාගේ දැනුත් ක්‍රිස්තුස්වහන්සේ ගෞරවයට පැමිණේයයි මාගේ තද බලාපොරොත්තුවක් ද ප්‍රාර්ථනාවක් ද ඇත්තේය.''**

**පිලි 1:20,21** කියවන අයට පෙනීයන්නේ, පාවුල්ගේ ජීවිතයේ මූලික අභිප්‍රාය වූයේ **ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ජීවත්වී, උන්වහන්සේගේ නාමය ගෞරවයට පැමිණවීම** බවයි.

එබැවින් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ජීවත් වුනු පාවුල් නිදහසේ ජීවත්වූවත් නිවාස අඩස්සියේ ජීවත්වූවත් ඔහුගේ අරමුණ වෙනස් නොවීය. ඔහුගේ මනසේ ක්‍රියා කළාවූ එකම ප්‍රශ්නය වූයේ, ක්‍රිස්තුස්වහන්සේ වෙත වඩා ගෞරවය සහ මහිමය ගෙන ඒමට අවස්ථාව තිබුණේ නිදහස් ජීවිතයක් තුළද, නැතහොත් රෝමයේ හිර කාරයෙක් ලෙසද යන ප්‍රශ්නයයි.

❖ <u>**පාවුල්ගේ නිගමනය**</u>

**පිලි 1:21-24** දක්වා පෙන්නුම් කරන්නේ, මරණය පුද්ගලිකව තමාට වඩා යහපත් වන බව පාවුල් විශ්වාස කළ නමුත්, පිලිප්පිවරුන්ගේ යහපත උදෙසා වඩා සුදුසුවූයේ ඔහු තව දුරටත් ජීවත්වීම බව ඔහු විශ්වාස කළ බවයි.

**පිලි 1:23,24 :- [23]........ මාගේ ආශාව නම් තුරන්ව ගොස් ක්‍රිස්තුස්වහන්සේ සමග විසීමටය, මක්නිසාද ඒක බොහෝ සෙයින් වඩා හොඳය. [24] නමුත් මාංසයෙහි සිටීම නුඹලා නිසා වඩා ඕනෑ කෙරේ."**

මේ වචන වලින් අප දකින්නේ, පාවුල්තුමා තමාට ප්‍රථමයෙන් අන් අය දැමීමයි. ඔහු ආශා කල දේට වඩා, පිලිප්පිවරුන්ට වඩා යහපත්වූ දේ, ඔහු විසින් තෝරා ගැනීමයි. මාගේ ප්‍රේමවන්ත දේවදරුවනි, අප සැමද සැමවිටම අප උදෙසා කුරුසියෙහි පූජාවුනාවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ජීවත් වෙමු. උන්වහන්සේගේ නාමය ගෞරවයට සහ මහිමයට පත්වන අන්දමට ජීවත් වෙමු .

**2 කොරි 5:15 :- උන්වහන්සේ සියල්ලන් වෙනුවට මැරුණේ, <u>ජීවත්වන්නන් තවත් තමුන් උදෙසා ජීවත් නොවී, ඔවුන් වෙනුවට මැරී නැවත නැගුටුණා වූ තැනන්වහන්සේ උදෙසා ජීවත් වන පිණිසය</u>..........."**

මීට අමතරව, අප අපගේම යහපත නොව, අන් අයගේ අවශ්‍යතා තේරුම් ගනිමින් ඔවුන්ගේ යහපත උදෙසා සේවයේ යෙදීමට සැලකිලිමත් වෙමු.

ඉහත සඳහන් අයුරින් අප සේවය කරන අතර, අපගේ සභාවේ තිබෙන්නාවූ සම්ප්‍රදායන්, නීතිරීති සහ විනය වැනිදේ, සමහරවිට ඔබ ආශා කරන ආකාරයට සේවය කිරීමට ඔබට ඇති නිදහස සීමා කිරීමට පුළුවන. මේවා ඔබ තුළ මානසික පීඩා ඇති කිරීමටද පුළුවන.

මාගේ ප්‍රේමවන්ත දේවදරුවනි, මෙවැනි දේවල් නිසා අධෛර්යයට පත් නොවන්න. මෙවැනි කාරණා මුල් කරගෙන, **කිසිදා ඔබගේ සභාව අත්හැර දමා, වෙන සභාවකට නොයන්න. සෑම විටම දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයමින් (දෙවියන්වහන්සේ ඔබව දැමුවාවූ) ස්ථානයේ සිටිමින් විශ්වාසවන්තව සේවයේ යෙදෙන්න.**

ඔබ යම්කිසි මානසික පීඩාවකට පැමිණෙනවාද, **එය ක්‍රිස්තුස්වහන්සේ උදෙසා දුක්විඳීමට ඔබට ලැබුනාවූ අවස්ථාවක් / වරප්‍රසාදයක් ලෙස සලකමින්, ප්‍රීතියෙන් යුක්තව මුළු හදවතින් සේවයේ යෙදෙන්න.**

**රෝම 5:4 :- "පීඩා විඳීමෙන් ඉවසිල්ලද, ඉවසිල්ලෙන් සහතිකකමද, සහතිකකමින් බලාපොරොත්තුවීමද, උපදින බව දැන <u>අප විඳින පීඩාවලදීත් ප්‍රීතිමත් වෙමු</u>. "**

## 3. <u>ක්‍රිස්තුස්වහන්සේ උදෙසා දුක්විඳීම - වරප්‍රසාදයකි - පිලි 1 :29</u>

### (a) <u>දේව දරුවන් නොහොත් කිතුනුවන් වෙත, ඔවුන් කිතුනුවන් වන නිසා පැමිණෙන පීඩා ඇත</u>

කිතුනු සභාවේ ආරම්භය සහ මුල් ඉතිහාසය සඳහන් වන්නාවූ **'ප්‍රේරිතයන්ගේ ක්‍රියා'** පොත කියවන අපදකින්නේ, මුල් කිතුනු සභාවට විවිධාකාර පීඩා සහ දුක්වලට මුහුණදීමට සිදුවූ බවයි.

(i) **පේත්‍රුස් සහ යොහන් වෙත පැමිණි පීඩා - ක්‍රියා 4:3**

**ක්‍රියා 4:3 :- " ඔවුන් පිට අත් හෙළා, සවස්වූ බැවින් පසුවදා වන තුරු හිරගෙයි තැබුවෝය."** මේ අයුරින් ප්‍රේත්‍රුස් සහ යොහන් හිරගෙදර දමනු ලැබුවේ **'යේසුස්වහන්සේගේ නාමයෙන් මව් කුස පටන් කොරව සිටි මනුෂ්‍යයෙක් සුවකිරීමේ'** වරද නිසායි.

(ii) **ස්තේපන්ව ගල් ගසා මැරීම - ක්‍රියා 7:54-60**

ස්තේපන් ගල් ගසා මරනු ලැබුවේ, ඔහු විසින් දෙවියන්වහන්සේ ගැන ඉදිරිපත් කළ කරුණු, සත්‍යයවූ නිසයි. ඔහුව නිහඬ කිරීමේ අරමුණ ඉටුකර ගැනීම උදෙසායි.

(iii) **යාකොබ් කඩුවෙන් මරණු ලැබීම - ක්‍රියා12:1,2**

**ක්‍රියා 12:1,2 :- "[1]........හෙරොද් රජ සභාවේ සමහරුන්ට පීඩා කරන්ට අත දිගුකළේය. [2] ඔහු යොහන්ගේ සහෝදරයාවූ යාකොබ් කඩුවෙන් මැරුවේය."**යාකොබ් මෙසේ කඩුවෙන් මරණු ලැබුවේ ඔහු යේසුස්වහන්සේගේ අනුගාමිකයෙක්වූ නිසායි.

(iv)**පාවුල්ට ගල්ගසා මරා දැමීමට උත්සාහ කිරීම - (ක්‍රියා 14:19)**

**ක්‍රියා 14:19 :-"නමුත් අන්තියෝකියෙන්ද ඉකෝනියෙන්ද යුදෙව්වරු ඇවිත් සමූහයන් පොළඹවාගෙන, පාවුල්ට ගල් ගසා, ඔහු නැසුණේ යයි සිතා නුවරින් පිටතට ඇද්දෝය."**

මේ අයුරින් පාවුල්ව ගල්ගසා මරා දැමීමට උත්සාහ කරනු ලැබුවේ, ඔහු ගිය සැමතැනම ඔහු නිර්භීතව ශුභාරංචිය ප්‍රකාශකළ නිසායි.

ඇත්තවශයෙන්ම ක්‍රියා පොතේ මෙවැනි සිදුවීම් සඳහන්වීම පුදුමයට කරුණක් නොවේ. අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, මේ දේ සිදුවීමට ප්‍රථමයෙන් පීඩා පැමිණෙන්ට යන බව, තම අනුගාමිකයන්ට ප්‍රකාශ කළසේක.

**මතෙව් 5:10-12 :- "[10]ධර්මිෂ්ඨකම නිසා පීඩා වින්ද තැනැත්තෝ ආශිර්වාද ලද්දෝය ; මක්නිසාද සවර්ග රාජ්‍යය ඔවුන්ගේය. [11] මනුෂ්‍යයන් මා නිසා නුඹලාට නින්දා පීඩාකොට නුඹලාට විරුද්ධව සියලු ආකාර අගුණ බොරුවෙන් කියන කල නුඹලා ආශිර්වාද ලද්දෝය. [12] ප්‍රීති වෙයල්ලා ; ඉතා සන්තෝෂ වෙයල්ලා ; මක්නිසාද සවර්ගයෙහි නුඹලාගේ විපාකය මහත්ය......."**

ප්‍රේමණීය දේවදරුව, යේසුස්වහන්සේ ප්‍රකාශ කළේ උන්වහන්සේ නිසා අප පීඩා විඳින්නේ නම් '**සවර්ගයෙහිදී අප මහත් විපාක ලබන බවයි.**

එබැවින් උන්වහන්සේ නිසා ඔබ වෙත පීඩා පැමිණෙන්නේ නම් ඒවා සතුටින් දරාගනිමින් උන්වහන්සේ උදෙසා පීඩා ලැබීමේ වරප්‍රසාදය ඔබට ලබාදීම ගැන උන්වහන්සේට ස්තුති ප්‍රශංසා පුදන්න.

**ක්‍රියා 5:40,41 :- " [40] ඔව්හු ......... ප්‍රේරිතයන් තමුන් වෙතට ගෙන්වා, ඔවුන්ට තළා, යේසුස්වහන්සේගේ නාමයෙන් කථා නොකරන්නට අණකොට යන්ට හැරියෝය.[41] එහෙයින් <u>ඔව්හු ඒ නාමය නිසා නින්දා විඳින්ට තුමූ වටින්නෝයයි. ගණන් ගනු ලැබූ බැවින් සන්තෝෂව ...............යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ</u> යයි දේශනා කිරීමෙන්ද නොනැවතුණෝය."**

ඉහත සඳහන් පද අපට විස්තර කරන්නේ, ප්‍රේරිතයන් පීඩාවලට දක්වූවාවූ ප්‍රතිචාරයයි. අපද ඔවුන්ගේ මේ ආදර්ශ අනුගමනය කරමු.

(b) **යමෙක් කිතුනුවෙක් වීම නිසා, පීඩා විඳින කල එය වරප්‍රසාදයක් වන්නේ මන්ද - පිලි 1:29**

(i) අප මේ හේතුව නිසා පීඩා විඳින අතර, අප පීඩා විඳින්නේ **'ඒ නාමය නිසා'** වන බැවිනි. (**ක්‍රියා 5:41**) තවද යේසුස්වහන්සේ අනනියස්ටද දර්ශනයකින් කථාකරමින් පාවුල් ගැන ප්‍රකාශකල වචන දේව වචනයෙහි මෙලෙස සඳහන් වේ.

**ක්‍රියා 9:16 :- " ඔහු මාගේ නාමය නිසා කොපමණ දේ විඳින්ට ඕනෑද කියා ඔහුට දක්වන්නෙමියි කී සේක."**

දෙවියන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට සියලු නාමවලට වඩා උසස් නාමය දී ඇති සේක. (**පිලි 2:9**) එබැවින් **'ඒ නාමය නිසා'** පීඩා විඳීමට ලැබීම මහත් වරප්‍රසාදයක් වේ.

(ii) අප කිතුනුවන් වීම නිසා පීඩා විඳින අතර, ඒ පීඩා විඳින්-නේ යේසුස්වහන්සේ උදෙසාය. අප මෙලෙස පීඩා විඳින්නේ, **'යේසුස්වහන්සේ වෙනුවට'** නිසයි. එදා කිතුනුවන්ට පීඩා කිරීම උදෙසා, පාවුල් දමස්කයට ගිය ගමනේ, යේසුස්වහන්සේ කී වචන වලින් මෙය පැහැදිලිව පෙනේ. උන්වහන්සේ පාවුල්ට ප්‍රකාශ කළේ **'මම වනාහි නුඹ පීඩාකරන යේසුස්ය' කියායි (ක්‍රියා 9:5).** (කරුණාකර **සෙකරියා 2:8** කියවා බලන්න)

දේවදරුව, අප දේවදරුවන් වන නිසා නොහොත් කිතුනුවන් වන නිසා, පීඩා විඳින කල, අප උන්වහන්සේ සමඟ **'සුවිශේෂ පංගුකාරකමකට ඇතුල්වන්නෙමු'** මෙය ඉමහත් වරප්‍රසාදයකි.

**1 පේත්‍රුස් 4:12,13:- " [12]ප්‍රේමවන්තයෙනි, නුඹලා සෝදිසි කිරීම පිණිස පැමිණෙන නුඹලා අතරේ තිබෙන ගිනිමය පීඩාව ගැන..... පුදුම නොවෙල්ලා [13]නුමුත් ක්‍රිස්තුස්වහන්සේ ගේ තේජසේ එළිදරව් වීමේදීත් නුඹලා ඉතා මහත් ප්‍රීතියකින් ප්‍රීතිවන පිණිස, උන්වහන්සේගේ දුක් විඳීමෙහි නුඹලා පංගුකාරයන් වන ප්‍රමාණයට ප්‍රීතිවෙයල්ලා."**

## 4. මෙම පීඩා මඟින් දෙවියන්වහන්සේ අපගේ ජීවිතවල ඉටුකරන්නාවූ දේ

(i) **අපගේ ඇදහිල්ල සෝදිසි කරමින් එය ශක්තිමත් කිරීම**

**1 පේත්‍රුස් 1 :7 :-"............... එසේද වුවත් ගින්නෙන් සෝදිසිකරන්නාවූ රනට වඩා අගේව තිබෙන නුඹලාගේ ඇදහිල්ල පරීක්ෂාකිරීමෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගේ එළිදරව්වීමෙදී ප්‍රශංසාවත් මහිමයත් ගෞරවයත් පැමිණෙන පිණිසය. "**

(කරුණාකර **ද්විතීය කථාව 8:2** කියවා බලන්න)

(ii) **ශුභාරංචි සේවයේ වැඩි දියුණුව ඇති කිරීම**

(කරුණාකර **පිලි 1:12,13** නැවත කියවා බලන්න)

(iii) **දේව දරුවන්ව දිරිමත් කිරීම**

(කරුණාකර **පිලි 1:14,28** නැවත කියවා බලන්න)

අවසාන වශයෙන්, කිතුනු නම දරන්නාවූ සියල්ලන් දුක් සහ පීඩා විඳින්නේ, **'යේසුස්වහන්සේගේ නාමය හෝ යේසුස්වහන්සේ වෙනුවට'** නොවන ඔබට මතක් කිරීමට කැමැත්තෙමි.

සමහර **'කිතුනුවන් '** විවිධ දුක්, පීඩා , ගැටළුවල හිරවී සිටින්නේ, ඔවුන් **දෙවියන්වහන්සේගේ කැමැත්තට එරෙහිව,උන්වහන්සේට අකීකරුව ජීවත්වීම නිසා විය හැක.**

**1 පේත්‍රුස් 4:15 :- '' නුඹලාගෙන් කිසිවෙක් මිනීමරන්නෙක්වත් සොරෙක්වත් නපුර කරන්නෙක්වත් අනුන්ගේ කාරණාවලටම දිවන්නෙක්වත් මෙන් දුක් නොවිඳීවා.''**


එබැවින්ම මාගේ ප්‍රිය සහෝදර සහෝදරියනි, ඔබ ප්‍රශ්නවලට මැදිවී දුක් විඳිමින් සිටින්නේ නම්, ඔබගේ ජීවිතය විමසා බලන්න. එසේ ඔබ දුක් විඳින්නේ, දෙවියන්වහන්සේට ඔබගේ කීකරුකම නිසා මිස අකීකරුකම නිසා නොවන බව තහවුරු කරගන්න.

දේවදරුවෙනි, අප සැම අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ජීවත්වෙමු. අප එසේ ජීවත්වන විට අප වෙත පැමිණෙන පීඩා, දෙවියන්වහන්සේ අපට දී ඇත්තාවූ වරප්‍රසාදයක් බව ඒත්තුගනිමින්, ඒවා තුළ ප්‍රීති වෙමු.

**මෙසේ ජීවත්වීමට, දෙව් ස්වාමීන්වහන්සේ**

**ඔබට පිහිටවන සේක්වා !!!**

# කිතුනුවකුගේ ජීවිතය සහ මරණය




## පිලිප්පි අධ්‍යයනය 05

# කිතුනුවකුගේ ජීවිතය සහ මරණය

## පිලිප්පි 1:21

**<u>හැඳින්වීම</u> :-**

සමාන්‍යයෙන් කිතුනු සභාවේ මරණය ගැන පණිවිඩයක් අපට අසන්නට ලැබෙන්නේ අපට සමීප කෙනෙකුගේ මරණයක් සිදුවූ අවස්ථාවක වේ. මෙසේ අසන පණිවිඩද බොහෝවිට ඉතා කෙටි සහ සරල ඒවාය.

මේ අතර පිලිප්පි පොතේ අධ්‍යයන මාලාවේ පස්වන අධ්‍යනය උදෙසා දේව මඟපෙන්වීම සොයමින් සිටි මගේ සිත දෙවියන්වහන්සේ යොමු කළේ **පිලිප්පි 1 : 21** වන පදය වෙතයි.

**පිලිප්පි 1:21 :- "මක්නිසාද මාගේ ජීවත්වීම නම් ක්‍රිස්තුස්වහන්සේ (උදෙසා) ය, මරණයද මට ලාභයක්ය."**

ඒ අනුව මා ඔබ ඉදිරියේ තැබීමට යන්නාවූ අධ්‍යයනයේ මාතෘකාව වන්නේ, **"කිතුනුවකුගේ ජීවිතය සහ මරණය"** යන්න වේ. මාගේ ප්‍රේමවන්ත දේව දරුවනි, මෙය හොඳ හැටි තේරුම් ගන්න. මෙලොව උපදින සෑම මනුෂ්‍යයෙකුම මරණයට පත් වන අතර සැබෑ කිතුනුවෙක් ජීවත්වන ආකාරය සහ මරණයට මුහුණදෙන ආකාරය, කිතුනු නොවන අයට වඩා බොහෝවිට බෙහෙවින් වෙනස් වේ.

එබැවින් මෙම අධ්‍යයනයට දැන් පිවිසෙන්නාවූ ඔබගෙන් මා ඉතා යටහත්ව ඉල්ලා සිටින්නේ **"සැබෑ කිතුනුවෙක් "** ලෙස ඔබගේ ජීවිතය ගතකරන්ට කියාය. එවිට **"මරණයද මට ලාභයක්ය" (පිලි 1:21)** කියා ඔබට නිශ්චිත වශයෙන්ම ප්‍රකාශකිරීමට හැකිවනු ඇත.

අපගේ බලාපොරොත්තුව සහ යාච්ඤාව වන්නේ මෙය කියවන ඔබ සැමට, ඒ අයුරින් ජීවත්වීමට දෙවි සමිඳුන් ඇදහිල්ල සහ ශක්තිය ලබාදේවි කියායි.

## අධ්‍යයනය :-

## 1. 'මනුෂ්‍යයා' යනු කවරෙක්ද කියා තේරුම් ගැනීම

මනුෂ්‍යයා කෙබඳු කෙනෙක් ද කියා තේරුම් ගැනීම උදෙසා, මනුෂ්‍යයාගේ ආරම්භය නොහොත් මනුෂ්‍යයා දෙවියන් වහන්සේ විසින් මවනු ලැබීම ගැන දේව වචනයේ සඳහන් දේ දෙස බැලීම උචිත වේ.

(i) **උත්පත්ති 1:26,27:- "[26]තවද දෙවියන්වහන්සේ : අපගේ ස්වරූපයෙන් අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා සාදම්හ........ [27] ......දෙවියන්වහන්සේ තමන් ස්වරූපයෙන් මනුෂ්‍යයා මැවූ සේක. දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් ඔහු මැවූසේක, පුරුෂයාද ස්ත්‍රියද කොට ඔවුන් මැවූසේක."**

මෙම පද දෙකේ, තමන්වහන්සේගේ **'ස්වරූපයෙන්'** මනුෂ්‍යයා මැව්ව බව තෙවතාවක්ම සඳහන් වේ. එබැවින් **'ස්වරූපය'** යන්නෙන් මෙහි අදහස්කරනු ලබන්නේ කිමෙක්ද කියා වටහා ගැනීම අතිශයින් වැදගත්වේ.

මෙහි අර්ථය දේව වචනය තුළ සොයන අපට **යොහන් 4:24** මහත් රුකුලක්වේ.

**යොහන් 4:24 :- "දෙවියන්වහන්සේ ආත්මයක්ය. උන්වහන්සේට නමස්කාරකරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමෙන්ද නමස්කාරකළ යුතුයයි කීසේක."**

දේවදරුව, මෙය මෙනෙහිකර බලන්න. දෙවියන්-වහන්සේ උන්වහන්සේගේ ස්වරූපයෙන් මැවූ මනුෂ්‍යයා ආත්මයක්ද? යන ප්‍රශ්නය මෙනෙහිකර බලන්න.

මෙම ප්‍රශ්නයට ඔබගේ පිළිතුර කුමක්ද?

මාගේ පිළිතුරනම් සැබැවින්ම මනුෂ්‍යයා ආත්මයක් වන බවයි.

(ii) **උත්පත්ති 1:26** හි වැඩි දුරටත් සඳහන් වන්නේ -
**''අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා සාදම්හ''** කියායි. මෙහි **'සමානත්වය'** යන්නෙන් අදහස්කරනු ලබන්නේ කිමෙක්ද කියා එකඟත්වයක් විචාරකයන් අතර නොමැති නමුත්, ඔවුන්ගේ එක මතයක් වන්නේ, **'සමානත්වය'** යනුවෙන් අදහස් කරනු ලබන්නේ **'ජාතිය'** යන්න බවයි. මෙම මතය නිවැරදි බව අප පිළිගන්නා අතර, ඒ අනුව මෙය කියවන ඔබ, **'දෙවියන්වහන්සේගේ ජාතියේ ආත්මයකි !!'**

දේව දරුව, ඔබගේ අගය, ඔබගේ වටිනාකම තේරුම්ගන්න. අති බලවත් දේවදූතයන් හෝ කෙරුබ්වරු හො සෙරපිම්වරු **'දෙවියන්වහන්සේගේ ජාතියේ ආත්ම'** වන බව සඳහන් නොවන අතර දේව වචනය ඔබ ගැන එසේ සඳහන් කරයි.

ඔබ කවුද කියා ඔබට වටහාගැනීමට උපකාර කිරීම උදෙසා දේව වචනයේ පද දෙකක් ඔබ ඉදිරයේ තැබීමට කැමැත්තෙමි.

**1 කොරින්ති 6:3 :- ''අපි දේවදූතයන් විනිශ්චය-කරන්නෙමුයයි නුඹලා දන්නේ නැද්ද?......''**

**හෙබ්‍රෙව් 1:14 :- ''ඔවුන් (එනම් දේවදූතයන්) සියල්ලෝ ගැළවීම උරුමකරගන්නට සිටින්නන් උදෙසා සේවයකරන පිණිස එවනු ලබන සේවක ආත්මයෝ නොවෙද්ද? ''**

මාගේ ප්‍රේමවන්ත දේවදරුවෙනි, ඉහත සඳහන් කරුණු අනුව,

**ඔබ සහ මම,**

- **මේ ලෝකයේ දෙවියන්වහන්සේගේ ක්‍රියා කිරීමට හැකියාව දෙනු ලැබුවාවූ,**

- **දෙවියන්වහන්සේගේ ජාතියට අයිති ආත්ම වන්නෙමු.**

(iii) ආත්මයක් වන්නාවූ අපගේ දෙවියන්වහන්සේ ප්‍රේම කරන සේක. **(රෝම 8:39)** (උන්වහන්සේට හැඟීම් ඇත), තීරණ ගනිමින් උන්වහන්සේගේ කැමැත්තේ මන්ත්‍රණය හැටියට සියල්ල සිද්ධකරණ සේක. **(එපීස 1:11)** මෙවැනි දේ අප දන්නෙමු.

එලෙසම දෙවියන්වහන්සේගේ ස්වරූපය ද දරන්නාවූ මනුෂ්‍යයා නැමැති ආත්මයට සිතීම, තීරණ ගැනීම වැනි දේ කළ හැක බව අප දන්නෙමු. මේ දේවල් කිරීම උදෙසා, මනුෂ්‍යයාට **'මනසක්'** ඇති අතර, තමාගේ කැමැත්ත කිරීම නොහොත් තීරණ ගැනීම, හැඟීම් ඇතිවීම, සිතීම සහ පෞරශත්වය යන්නාවූ මූලික අංශ හතර **'මනසට'** අයිතිවේ.

මේ අනුව, මනුෂ්‍යයා යනු **දෙවියන්වහන්සේගේ ජාතියේ ආත්මයක් වන අතර, මේ ආත්මයට මනසක් තිබේ.**

(iv) දෙවියන්වහන්සේ මනුෂ්‍යයාව මැව්ව ආකාරය, **උත් 2:7** හි මේ අයුරින් සඳහන්වේ.

**උත් 2:7:-"ස්වාමීවූ දෙවියන්වහන්සේ භූමියේ දූවිල්ලෙන් මනුෂ්‍යයා සාදා ඔහුගේ නාස්පුඩු තුළට ජීවනයේ හුස්ම හෙළූසේක. එවිට මනුෂ්‍යයා ජීවමාන ප්‍රාණයක් විය ."**

අප මෙහි දකින්නේ දෙවියන්වහන්සේ භූමියේ දූවිලි ගෙන "මනුෂ්‍යයාගේ **'ශරීරය'** ඇඹූ බවයි. මෙසේ උන්වහන්සේ විසින් අඹන ලද ශරීරයට **'ජීවමාන ප්‍රාණයක්'** කිරීම උදෙසා දෙවියන්වහන්සේ මනුෂ්‍ය **'ශරීරයේ** නාස් පුඩු තුළට **'ජීවනයේ හුස්ම'** හෙළූ බවයි.

ඉහත සඳහන් අයුරින්, **'ජීවමාන ප්‍රාණයක්'** ලෙස මවන ලද, මනුෂ්‍යයාට - එනම් ඔබට සහ මට,

- දූවිල්ලෙන් මවන ලද තාවකාලික කූඩාරමක් වැනි ශරීරයක් තිබේ .
- දෙවියන්වහන්සේගේ ජාතියේ සදාකාලික ආත්මයක් තිබේ.
- අපගේ ආත්මවල මනසක් තිබේ.

## 2. ආදම් කරණකොටගෙන මරණය සහ ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන ජීවනය මනුෂ්‍යයාට හිමිවීම - රෝම 5:12-20

**රෝම 5:12-20** දක්වා ඉගැන්වීම ඇතුලත්වීමට වඩාම සුදුසු ස්ථාන වන්නේ **'රෝම අධ්‍යයන මාලාවේ 09 වන අධ්‍යයනයට'** බව එම අධ්‍යයන මාලාව කියවන ඕනෑම කෙනෙකුගේ අදහස් වීම නිසැකය. එදා මට ලැබුන මඟ පෙන්වීම අනුව එහි **'හැඳින්වීමේදී'** මා විසින් සඳහන් කරනු ලැබුවේ මෙසේය.

### උපුටා ගැනීම - රෝම අධ්‍යනය 09 - හැඳින්වීම

*රෝම 5:12-20 දක්වා දේව වචනය පෙන්වා දෙන්නේ ආදම්ගේ පාපය කරණකොටගෙන සියලු මනුෂ්‍යයන් පාපයේ වරදට අසුවී මරණයට ඇතුල් වූවා සේම, යේසුස්වහන්සේගේ කීකරුකම කරණකොටගෙන බොහෝ දෙනා ධර්මිෂ්ඨ කරනු ලබන බවයි. මේ පිළිබඳ වැඩි විස්තර ඉගැන්වීමට අදහස් නොකරන අතර...........*

මේ අයුරින් මා **රෝම 5:12-20** දක්වා ඉගැන්වූ නැති බව මාගේ මතකයේ සටහන් වී නොතිබුණු බැවින්, අද උදෑසන මා **'රෝම අධ්‍යයනය 09'** අතට ගත්තේ, එහි සඳහන් **රෝම 5:12-20** දක්වා ඉගැන්වීම ඔබ ඉදිරියේ තැබීමේ අදහසිනි.

මාගේ ප්‍රේමවන්ත සහෝදර, සහෝදරියනි, මේ අයුරින් **රෝම 5:12-20** දක්වා ඇති ඉගැන්වීම් **රෝම අධ්‍යයනය 09** ඇතුලත් නොකොට , **පිලිප්පි අධ්‍යනයට 05** ට ඇතුලත් කිරීමට මඟ පෙන්වූයේ, දෙවි සමිඳුන් බව මම නිසැකවම දනිමි. එබැවින් මේ කොටස ඉගැන්වීමට මා පිවිසෙන්නේ, මට නිතරම මඟපෙන්වන්නාවූ දෙවි සමිඳුන්ට වැඳ වැටී නමස්කාර කරමිනි, ස්තුති ප්‍රශංසා පුදමිනි. නිවැරදිව දේව වචනය ඔබට ඉගැන්වීමට මට උපකාර වනමෙන් දෙවි සමිඳුන්ට යදිමිනි.

(i) **රෝම 5:12 :-" එහෙයින් එක් මනුෂ්‍යයෙකු කරණකොටගෙන පාපයත් <u>පාපය කරණකොටගෙන මරණයත් ලෝකයට ඇතුල්වුණාක් මෙන්</u>, සියලු මනුෂ්‍යයන් පව්කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණයද පැමුණුණේය."**

මෙම පදයෙන් අපට උගත හැකි දේ දෙස බලමු.

(a) **පාපය කරණකොටගෙන මරණයත් ඇතුල්වුණාක් මෙන්**

- ශාරීරික මරණය මනුෂ්‍යයා වෙත පැමිණියේ පාපයේ දඬුවම ලෙසයි.
- මේ අතර ශාරීරික මරණය, පාපය කරණකොටගෙන මනුෂ්‍යයා දෙවියන්වහන්සේගෙන් වෙන්වීම, නොහොත් ආත්මික මරණය සංකේතවත් කරයි.

(b) **'සියලු මනුෂ්‍යයන් පව් කළ බැවින්'**

මෙයින් අදහස් කරනු ලබන්නේ , ආදම්ගේ පාපය තුළින් මුළු මනුෂ්‍ය සංහතියම , පාපයට ඇතුලත් වුණු බවයි .

**රෝම 5:18,19 :- "[18] එබැවින් එක වරදක් කරණකොටගෙන දඬුවමට පත්කිරීම පිණිස විනිශ්චය සියලුම මනුෂ්‍යයන් කෙරෙහි පැමිණුනාක් මෙන්ම, ...... [19] මක්නිසාද එක මනුෂ්‍යයාගේ අකීකරුකම කරණකොටගෙන බොහෝදෙනා පව්කාරයන් කරනු ලැබුවා සේම......"**

(c) සෑම මනුෂ්‍යයෙක්ම ලොවට බිහිවන්නේ තමා තුළ **'පව්කාර ස්වභාවයක්'** සහිතව බැවින් පවින් තොර ජීවිතයක් ගතකිරීමට අපට නොහැකිවේ.

**උත්පත්ති 8: 21 :- "...... මක්නිසාද බාල වයසේ පටන් ඔහුගේ සිතේ කල්පනා නපුරුව තිබේ....."**
**ගීතාවලිය 51:5 :-" බැලුව මැනව, මම අයුතුකම සහිතව සාදනු ලැබීමි. මාගේ මෑණියෝ පාප සහිතව මා ගැබ්ගත්තාය."**

**ගීතාවලිය 58:3 :- "දුෂ්ඨයෝ මවු කුස පටන් නොමග යති. ඔවුහු උපන්තැන් පටන් බොරු කියමින් මුළාව යති."**

(ii) **රෝම 5:17-19 :- " [17]............... එක්කෙනාවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන ඊට වඩා ජීවනයෙහි රජකම් කරන්නෝය. [18]............. එක ධර්මිෂ්ඨ ක්‍රියාවක් කරණකොටගෙන ජීවනයේ ධර්මිෂ්ඨකම පිණිස දීමනාව සියලු මනුෂ්‍යයන් කෙරෙහි වූයේය. [19]......... එක්කෙනාගේ කීකරුකම කරණකොටගෙන බොහෝදෙනා ධර්මිෂ්ඨකරනු ලබන්නෝය ."**

(a) **'ඊට වඩා ජීවනයෙහි රජකම් කරන්නෝය.'**
යේසුස්වහන්සේට අපගේ ජීවිත භාරකර, දේව දරුකමට ඇතුල්වන්නාවූ අප සැම, උන්වහන්සේ සමඟ රජකම් කරන්නෙමු.

**2 තිමෝති 2:12 :- " අපි ඉවසමු නම් උන්වහන්සේ සමඟ රජකම් කරනුනෙමුව".**

**එළිදරව්ව 22:5 :- .... ඔවුහු සදාකාලේටම රජකම් කරන්නෝය."**

(b) **' දීමනාව සියලු මනුෂ්‍යයන් කෙරෙහි වූයේය'**
මෙයින් අදහස් කරනු ලබන්නේ **'ජීවනයේ ධර්මිෂ්ඨකම'** පිණිස දීමනාව, සියලු මනුෂ්‍යයන් ලබන්ට යන බව නොවේ. එය **සෑම මනුෂ්‍යයෙකුටම ලබාගත හැකි බවයි.**

එසේ ලබාගත හැකි එකම මාර්ගය වන්නේ **මෙම දීමනාව පිළිගැනීමයි**.

යහපත් ක්‍රියා කිරීමෙන් හෝ යහපත් ජීවිතයක් ගත කිරීමෙන් හෝ එය ලබාගත නොහැකිවේ. **(එපීස 2:8,9)**

(c) **'එක්කෙනාගේ කීකරුකම කරණකොටගෙන බොහෝ දෙනා ධර්මිෂ්ඨකරනු ලබන්නෝය. '**

යේසුස්වහන්සේ දෙවියන්වහන්සේට කීකරුවී අප වෙනුවෙන් **'පාප පූජාවක් '** වූ බැවින්, යේසුස්වහන්සේ පිළිගන්නාවූ සැමදෙන ධර්මිෂ්ඨ කරනු ලැබ සිටිති.

**2 කොරි 5:21 :- ''අප උන්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම වන පිණිස පාපයක් නොදත්තාවූ උන්වහන්සේ අප වෙනුවට පාපය වෙන්ට (දෙවියන්වහන්සේ) සැලැස්සු සේක.''**

ප්‍රියමිතුර, පමා නොවී යේසුස්වහන්සේ ඔබගේ ගැළවුම්-කාරයා ලෙස පිළිගෙන, දෙවියන්වහන්සේ නොමිලේ ඔබට දීමට බලා සිටින්නාවූ දීමනාව අදම ඔබගේ කරගන්න.

**3. <u>කිතුනුවකුගේ ජීවිතය</u>**

අප විසින් මෙහිදී **'කිතුනුවකු'** ලෙස විස්තර කරනු ලබන්නේ, ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම **ගැළවුම්-කාරයාණන්වහන්සේ සහ ස්වාමීන්වහන්සේ** ලෙස පිළිගත් කෙනෙකු වේ.

**පිලි 1:21:- ''මක්නිසාද මාගේ ජීවත්වීමනම් ක්‍රිස්තුස්වහන්සේ (උදෙසා)ය,…''**

පාවුල්තුමා කරන්නාවූ ප්‍රකාශනය මගින් කිතුනු ජීවිතය ගැන අපට උගතහැකි කරුණු තුනක් ඔබ ඉදිරියේ තබන්නට කැමැත්තෙමි.

(i) **<u>එම ජීවිතයේ සාරය වන්නේ ක්‍රිස්තුස්වහන්සේයි.</u>**

අප සැම දෙන සිටියේ ආත්මිකව මරණයට පත්ව අතර යේසුස්වහන්සේ අපව එයින් මුදවා අප ජීවත් කල සේක.

**එපීස 2:1 :- '' නුඹලා නුඹලාගේ වරද සහ පාප කරණකොටගෙන මැරී සිටි කල උන්වහන්සේ නුඹලා ජීවත්කළසේක.''**

උන්වහන්සේ අපට සදාකාලික ජීවනය (ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය) ලබාදී ඇති අතර, මෙම ජීවිතයේ සාරය වන්නේ ක්‍රිස්තුස්වහන්සේයි.

**යොහන් 5:24:- '' …. මාගේ වචනය අසා, මා එවූ තැනන්වහන්සේ අදහන්නාට <u>සදාකල ජීවනය තිබේ.</u>''**

**1 යොහන් 5:11,12 :- " [11] ඒ සාක්ෂිය නම් දෙවියන්වහන්සේ අපට සදාකාල ජීවනය දුන් බවය, [12] ඒ ජීවනයද තමන් පුත්‍රයාණන් තුළ තිබේ. පුත්‍රයාණන්වහන්සේ ඇත්තාට ඒ ජීවනය ඇත. <u>දෙවියන්වහන්සේගේ පුත්‍රයා නැත්තාට ඒ ජීවනය නැත.</u> "**

ප්‍රේමවන්ත දේව දරුව, **දෙවියන්වහන්සේගේ පුත්‍රයා එනම් යේසුස්වහන්සේ ඔබ තුළ වැඩවසනසේක.** උන්වහන්සේට ඔබගේ ජීවිතයේ **පාලනය භාර දෙන්න.**

අපගේ ජීවිතවල අපට නිතර ඉතා වැදගත් තීරණ ගැනීමට සිදුවන අතර, **ඒ සෑම අවස්ථාවකදීම ඔබගේ කැමැත්ත දෙවියන්වහන්සේගේ කැමැත්තට යටත් කරන්න.** එසේ කිරීම උදෙසා, ඔබ ඉදිරියේ තිබෙන ප්‍රශ්නය යේසුස්වහන්සේ ඉදිරියේ තිබුනේ නම්, උන්වහන්සේ කෙසේ ක්‍රියාකරයිද ? කියා සිතා **ඔබත් එම ක්‍රියා මාර්ගය ගැනීමට උත්සාහ කරන්න.**

(ii) **<u>එම ජීවිතය අන් අයට ආදර්ශයක්, අභියෝගයක් විය යුතුවේ</u>**

**යොහන් 8:12 :-"....... මම ලෝකයේ ආලෝකයය. <u>මා අනුව එන්නා අන්ධකාරයෙහි නොහැසිර</u> ජීවනයේ ආලෝකය ලබන්නේ යයි කීසේක."**

**පිලිප්පි 2:14 :- " වංකවූ හිතුවක්කාරවූ පරම්පරාවක් අතරේ <u>නුඹලා නිදොස්ව, අහිංසකව, දෙවියන්වහන්සේගේ නිර්දෝෂ දරුවන්ව සිටින පිණිස</u>, කෙඳිරීම්ද විවාදද නැතුව සියල්ල කරපල්ලා. "**

ඉහත සඳහන් පද දෙක තුළ දෙවියන්වහන්සේ උන්වහන්සේගේ දරුවන් වන්නාවූ අපට අනුශාසනා කරන්නේ,

- අන්ධකාරයේ නොහැසිරෙන්න කියායි.
- නිදොස් ජීවිත ගත කරන්ට කියායි.
- කෙඳිරිනොගා, විවාද නොකර ක්‍රියාකරන්න කියායි.

**පිලිප්පි 2: 15 :-"ඔවුන් අතරේ නුඹලා ජීවනයේ වචනය පාමින් ආලෝකවල් මෙන් ලෝකයෙහි දක්නා ලබන්නහුය."**

**මතෙව් 5:16 :- "මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක, ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේට ගෞරවකරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබළවා."**

දේව දරුවෙනි, අප යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීමට බොහෝසේ ලංව සිටින මේ කාලයේ, අපගේ ජීවිත අපගේ හැසිරීම, අපගේ ක්‍රියා, **ආලෝක මෙන් බැබළිය යුතුවේ.** මෙවැනි ආදර්ශමත්වූ, අන් අයට මහත් අභියෝගයක් වන්නාවූ, ජීවිත අප ගත කළ යුතු අතර **ඒ සමගම අප විසින් ඔවුන්ට ජීවනයේ වචන ප්‍රකාශකළ යුතුවේ.**

අපගේ ජීවිත අපගේ දෙවි පියාණන්වහන්සේට ගෞරවය ගෙන දිය යුතුවේ.

(iii) **එම ජීවිත ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ජීවත්වන ඒවා විය යුතුවේ.**

**2 කොරි 5:15 :- උන්වහන්සේ සියල්ලන් වෙනුවට මැරුණේ ජීවත්වන්නන් <u>තවත් තමුන් උදෙසා ජීවත් නොවී, ඔවුන් වෙනුවට මැරී නැවත නැඟුටුණාවූ තැනන්වහන්සේ උදෙසා ජීවත්වන පිණිසය</u> කියාත්, අපි නිශ්චයකොට කියමුව."**

වර්තමාන සමාජයේ අප දකින්නේ, මනුෂ්‍යයන්ගෙන් අති බහුතරයක් බොහෝසේ ආත්මාර්ථකාමිවූ ජීවිතගත කිරීමයි. මනුෂ්‍යයා තමාගේම ආශා, අරමුණු, ඉලක්ක ඉටුකර ගැනීම උදෙසා, අන් අය කෙරෙහි ඉතා අසාධාරණ අන්දමින් කටයුතු කිරීමයි. මේ අතර අපගේ ස්වාමී වූ යේසුස්වහන්සේ මෙළොවට පැමිණියේ සියලු මනුෂ්‍යයන් උදෙසා උන්වහන්සේගේ ජීවිතය පූජා කිරීමටයි.

**2 කොරි 5:15** හි දේව වචනය ප්‍රකාශකරන්නේ සැබෑ කිතුනුවන්ව උන්වහන්සේ කැඳවන්නේ, උන්වහන්සේ

උදෙසා ජීවිත්වීමට කියායි. එබැවින් අප ඉදිරියේ තිබෙන ප්‍රශ්නය වන්නේ, අප එසේ කරන්නේ කෙසේද? කියායි. දේව දරුවනි, අප යේසුස්වහන්සේ උදෙසා ජීවත් වෙමු. උන්වහන්සේගේ කැමැත්ත සහ කැඳවීම ලෙස අප සැම,

- ශුභාරංචිය ප්‍රකාශකරමු.
- උන්වහන්සේගේ සේවය උදෙසා අපගේ ශ්‍රමය, ශක්තිය තලෙන්ත, මිල මුදල් නොමසුරුව යොදවමු.
- දුගී, අසරණ අය පිළිබඳව ආදරයෙන් සහ කරුණාවෙන් ක්‍රියා කරමු.
- දුක් විඳින්නන් සනසමු.
- හැකි තරම් දුරට සැමදෙනා සමඟ සමාදානයෙන් ජීවත්වෙමු.
- යේසුස්වහන්සේගේ ආදර්ශය අනුගමනය කරමු.
- උන්වහන්සේගේ සභාව ගොඩනැගීමට උන්වහන්සේ සමග එකට උන්වහන්සේගේ දාසයන් ලෙස ක්‍රියා කරමු.

## 4. <u>කිතුනුවකුගේ මරණය</u>

**දේශනාකාරයා 12:7 :- "දුවිල්ල තිබුණු හැටියට පොළොවට හැරී යන්ටත්, <u>ආත්මය ඒක දුන් දෙවියන්වහන්සේ වෙතට හැරියන්ටත්</u> පළමුවෙන් උන්වහන්සේ සිහිකරන්න."**

මෙම පදය මනුෂ්‍යයාගේ ශාරීරික මරණය ඉතා පැහැදිලිව විස්තර කරයි. මනුෂ්‍යයාගේ මරණයෙහිදී සිදුවන්නේ, මනුෂ්‍යයාගේ ආත්මය ඔහුගේ ශරීරයෙන් වෙන්වී යෑමයි, මෙසේ දෙවියන්වහන්සේ විසින් 'දූවිල්ලෙන්' සාදන ලද මනුෂ්‍ය ශරීරය පොළොවට හැරී ගොස් දූවිලි බවට පත්වීමයි.

මෙලෙස ශරීරයෙන් වෙන්වී **දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට දුන් ආත්මය නැවත <u>උන්වහන්සේ වෙතට හැරී ගොස්, උන්වහන්සේ සමග පවතින්නේ,</u> යේසුස්වහන්සේගේ පූජාව තුළින් <u>දේව දරුකම ලැබූ අයවලුන්ගේ පමණි</u>. (යොහාන් 14:6)**

පාවුල් තුමා **පිලිප්පි 1:21** හි **'මරණයද මට ලාභයක්ය'** කියා ප්‍රකාශකරන අතර කිතුණුවෙකුගේ මරණය තුළින්, ඔහු ඇතුල්වන්නාවූ ආශිර්වාද තුනක් ඔබ ඉදිරියේ තැබීමට කැමැත්තෙමි.

(i) **කිතුනුවාට මරණය ගෙන දෙන්නේ, නිදහසයි**

**2 කොරි 5 :8 :- ''එසේය අපි ධෛර්යවත්ව, ශරීරයෙන් ඈත්ව ස්වාමීන්වහන්සේ සමඟ සිටින්ට වඩා කැමතිවෙමුව.''**

**පිලිප්පි 1:23 :- ''............. මාගේ ආශාව නම් තුරන්ව ගොස් ක්‍රිස්තුස්වහන්සේ සමඟ විසීමටය, මක්නිසාද ඒක බොහෝසෙයින් වඩා හොඳය.''**

දේව දරුවෙනි, අප සැවොම **'දෙවියන්වහන්සේගේ ජාතියේ ආත්ම'** වන අතර, මෙම ලෝකයේ අප අපගේ 'දුර්වල ශරීර කූඩුව' තුළ හිරවී සිටින්නෙමුව. පාපයෙන් පිරුණාවූ, පිරිහුනු, ලෝකයේ **'සෑම සැබෑ කිතුනුවෙකුටම'** විවිධ ආකාර පීඩා සහ දුක් විඳින්ට සිදුවේ. තවද ස්වභාවික විපත්ති මෙන්ම විවිධ රෝග තුළින් බොහෝ මානසික/ශාරීරික/ ආර්ථික ගැටළු අපට මුහුණ දෙන්ට සිදුවේ .

මේ අතර **'සදාකාලික ජීවනය '** ලබාඇත්තාවූ **'දෙවියන්වහන්සේගේ පුත්‍රයා අප තුළ වැඩවිසීම'** ලබා ඇත්තාවූ අපට, මරණය ගෙන එන්නේ මේ සෑමදෙයින් මහත් නිදහසකි.

එබැවින් කිතුනුවකුගේ මරණය, ඔහු **'බොහෝසෙයින් වඩා හොඳ'** ස්ථානයකට ඇතුල්වීමේ දොරටුවක් ලෙස සැලකීම නිවැරදී වේ.

(ii) **කිතුනුවාට මරණය ගෙන දෙන්නේ නැවත නැගිටීමේ ආශිර්වාදයයි**

කිතුනුවා මැරණායින් පසු, යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීමේදී **'තේජස් ශරීරයක් '** ලබනවා ඇත.

**පිලිප්පි 3:20,21 :- " [20] නමුත් අපේ නාගරිකත්වය සවර්ගයෙහිය, එතැනින් ගැළවුම්කාරයෙක් වන ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ එනවා අපි බලාසිටිමුව. [21] ..... උන්වහන්සේ අපේ පහත්කමේ ශරීර තමන්වහන්සේගේ තේජසේ ශරීරයට සමානවන පිණිස එවා වෙනස්කරනවා ඇත."**

දූවිල්ලෙන් සාදන ලද ශරීරයකින් මෙලොවේ වෙසෙන අප මේ ශරීරය තුළ **'කෙඳිරිගාන්නෙමුව' (රෝම 8:22,23)** මෙනමුත් අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නැවත පැමිණෙන කල, උන්වහන්සේගේ උත්ථානවූ ශරීරයට සමාන ආත්මික ශරීරයක් අප ලබන්නට යන්නෙමු.

**1 කොරි 15:51-53 :- " [51] අපි සියල්ලෝම නොසැත පෙන්නෙමුව, නුමුත් අන්තිම හොරණෑව පිඹින කල මොහොතකින්, [52] ඇසිපිය හෙළන ක්ෂණයකින්, අපි සියල්ලෝම වෙනස්කරනු ලබන්නෙමුව. මක්නිසාද හොරණෑව පිඹිනු ලබන්නේය, එකල මළාහු නොදිරන ස්වභාවෙන් යුක්තව නැගුටුවනු ලබන්නෝය, අපිද වෙනස්කරනු ලබන්නෙමුව, [53] මක්නිසාද දිරන සුලුවූ මේක නොදිරන බවට පැමිණෙන්ට ඕනෑය, මරණීයවූ මේක අමරණීය භාවයට පැමිණෙන්ට ඕනෑය."**

(කරුණාකර **රෝම 8:11; 1 තෙසලෝනික 4:16, 17** කියවා බලන්න)

(iii) **කිතුනුවාගේ මරණය ඔහුට ගෙන දෙන්නේ ප්‍රීතිමත් අනාගතයකි.**

දේවදරුව, මරණය තුළින් අප මේ ලෞකික ශරීරයෙන් නිදහස ලබා, අමරණීයවූ තේජසේ ශරීරයක් ලබා අපගේ ස්වාමීන්වහන්සේ සමඟ ජීවිතයකට ඇතුල්වීම උදෙසා පානගන්නෙමුව. උන්වහන්සේ සමඟ අප ගතකිරීමට යන්නාවූ ජීවිතය ප්‍රීතියෙන් පූර්ණ වූ එකක් වන්නේය.

**ගීතාවලිය 16:11 :-".....ඔබ අභිමුඛයෙහි ප්‍රීතියේ සම්පූර්ණකම ඇත්තේය, ඔබගේ දකුණු පැත්තෙහි සදාකාලේටම සැපත ඇත්තේය ."**

මරණයට පත්වන කිතුනුවා ඇතුල්වීමට යන්නේ ඔහුගේ පියාණන්වහන්සේ ගෘහයේ ප්‍රීතියටයි.

**යොහන් 14 : 2 :- "[2] මාගේ පියාණන්වහන්සේගේ ගෘහයෙහි බොහෝ වාසස්ථාන ඇත්තේය.... මක්නිසාද නුඹලාට ස්ථානයක් පිළියෙළකරන පිණිස යමි. [3] මම ගොස් නුඹලාට ස්ථානයක් පිළියෙළකරමිනම් මා සිටින තැන නුඹලාත් සිටින පිණිස මම නැවත ඇවිත් නුඹලා මා ළඟට ගන්නෙමි."**

කිතුනුවා ඇතුල්වන්නාවූ මෙම ප්‍රීතිමත් අනාගතයේදී අප ප්‍රේමකරන්නාවූ හිත මිතුරන්ද සමඟ අප වෙසෙන්ට යන්නෙමු.

**1 තෙසලෝනික 2: 19, 20 :- "[19] අපගේ බලාපොරොත්තුවත් ප්‍රීතියත් පාරට්ටුවේ ඔටුන්නත් කිමෙක්ද? අපගේ ස්වාමීවූ යේසුස්වහන්සේගේ ඊමේදී උන්වහන්සේ ඉදිරියෙහි නුඹලාම නොවිද? [20] එසේය, නුඹලා අපේ ගෞරවයත් අපේ ප්‍රීතියත්ය."**

**'කිතුනුවකුගේ ජීවිතය සහ මරණය'** යන මේ ඉගැන්වීම මෙතෙක් දුරට කියෙව්වාවූ මා ප්‍රිය මිතුර, මිතුරිය, ඔබ කියෙව්වාවූ මේ දේ ගැන ඔබ පැහැදිලි තීරණයක් ගැනීම අනිවාර්ය වන බව මාගේ විශ්වාසයයි.

විශේෂයෙන්ම ඔබ **'කිතුනු'** යන නම දරන්නෙක් නම්, ඔබ ඔබගෙන්ම අසා ගතයුතු ප්‍රශ්නයක් තිබේ. එය නම් ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව ඔබගේ **'ගැලවුම්කාරයාණන්වහන්සේ'** ලෙස පිළිගෙන, දේව දරුකමට ඇතුල්වී තිබෙනවාද ?යන ප්‍රශ්නයයි. නොඑසේ නම් **අදම එසේ කර,** මෙම ඉගැන්වීමේ සඳහන්,

**'3. කිතුනුවකුගේ ජීවිතය' යන කොටසේ පෙන්වාදී ඇති ආකාරයට ජීවත්වීමට කැපවන්න.**

**එසේ කිරීමට, මෙම පොත කියවන්නා වූ**
**සෑම දෙනාටම, දෙවි ස්වාමීන්වහන්සේ**
**උපකාර කරනසේක්වා !!!**

සටහන්

# සටහන්

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

# සටහන්

# ආත්මික එක්සත්කම



පිලිප්පි අධ්‍යයනය 06

# ආත්මික එක්සත්කම

## පිලිප්පි 2:1-4

**<u>හැඳින්වීම</u> :-**

අප වෙසෙන්නාවූ රට, ''ලෝක ආගම්'' හතරකට අයිති බොහෝ ජනයා ජීවත් වන්නාවූ රටකි. එම ආගම් වන්නේ බෞද්ධ, කිතුනු, ඉස්ලාම් සහ හින්දු යන ආගම් හතර වේ.

මෙම ආගම්වලට අයිති බැතිමතුන්ගේ නමස්කාරය දෙස බලන අපට පෙනෙන එක විශේෂ ලක්ෂණයක් ඔබ ඉදිරියේ තබන්නට කැමැත්තෙමි. එය නම් බෞද්ධ, ඉස්ලාම් සහ හින්දු බැතිමතුන්, කිසි චකිතයක් නැතුව, ලංකාවේ ඕනෑම ස්ථානයක පිහිටා තිබෙන්නාවූ තමන් අදහන ආගමේ ඕනෑම පන්සලකට, මුස්ලිම් පල්ලියකට හෝ කෝවිලකට ගොස් නමස්කාර කරන අතර, කිතුනුවන් එසේ කිරීමට මැලි වන බවයි. එනම් බොහෝ කිතුනුවන් තමන් නමස්කාර කරන්නාවූ **'සභාවට'** අයිති නොවන්නාවූ, නැතහොත් **'වෙනත් සභාවකට'** අයිති වන්නාවූ කිතුනු දේවස්ථානයකට ගොස් නමස්කාර කිරීමට පවා වැඩි කැමැත්තක් නොදක්වන බවයි.

මාගේ ප්‍රේමවන්ත දරුවනි, එකම දෙවියන්වහන්සේ වන **'ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේ '** අදහන්නාවූද, අපගේ එකම ගැළවුම්කාරයා වන ස්වාමීවූ **යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේ කරණකොටගෙන 'දේව දරුකම'** ලබා ඇත්තාවූද, කිතුනු අප තුළ මෙවැනි හැසිරීම් රටාවක් තිබීම ඉතා කණගාටු සහිත බව මාගේ හැඟීමයි.

ඔබ ඉදිරියේ මා දැන් තබන්නාවූ **'ආත්මික එක්සත්කම'** යන මේ අධ්‍යයනය, කිතුනු අප තුළ ඇත්තාවූ මෙම තත්ත්වය සුළු වශයෙන් හෝ වෙනස් කිරීම උදෙසා දෙවියන්වහන්සේ ඔබ තුළ වෙනසක් ඇතිකිරීම මාගේ බලාපොරොත්තුව හා පැතුමයි.

## අධ්‍යයනය :-

## 01. ආත්මික එක්සත්කමේ පදනම - පිලි 2:1

**පිලිප්පි 2:1 :- "ඉතින් ක්‍රිස්තුස්වහන්සේ තුළ යම් අස්වැසිල්ලක් ඇත්නම්, ප්‍රේමයේ යම් සැනසිල්ලක් ඇත්නම්, ආත්මයාණන්වහන්සේගේ යම් පංගුකාරකමක් ඇත්නම්, යම් ආදරයක් සහ දයාබරකමක් ඇත්නම්,......"**

බයිබලයේ සිංහල පරිවර්තනයේ මෙසේ කරුණු හතරක් අප ඉදිරියේ තබා, ඒවා **'ඇත්නම්'** යන ප්‍රශ්නය අප ඉදිරියෙහි තබා තිබෙන අතර, ග්‍රීක් අනුවාදයෙන් ඉදිරිපත් වන අදහස වන්නේ **'ඇති නිසා'** යන්නයි. එබැවින් දේව වචනය මෙම පදයෙන් අපට පෙන්වාදෙන්නේ, ඉහත සඳහන් කරුණු කිතුනුවන් අතර **'ආත්මික එක්සත්කම'** ඇතිකිරීම උදෙසා බොහෝසේ ඉවහල් වන බවයි.

(a) **'ක්‍රිස්තුස්වහන්සේ තුළ යම් ඇස්වැසිල්ලක් ඇති නිසා'**

කිතුනුවන් අතර ආත්මික එක්සත්කම තිබීම උදෙසා ඉතාමත්ම වැදගත් කරුණ වන්නේ, **'කිතුනුවා යේසුස්වහන්සේ තුළ වැඩවිසීමයි.'**

මෙය වඩා පැහැදිලිව **පිලිප්පි 2:1** හි, ඉංග්‍රිසි පරිවර්තනය අපට පෙන්වා දෙයි. **'ක්‍රිස්තුස්වහන්සේ තුළ'** යන වචන එහි සඳහන් වන්නේ "United with Christ" (NIV) කියායි.

දේව දරුවනි, මෙය තේරුම් ගන්න. **'සැබෑ කිතුනුවෙක්'** යනු **'යේසුස්වහන්සේ සමග එක්සත්'** වුනු කෙනෙකි. හෙතෙම **'යේසුස්වහන්සේ තුළ වැඩවසන කෙනෙකි'.** ඔහු තුළ **'යේසුස්වහන්සේ වැඩවසන සේක.'**

**යොහන් 15:4 :-" <u>මා තුළ පැවතෙන්න</u>, <u>මමත් නුඹලා තුළ පවතින්නෙමි.</u> ............ නුඹලා මා තුළෙහි නොපවතිවූ නම් එල දරන්ට නුඹලාට බැරිය."**

**2 කොරි 5:17 :- '' එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය......''**

**ගලාති 2:20 :-'' ......එසේවී නුමුත් මම ජීවත්වෙමි. නුමුත් තවත් මා නොව ක්‍රිස්තුස්වහන්සේ මා තුළ ජීවත්වනසේක.''**

**රෝම 8:1 :- '' එහෙයින් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ සිටින්නන්ට දැන් දඬුවමට පත්කිරීමක් නැත.''**

මාගේ ප්‍රේමණීය සහෝදර සහෝදරී, **'ක්‍රිස්තුස්වහන්සේ තුළ'** සිටින්නාවූ සැමදෙන, **'දෙවියන්වහන්සේගේ දරුවන් වන සේක'** (**යොහන් 1:12**) එබැවින් එසේ සිටින්නාවූ සැමදෙන, අපව මැව්වාවූ, අපව මුදවාගත්තාවූ **'දෙවි පියාණන්-වහන්සේගේ දරුවෝ '** වන්නෙමු.

අප සැම එකම පවුලට අයිති වන්නාවූ, එනම් දෙවියන්වහන්සේගේ පවුලට අයිති, **සහෝදර සහෝදරියන් වන්නෙමු.** මෙම පදයේ **'අස්වැසිල්ලක් '** ලෙස පරිවර්තනය කර ඇති වචනය ඉංග්‍රීසි බයිබලයේ සඳහන් කර ඇත්තේ 'Encouragement' කියායි. එහි අර්තය වන්නේ **'ධෛර්‍යය දීම'** නොහොත් **'පෙළඹවීම'** යන්නයි. එබැවින් දේවදරුවන් වන අප සැම, ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටිමින්, එකිනෙකා ධෛර්‍යමත් කරමින්, **'ක්‍රිස්තුස්වහන්සේට අප තුළ ක්‍රියා කිරීමට'** ඉඩ හරිමු.

එකම පියෙකුගේ දරුවන් ලෙස ආත්මික දේ ගැන එක්සත්කමින්ද සහයෝගයෙන්ද එකට සේවය කරමු.

(b) **'ප්‍රේමයේ යම් සැනසිල්ලක් ඇති නිසා'**

මෙම වචන ඉංග්‍රිසි පරිවර්තනයේ සඳහන් වන්නේ, 'Comfort from His Love' (NIV) කියායි. එනම් එහි අදහස් කරනු ලබන්නේ, **'යේසුස්වහන්සේගේ ප්‍රේමය කරණකොටගෙන අපට සැනසීම ඇතිනිසා'** ආත්මිකව එක්සත්කමට ඇතුල්වන්න කියායි.

මෙම කොටසේ **'සැනසිල්ලක් '** ලෙස යොදා තිබෙන්නේ 'PARAKLESIS' යන ග්‍රීක් වචනය වන අතර, මෙය ශුද්ධාත්මයාණන්වහන්සේ (PARAKLETOS) යන වචනයට ඉතා සමීප වචනයකි.

තවද **පිලිප්පි 2:1** හි 'ප්‍රේමය' කියා සඳහන් කර ඇති වචනයද, ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල සඳහන් වන **ගලාති 5:22** හි ප්‍රේමය ලෙස පරිවර්තනය කර ඇති වචනයද, ග්‍රීක් භාෂාවේ සඳහන් වන්නේ 'AGAPE ' කියායි. අප කවුරුත් හොඳහැටි අසා පුරුදු හැටියට 'AGAPE ' යනු **'පූජාවීමේ ප්‍රේමයයි'.**

මේ අනුව පාවුල්තුමා පිලිප්පියේ සභාවට අනුශාසනා කරන්නේ,
- සභාවේ සමහරවිට විවිධ අදහස් සහ මත තිබිය හැකි නමුත්, **'අගාපේ ප්‍රේමයෙන් එකිනෙකාට ප්‍රේමකරමින් '** අනෙකාට වඩාත්ම යහපත් දේ ක්‍රියාවට නංවන්න කියාය. මෙවැනි ප්‍රේමය සභාව තුළ **'ආත්මික එක්සත්කම'** ඇතිකරයි, ගොඩනගයි.

මාගේ ප්‍රේමවන්ත දේවදරුවනි, අප සැමදෙන අපගේ ජීවිතවල, **'ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල'** වර්ධනය කරගැනීම උදෙසා ක්‍රියා කරමු.

**1 යොහන් 3:16 :- "අප ප්‍රේමය දැනගන සිටින්නේ ඒතැනන්වහන්සේ තමන් ප්‍රාණය අප උදෙසා දුන් හෙයින්ය. <u>අප විසින් සහෝදරයන් උදෙසා අපේ ජීවිත දෙන්ට යුතුය</u>."**

එම ප්‍රේමය සභාව තුළ ආත්මික එක්සත්කම ඇති කරමින්, අපවද අපගේ සභාවද **'ලෝකයේ ආලෝකය' මෙන් බබලන්ට සලස්වනවා ඇත.**

**යොහන් 13:35 :- "නුඹලා එකිනෙකාට ප්‍රේමකරනවා නම්, නුඹලා මාගේ ගෝලයෝ බව එයින් සියල්ලන් දැනගන්නවා ඇතැයි කීසේක."**

(c) '<u>ආත්මයාණන්වහන්සේගේ යම් පංගුකාරකමක් ඇති නිසා</u>'

**පිලිප්පි 1:5 :- ''ශුභාරංචියේ වර්ධනය සඳහා තිබෙන, නුඹලාගේ පංගුකාරකම ගැන මාගේ දෙවියන්වහන්සේට ස්තූතිකරමි.''**

**පිලිප්පි 2:1** හි පාවුල් සඳහන් කරන්නේ, ශුද්ධාත්මයාණන්-වහන්සේ ඇති කරන්නාවූ **පංගුකාරකම නොහොත් සහභාගිකම ගැනයි.**

මාගේ ප්‍රේමවන්ත දේවදරුවනි, **පිලිප්පි 1:5** හි සහ **2:1** හි සඳහන් කරනු ලබන්නේ, සභාවක් විවිධ ආකාර **'විනෝදාත්මක අවස්ථා'** හෝ **'සංග්‍රහයක්'** මගින් ඇතිකිරීමට උත්සාහ කරන්නාවූ සහභාගීකම නොවේ. මෙහි සඳහන් කරන්නාවූ පංගුකාරකමේ උල්පත වන්නේ **ශුද්ධාත්මයාණන්වහන්සේ වන අතර, සභාවේ ආත්මික එක්සත්කම ඇතිකරන්නේ උන්වහන්සේ වනසේක.**

ප්‍රාදේශීය සභාවන් තුළද වෙනත් සභාවන් සමගද **'සංවිධානාත්මක එක්සත්කම'** ඇති කිරීම ගැන නොයෙක් සභාවන් මහත් උනන්දුවක් දක්වන නමුත්, පාවුල්තුමා මෙහි අවධානය යොමු කරන්නේ, සංවිධානාත්මක එකමුතුවීම වෙත නොව, **ආත්මික එක්වීම වෙතයි.**

ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් කරනු ලබන්නාවූ, සුවිශේෂ කාර්‍යයක් වන්නේ, **යේසුස්වහන්සේ ගැන සත්‍යය අපට උගන්වා, උන්වහන්සේව ගෞරවයට හා මහිමයට පත්කිරීමයි.**

**යොහන් 16:13,14 :- '' [13] <u>උන්වහන්සේ එනම් සැබෑකමේ ආත්මයාණන්වහන්සේ ආ කල, උන්වහන්සේ මුළු සත්‍යය කරා නුඹලාට මඟපෙන්වන සේක.</u> මක්නිසාද උන්වහන්සේ තමන්ගෙන්ම උපදවා කථා නොකර, උන්වහන්සේ අසන දේ කියා, පැමිණෙන්ට තිබෙන දේ නුඹලාට ප්‍රකාශ කරනසේක. [14] <u>උන්වහන්සේ මා ගෞරවයට පමුණුවන සේක</u>.''**

එබැවින් යේසුස්වහන්සේ ගැන සත්‍යය නොපිළිගන්නාවූ අය සහ ' **ඇදහිලිවන්තයන්** ' අතර **සැබෑ ආත්මික එක්සත්කමක් තිබිය නොහැකිවේ.**

අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ප්‍රකාශ කළාවූ, **යොහන් 14 : 6** හි සඳහන් සත්‍යය සෑම සැබෑ කිතුනුවෙක් විශ්වාස කරයි.

**යොහන් 14 : 6 :- "යේසුස්වහන්සේ ඔහුට කියන්සේක් : මාර්ගයද සැබෑවද ජීවනයද මමය. <u>මා කරණකොටගෙන මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත</u>."**

යේසුස්වහන්සේ , තමන්වහන්සේ ගැන ප්‍රකාශකල දේ, සත්‍යය බව ශුද්ධාත්මයාණන්වහන්සේ අපට උගන්වනසේක.

**මෙය නොපිළිගන්නාවූ කිසි කෙනෙක් සමඟ 'ආත්මික එකඟතාවයට' පැමිණීමට සැබෑ කිතුනුවෙකුට නොහැකි වේ.**

අප සැමදෙනාම පාහේ , ඉහත සඳහන්දේ නොපිළිගන්නාවූ 'කිතුනුවන්' මුණගැසී ඇතැයි සිතමි. මෙවැනි අය අපගේම සභාවේද, අන් සභාවලද සිටිය හැක. මොවුන් සැමදෙනා සමග දේශපාලනය ගැන, ක්‍රීඩා ගැන, අධ්‍යාපනය ගැන, සංගීතය සහ වෙනත් බොහෝ දේවල් ගැන එකඟතාවයක් සහ එක්සත්කමක් අප තුළ තිබිය හැක. **නමුත් ඔවුන් සමග 'ආත්මික එක්සත්කම' ඇතිකර ගැනීමට සැබෑ කිතුනුවෙකුට නොහැකි වේ.**

(d) **යම් ආදරයක් සහ දයාබරකමක් ඇතිනිසා**

සෑම සැබෑ කිතුනුවෙක් තුළ, අන් කිතුනුවන් වෙත ආදරයක් සහ දයාබරකමක් තිබිය යුතුවේ.

**කොලොස්සි 3 : 12 :- " එබැවින් දෙවියන්වහන්සේගේ ශුද්ධවූ ප්‍රේමවන්තවූ <u>තෝරාගත්තවුන් මෙන් දයාබර හිතක්ද ගුණවන්තකමක්ද යටත්කමද මෘදුකමද ඉවසිලිවන්තකමද පැළඳගෙන</u>,....."**

දේවදරුව, මෙවැනි ගුණාංග සැබෑ කිතුනු ජීවිතයක වර්ධනය වෙමින් තිබිය යුතුවේ. පාවුල්තුමා **පිලිප්පි 2:1** හි සඳහන් කරන්නේ පිලිප්පි සභාවේ මෙවැනි ගුණාංග පැවති බවයි.

ඔබ නමස්කාර කරන්නාවූ සභාවේ, සමාජිකයන් අතර, මෙවැනි ආදරයක් සහ දයාබරකමක් ඇතිකරන ලෙස දෙවිසමිඳුන්ට යදින්න. එලෙසම ඔබගේ ජීවිතයේ මෙම ගුණාංග ඇතිකර ගැනීමට කැපවෙමින්, එසේ කිරීමට ඔබට පිහිටවන මෙන් නිතරම යාච්ඤා කරන්න.

## 2. <u>පාවුල්තුමා පිලිප්පිවරුන්ගෙන් කරන ඉල්ලීම - පිලි 2:2-4</u>

**පිලිප්පි 2:2 :- "නුඹලා එක ප්‍රේමය ඇතුව, එකඟව සිට, එක කාරණයම අභිප්‍රායකරගෙන එක්සිත්ව සිටීමෙන්, <u>මාගේ ප්‍රීතිය සම්පූර්ණ කරපල්ලා</u>."**

පිලිප්පිවරුන්ට පාවුල්තුමා, විසින් මෙම ලිපිය ලියන ලද්දේ, රෝමයේ ඔහු 'හිර අඩස්සියේ ' හෝ 'නිවාස අඩස්සියේ ' සිටි කාලයේ බව, අප මීට ප්‍රථමයෙන් සඳහන් කළෙමු. මෙවැනි අවස්ථාවක සිටි ඔහු **'ප්‍රීතිය මුල් කරගත්තාවූ'** ලිපියක් පිලිප්පිවරුන්ට ලියුවේ, නිසැකවම ඔහු තුළ **තිබුනාවූ ප්‍රීතිය සහ එහි රහසද** බෙදාගැනීම ඔහුගේ එක් අරමුණක් වූ හෙයිනි.

මෙනමුත් '**මාගේ ප්‍රීතිය සම්පූර්ණ කරපල්ලා' (පිලි. 2:2**) යන, ඔහුගේ ඉල්ලීමෙන් අපට පෙනී යන්නේ, ඔහුගේ ප්‍රීතිය **'අසම්පූර්ණව'** තිබුණු බවයි. එනම් ඔහුගේ හදවතට '**දුක සහ වේදනාව**' ගෙනදුන් දෙයක් පිලිප්පි සභාවේ තිබුණු බවයි.

සෑම පීඩාවක් සහ වේදනාවක් යේසුස්වහන්සේ උදෙසා ඉතා සතුටින් භාර ගත්තාවූද, **'ස්වාමීන්වහන්සේ තුළ නිතරම ප්‍රීතිවෙයල්ලා' (පිලි. 4:4**) කියා පිලිප්පියේ සභාවට අනුශාසනා කළාවූද පාවුල්, මෙවැනි දෙයක් ඔවුන්ගෙන් ඉල්ලීමට හේතුව අප සැමදෙන හොඳහැටි වටහා ගැනීම ඉතා වැදගත් බව සිතමි .

පාවුල්තුමා මෙවැනි ඉල්ලීමක් පිලිප්පි සභාවෙන් ඉල්ලීමට හේතුවක් වූයේ, සභාව තුළ '**ආත්මික එක්සත්කමේ**' අඩුපාඩු තිබුණු නිසා බව **පිලිප්පි 2:2,4** තුළින් ඉතා පැහැදිලිව පෙනෙන අතර, කිතුනු සභාව තුළ තිබිය යුතු '**ආත්මික එක්සත්කමේ වැදගත්කමද**' අපට වටහා ගත හැකිවේ.

(ai) '**එක ප්‍රේමය ඇතුව** (සිටින්න)'

**යොහන් 15:12 :- "මාගේ ආඥාව නම් මා නුඹලාට ප්‍රේමකළාක්මෙන් නුඹලාත් එකිනෙකාට ප්‍රේමකරපල්ලාය යනුය."**

**රෝම 12:10 :- "සහෝදර ප්‍රේමයෙන් එකිනෙකාට ස්නේහවෙයල්ලා...."**

**ගලාති 5:13 :- "....... ප්‍රේමයෙන් එකිනෙකාට සේවය කරන්නෝ වෙයල්ලා."**

ඉහත සඳහන් පද වැනි පද බොහෝමයක් නව ගිවිසුමේ අප කියවන අතර, මෙහි සඳහන් වන්නේ '**සභාවේ සාමාජිකයන් අතර**' තිබිය යුතු ප්‍රේමය ගැනයි.

මාගේ ප්‍රේමවන්ත දේවදරුවෙනි, නිසැකව කිතුනු සභාව තුළ ප්‍රේමය තිබෙන නමුත්, එහි බොහෝ අඩුපාඩු ඇති බවත්, අප විසින් එය ගැන නිසි සැලකිල්ලක් නොදක්වන බවත් නොරහසකි.

එබැවින් මෙය කියවන ඔබ සැමගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටින්නේ, අන් අය දෙස නොව, ඔබගේම ජීවිත විමසා බලන ලෙසයි. මෙසේ අපගේම ජීවිත විමසා බලමින්, **අප සැමදෙනා, සභාවේ සහෝදර සහෝදරියන්ට ප්‍රේමයෙන් සේවය කිරීමට** උත්සාහ කරමු, කැපවෙමු.

(aii) '**එකඟව සිට, එම කාරණය අභිප්‍රාය කරගෙන** (සිටින්න)'

බයිබලයේ ඉංග්‍රිසි පරිවර්තනයේ, මෙම වචන සඳහන් වන්නේ, 'being one in spirit and purpose' (NIV) කියායි.

මෙසේ ඉංග්‍රිසි බයිබලයේ සඳහන් වචන වල අරුත වන්නේ **'එක ආත්මයෙන් සහ අරමුණෙන් එකඟව'** හෝ ඊට සමාන අරුතකි.

මා ප්‍රිය මිතුරු මිතුරියනි, **අපට ඇත්තේ එකම එක ශුද්ධාත්මයාණන්වහන්සේ කෙනෙක් පමණි. එකම දෙවියන්-වහන්සේ කෙනෙක් පමණි. එකම ගැළවුම්කාරයෙක් පමණි**. එබැවින් අප ත්‍රිඑක දෙවියන්වහන්සේට අපගේ ජීවිත භාරකොට, උන්වහන්සේගේ වචනයට කීකරුව ජීවත්වන විට, **අනිවාර්‍යයෙන්ම අප ආත්මයෙන් එකඟතාවයට පැමිණෙන්නෙමු.**

මේ අතර **'අරමුණෙන් එකඟව'** යන්නෙන් අදහස් කරනු ලබන්නේ, සෑම කිතුනුවකුගේ ජීවිතයේ ප්‍රධාන අරමුණ නොහොත් මූලික අරමුණ විය යුත්තේ, **'දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව ජීවත්වී දෙවියන්වහන්සේට ගෞරවය සහ මහිමය' ගෙන දෙන ආකාරයට ජීවත්වීම'** කියා සිතිය හැක.

එබැවින් **'ආත්මයෙන් සහ අරමුණෙන් එකඟව ' (එක්සිත්ව සිටිමින්)** යන්නෙන් අදහස් කරනු ලබන්නේ, අප සෑමදෙයකදීම එකම මතයක් දරණ, විවිධ අදහස් නොමැති කණ්ඩායමක් විය යුතු බව නොවේ. අප (නොහොත් සභාව) එකට ක්‍රියාකරමින්, එකිනෙකාට ප්‍රේමකරමින්, යේසුස්වහන්සේගේ සිත මෙන් සිතක් ඇතිව දෙවියන්-වහන්සේගේ ගෞරවය උදෙසා ජීවත්වීමයි.

**1 කොරි 10 : 31 :- ''එහෙයින් නුඹලා කතත් බොතත් වෙන යමක් කරතත්, සියල්ල දෙවියන්වහන්සේගේ ගෞරවය පිණිස කරපල්ලා.''**

දෙවියන්වහන්සේ විසින් තෝරාගෙන ඇත්තාවූ, උන්වහන්සේගේ දරුකමට පත්කරනු ලැබුවාවූ, උන්වහන්සේ උදෙසා උන්වහන්සේගේ **'තානාපතියෙක් ලෙස ජීවත්වීමට ආරාධනාව ලබා ඇත්තාවූ' (2 කොරි 5:20)** දේව දරුවනි, අප සැම උන්වහන්සේගේ ගෞරවය උදෙසා එක්සිත්ව ක්‍රියාකරමු.

(b) **පිලිප්පි 2:3 :- '' පක්ෂවාදිකමෙන්වත් නිෂ්ඵල පාරට්ටුකාරකමෙන්වත් කිසි දෙයක් නොකොට, එකිනෙකා තම තමාට වඩා වෙන කෙනෙක් උතුමැයි යටහත්කමින් සිතාවා.''**

(bi) **'පක්ෂවාදිකමෙන් ... කිසිදෙයක් නොකොට'**

අප කෙතරම් **'අපේ සභාවේ පක්ෂවාදකම්'** නොමැති බව ප්‍රකාශකළත්, බොහෝ සභාවන්වල මෙවැනි දේ පවතින බව නොරහසකි. පාවුල්තුමා පවසන්නේ මෙවැනි කිතුනුවන් **'මාංසික කිතුනුවන්'** වන බවයි.

**1 කොරින්ති 3 : 4 :- ''මක්නිසාද එක්කෙනෙක් : මම පාවුල්ගේය : වෙන කෙනෙක් : මම අපොල්ලොස්ගේ යයි කියන කල නුඹලා මාංසිකයෝ නොවෙත්ද? ''**

පාවුල් මෙවැනි අයවලුන් ගැන වැඩිදුරටත් පවසන්නේ, මොවුන් **'ආත්මික බිලිඳුන්'** වූ බවයි.

**1 කොරින්ති 3:1 :- '' සහෝදරයනි, ආත්මිකයන්ට මෙන් නුඹලාට කථාකරන්ට නොහැකිව, මාංසිකයන්ටත් ක්‍රිස්තුස්වහන්සේ තුළ බිළිඳුන්ටත් මෙන් කථා කෙළෙමි.''**

දේවදරුවනි, ඔබ නමස්කාරය කරන සභාවේ නායකයන් දෙදෙනෙකු අතර හෝ, ප්‍රමුඛ සාමාජිකයන් දෙදෙනෙක් අතර හෝ, යම්කිසි දෙයක් ගැන නොඑකඟත්වයක් ඇතිවූයේ යයි සිතන්න. මෙවැනි අවස්ථාවක සභාවේ බොහෝ දෙනෙක් කරන්නේ, තමා සමග වඩා මිතුරුකමක් ඇත්තාවූ හෝ නෑකමක් ඇත්තාවූ තැනැත්තා නිවැරදි බව ප්‍රකාශ කරමින් **'පක්ෂවාදිකමින් ක්‍රියා කරනවාද'** කියා සිතා බලන්න.

මෙවැනි අවස්ථාවක හෝ මෙයට සමාන ඕනෑම අවස්ථාවක, අප විසින් ගත හැක්කේ **එක පක්ෂයක් පමණි. එනම් අප සැමවිටම ගතයුත්තේ දෙවියන්වහන්සේගේ පක්ෂය පමණි.**

(අවුරුදු 49 කට ආසන්න කාලයක් උන්වහන්සේට සේවය කරන්නාවූ මම, සෑමවිටම උත්සාහ කරන්නේ එලෙස ක්‍රියා කිරීමටයි).

**මතෙව් 5:9 :- ''සමාදානයකරන්නෝ ආශිර්වාදලද්දෝය. මක්නිසාද ඔව්හු දෙවියන්වහන්සේගේ පුත්‍රයෝ යයි කියනු ලබන්නෝය.''**

(bii) **'නිෂ්ඵල පාරට්ටු කර ගැනීමෙන් කිසිදෙයක් නොකොට'**

දේව වචනය අපට පෙන්වාදෙන්නේ, යේසුස්වහන්සේගෙන් වෙන්ව අපට කිසිදෙයක් කල නොහැකි බවයි.

**යොහන් 15:5 ''.... මක්නිසාද මාගෙන් වෙන්ව කිසිවක් කරන්ට නුඹලාට බැරිය.''**

එබැවින් අප තුළින් දෙවියන්වහන්සේ යහපත් දේ ඉටුකරමින් සිටිත් නම්, අප විසින් පාරට්ටු කළ යුත්තේ, **උන්වහන්සේ ගැන මිස අප ගැන නොවේ.**

**ගලාති 6:14 :- ''නමුත් අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය ගැන මිස වෙන කිසි දෙයක් ගැන පාරට්ටු කරගන්ට මට සිද්ධ නොවේවා...''**

අප සැම පාවුල්තුමා පවසන්නාවූ වදන් අපගේම කරගනිමු. අපගේ දෙවිපියාණන්වහන්සේගේද , ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේද, ශුද්ධාත්මයාණන්වහන්සේගේද මහත් ක්‍රියා ගැන, ප්‍රේමය ගැන, විශ්වාසවන්තකම ගැන පාරට්ටු කිරීම මිස, අප ගැන නිෂ්ඵල පාරට්ටු කරගැනීමෙන් සම්පූර්ණයෙන්ම වලකිමු.

(biii) **'එකිනෙකා තම තමාට වඩා වෙන කෙනෙක් උතුමැයි යටහත්කමින් සිතාවා'**

**රෝම 12:10 :- ''.....ගෞරවයෙන් තම තමාට වඩා අනික් අය උතුම්කොට සලකාපල්ලා.''**

**එපීස 5:21 :- ''ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි භය ඇතුව <u>එකිනෙකාට යටත් වෙයල්ලා</u>.''**

**1 පේත්‍රුස් 5:5 :- ''....එසේය, නුඹලා සියල්ලෝම එකිනෙකාට මෙහෙකරන පිණිස <u>යටහත්කම පැළඳගනිල්ලා</u>, මක්නිසාද <u>දෙවියන්වහන්සේ</u> උඩඟු අයට විරුද්ධව සිට <u>යටහතුන්ට කරුණාව දෙනසේක</u>. ''**

ඉහත සඳහන් වචන වලින් අදහස් කරනු ලබන්නේ, අන් සැමදෙනාම ඔබට වඩා හැකියාවන් සහ දීමනා ඇති, ඔබට වඩා උසස් අය වන බව නොවේ. ඒවායින් අපට උගන්වනු ලබන්නේ, **දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපගේ හදවත්වල ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් වගුරුවා ඇති නිසා <u>අප අන් අය දෙස බැලිය යුත්තේ, ඔවුන් විශේෂ සැලකිල්ලක් ලැබීමට වටින්නාවූ අය ලෙස බවයි</u>.**

(c) **පිල්ප්පි 2:4 :- ''නුඹලා එක් එක්කෙනා තම තමාගේම කාරණා නොව අනුන්ගේ කාරණාත් බලාපල්ලා.''**

අද අප වෙසෙන්නාවූ සමාජයේ, සෑම අංශයක්මපාහේ අපට පෙනීයන්නේ, මනුෂ්‍යයන්ගෙන් බහුතරයක් ඉතා ආත්මාර්ථකාමී ලෙස ක්‍රියාකරන බවයි. බොහෝ මනුෂ්‍යයන් මෙසේ ක්‍රියාකිරීම හේතුවෙන්, අසාධාරණය, වංචාව, සොරකම, අල්ලස් සහ දූෂණ වැනි දේ අපගේ සමාජයේ වර්ධනය වෙමින් පවතියි. මෙවැනි සමාජයක ජීවත්වන්නාවූ අපව, දෙවියන්වහන්සේ කැඳවන්නේ පරාර්ථකාමී ජීවිත ගත කිරීමටයි .

**රෝම 15:2 :- ''අපෙන් එකිනෙකා තම තමාගේ අසල්වාසියාගේ වැඩිදියුණුව පිණිස යහපත සඳහා ඔහු සතුටු කෙරේවා.''**

**මතෙව් 19:19 :- ''....තමාට මෙන් තමාගේ අසල්වාසියාට ප්‍රේමකරව.....''**

යහපත් සමාරිතයාගේ උපමාවෙන්, යේසුස්වහන්සේ පෙන්වාදෙන එක වැදගත් කරුණක් වන්නේ, **අසරණව සිටින මනුෂ්‍යයන් අප සැලකිය යුත්තේ අපගේ අසල්වැසියෙක් ලෙස බවයි.**

දේවදරුව, **පිලිප්පි 2:4** හි සඳහන් අනුශාසනා පාවුල් ලබා දෙන්නේ සභාවටයි. එබැවින් ඉහත සඳහන් කරුණු එකට ගොනුකල විට, දේව වචනය අපට උගන්වන්නේ, **සභාවේ ඕනෑම කෙනෙක් අසරණ භාවයට** (ආත්මිකව, ශාරීරිකව, ආර්ථිකව, මානසිකව හෝ වෙනත් ආකාරයේ අසරණ භාවයට) **පත්වුවහොත්, අප අපම ගැන පමණක් නොසිතා, ඔහුට ප්‍රේමයෙන් උපකාර කළ යුතු බවයි.**

මාගේ ප්‍රේමවන්ත සහෝදර සහෝදරියනි, මෙම අධ්‍යයනයෙහි **' හැඳින්වීමෙහි '** මා සඳහන් කලාවූ දේ ගැන ඔබගේ අවධානය නැවත යොමුකිරීමට කැමැත්තෙමි.

එහි අප සඳහන් කළාවූ කණගාටු සහිත තත්ත්වයට, **පිලිප්පි 2:1-4** දක්වා කොටස විසඳුමක් ලබාදී ඇති බව ඔබට පෙන්වාදීමට කැමැත්තෙමි.
එහි සඳහන් ආකාරයට බොහෝ කිතුනුවන්,

- **යේසුස්වහන්සේ තුළ වෙසෙමින්,**
- **එකිනෙකාට ප්‍රේමකරමින්,**
- **ශුද්ධාත්මයාණන්වහන්සේ ගෙනදෙන්නාවූ පංගුකාරකම අත්දකිමින්**
- **ආදරය සහ දයාබරකම පැළඳ ගනිමින්,**
- **ආත්මයෙන් සහ අරමුණින් එකඟව,**
- **යටහත්ව,**
- **අසරණවුන්ට උපකාර කරමින්,**

ජීවත් වන්නේ නම්, දෙවියන්වහන්සේ **'ආත්මික එක්සත්වීමක් '** සභාව තුළ වර්ධනය කරනු ඇත. එවිට සභාවේ එක්සත්කම, එක්සිත්කම, ප්‍රේමය සහ යටහත්කම ලෝකයා දකිනු ඇත.

එම හේතුව නිසා බොහෝ දෙනා, යේසුස්වහන්සේ වෙත පැමිණෙනු ඇත.

**මෙවැනි ජීවිත ගතකිරීමට,**

**අපගේ දෙවිස්වාමීන්වහන්සේ,**

**මෙම අධ්‍යයන කියෙව්වාවූ**

**ඔබ සැමට - පිහිටවන සේක්වා !!!**

# යේසුස්වහන්සේගේ මෙන් සිතක් අප තුළ තිබීම



# පිලිප්පි අධ්‍යයනය 07

# යේසුස්වහන්සේගේ මෙන් සිතක් අප තුළ තිබීම

**පිලිප්පි 2:5-11**

**<u>හැඳින්වීම</u>:-**

පාවුල්තුමා විසින් පිලිප්පිවරුන්ට ලියන ලද ලිපිය අධ්‍යයනය කරන අපට පෙනීයන්නේ, එම සභාවේ තිබුනාවූ එක් දුර්වලකමක් වෙත පාවුල් තෙවතාවක්ම ඔවුන්ගේ අවධානය යොමුකළ බවයි. පාවුල් මෙසේ සඳහන් කරන්නාවූ දුර්වලතාවය වූයේ ඔවුන්ගේ ඇදහිල්ල ගැන හෝ, ඔවුන්ගේ දේවධර්මය පිළිබඳව තිබුනාවූ දැණුම වැනි දෙයක් නොවේ. පාවුල් තෙවතාවක්ම ඔවුන්ගේ අවධානය යොමුකරන්නේ, ඔවුන්ගේ **'හැසිරීමේ නොහොත් ක්‍රියාකිරීමේ'** ඇතිව තිබුනාවූ දුර්වලකම් වෙතටයි.

මෙම අවස්ථා තුන දෙස මොහොතකට බලමු.

(i) **පිලිප්පි 1:27 :- "මම ඇවිත් නුඹලා දක්නෙම් නුමුත්, ඈත්ව සිටින්නෙම් නුමුත්, නුඹලා <u>එකම ආත්මයෙන්</u> ස්ථිරව, <u>එක සිතකින්</u> ..... ක්‍රිස්තුස්වහන්සේගේ <u>ශුභාරංචියට ඔබින ලෙස හැසිරියල්ලා</u>."**

(ii) **පිලිප්පි 2:2-3 :- "[2]නුඹලා එක ප්‍රේමය ඇතුව, <u>එකඟව සිට</u>, ....<u>එක්සිත්ව සිටීමෙන්</u>........ [3]........ <u>පක්ෂවාදිකමෙන්වත්</u> නිෂ්ඵල පාරට්ටුකාරකමෙන්වත් <u>කිසි දෙයක් නොකොට</u>, ....."**

(iii) **පිලිප්පි 4:2 :- "ස්වාමීන්වහන්සේ තුළ <u>එක්සිත්වන මෙන් එවෝදියාගෙන් ඉල්ලමි, සින්තිකීගෙන්ද ඉල්ලමි</u>."**

ඉහතසඳහන් පද තුළින් ඉතා පැහැදිළිව පෙනීයන්නේ, පිලිප්පියේ සභාවේ **හැසිරීමේ දුර්වලකම් (පිලි 1:27), පක්ෂවාදිකම් සහ නිෂ්ඵල පාරට්ටුකරගැනීම් (පිලි 2:3), අසමගිකම් (පිලි 4:2)** සහ තවත් එවැනි දේ තිබුනු බවයි.

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, ඔබ නමස්කාර කරන්නාවූ සභාවේද, මෙවැනි දුර්වලකම් තිබෙනවාද? කියා සිතා බලන්න. මෙසේ ඔබ සොයා බැලුවොත්, එවැනි දේ ඔබගේ සභාවේ තිබෙන බවත්, එය ගැන සභාව වැඩි අවධානයක් යොමු නොකරන බවත් ඔබට පෙනෙන්ට පුළුවන. මෙනමුත් පිලිප්පි පොතේ අප දකින්නේ පාවුල්තුමා මෙවැනි දේවල් ගැන දැඩි අවධානයක් යොමුකළ බවයි. පාවුල් මෙසේ කිරීමට මූලික හේතුවක් ලෙස මා දකින්නේ, මෙවැනි දේ සභාවක් තුළ පැවතීමට තුඩුදෙන්නේ **'ඔවුන්ගේ සිත්වල තිබුනාවූ වැරදි ආකල්ප'** නිසා බවයි.

එම වැරදි ආකල්ප නම්,

- **මමත්වය**
- **උඩඟුකම**
- **යටහත්කම නොමැතිකම** (යටහත්කම දුර්වලකමක් කියා සිතීම)

**සහ තවත් එවැනි ආකල්පයි.**

පාවුල් මෙම දුර්වලකම් වලින් ජයගැනීම උදෙසා පිලිප්පි සභාවට අනුශාසනා කරන්නේ, **"ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තිබුණු සිතම නුඹලා තුළත් තිබේවා" (පිලි 2:5)** කියායි.

එසේ කිරීමට ඔබ සැමට, මේ අධ්‍යයනය උපකාරවේය යන්න, අපගේ පැතුම සහ බලාපොරොත්තුවයි.

**<u>අධ්‍යයනය</u> :-**

## <u>යේසුස්වහන්සේගේ සිත මෙන් සිතක් අප තුළ ඇතිකර ගැනීම</u>

### 1. <u>මනුෂ්‍යයාගේ සිත</u>

අපගේ සිත නොහොත් මනුෂ්‍යයාගේ සිත ගැන නව ගිවිසුමේ සඳහන් පද කිහිපයක් වෙත ඔබගේ අවධානය යොමුකිරීමට කැමැත්තෙමි .

**මතෙව් 22:37 :- "තාගේ මුළු හෘදයෙන්ද තාගේ මුළු ආත්මයෙන්ද <u>තාගේ මුළු බුද්ධියෙන්ද</u> (Mind-NIV) <u>තාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට ප්‍රේමකරව</u>."**

**රෝම 12:2 :- "නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත්වූ පිළිගත යුතුවූ සම්පූර්ණවූ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස, <u>සිත අලුත්කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා</u>."**

**2 කොරින්ති 4:4 :- "නොඇදහිලිකාරවූ ඔවුන් තුළ දෙවියන්වහන්සේගේ ස්වරූපයවූ ක්‍රිස්තුස්වහන්සේගේ තේජසේ ශුභාරංචි ආලෝකය නොබැබළෙන පිණිස, <u>මේ ලෝකයේ දෙවියා ඔවුන්ගේ සිත් අන්ධකළේය</u>."**

**එපීස 4:22,23 :- " [22]....දූෂ්‍යවන්නාවූ පරණ මනුෂ්‍යයා පහකරදමා, [22] <u>නුඹලා නුඹලාගේ චිත්තාත්මයෙන් අලුත්කරනු ලැබ</u> ,"** (made new in the attitude of your minds-NIV)

**පිලිප්පි 4:7 :- " එවිට කිසි නුවණකින් දැනගත නොහැකිවූ දෙවියන්වහන්සේගේ සමාදානය ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ <u>නුඹලාගේ සිත්ද සිතිවිලිද ආරක්ෂාකරනවා ඇත</u>."**

**කොලොස්සි 3:2 :- " පොළොවේ තිබෙන දේ නොව <u>උසස්තැන්හි තිබෙන දේම සලකාපල්ලා</u>."** (set your minds on things above - NIV)

**එළිදරව් 2:23 :- " <u>මා වනාහි අදහස්ද හෘදයන්ද විමසන තැනැත්තා බව</u>** (I am he who searches hearts and minds - NIV) **සියලු සභාවෝ දැනගන්නාහුය."**

මාගේ ප්‍රේමවන්ත සහෝදර සහෝදරියනි, ඉහත සඳහන් බයිබල් පද කියවා, ඒවා ගැන මෙනෙහි කරමින්, ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබට කථාකිරීමටද ඔබ තුළ ක්‍රියාකිරීමටද ඉඩහරින්න.

## 2. <u>යේසුස්වහන්සේගේ සිත තේරුම්ගැනීම - පිලිප්පි 2:6-8</u>

(i) **යේසුස්වහන්සේ යනු කවුද කියා හඳුනාගැනීම**

(a) **''උන්වහන්සේ දෙවියන්වහන්සේගේ රූපාකාරය දරනසේක්,'' (පිලි 2:6)**

දෙවියන්වහන්සේ ආත්මයක් වනසේක. එබැවින් උන්වහන්සේට දෘශ්‍යමානවූ රූපාකාරයක් නොමැතිවේ. එමනිසා මෙම වචනවලින් පෙන්නුම්කරනු ලබන්නේ යේසුස්වහන්සේ ඊයෙත් අදත් සදාකල්හිත් දෙවියන්වහන්සේ වන බවයි.

**රෝම 9:5 :- ''....මාංසාකාරයෙන් ක්‍රිස්තුස්වහන්සේ පැමිණුණෙත් ඔවුන්ගෙන්ය ; <u>උන්වහන්සේ සියල්ලන්ටම උතුම්වූ සදාකාල ආශිර්වාදලත් දෙවියන්වහන්සේය. ආමෙන්</u>.''**

**මතෙව් 1:22,23 :- '' [22]....උන්වහන්සේට එම්මානුවෙල් යන නාමය තබනවා ඇත. [23] ඒ <u>නාමයේ අර්ථය නම් දෙවියන්වහන්සේ අප සමගය යනුයි</u>.''**

**යොහන් 1:1 :- ''<u>පටන්ගැන්මෙහිදී වාක්‍යයාණෝ</u> සිටිසේක, වාක්‍යයාණෝ දෙවියන්වහන්සේ හා සමග සිටිසේක, <u>වාක්‍යයාණෝ දෙවියන්වහන්සේව සිටිසේක</u>.''**

**2 පේත්‍රුස් 1:1 :- ''....සීමොන් පේත්‍රුස් නම් මා විසින්, <u>අපේ දෙව්වූ ගැළවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ</u> .....''**

(b) **''දෙවියන්වහන්සේට සමානව සිටීම තමන් විසින් අල්ලාගනම සිටිය යුතුවූ වස්තුවකැයි නොසිතා, '' (පිලි 2:6)**

යේසුස්වහන්සේ දෙවියන්වහන්සේවූ බැවින්, උන්වහන්සේ දෙවියන්වහන්සේට පමණක් ප්‍රකාශ කළ හැකි දේ ප්‍රකාශ කිරීමෙන් කළේ උන්වහන්සේට කිරීමට අයිතියක් නොමැති දෙයක් කිරීම නොවේ.

එබැවින් යේසුස්වහන්සේ මෙවැනි දේ ප්‍රකාශ කළ විට යුදෙව්වරුන් උන්වහන්සේ මරන්ට සෙව්වෝය.

**යොහන් 5:18 :- "එබැවින් උන්වහන්සේ සබත් කඩකළා පමණක් නොව, දෙවියන්වහන්සේ තමන්ගේම පියාණෝයයි කියමින්, තමන් දෙවියන්වහන්සේ හා සමාන කරගත් නිසා, යුදෙව්වරු උන්වහන්සේ මරන්ට වඩ වඩා සෙවූවෝය."**

**යොහන් 10:33 :- "....අප නුඹට ගල් ගසන්නේ යහපත් ක්‍රියාවක් නිසා නොව දේව අපහාසය නිසාය ; මනුෂ්‍යයෙක්වූ නුඹ දෙවියන්වහන්සේ වෙන්ට සාදන නිසායයි කීවෝය."**

යුදෙව්වරුන් මෙසේ ක්‍රියා කළේ, යේසුස්වහන්සේ කී කළ දේ තුළින් උන්වහන්සේ දෙවියන්වහන්සේ වනබව දෙවියන්වහන්සේට සමාන යයි ප්‍රකාශ වනබව ඔවුන් තේරුම්ගත් නිසාය.

(ii) **යේසුස්වහන්සේගේ පූද්‍රමාකාර යටහත්කම සහ පරිත්‍යාගශීලීකම - පිලිප්පි 2:7,8**

(a) **"එය** (දෙවියන්වහන්සේගේ රූපාකාරය) **ඉවත්කර" (පිලි 2:7)** සිංහල පරිවර්ථනයේ 'එය ඉවත්කර ' ලෙස සඳහන් වචන, ඉංග්‍රීසි පරිවර්තනයේ සඳහන් වන්නේ,
'made himself nothing' - NIV
'emptied himself' - RSV

මෙයින් අදහස්කරනු ලබන්නේ යේසුස්වහන්සේ මෙලොව බිහිවීම උදෙසා උන්වහන්සේට තිබුනාවූ **'මහිමය'** ඉවත්කළ බවයි.

**යොහන් 17:5 :- "දැන් පියාණෙනි, ලෝකය තිබෙන්ට පළමුවෙන් ඔබ වෙත මට තිබුණු මහිමයෙන් ඔබ වෙත මා ගෞරවයට පැමිණෙවුව මැනව."**

ප්‍රිය මිතුර, අපගේ ස්වාමීන්වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, ස්වර්ගයේ සියලු සම්පත්, ගෞරවය, මහිමය, තේජස අතහැරදමා මෙළොව බිහිවූයේ, අප වෙත ඇති දෙවියන්වහන්සේගේ අසීමිත ප්‍රේමය නිසා බව කිසිදාක අමතක නොකරන්න.

## (b) **"දාසයෙකුගේ ස්වරූපය ගෙන" (පිලි 2:7)**

මෙලොව වෙසෙන්නාවූ මනුෂ්‍යයන්ගෙන් අති බහුතරයක් උත්සාහ කරන්නේ **'දාසයෙක් '** වීමට නොව **'ස්වාමියෙක් '** වීමටය. අපගේ සභාවන්වල පවා, බොහෝ දෙනෙක් උත්සාහ කරන්නේ, නොයෙක් ආකාර තිල හෝ තනතුරු ලබා, සභාවේ උසස්වන්ට හෝ යම්කිසි පිළිගැනීමක් / ගෞරවයක් ලබාගැනීමටය. මේ අතර අපගේ ස්වාමීවූ යේසුස්වහන්සේ මෙලොව බිහිවුනේ, මීට වඩා හාත්පසින්ම වෙනස්වූ ආකල්පයක් / අරමුණක් ඇතිවය.

**මාර්ක් 10:45 :- "මක්නිසාද සැබවින් <u>මනුෂ්‍ය පුත්‍රයා සේවය ලබන්ට නොව සේවය කරන්නටද</u> ...... <u>ආයේයයි කීසේක</u>."**

**ලූක් 22:27 :- "වඩා උතුම් කවුද? කෑමට හිඳින තැනැත්තාද? නොහොත් උපස්ථාන කරන්නාද? කෑමට හිඳින තැනැත්තෝ නොවේද? නුමුත් <u>මම වනාහි නුඹලා මධ්‍යයෙහි උපස්ථාන කරන්නා මෙන් වෙමි</u>."**

**යොහන් 13:5 :- "ඉන්පසු උන්වහන්සේ භාජනයට වතුර වත්කොට ගෝලයන්ගේ පාද සෝදන්ටත් තමන් ඉඟටියේ බැඳගත් රෙදිකඩින් පිසදමන්ටත් පටන්ගත්සේක."**

ඉහත සඳහන් පදවලින් අපට පෙනීයන්නේ, යේසුස්වහන්සේ **'දාසයෙකුගේ ස්වරූපය'** ගනිමින්, තමන්වහන්සේගේ ගෝලයන්ට සේවය කරමින් ඔවුන්ගේ පාද සේදීමයි. මින්පසු උන්වහන්සේ එම ගෝලයන්ට වදාල වචන දෙස දැන් බලමු.

**යොහන් 13:14,15 :- " [14]ඉඳින් ස්වාමීද ආචාර්යද වූ මම නුඹලාගේ පාද සේදීම් නම් නුඹලා විසිනුත් එකිනෙකාගේ පාද සේදිය යුතුය. [15] මක්නිසාද මා නුඹලාට කළ ලෙස නුඹලාත් කරන පිණිස නුඹලාට ආදර්ශයක් දුනිමි."**

යේසුස්වහන්සේ එදා උන්වහන්සේගේ ගෝලයන්ට පැවසූ වදන්, අද අදාල වන්නේ අපටයි. එබැවින් කිතුනු අප සැම අපට දෙවියන්වහන්සේ ලබා දෙන සැම අවස්ථාවකම, **සේවය ලබන්ට නොව සේවය කිරීමට උත්සාහ කරමු.**

(c) **''මනුෂ්‍යයන්ගේ සමානත්වයට පැමිණිසේක'' (පිලි 2:7)**

**රෝම 8:3** වන පදය මෙය අනර්ඝ ලෙස පහදා දෙයි.

**රෝම 8:3 :- '' මක්නිසාද දෙවියන්වහන්සේ <u>තමන්වහන්-සේගේම පුත්‍රයාණන් පාප-මාංසයේ සමානකමෙන්ද</u> පාපය නිසාද එවා, මාංසයේ පාපය දඬුවමට පත්කරමින්, .... ව්‍යවස්ථාවට බැරිවූ දේ ඉෂ්ටකළසේක.''**

**යොහන් 1:14 :- '' තවද වාක්‍යාණෝ මාංසවත් වී, කරුණාවෙන්ද සත්‍යයෙන්ද පූර්ණව, අප අතරෙහි වාසය කළසේක.''**

මෙසේ යේසුස්වහන්සේ මනුෂ්‍යයන්ගේ සමානත්වයට පැමිණ සැබවින්ම මනුෂ්‍යයෙක් ලෙස මෙලොව ජීවත්වුනු අතර, උන්වහන්සේ සැබවින්ම දෙවියන්වහන්සේ වූසේක.

(d) **''මනුෂ්‍යාකාරයෙන් සිටිය කලත් '' (පිලි 2:7)**

යේසුස්වහන්සේ මෙලොව ජීවත්වූයේ මනුෂ්‍යයෙක් ලෙසයි.

-උන්වහන්සේට බඩගිනිවූවා **(මතෙව් 4:2)**

-උන්වහන්සේව යක්ෂයා විසින් පරීක්ෂා කරනු ලැබුවා. **(මතෙව් 4:3)**

-උන්වහන්සේ විඩාවට පත්වුනා **(මාර්ක් 4:38)**

-උන්වහන්සේ ඇඬුවා **(යොහන් 11:35)**

-උන්වහන්සේටපිපාසය දැනුනා.**(යොහන් 19:28)**

(e) **උන්වහන්සේ යටහත්කම පැළඳගත්සේක**

සිංහල පරිවර්තනයේ මෙම වචන සඳහන් වී නොමැති නමුත්, ඉංග්‍රීසි පරිවර්තන වල එසේ සඳහන් වේ. 'he humbled himself' **(පිලි 2:8)** -NIV, RSV

- උන්වහන්සේ උපත ලැබුවේ යුදාහි පිහිටා තිබුනාවූ **'කුඩාවූ'** බෙත්ලෙහෙමෙහිය - **මීකා 5:2**
- උන්වහන්සේ ඇති දැඩි වූයේ **'කිසි යහපතක් නොමැති'** නාසරෙත් නුවරයි - **යොහන් 1:46**
- උන්වහන්සේ ඉපදුනේ 'උතුම් පවුලකට' නොවේ. **මතෙව් 13:55**
- උන්වහන්සේට නිවසක් තිබුනේ නැත - **ලූක් 9:58**

යේසුස්වහන්සේ මෙසේ යටහත්කම පැළඳගනිමින්, උන්වහන්සේගේ පුද්ගලික ආශාවන් සහ අයිතිවාසිකම් සියල්ලම අතහැරියේ, අන් අයගේ ජීවිතවලට ආශිර්වාදයක් / පිහිටක් වීම උදෙසායි.

(f) "(උන්වහන්සේ දෙවියන්වහන්සේට) **මරණය දක්වා කීකරු වූසේක." (පිලි 2:8)**

**හෙබ්‍රෙව් 5:8-10 :- " [8] උන්වහන්සේ පුත්‍රයෙක්ව සිටි නමුත්, තමන් වින්ද දේ වලින් කීකරුකම ඉගෙනගත්සේක. [9] මෙසේ උන්වහන්සේ ....[10] කීකරුවන්නාවූ සියල්ලන්ටම සදාකාල ගැළවීමේ කර්තෘ වූසේක."**

දේව දරුවෙනි, අපගේ ස්වාමීන්වහන්සේගේ කීකරුකම ආදර්ශයක් කර ගනිමින්, දෙවියන්වහන්සේට කීකරුව ජීවත්වෙමු. කෙතරම් දුෂ්කර වුවත් සෑම දෙයකදීම උන්වහන්සේට කීකරුවෙමු.

යේසුස්වහන්සේ මෙන් දෙවියන්වහන්සේට කීකරුවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමට අපගේ ජීවිතවල වඩාත්ම ප්‍රමුඛ ස්ථානය දෙමු.

**යොහන් 4:34 :- "යේසුස්වහන්සේද : මාගේ කෑම නම් මා එවූ තැනන්වහන්සේගේ කැමැත්ත කොට උන්වහන්සේගේ වැඩ ඉෂ්ටකිරීමය."**

(g) **"එසේය, කුරුසියේ මරණය දක්වා කීකරුවූසේක."(පිලි 2:8)**

**"කුරුසියේ මරණය"** තරම් කෲරවූ, වේදනාත්මකවූ, මනුෂ්‍යයෙක් අතිනිග්‍රහයට සහ ලජ්ජාවට පත්කළාවූ, හැම හුස්මක්ම ඉමහත් වේදනාව ගෙනදුන් නමුත් මරණය ඉක්මනින් නොපැමිණීම නිසා බොහෝ වේලා විඳීම ගෙනදුන්නාවූ මරණයකි .
දේව දරුව, යේසුස්වහන්සේ මේ සියල්ල වින්දේ, අපට ඇති ප්‍රේමය නිසයි.

(iii) **දෙවියන්වහන්සේ විසින් යේසුස්වහන්සේව උසස් කරනු ලැබීම - පිලි 2:9-11**

(a) **"එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස්කොට," (පිලි 2:9)**

යේසුස්වහන්සේ සැබවින්ම දෙවියන්වහන්සේ වන බැවින්, සදාකාලයෙන් සදාකාලයටම, උන්වහන්සේට දෙවියන්වහන්සේගේ තේජස හිමිව තිබෙනසේක. **පිලි 2:9** හි මෙම කොටස හඳුන්වාදෙන්නේ, දෙවියන්වහන්සේ විසින් යේසුස්වහන්සේව උන්වහන්සේ මනුෂ්‍යයෙක්ව සිටියදීම උසස් කිරීමයි.

**එපීස 1:20 :- "උන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ තුළ ඉෂ්ටකළාවූ ස්වකීය පරාක්‍රමයේ ශක්තිමත්කමේ ඒ ක්‍රියාකිරීමේ ප්‍රකාරයට ක්‍රිස්තුස්වහන්සේව මළවුන්ගෙන් නැගුටුවා,"**

මෙලොව විසූ කිසිම ආගම් කතුවරයෙක් මළවුන්ගෙන් නැගුටුවනු නොලැබූ අතර, යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගුටුනුසේක.

**ක්‍රියා 1:9 :- "උන්වහන්සේ මේ කාරණා කී කල්හි, ඔවුන් බලා සිටියදීම ඔසවාගනු ලැබ, වලාකුළකින් වැසී, ඔවුන්ට නොපෙනී ගියසේක."**

මළවුන්ගෙන් නැගුටුවනු ලැබූ යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ විසින් ස්වර්ගයට ඔසවා ගැනු ලැබූසේක.

(b) **"සියලු නාමයන්ට වඩා උසස් නාමය උන්වහන්සේට දුන්සේක." (පිලි 2:9)**

**එපීස 1:21 :- "..... මේ ලෝකයෙහි පමණක් නොව පරලෝකයෙහිත් සඳහන්කරනලද සියලු නම්වලටත් වඩා උසස්කොට ස්වර්ගීය ස්ථානවල තමන් දකුණු පැත්තෙහි හිඳුවා,"**

**ක්‍රියා 4:12:- "වෙන කිසිවෙකු තුළ ගැළවීම නැත්තේය. මක්නිසාද අපේ ගැළවීමට අවශ්‍යවූ, මනුෂ්‍යයන් අතරේ දෙනලද වෙන කිසි නාමයක් ස්වර්ගයෙන් යට නැත්තේයයි කීවේය."**

**මතෙව් 1:21 :- ''..... <u>උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න</u> ; මක්නිසාද තමන්ගේ සෙනඟ ඔවුන්ගේ පාප වලින් ගළවන්නේ උන්වහන්සේ යයි කීවේය.''**

(c) **''සියල්ලන් යේසුස් යන නාමයෙන් දණ නමන පිණිසත්,'' (පිලි 2:10)**

**එපීස 3:15 :- ''..... <u>පියාණන්වහන්සේට මම මාගේ දණ නමා</u>, ...''**

- පාවුල්තුමා **එපීස 3:15** හි සඳහන් කරන්නේ ඔහු දෙවියන්වහන්සේට දණ නමන බව වන අතර, එයින් අදහස් කරනු ලබන්නේ ගැඹුරු හැඟීම් බරව ඉමහත් ගෞරවයෙන් ඔහු දෙවියන්වහන්සේට නමස්කාර කරන බවයි.

  ඇදහිලිවන්තයන් වන්නාවූ අප සැමද, පුරුද්දක් හෝ චාරිත්‍රයක් ලෙස නොව, **'ආත්මයෙන් සහ සැබෑකමෙන් දෙවියන්වහන්සේට නමස්කාර කරමු ' (යොහන් 4:24). 'උන්වහන්සේ ස්වර්ගයෙහිද පොළොවෙහිද සියලු ගෝත්‍රවලට නම් දෙන්නාවූ පියාණන්වහන්සේ වනසේක' (එපීස 3:14,15).** <u>එබැවින් අප සැම ගැඹුරු හැඟීම්බරව ඉමහත් ගෞරවයෙන් අපගේ පියාණන් වන දෙවියන්වහන්සේ ඉදිරියේ වැඳ වැටී, ආත්මයෙන් සහ සැබෑකමෙන් උන්වහන්සේට නමස්කාර කරමු</u>.

- අද අප මෙසේ නමස්කාර කළ යුතු වන අතර, **පිලිප්පි 2:10** හි **'සියල්ලන් '** යනුවෙන් පෙන්වා දෙනු ලබන්නේ, ඇදහිලිවන්තයන් වන්නාවූ අප පමණක් නොව, උන්වහන්සේගේ සතුරන් වන්නාවූ සියලු මනුෂ්‍ය වර්ගයාද, අනාගතයේදී උන්වහන්සේ ඉදිරියේ වැඳ වැටෙන්ට යන බවය.

  ඈත අතීතයේ, වහලෙකු මෙන් ඊජිප්තුව වෙත ගෙන යනු ලැබූ යෝසෙප් ඉදිරියෙහි ඊජිප්තු ජාතිකයන්ට දණ නමන්ට සිදුකලාවූ දෙවියන්වහන්සේ, අනාගතයේ යේසුස්වහන්සේගේ සතුරන්ට උන්වහන්සේ ඉදිරියේ දණ නමන්ට සලස්වනසේක.

**උත්පත්ති 41:43 :- "…. ඔහුට තමාගේ දෙවෙනි රථයෙන් යන්ට සැලැස්විය. මිනිස්සුද : දණ නමව් කියා මොරගසමින් ඔහුට පෙරටුව ගියෝය ….."**

(d) **"එසේ කළේ, ස්වර්ගයෙහිද පොළොවෙහිද පොළොව යටද සියල්ලන් ….. දණ නමන පිණිසත්," (පිලි 2:10)**

දේව වචනය පැහැදිලිව උගන්වන්නේ, මුළු විශ්වය මවා පාලනය කරන්නාවූ දෙවියන්වහන්සේ විසින් මවන ලද්දාවූ සියළුම දේව දූතයන්ද, මනුෂ්‍යයන්ද, යක්ෂයා සහ උගේ දාසයන් සැමදෙනාද, **යේසුස් යන නාමයට දණ නමන්ට යන බවයි.**

යෙසායා අනාගතවක්තෘතුමා තුළින්, දෙවියන්වහන්සේ පැවසූ වදනක් දෙස බලමු.

**යෙසායා 45:23 :- " <u>සියලු දණහිස් මට නැමෙනවා ඇත, සියලු දිව්ද මා ගැන දිවුරනවා ඇත</u> කියා මම මා ගැනම දිවුළෙමි, අවලංගු නොවන ධර්මිෂ්ඨකමේ වචනයක් මාගේ මුඛයෙන් නික්මුනේය."**

(e) **"යේසුස්ක්‍රිස්තුස්වහන්සේ ස්වාමීන්වහන්සේ බව පියවූ දෙවියන්වහන්සේගේ ගෞරවය සඳහා සියලු දිව්වලින් ඒත්තුගන්න පිණිසත්ය." (පිලි 2:11)**

මේ පිළිබඳව **එළිදරව් 5:12,13** හි සඳහන් වචන වෙත ඔබගේ අවධානය යොමුකිරීමට කැමැත්තෙමි.

**එළිදරව් 5:11-13 :- " [11] එවිට සිංහාසනයද ….. වටකර බොහෝ දේවදූතයන් සිටිනවා දුටිමි, ඔවුන්ගේ හඬද මට ඇසුණේය ; ඔවුන්ගේ ගණන දසදහසක් වර දසදහසක් සහ දහස්වර දහස්ව තිබුණේය. [12] ඔව්හු කථාකොට: මරනු ලැබූ බැටළුපැටවාණෝ බලයත් ධනයත් ප්‍රඥාවත් පරාක්‍රමයත් ගෞරවයත් තේජසත් ප්‍රශංසාවත් ලබන්ට වටින තැනන්වහන්සේයයි මහත් හඬකින් කීවෝය. [13] තවද ස්වර්ගයෙහිත් පොළොවෙහිත් පොළොවෙන් යට සහ මුහුද පිටත් ඇත්තාවූ සියලු මැවිලි වන එහි ඇති සියල්ලෝ :**

**සිංහාසනයෙහි වැඩඉන්න තැනන්වහන්සේටත් බැටළුපැටවාණන්ටත් ප්‍රශංසාවද ගෞරවයද මහිමයද පරාක්‍රමයද සදාකාලේටම වේවයි කියනවා ඇසීමි.''**

## 3. <u>යේසුස්වහන්සේගේ සිත මෙන් සිතක් ඇතිව ජීවත්වීම</u>

මෙසේ ජීවත්වීම උදෙසා, **'හැඳින්වීමේදී'** අප සඳහන් කළ ආකාරයට, අප විසින් අපගේ **මමත්වයෙන් නිදහස්වී, උඩඟුකමෙන් ඈත්වී, යටහත්කම පැළඳ ගතයුතුවේ.**

### (a) මමත්වයෙන් නිදහස්වීම

දේව දරුවෙනි, අප වෙසෙන ලෝකයේ සියලුම ප්‍රශ්නවලට පාහේ තුඩුදුන් ප්‍රධානතම හේතුව වූයේ මමත්වයයි.

(i) සාතන් යනු දෙවියන්වහන්සේ විසින් මවන ලද්දාවූ ඉතා බලවත් දේව දූතයෙක් වූ අතර, ඔහු තුළ තිබුනාවූ **මමත්වය** නිසා, ඔහු උත්සහ කළේ දෙවියන්වහන්සේට වඩා උසස් වීමටයි. මෙහි ප්‍රතිඵලය වූයේ ඔහු දෙවියන්වහන්සේට විරුද්ධවී, උන්වහන්සේ අභිබවා යෑමට උත්සාහ කිරීමයි.

**යෙසායා 14:12-14 :- '' [12] අලුයම පුත්‍රය, නුඹ ස්වර්ගයෙන් වැටුණු හැටි! ......[13] නුඹ සිත තුළ සිතාගෙන : <u>මම</u> ස්වර්ගයට නැගී, <u>මාගේ</u> සිංහාසනය දෙවියන්- වහන්සේගේ තාරකාවලට උඩින් තබා, උතුරේ ඉතා දුර සීමාවල තිබෙන රැස්වීමේ කන්ද පිට <u>(මම)</u> හිඳගන්නෙමි. [14] <u>මම</u> වලාකුල් මුදුන් පසුකොට ඉහළ නගින්නෙමි ; මහෝත්මයාණන්ට <u>(මම)</u> සමාන වන්නෙමියි කීයෙහිය.''**

මෙම කොටසේ මා විසින් (යට ඉරි දෙකකින්) සලකුණු කර ඇති සෑම ස්ථානයකම ඉංග්‍රීසි බයිබලයේ (NIV) සඳහන් වන්නේ 'I' **නොහොත් 'මම'** කියායි. මෙම දූතයාගේ **මමත්වය** සාතන්ගේ බිහිවීමට හේතුවිය.

**යෙසායා 14:15 :- ''එහෙත් නුඹ පාතාලය නම් වළේ ගැඹුරටම බසිනවා ඇත.''**

(ii) දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේගේ ස්වරූපයෙන් සහ සමානත්වයෙන් මවන ලද මනුෂ්‍යා, ඔහුට හිමි ස්ථානය නැතිකරගත්තේ, ඔහුගේ **මමත්වය** නිසා, දෙවියන්වහන්සේට අකීකරුවී උන්වහන්සේට සමාන-වීමට දූරූ අඥාන, අකීකරු, අසාර්ථක ප්‍රයත්නය නිසයි.

**උත්පත්ති 3:5 :- ''සර්පයාද නුඹලා ඇත්තටම නසින්නේ නැත; මක්නිසාද නුඹලා එයින් කන දවසෙහි නුඹලාගේ ඇස් ඇරෙන බවත් නුඹලා යහපත හා නපුර දැනගෙන දෙවියන්වහන්සේට සමාන වන බවත් දෙවියන්වහන්සේ දන්නාසේකැයි ස්ත්‍රියට කීය.''**

දෙවියන්වහන්සේ කන්ට එපා කියා මනුෂ්‍යයාට අණකල ගසේ ගෙඩි මනුෂ්‍යයා කෑවේ, මනුෂ්‍යයාගේ මමත්වය නිසා, **'දෙවියන්වහන්සේට සමාන වීමේ '** ආශාවෙනි.

(b) **උඩඟුකමෙන් ඈත්වීම**

සාතන් බිහිවීමට හේතුවූ තවත් කරුණක් වූයේ **උඩඟුකමයි.**

**එසකියෙල් 28:17 :- ''නුඹේ රුව නිසා නුඹේ සිත උඩඟුවී තිබේ, ...... මම නුඹ පොළොවට හෙළා, .....''**

දේව දරුව, උඩඟුකම **විනාශය ගෙන දෙයි. (හිතෝ 16:18) එය ඇත්තා ස්වාමීන්වහන්සේට පිළිකුලක්ය. (හිතෝ 16:5)**

**ස්වාමීන්වහන්සේ ද්වේෂකරන එක දෙයක් වන්නේ 'උඩඟු ඇස්ය.' (හිතෝ 6:16,17) දෙවියන්වහන්සේ උඩඟු අයට විරුද්ධව සිටිනසේක. (1 පේත්‍රුස් 5:5)**
දේව දරුවෙනි, අපි උඩඟුකමින් ඈත්වෙමු.

(c) **යටහත්කම පැළඳගැනීම**

යටහත්කම පැළඳගැනීම දෙවියන්වහන්සේ බොහෝසේ ප්‍රියකරන සේක. එම ගුණාංගය **ආබ්‍රහම් (උත් 18:27), මෝසෙස් (ගණන් 12:3), අනාගතවක්තෘවරු (මීකා 6:8), යොහන් බව්තීස්ත (යොහන් 3:26-30)**, සහ බොහෝ වෙනත් බයිබල් චරිත තුළද, ඉතා සුවිශේෂ ලෙස **යේසුස්වහන්සේ තුළද අපි දකින්නෙමු.**

දේව වචනය වැඩි දුරටත් ප්‍රකාශ කරන්නේ **'දෙවියන්වහන්සේ ...... යටහතුන්ට කරුණාව දෙනසේක' කියායි. (1 පේත්‍රුස් 5:5)**

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, අප සැම **මමත්වයෙන් නිදහස්වී, උඩඟුකමෙන් ඈත්වී, යටහත්කම පැළඳගෙන,** යේසුස්වහන්සේගේ අඩිපාරේ යෑමට උත්සාහ කරමු. එසේ කිරීම උදෙසා යේසුස්වහන්සේගේ සිත මෙන් සිතක් අප තුළ ඇතිකරන මෙන් දෙවි සමිඳුන්ට නිතරම යදිමු.

**මෙසේ කිරීමට අපගේ දෙව් පියාණන්වහන්සේ**

**ඔබ සැමට පිහිටවනසේක්වා !!!**

# පාවුල්ගේ ආත්මික
# දරුවෙක් වූ තිමෝතියස්



## පිලිප්පි අධ්‍යයනය 08

# පාවුල්ගේ ආත්මික දරුවෙක්වූ තිමෝතියස්

**පිලිප්පි 2:19-24**

<u>**හැඳින්වීම**</u> :-

පාවුල්ගේ ප්‍රථම මිෂනාරි ගමනේදී, පාවුල් සහ බාර්ණබස් ලූකෝනියේ නුවරක්වූ ලුස්ත්‍රාවට ගමන් කළහ. **(ක්‍රියා 14:6,7)** මෙම කාලයේ ලුස්ත්‍රාවේ විසූ තිමෝතියස්ගේ වයස අවුරුදු 15 ක් පමණ වූ අතර, ඔහු මෙම අවස්ථාවේදි ශුභාරංචිය අසා ඇදහිල්ලට පැමිණි බව උපකල්පනය කළ හැකිවේ.

පාවුල් විසින් දෙවැනි වරට ලූස්ත්‍රාවට යනු ලැබුවේ මීට වසර හයකට පසුවවූ අතර ඒ කාලය වන විට තිමෝතියස් සහෝදරයන් අතරේ ඉතා හොඳ නාමයක් දිනාගෙන තිබුනේය.

**ක්‍රියා 16:2 :- '' ඔහු ලූස්ත්‍රාවෙහිද ඉකෝනියෙහිද සිටි සහෝදරයන් අතරේ යහපත්යයි ප්‍රසිද්ධවූ කෙනෙක්ය.''**

එබැවින් තිමෝතියස් ගැන මහත් පැහැදීමක් පාවුල්ගේ සිතේ ඇතිවීම හේතුවෙන්, ඔහු විසින් තමාගේ මිෂනාරි සේවයට එකතුවන මෙන් තිමෝතියස්ට ඇරයුම් කරන ලදී. (**ක්‍රියා 16:3**) මේ අන්දමින් පාවුල් සමඟ හවුල් සේවයේ යෙදුනාවූ තිමෝතියස්, පාවුල් සමඟ කොරින්තියේ, අතීනසයේ, අන්තියෝකියේ, පිලිප්පියේ සහ රෝමයේ සිටි බව දේව වචනයෙන් අපට පැහැදිලි වේ.

පාවුල්තුමා පිලිප්පිවරුන්ට මෙම ලිපිය ලියන විට ඔහු අවුරුදු 65 ක් පමණ වයස්ගත වී සිටි අතර, තිමෝතියස්ගේ වයස අවුරුදු 35 ක් පමණ වෙන්ට ඇත.

එබැවින් පාවුල් සහ තිමෝතියස් අතර සම්බන්ධකම වසර 20 ක පමණ කාලයක් තුල ගොඩනැගුණාවූ **'ආත්මික පියෙක් සහ පුතෙක්'** අතර සම්බන්ධකමකි.

අද අප අධ්‍යයනය කිරීමට යන්නේ, මෙම ඉතා අලංකාර සම්බන්ධකම වන අතර, එය ඔබ සැමට මහත් ආදර්ශයක් සහ අභියෝගයක් වේය, යන්න මාගේ විශ්වාසයයි.

**<u>අධ්‍යයනය</u> :-**

## 1. <u>තිමෝතියස්ගේ පසුබිම</u>

(i) ලුස්ත්‍රාවේ විසූ තිමෝතියස්, උපත ලැබුවේ මිශ්‍ර පවුලකටයි. ඔහුගේ මව ඇදහිලිවන්ත යුදෙව් ස්ත්‍රියක් වූ අතර, ඔහුගේ පියා ග්‍රීකයෙක් විය. (**ක්‍රියා 16:1,2**)

(ii) තිමෝතියස්ගේ මවගේ නම එවුනීකිද, ඔහුගේ ආච්චිගේ නම ලොයිස්ද, වූ අතර ඔවුන් දෙදෙනාම ඇදහිලිවන්තයන් වූහ. **2 තිමෝති 1:5 :- "ඒ ඇදහිල්ල පළමුකොට නුඹේ ආච්චිවූ ලොයිස් තුළද නුඹේ මෑණියන්වූ එවුනීකි තුළද වාසය කළාය.."**

(iii) මොවුන් දෙදෙනා ඇදහිලිවන්තයන් බවට පත්වුයේ පාවුල් ගේ ප්‍රථම මිෂනාරි ගමනේදීය. එබැවින් එම අවස්ථාවේදීම තිමෝතියස්ද ඇදහිල්ලට පැමිණ බව හෝ, ඉන් අනතුරුව ටික කලකට පසු තම මවගේ සහ ආච්චිගේ ආභාශයෙන් සහ ඇදහිල්ලෙන් ඔහු ඇදහිල්ලට පැමිණි බව අපට විශ්වාස කළ හැක. (**2 තිමෝති 1:5 :- "............... නුඹ තුළත් එය වාසයකරන බව විශ්වාස කරගන සිටිමි."** )

පාවුල්තුමා ප්‍රථම වරට ලුස්ත්‍රාවට පැමිණි විට, තිමෝතියස් 15 ස් හැවිරිදි ළමයෙක් විය. ඔහුගේ යුදෙව් මව සහ ආච්චි කුඩා කල සිටම දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල ඔහු තුළ ඇතිකිරීම උදෙසා ක්‍රියා කළ බව නිසැකය.

පාවුල්තුමා මේ පවුලට යේසුස් ක්‍රිස්තුස්වහන්සේව හඳුන්වා දුන් කළ, ලොයිස් සහ එවුනීකි උන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල තබා, තිමෝතියස්වද එම ඇදහිල්ලට ගෙන ඒමට ක්‍රියාකරන්නට ඇත.

මව්වරුනි පියවරුනි, ඔබගේ දරුවන්ගේ අනාගතය බොහෝසේ රැඳී තිබෙන්නේ, **ඔබගේ ඇදහිල්ල මතය. ඔබගේ ආදර්ශය මතය. දෙවියන්වහන්සේ කෙරෙහි ඔබ දක්වන්නාවූ ගෞරවය සහ කීකරුකම මතය. ඔබගේ යාච්ඤා ජීවිතය මතය.**
<u>මෙය කිසිමදාක අමතක නොකරන්න.</u>

(iv)පාවුල් දෙවැනි වරට ලුස්ත්‍රාවට පැමිණෙන විට, අවුරුදු 21 ක් පමණව සිටියාවූ තිමෝතියස්ව දේව වචනයේ සඳහන් කරන්නේ,

**-ගෝලයෙක් ලෙසයි (ක්‍රියා 16:1)**

**-යහපත්යයි ප්‍රසිද්ධ වූ කෙනෙක් ලෙසයි (ක්‍රියා 16:2)**

මේ අනුව අප දකින්නේ යේසුස්වහන්සේව අවුරුදු 15ක ලාබාල තරුණයෙක් ලෙස හඳුනාගත්තාවූ තිමෝතියස් අවුරුදු හයක් වැනි කෙටි කාලයකින් පාවුල්ගේ හවුල් මිෂනාරිවරයෙකු ලෙස සේවය කිරීමට සුදුසු දේව දාසයෙක් වීමට තරම් ආත්මිකව වර්ධනය වීමයි.

මා පෙම්බර කිතුනු තරුණ තරුණියනි, මෙය කියවන්නාවූ ඔබගෙන් වැඩිදෙනෙක් කිතුනු පවුල්වල උපත ලබා බව්තිස්ම කරනු ලැබ, කිතුනු සභාවක නමස්කාර කරන්නාවූවන් බව මම විශ්වාස කරමි.

අවුරුදු 15 සිට 20 දක්වා වයසැති අය **'තරුණ තරුණියන් '** ලෙස අප සැලකුවොත් මෙය කියවන්නාවූ 'තරුණ' ඔබ **''යේසුස්වහන්සේගේ යහපත් ගෝලයෙක් ''** ලෙස විස්තර කල හැකිද? කියා සිතා බලන්න.

අප අවංකව අපගේ සභා දෙස විමසිල්ලෙන් බැලුවොත්, අපට බොහෝවිට පෙනීයන්නේ, අපගේ සභාවල තරුණ තරුණියන්ගෙන් බොහෝ දෙනෙක් **''යේසුස්වහන්සේගේ සැබෑ ගෝලයන් ''** නොවන බවයි.

දේව දරුව, යේසුස්වහන්සේ ඔබ උදෙසා තම ජීවිතය පූජා කළේ 33 න් හැවිරිදි තරුණයෙක් ලෙසයි. ඔබ උදෙසා ජීවිතය පූජාකළ උන්වහන්සේට සේවය කිරීම උදෙසා ඔබගේ තරුණ ජීවිතය කැපකරන්න.

## 2. <u>පාවුල් සහ තිමෝතියස් අතර තිබුනාවූ ආත්මික සම්බන්ධකම</u>

දේව වචනය දෙස බලන අප දකින්නේ, පාවුල් සහ තිමෝතියස් අතර තිබුනාවූ සම්බන්ධකම තුන් ආකාරයකින් එහි සඳහන් කර ඇති බවයි. ඒවා නම්

- පියෙක් සහ දරුවෙක් ( **පිලි 2 : 22**)
- ස්වාමියෙක් සහ දාසයෙක් (**පිලි 2:19**)
- හවුල් සේවකයන් දෙදෙනෙක් (**පිලි 2 :22**)

(i) **පියෙක් සහ දරුවෙක් (පිලි 2 : 22)**

**පිලි 2 : 22 :- " ඔහු නම් <u>දරුවෙක් පියෙකුට සේවයකරන්නාක් මෙන්</u> ශුභාරංචියේ වර්ධනය සඳහා මා සමග සේවය කළේය යන ඔප්පුව නුඹලා දනිහුය."**

පාවුල් සහ තිමෝතියස් අතර තිබුනාවූ මේ පිය-දරු සම්බන්ධකම තේරුම් ගැනීම උදෙසා ඊට අදාල වන්නාවූ වෙනත් පද කිහිපයක් දෙස අවධානය යොමුකරමු.

(a)**1 තිමෝති 1 :2 :- "පාවුල් නම් මා විසින්, ඇදහිල්ලෙහි මාගේ සැබෑ දරුවාවූ තිමෝතියස්ට ලියා එවන වග නම් :-...."**

ප්‍රේමණීය සොයුර සොයුරිය, පියෙක් ඔහුගේ එක පුතෙක් ගැන '**මාගේ සැබෑ දරුවෙක්** ' ලෙස සඳහන් කරන අතර බොහෝවිට ඔහු අදහස් කරන්නේ, ' **මා වගේම දරුවෙක් නොහොත් මට සමාන දරුවෙක්** ' යන්නයි.

එබැවින් මෙම වචන පෙන්නුම් කරන්නේ, තිමෝතියස්ට තමාගේ වැනි හදවතක් / මනසක් / තිබුනු බව පාවුල් හඳුනාගෙන තිබුනු බවයි.

දේව දරුව, ඔබට ප්‍රේමකරමින් ඔබව ආත්මිකව ගොඩනගන්නාවූ ආත්මික පියෙක් / මවක් දෙවියන්වහන්සේ ඔබට ලබාදී ඇත්නම්, ඔබද ඔහුව/ ඇයව අනුගමනය කරමින් ඒ ආකාරයෙන්ම අඩුම වශයෙන් එක ආත්මික බිළිඳෙකුව හෝ ගොඩනැගීම උදෙසා ක්‍රියා කරන්න.

(b) **1 කොරින්ති 4:15-17 :- " [15] ..... මක්නිසාද ශුභාරංචිය කරණකොටගෙන ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ මම නුඹලා ජනිත කෙළෙමි. [16] එහෙයින් නුඹලා මා ආදර්ශයට ගන්නන් වන ලෙස නුඹලාගෙන් ඉල්ලමි [17] මේ පිණිස ස්වාමීන්වහන්සේ තුළ මාගේ ප්‍රියවූ විශ්වාස දරුවාවූ තිමෝතියස් නුඹලා ළඟට එවීමි..... ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇත්තාවූ මාගේ මාර්ගයන් ඔහු නුඹලාට සිහිකරවනවා ඇත."**

පාවුල් මෙම පද තුන තුළෙහි තිමෝතියස් ගැන සඳහන් කරන්නාවූ කරුණු දෙස බලමු.

- **මාගේ ප්‍රියවූ දරුවාවූ තිමෝතියස් (1 කොරි 4:17)**
- "my son Timothy whom I love" (NIV)

සිංහල පරිවර්තනයේ ' **ප්‍රියවූ** ' යන වචනය ඉංග්‍රීසි පරිවර්තනයේ සඳහන් වන්නේ "love" කියායි. මෙයින් අප දකින්නේ, පාවුල්ට '**ආත්මික දරුවන්** ' විශාල සංඛ්‍යාවක් සිටි නමුත් ඔවුන් අතරේ තිමෝතියස් ඉතා සුවිශේෂ ස්ථානයක් ගත් බවයි. තමාට වඩා වසර 30 ක් පමණ බාලවූ තිමෝතියස්ට ඔහු පියෙක් තම එකම පුතාට ප්‍රේම කරන්නාක්මෙන් **පාවුල් තිමෝතියස්ට ප්‍රේම කළ බවයි.**

- **මාගේ විශ්වාස දරුවාවූ තිමෝතියස් (1 කොරි 4:17)**

අප මෙහිද දකින්නේ, පියෙක් තමා වඩාත්ම විශ්වාසකරන පුතාට මෙන්, **තිමෝතියස් කෙරෙහි විශ්වාසය තැබූ බවයි.**

- **ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇත්තාවූ (මාගේ) මාර්ගයන් ඔහු නුඹලාට සිහිකරවනවා ඇත. (1 කොරි 4 :17)**

පාවුල් මෙහි ප්‍රකාශකරන දේ වඩාත් හොඳින් තේරුම්ගැනීම උදෙසා, ඔහු කොරින්තිවරුන්ට දෙන්නාවූ එක් උපදේශයක් දෙස බලමු. එනම් **'මා ආදර්ශයට ගන්නන් වන ලෙස නුඹලා ගෙන් ඉල්ලමි' (1 කොරි 4 : 16** හි සඳහන් උපදෙසයි).

අප **1 කොරි 4:16** සහ **17** (වන පද) එකට ගත්විට පාවුල් කොරින්තිවරුන්ට උපදෙස් දෙන්නේ, **'මාව ආදර්ශයට ගන්න. මෙසේ කිරීමට හොඳම මාර්ගය තිමෝතියස්ගේ ජීවිතය දෙස බැලීමයි'** යන්නයි. පාවුල් සහ තිමෝතියස් අතර තිබුනාවූ පිය-පුත් සම්බන්ධකම මෙයින් එමට පෙනීයයි.

(ii) **'ස්වාමියෙක් සහ ඔහු යටතේ සේවය කලාවූ සහයකයෙක්' (පිලි. 2:19)**

**පිලි. 2:19 :- " මමත් නුඹලාගේ කාරණා දැන හොඳ සැනසිල්ල ලබන පිණිස නුඹලා ළඟට තිමෝතියස් නොබෝ කලකින් එවන්ට..... බලාපොරොත්තු වෙමි."**

මෙහි අප දකින්නේ, තිමෝතියස් සැමවිටම ඔහුගේ **ආත්මික නායකයාවූ** පාවුල්ගේ ඉල්ලීම් ඉෂ්ඨ කිරීමට සූදානම්ව සිටියාවූ පාවුල්ගේ සහයකයෙක් නොහොත් ආධාරකරුවෙක් වූ බවයි.

දේව දරුවනි, සභාවක් වර්ධනය වීම උදෙසා, ආත්මික නායකයින් ඉතා වැදගත් සේවාවන් ඉටුකරන අතර, ඔවුන්ගේ නායකත්වය යටතේ ක්‍රියාකරන්නාවූ **'ආධාරකරුවන්ගේ '** සේවයද අතිශයින් වැදගත්වේ. එබැවින් නායකයා උපදෙස් සහ නායකත්වය ලබාදීම වැදගත් වන්නාක්මෙන්ම ඒවාට අවනතව විශ්වාසවන්තව සේවයේ යෙදෙන්නාවූ සහයකයන්ගේ සේවය අනිවාර්ය්‍ය වේ.

මේ අතර සභාවක් තුළ බොහෝවිට අප දකින්නාවූ ඛේදජනක සිදුවීමක් වන්නේ **' සභානායකයන් නායකත්වය ලබාගැනීමට වෙර දැරීම හේතුකොටගෙන භේද ඇතිවීමයි.**

දේව දරුවෙනි, අප සැමදෙන දෙවියන්වහන්සේ අපට පවරා ඇති සේවය හඳුනාගෙන, විශ්වාසවන්තව එම සේවයේ යෙදෙමු.

(iii) **'ශුභාරංචියේ හවුල් සේවකයන් දෙදෙනෙක් '(පිලි 2 : 22)**

**පිලි 2: 22 :-"............ ශුභාරංචියේ වර්ධනය සඳහා මා සමඟ සේවයකළේය යන ඔහුගේ ඔප්පුව නුඹලා දනීහුය. "**

මෙහි අප දකින්නේ පාවුල් තිමෝතියස්ව ඔහු සමඟ එකට සේවය කළාවූ ' **හවුල් සේවකයෙක්** ' ලෙස හඳුන්වාදීමයි.

## 3. පාවුල් තිමෝතියස් කෙරෙහි දැක්වූවාවූ ප්‍රේමය

පාවුල් තිමෝතියස්ට කෙතරම් ප්‍රේම කළාද කියා අපට පෙන්වන්නාවූ එක් සාධකයක් වන්නේ, තිමෝතියස් වෙත ඔහු විසින් ලියන ලද්දාවූ ලිපි දෙකයි. මෙම ලිපි වල ඔහු තිමෝතියස්ගේ ආත්මික වර්ධනය ගැන කෙතරම් සැලකිල්ලක් දක්වූවාද යන්න අපට පෙනේ. මේ අයුරින් ඔහු තිමෝතියස්ට එම ලිපි දෙකේ බොහෝ උපදෙස් දෙන්නේ, ඔහුගේ හදවතේ තිමෝතියස් කෙරෙහි තිබුනාවූ **ප්‍රේමය** ගෞරවය, බලාපොරොත්තුව, විශ්වාසය විදහා දක්වමිනි,

මෙම **ප්‍රේමය** පෙන්නුම් කරන්නාවූ එක් අවස්ථාවක් **2 තිමෝති** ඇසුරෙන් ඔබට ඉදිරියේ තැබීමට කැමැත්තෙමි.

**2 තිමෝති 1:2-4 :- " [2] පාවුල් නම් මා විසින්, මාගේ ප්‍රේමවන්ත දරුවා වන තිමෝතියස්ට ලියා එවන වග නම් ...... [3] මම රෑ දවල් කඩනැතුව මාගේ යාච්ඤාවලදී නුඹ සිහිකරමින්..... දෙවියන්වහන්සේට ස්තුතිකරමි. [4] එසේය, නුඹේ කඳුළු සිහිකර, නුඹ තුළ තිබෙන අවංක ඇදහිල්ල සිහියට ගෙන මම ප්‍රීතියෙන් පූර්ණවන පිණිස නුඹ දකින්ට ආශාවෙමි ."**

පාවුල් මෙහි සඳහන් කරන දේවල් 4 ක් දෙස බලමු.

(i) **'මාගේ ප්‍රේමවන්ත දරුවා'**

පාවුල් තිමෝතියස් ප්‍රකාශ කරන්නාවූ, ඔහුගේ හදවතෙන් නැගෙන්නාවූ මෙම වචන ගැන වැඩි විස්තරයක් අනවශ්‍ය බව සිතමි.

(ii) **'මම රෑ දවල් කඩනැතුව මාගේ යාච්ඤාවලදී නුඹ සිහිකරමින්,'**

දේව දරුව, ඔබගේම පවුලේ අය ගැන ඔබ මෙසේ යාච්ඤා කරන බව ඔබට අවංකව ප්‍රකාශ කිරීමට හැකිද?

නිසැකවම අප සැමදෙන අපගේ දෙමවුපියන්ට සහෝදර / සහෝදරියන්ට, ස්වාමිපුරුෂයාට/භාර්යාවට සහ දරුවන්ට අතිශයින් ප්‍රේමකරන්නෙමු. මෙසේ ඔවුන්ට ප්‍රේමකරන අප, ඔවුන් ගැන නිතරම යාච්ඤා කරන බව නිසැකය. එසේ වී නමුත්, පාවුල් මෙහි සඳහන් කරන අයුරින් අප ඔවුන් ගැන යාච්ඤාකරන බව අපගෙන් බොහෝ දෙනෙකුට අවංකව ප්‍රකාශ කිරීමට නොහැකි බව මම සිතමි.

(iii) **'නුඹේ කඳුළු සිහිකර'**

මෙහි පාවුල්තුමා සඳහන් කරන්නාවූ දේ සිදුවූයේ **1 තිමෝති 1 :4** හි සඳහන් අවස්ථාවේදී කියා සිතිය හැක.

**1 තිමෝති 1 :4 :- "………. එපීසියෙහි නැවතී සිටින්ට කියා මා මකිදෝනියට යන කල නුඹට අවවාද කළෙමි. "**

පාවුල් එපීසයේ සභාව ගොඩනැගීම උදෙසා තිමෝතියස්ව එපීසයේ නවතා මකිදෝනිය කරා ගිය අවස්ථාවේදී, එම වෙන්වීමට සිදුවීම ගැන තම හැඟීම පාලනය කිරීමට නොහැකිව තිමෝතියස් කඳුළු සැළු බව අපට සිතිය හැක.

තිමෝතියස්ට බොහෝසේ ප්‍රේම කළ පාවුල්, තිමෝතියස්ට ලියු පළමුවෙනි ලිපියේ ආරම්භයේදීම මෙය සඳහන් කිරීම තුළින් පෙනී යන්නේ, පාවුල්ට එම සිදුවීම අමතක නොකළහැකි සිදුවීමක් වූ බවයි. එයින් පෙනීයන්නේ තිමෝතියස්ට පාවුල් කෙතරම් ප්‍රේම කළාද යන්නයි.

(iv) **'මම ප්‍රීතියෙන් පූර්ණවන පිණිස <u>නුඹ දකින්ට ආසාවෙමි'</u>**
පාවුල්තුමා තිමෝතියස්ව මුණගැසීමට ආසා කළාද කියා පෙන්වීම උදෙසා තව පද දෙකක් ඔබ ඉදිරියේ තැබීමට කැමැත්තෙමි.

**2 තිමෝති 4:9 :- " මා ළඟට නොපමාව එන්ට වෑයම් කරපන්න."**

**2 තිමෝති 4 : 21:- "ශීත කාලයට පළමුවෙන් එන්ට වෑයම් කරපන්න."**

තිමෝතියස්ව දකීමට ආසාවෙන් සිටින බව **2 තිමෝති** ආරම්භයේදි සඳහන් කළ පාවුල් එම ලිපියේ කෙලවරදි දෙවතාවක්ම තිමෝතියස්ගෙන් ඉල්ලා සිටින්නේ **'නොපමාව එන්ට වෑයම් කරපන්න'** කියායි.

## 4. <u>පාවුල් තිමෝතියස්ව ප්‍රශංසා කිරීම - පිලි 2 : 22</u>

**පිලි 2 : 22 :- "....... ඔහුගේ ඔප්පුව නුඹලා දනීහුය."**
සිංහල පරිවර්තනයේ මෙලෙස සඳහන් වචන ඉංග්‍රීසි පරිවර්තනයේ සඳහන් වන්නේ -
' Timothy has proved himself ' - (NIV) ලෙසයි.

මෙම වචන වලින් අදහස්කරනු ලබන්නේ, තිමෝතියස් ඉතා සාර්ථකව, ඔහුට පැවරුණු සේවාවන්, විවිධ වගකීම්, පැමිණි සියළු අභියෝග වැනි සියල්ලම නිසිලෙස ඉටුකරමින් ඔහුගේ හැකියාවන් සහ කැපවීම , ඔප්පුකර පෙන්වා ඇති බවයි.

දේවදරුව, සැබෑ කිතුනු ජීවිතයක් ගතකිරීමේදී දෙවියන්වහන්සේ අපට පවරා ඇති කැඳවීම/වගකීම කුමක් වුවත් ඒවා නිසිලෙස ඉටුකරමින්, **අපගේ කැඳවීමට ඔබින ලෙස හැසිරීම/ජීවත්වීම** අප විසින් කළ යුතුවේ. අප සැම තිමෝතියස් මෙන් මෙසේ කරමින් **' අපගේ ඔප්පුව'** අන් සැම ඒත්තු ගන්නා අන්දමට ජීවත්වෙමු.'

තිමෝතියස්ගේ ජීවිතයේ පාවුල්ගේ ප්‍රශංසාවට ලක්වන්නාවූ ගුණාංග කිහිපයක් දෙස බලමු .

(i) **<u>තිමෝතියස්ගේ විශ්වාසවන්තකම - පිලි 2 : 20</u>**

**පිලි 2:20 :- " මක්නිසාද නුඹලාගේ කාරණ ගැන ඔහු වාගේ සැබෑලෙස සලකන්නාවූ වෙන කෙනෙක් මට නැත."**

පාවුල් මෙහි පිලිප්පිවරුන්ට ප්‍රකාශ කරන්නේ, තිමෝතියස් මෙන් පිලිප්පිවරුන්ගේ අවශ්‍යතාවයන් ගැන දන්නාවූ ඒවා ගැන සැබෑලෙස ක්‍රියා කරන්නාවූ, වෙන කෙනක් පාවුල් නොදන්නා බවයි. එනම් ඔහු දන්නා අය අතුරින්, පිලිප්පිය වෙත එවන්නට **වඩාත්ම සුදුසු, වඩාත්ම විශ්වාසවන්තවූ** තැනැත්තා වන්නේ තිමෝතියස් බවයි.

**1 කොරින්ති 4: 1,2 :- " [1] මනුෂ්‍යයෝ අප ක්‍රිස්තුස්වහන්සේගේ සේවකයන් මෙන්ද දෙවියන්වහන්සේගේ රහස්වල ගබඩාකාරයන් මෙන්ද ගණන් ගනිත්වා [2] ඇරත් මෙහිදී ගබඩාකාරයන්ගෙන් ඕනෑ කරන්නේ <u>එක එක මනුෂ්‍යයා විශ්වාසව සිටීමය</u>."**

**මතෙව් 25:21 :- " ඔහුගේ ස්වාමියා ඔහුට කථාකොට යහපත් වූ <u>විශ්වාසවූ දාසය</u>, ඒ යහපත, ස්වල්ප දේ ගැන නුඹ විශ්වාසවුවෙහිය, <u>බොහෝ දේ කෙරෙහි නුඹ අධිපති කරමි.</u>"** දේව දරුවනි, අප සැම විශ්වාසවන්තව දෙවියන්වහන්සේ අපට පවරන්නාවූ දේවල් ඉටුකරමු.

(ii) **<u>තිමෝතියස්ගේ අවංකකම - පිලි 2 : 20</u>**

**පිලි 2 : 20 :- "..... ඔහු වාගේ සැබෑලෙස සලකන්නාවූ...."** මෙම වචන අපගේ වචනවලින් කියන්නේ නම්, **'හොර බොරු වංචාව නැති අවංක කෙනෙක්'** ලෙස සැලකීම නිවැරදි යයි සිතමි. දේව දරුවෙනි, අප සැමද සැමවිටම, හොර බොරු වංචාව නැතිව, **කථාකරමු/ ක්‍රියාකරමු.**

(iii) **<u>තිමෝතියස් ක්‍රිස්තුස්වහන්සේගේ කාරණාවලට මුල් තැන දීම පිලි 2 : 21</u>**

**පිලි 2 : 21:- "මක්නිසාද සියල්ලෝ යේසුස් ක්‍රිස්තුස්-වහන්සේගේ කාරණා නොව තම තමුන්ගේම කාරණා සොයන්නෝය."**

දේව දරුවෙනි, තිමෝතියස්මෙන්, අපගේ ජීවිතවල දෙවියන්වහන්සේ සහ යේසුස්වහන්සේගේ කාරණාවලට අපගේ කාරණාවලට වඩා ප්‍රමුඛත්වයක් දෙමු.

## 5. <u>පාවුල් විසින් තිමෝතියස්ට දෙන ලද උපදෙස්</u>

පාවුල් විසින් තිමෝතියස්ට දෙනු ලැබුවාවූ බොහෝ අවවාද, අනුශාසනා සහ උපදෙස් **1 තිමෝති** සහ **2 තිමෝති** පොත් වල සඳහන් වන අතර, ඒවායින් **2 තිමෝති** පොතේ සඳහන් උපදෙස් 7 ක් ඔබ ඉදිරියේ තබන්ට කැමැත්තෙමි.

(i) **2 තිමෝති 1:6,7 :- " [6]....නුඹ තුළ තිබෙන දෙවියන්-වහන්සේගේ <u>දීමනාව පුබුදුකරන හැටියට නුඹට සිහිකරවමි.</u> [7] මක්නිසාද දෙවියන්වහන්සේ අපට දුන්නේ බයාදුකමේ ආත්මයක් නොව බලයෙත් ප්‍රේමයෙත් හික්මවීමෙත් ආත්මයක්ය."**

සෑම දේව දරුවෙකුටම ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් දීමනා ලබා දී ඇති අතර, (**1 කොරින්ති 12:11**) එම දීමනා පුබුදු කිරීම නොහොත් වර්ධනය කිරීම උදෙසා ක්‍රියා කිරීමේ වගකීම අප වෙත පැවරී තිබේ. තිමෝතියස් වෙත මෙම දීමනා ගෙනදීම උදෙසා දෙවියන්වහන්සේ විසින් පාවුල්ව පාවිච්චි කළ අතර (**2 තිමෝති 1:6**) තිමෝතියස්ගේ සේවය පිළිබඳවද ඔහු විසින් අනාගතවාක්‍ය ලබා දී තිබුණි. (**1 තිමෝති 1 :18**)

මෙසේ අප ලබා ඇති දීමනා පුබුදු කළ විට දෙවියන්-වහන්සේගේ ආත්මයාණන්වහන්සේ අපට නිර්භීතකම, ප්‍රේමය සහ බලය ලබාදෙනසේක. (**2 තිමෝති 1 :7**)

(ii) **2 තිමෝති 1 : 13 :- "නුඹ මාගෙන් ඇසූ සාරවූ වචනවල ආදර්ශය ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තිබෙන ඇදහිල්ල සහ ප්‍රේමයෙන් යුක්තව අල්ලාගෙන සිටපන්න."**

තිමෝතියස් විසූ කාලයේ නොයෙක් ආකාර වැරදි ඉගැන්වීම් තිබුණු අතර, පාවුල්තුමා තිමෝතියස්ට උපදෙස් දෙන්නේ, ඒවායින් මුලා නොවී, **'සාරවූ වචනය තදින් අල්ලාගෙන සිටීමටයි'**
( කරුණාකර **1 තිමෝති 1:3-11, 4:6, 4:16, 6:20** කියවා බලන්න)

(iii) **2 තිමෝති 2 : 3, 4 :- " [3] ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ යහපත් භේවායකු මෙන් දුක් විඳීමට පංගුකාරයෙක් වෙයන්න. [4] භේවාකම් කරන්නාවූ කිසිවෙක්, ඔහු භේවායකු මෙන් ලියාගත් අය සතුටු කරන පිණිස මේ ජීවිතයේ කාරණා වලට පටලැවෙන්නේ නැත."**

ඕනෑම කෙනෙක් දේව දරුකමට ඇතුල්වීමත් සමඟ ඇතුල්වන්නේ, යක්ෂයා සමඟ යුද්ධයකටයි. එබැවින් විවිධ බාධා සහ දුක්පීඩා ඔහු වෙත පැමිණීම පුදුමයක් නොවේ.

කිතුනු අප විසින් කළයුත්තේ ක්‍රිස්තුස්වහන්සේගේ භේවායෙකු මෙන්, **" යක්ෂයාට විරුද්ධව සිට ඌව පලවා දැමීමයි " (යාකොබ් 4 :7) .**

(iv) **2 තිමෝති 2 : 15 :- " සැබෑවේ වචනය හරි ආකාර පහදා දෙන්නාවූ ..... දෙවියන්වහන්සේට ඒත්තුවුනාවූ කෙනෙකු මෙන් පෙනෙන්ට උත්සාහ කරපන්න."**

බයිබලයේ ඉංග්‍රීසි පරිවර්තනයේ මෙම පදය සඳහන් වන්නේ " study to show thyself approved unto God ....."(KJV) ලෙසයි.

ඒ අනුව, දේව වචනය හොඳට ඉගෙනගෙන/අධ්‍යයනය කර නිවැරදිව පහදා දීමේ වැදගත්කම, තිමෝතියස්ට දෙන මේ උපදෙස් වලින් පාවුල් අපට උගන්වයි.

(v) **2 තිමෝති 2 : 22 :- "යෞවන වයසේ තෘෂ්ණාවලින් දුරුව, පිරිසිදු සිතින් ස්වාමීන්වහන්සේට යාච්ඤාකරන්නන් සමග ධර්මිෂ්ඨකමත් ඇදහිල්ලත් ප්‍රේමයත් සමාදානයත් අනුව පලයන්න."**

තරුණ තරුණියනි, දේව වචනය අපට උගන්වන්නේ යෞවන වයසේදී මාංසික තෘෂ්ණාවලින් ජයගැනීමේ වැදගත්කම වන අතැර, එය උදෙසා පාවුල් නිර්දේශකරන්නේ **ඒවායින් පලායෑමටයි.**

(Flee evil desires of youth - NIV) **හිතෝපදේශ 18:10 :- "ස්වමීන්වහන්සේගේ නාමය බලකොටුවක්ය. ධර්මිෂ්ඨයා එහි**

(vi) **දුව ගොස් සුරක්ෂිතවෙයි."**

**2 තිමෝති 3 : 15 :- " ක්‍රිස්තුස් යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරණකොටගෙන ගැළවීම පිණිස නුඹ නැණවත්කරන්ට පුළුවන්වූ ශුද්ධලියවිලි නුඹ බාල වයසේ පටන් දැනගන සිටින බවත් දැන, ඒවායෙහි පිහිටා සිටපන්න.**

( Continue in what you have learned - NIV )

බොහෝ කිතුනුවන් ඉතා උනන්දුවෙන් කිතුනු ජීවිත ආරම්භ කරන නමුත්, විශාල සංඛ්‍යාවක් එහි පැවතීමට ( Continue) අපොහොසත් වෙති.

**යොහන් 8 : 31 :- " යේසුස්වහන්සේ කියනසේක් : නුඹලා මාගේ වචනයෙහි පවතිනවා නම්, සැබෑවට නුඹලා මාගේ ගෝලයෝය."**

දේව දරුවෙනි, අපට හුස්ම ඇතිතෙක් දේව වචනය තුළ පවතිමු. ඒ අනුව ජීවත් වෙමු.

(vii)**2 තිමෝති 4 :5 :- "නුමුත් නුඹ සියලු කාරණාවලදී <u>සිහි ඇතුව සිටපන්න,.........</u>"**

මෙයට අදාල වෙනත් පද කීහිපයක් දෙස බලමු.

**මතෙව් 26:41 :- " නුඹලා පරීක්ෂාවට නොපැමිණෙන පිණිස <u>අවදිව ඉඳ</u> යාච්ඤා කරපල්ලා."**

**කොලොස්සි 4 :2 :- " ස්තුතිදීමෙන් යුක්තව <u>යාච්ඤාවෙහි අවදිව සිට</u>, නොකඩව එහි පැවතියල්ලා."**

**1 පේත්‍රුස් 4 : 7 :- " නමුත් සියලු දේවල අන්තිමය ලංවී තිබේ. එබැවින් නුඹලා <u>සිහියෙන් යුක්තව සිට</u>, යාච්ඤා කිරීම පිණිස පිබිද සිටපල්ලා."**

අප සැමද, පාවුල්තුමා තිමෝතියස්ට මෙසේ දුන් සියලු උපදෙස් අනුව ජීවත්වීමට, මුළු හදවතින් කැපවෙමු.

**එසේ කිරීමට, ඔබට බොහෝසේ**

**ප්‍රේමකරන්නාවු දෙවි සමිඳුන්**

**ඔබට පිහිටවනසේක්වා !!!**

# ක්‍රිස්තුස්වහන්සේව වඩවඩා දැනගැනීම



# පිලිප්පි අධ්‍යයනය 09

# ක්‍රිස්තුස්වහන්සේව වඩවඩා දැනගැනීම

**පිලිප්පි 3:1-11**

**<u>හැඳින්වීම</u>:-**

පාවුල්තුමාගේ ජීවිතය අධ්‍යයනය කරන්නාවූ ඕනෑම කෙනෙක් මවිතයට පත්කරන්නාවූ එක් දෙයක් වන්නේ, සිතා නොහැකි තරම් බාධා, පීඩා, විරෝධතා, දුෂ්කරතා, දුක, වේදනා, පහරදීම්, සිරගතවීම් සහ වෙනත් එවැනි කම්කටොලු රාශියක් මැද්දේ ඔහු දක්වන්නාවූ තිර ඇදහිල්ල සහ විශ්වාසවන්තකමයි.

**2 කොරි 11:24-27 :- "[24]"යුදෙව්වරුන්ගෙන් පස්වරක් එකුන් සතළිසක් පහර කෑවෙමි. [25] තුන් වරක් වේවැල්වලින් තැළුම් කෑවෙමි, එක වරක් ගල් ගසනු ලැබීමි, තුන්වරක් නැව් බිඳී උපද්‍රවයට පැමිණුණෙමි, රාත්‍රියකුත් දවාලකුත් ගැඹුරේ සිටියෙමි. [26] තවද බොහෝ විට ගමන්වලටද, ගංගා උපද්‍රවවලටද, සොර උපද්‍රවවලටද ...... නුවරෙහි උපද්‍රවවලටද, වනයේ උපද්‍රව වලටද, මුහුදේ උපද්‍රවවලටද .....[27] නොයෙක්විට නිදිමැරීමටද, ක්ෂුධාව සහ පිපාසයටද, නොයෙක්විට නිරාහාරව සිටීමටද, ශීතලයටද, නග්නභාවයටද පැමිණියෙමි."**

ක්‍රිස්තුස්වහන්සේ නිසා, ඉහත සඳහන් අයුරින් ඉතා අධික ලෙස වේදනා සහ පීඩාවලට ලක්වුනාවූ පාවුල්තුමා, ඊළඟ පදයේ, එනම් **2 කොරි 11:28** හි පෙන්නුම් කරන්නේ ක්‍රිස්තුස්වහන්සේ විසින් ඔහුට පවරන ලද්දාවූ සේවයට ඔහු දුන්නාවූ ප්‍රමුඛත්වය සහ අනර්ඝ ස්ථානයයි.

**2 කොරි 11:28 :- "බාහිරවූ ඒ දේ හැර <u>සියලු සභාවන් ගැන සිතේ බරක් දවස්පතා මට ඇත්තේය</u>."**

මෙම වචනවලින් අප දකින්නේ, තමා විසින් විඳින ලද්දාවූ මහත් පීඩා පාවුල් සැලකුවේ, **"සුළු ප්‍රශ්න"** ලෙස බවයි. ඔහුගේ සිත, හදවත සහ ජීවිතය වෙළා ගත්තාවූ ප්‍රශ්නය වූයේ, **'ක්‍රිස්තුස්වහන්සේ දුන් කැඳවීම, එනම් අන්‍යජාතීන්ට අපෝස්තලුවරයෙක් ලෙස සේවය කිරීම (රෝම 11:13) විශ්වාසවන්තව ඉටුකරන්නේ කෙසේද?'** යන ප්‍රශ්නයයි.

එබැවින් ඔහුගේ සිතේ ක්‍රියාකළාවූ **'ලොකු ප්‍රශ්නය'** වූයේ, දෙවියන්වහන්සේ ඔහුට ලබාදුන්නාවූ සභාවන්වල ආත්මික වර්ධනයයි.

දේව දරුවෙනි, අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දුක්විඳීම සහ කුරුසි පූජාව ගැන අප සැම හොඳහැටි දන්නෙමු. දෙවියන්වහන්සේගේ කැමැත්තට යටත්වීමද, සැමවිටම පියාණන්වහන්සේට කීකරුවීමද යේසුස්වහන්සේ දුන්නේ ප්‍රථම ස්ථානයවූ බවද අප දන්නෙමු.

**යොහන් 4:34 :- "යේසුස්වහන්සේද : මාගේ කෑම නම් මා එවූ තැනන්වහන්සේගේ කැමැත්ත කොට උන්වහන්සේගේ වැඩ ඉෂ්ට කිරීමය."**

**පිලිප්පි 2:8 :- "**(යේසුස්වහන්සේ) **මනුෂ්‍යාකාරයෙන් සිටිය කලත්, මරණය, එසේය, කුරුසියේ මරණය දක්වා කීකරුවූසේක."**

මේ අයුරින්, දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමට සහ දෙවියන්වහන්සේට කීකරුවීමට ඕනෑම කිතුනුවෙක් මුළු හදවතින් කැපවුවහොත්, පාවුල් මෙන්, නොසැලී ඕනෑම උපද්‍රවයකට හෝ අභියෝගයකට මුහුණ දීමට, ඔහුට හැකිවනු ඇත. මෙය හඳුනාගත්තාවූ, අත්දුටුවාවූ පාවුල් එබැවින් එදා පිලිප්පි සභාවටද **අද අපටද අනුශාසනා කරන්නේ, 'ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තිබුණු සිතම නුඹලා තුළත් තිබේවා', (පිලි 2:5)** කියායි.

මෙම අධ්‍යයනයේ අප ඉගෙන ගැනීමට යන්නාවූ මූලික දෙයක් වන්නේ, **'ක්‍රිස්තුස්වහන්සේ දුන් කැඳවීම අනුව ක්‍රියා කිරීමට නොහොත් උන්වහන්සේට කීකරුව ජීවත්වීමට, පාවුල්ගේ හදවතේ තිබුනාවූ අධිෂ්ඨානය සහ කැපවීමයි.'**

ඔබ සැමටද එවැනි සිතක් දෙමින්, දෙවියන්වහන්සේගේ මුළු කැමැත්ත අනුව ජීවත්වීමට, මෙම අධ්‍යයනය ඔබට මහත් ආශිර්වාදයක් සහ රැකුලක් වේය යන්න අපගේ පැතුම සහ බලාපොරොත්තුවයි.

අධ්‍යයනය :-

## ක්‍රිස්තුස්වහන්සේව වඩවඩා දැනගැනීම

### 1. පාවුල්තුමාගේ හදවත

අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සම්බන්ධයෙන් පාවුල්තුමාගේ හදවතේ තිබුනාවූ ආශාවන් සහ අභිලාශයන් බොහොමයක් **පිලිප්පි පොතේ** ඔහු විසින් සඳහන් කර ඇති අතර, ඒවායින් කීහිපයක් වෙත ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි. ඒවා නම්,

(i) යේසුස්වහන්සේ ඇඳින ගැනීම .

**පිලිප්පි 3:8:- '' මාගේ ස්වාමිවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ ඇඳින ගැනීම.''**

(ii) උන්වහන්සේව ලබා ගැනීම

**පිලිප්පි 3:8 :- ''එසේ කරන්නේ මම ක්‍රිස්තුස්වහන්සේ ලබා ගන්නා පිණිසත්,''**

(iii) ක්‍රිස්තුස්වහන්සේ ගෞරවයට පැමිණවීම

**පිලිප්පි 1:20 :- ..... ක්‍රිස්තුස්වහන්සේ ගෞරවයට පැමිණේ යයි මාගේ තද බලාපොරොත්තුවක්ද ප්‍රාර්ථනාවක්ද ඇත්තේය.''**

(iv) ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටීම

**පිලිප්පි 3:9 :- ''දෙවියන්වහන්සේගෙන් පැමිණෙන ධර්මිෂ්ඨකම ඇතුව ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින පිණිසත් .''**

(v) උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලය දැනගැනීම

**පිලිප්පි 3: 10,11 :- '' [10]යම් අන්දමකින් මළවුන්ගෙන් නැගිටීමට පැමිණෙන ලෙස, [11] උන්වහන්සේ සහ උන්වහන්සේගේ නැවත - නැගිටීමේ බලයත් ..... දැනගන්නා පිණිසත්ය.''**

(vi) ක්‍රිස්තුස්වහන්සේ සමඟ විසීම

**පිලිප්පි 1:23 :- ''..... මාගේ ආශාව නම් තුරන්ව ගොස් ක්‍රිස්තුස්වහන්සේ සමඟ විසීමටය ; ...........''**

(vii) ක්‍රිස්තුස්වහන්සේගේ දවසේදී පාරට්ටුවක් ඇතිවීම

**පිලි 2:16 :- ''මම නිෂ්ඵලලෙස නොදිවීම්, ..... කියා ක්‍රිස්තුස්වහන්සේගේ දවසේදී මට පාරට්ටුවක් ඇතිවන්නේය.''**

මෙහි පාරට්ටුවක් ලෙස පරිවර්තනය කර ඇති වචනය ඉංග්‍රීසි පරිවර්තනයේ, REJOICE-(KJV) ලෙස සඳහන් වේ. මෙම වචනයේ අර්ථය වන්නේ **ප්‍රීතිවීම නොහොත් සතුටුවීමයි.**

ඉහත සඳහන්, පාවුල්තුමාගේ හදවතේ තිබුනාව ආශාවන්, අරමුණු සහ අභිලාෂයන් වෙත අපගේ අවධානය දැන් යොමුකරමු.

## 2. යේසුස්වහන්සේ ඇඳින ගැනීම (පිලි 3:8)

### (i) යේසුස්වහන්සේව දැනගැනීමේ වැදගත්කම

අප ඉහත සඳහන් කර ඇත්තාවූ, පාවුල්තුමාගේ අපේක්ෂාවලින්, වඩාත්ම වැදගත් වන්නේ, මුලින්ම සඳහන් කර ඇත්තාවූ, **යේසුස්වහන්සේව ඇඳිනගැනීම නොහොත් දැනගැනීම** යන්නයි. මක්නිසාදයත්, ඔහු සඳහන් කරන්නාවූ ඉතිරි අපේක්ෂා හයම රඳා පවතින්නේ, ' **යේසුස්වහන්සේව දැනගැනීම** ' නමැති අත්තිවාරම මත නිසයි.

මෙම සත්‍යතාවය ඔබ සැමට තේරුම් ගැනීමට පහසු කිරීම උදෙසා, මාගේ අත්දැකීම ඔබ ඉදිරියේ ඉතා කෙටියෙන් සඳහන් කිරීමට කැමැත්තෙමි.

ඉතා භක්තිවන්ත කිතුනු පවුලකට උපත ලැබූ මා, කුඩා කාලයේ සිටම දිනපතා දේව වචනය කියවීමටද යාච්ඤා කිරීමටද, ඉරුදින දේව නමස්කාර මෙහෙයට අනිවාර්‍ය-යෙන්ම සහභාගීවීමද පුරුදුව සිටියෙමි. එමනිසා මා බාල වයසේ සිටම **දෙවියන්වහන්සේ ගැන සහ යේසුස්වහන්සේ ගැන** බොහෝ දේ දැන සිටිය නමුත්, **මා යේසුස්වහන්සේව දැන නොසිටියෙමි.** මා උන්වහන්සේව **අඳුනාගත්තේ නොහොත් දැනගත්තේ,** අවුරුත් 22ක් වයස්ගතවූ තරුණයෙක් ලෙසිනි.

මෙසේ මා උන්වහන්සේව අඳුනාගත්තාවූ දින පටන්, උන්වහන්සේ මට උගන්වමින්, ශක්තිමත් කරමින්, මඟ පෙන්වමින්, ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා සහ ඵල දෙමින්, මාගේ ජීවිතයේ බොහෝ අරමුණු ඇතිකර තිබේ. මේ සියල්ලම මාගේ ජීවිතයට එකතුකිරීම උදෙසා අනිවාර්‍යවූ ප්‍රථම සහ වඩාත්ම වැදගත් පියවර වූයේ, **යේසුස්වහන්සේව දැන ගැනීමයි.**

(ii) **උන්වහන්සේව පුද්ගලිකවද නිවැරදිවද දැනගැනීම**

**පිලිප්පි 3:8 :- එසේය, මාගේ ස්වාමී වූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ ඇඳින ගැනීමේ උතුම්කම නිසා සියල්ල අලාභයයි සලකමි....**" පාවුල් කරන්නාවූ මේ වදන් දෙස, විමසිල්ලෙන් බලමු.

(a) **' මාගේ '**

දේව දරුවෙනි, අප දේව දරුවන්වීම උදෙසා, අප විසින් යේසුස්වහන්සේව **අපගේ පුද්ගලික ගැළවුම්කාරයාණන්-වහන්සේ ලෙස පිළිගත යුතුවේ.**

**යොහන් 1:12 :- "නුමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, ...... ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන්සේක."**

මෙම තීරණය අප විසින් පුද්ගලිකව ගත යුතු තීරණයක් වේ. ඔබ වෙනුවෙන් වෙන කිසිවෙකුට යේසුස් වහන්සේව පිළිගත නොහැකි වේ. ඔබ කිතුනු පවුලකට උපත ලැබීම පමණින් ඔබ දේව දරුවෙක් බවට පත් නොවේ. එය උදෙසා **ඔබ විසින් පුද්ගලික තීරණයක් ගත යුතුවේ.**

(b) **' ස්වාමීවූ '**

මෙසේ අපගේ පුද්ගලික ගැළවුම්කාරයාණන්වහන්සේ ලෙස පිළිගන්නාවූ අප, **අපගේ ජීවිතයේ ස්වාමීත්වය** උන්වහන්සේට භාරදිය යුතුවේ.

(c) **' ක්‍රිස්තුස් '**

' Christos ' යන ග්‍රීක් වචනයට අප සිංහලෙන් 'ක්‍රිස්තුස්' යන වචනය භාවිතා කරන අතර, එහි අදහස වන්නේ **'ආලේපලත් තැණන්වහන්සේ '** යන්නයි. (Christos **මෙසායා** (MESSIAH) යන හෙබ්‍රෙව් වචනයට සමාන වන්නාවූ වචනයයි.)

**ක්‍රියා 10 :38:- " දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරීය <u>යේසුස්වහන්සේ ආලේප කළ බවත්</u>, ..."**

(d) **' යේසුස්වහන්සේ '**

ගෞරවාන්විතව අප **'යේසුස්වහන්සේ'** ලෙස උන්වහන්සේට ව්‍යවහාර කරන අතර, උන්වහන්සේගේ නම **'යේසුස් '** වූසේක. මෙම නාමය උන්වහන්සේට තැබීමට යෝසෙප්ට දන්වනු ලැබුවේ දේව දූතයන් විසින් ස්වප්නයක් මගිනි.

**මතෙව් 1:21 :- "ඈ පුත්‍රයෙකු වදන්නීය, උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න ; මක්නිසාද තමන්ගේ සෙනඟ ඔවුන්ගේ පාපවලින් ගළවන්නේ උන්වහන්සේ යයි කීවේය."**

උන්වහන්සේගේ නම හෙබ්‍රෙව් බසින් **යේෂුවා, හෙහෝෂුවා, සහ යෝෂුවා** ලෙස සඳහන් වන අතර, එහි අර්ථය වන්නේ **'ස්වාමීන්වහන්සේගේ ගැළවීම'** යන්නයි.

**'යේසුස් '** යන නාමය දෙවියන්වහන්සේ විසින්, සෑම නාමයකට වඩා උසස් කරනලදසේක.

**පිලිප්පි 2:9,10 :- [9] දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස්කොට, සියලු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන්සේක. [10] එසේ කළේ, ස්වර්ගයෙහිද පොළොවෙහිද පොළොව යටද සියල්ලන් යේසුස් යන නාමයෙන් දණ නමන පිණිසත්,"**

මාගේ ප්‍රේමවන්ත සහෝදරයා, සහෝදරී,

- ඔබ ඔබගේ කැමැත්තෙන් යේසුස්වහන්සේව **ඔබගේ ගැළවුම්කාරයා** ලෙස පිළිගෙන තිබෙනවාද?
- ඔබ උන්වහන්සේට ඔබගේ **ජීවිතයේ ස්වාමිත්වය භාරදී, උන්වහන්සේට කීකරුව ජීවත්වනවාද?**
- උන්වහන්සේ දෙවියන්වහන්සේ විසින් එවන ලද්දාවූ, ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද ආලේප කරනලද්දාවූ, මුළු මනුෂ්‍ය වර්ගයාට ඇත්තාවූ, **එකම ගැළවුම්කාරයා** බව ඔබ අදහමින්, අන් අයට උන්වහන්සේ ගැන කියනවාද?
- දෙවියන්වහන්සේ, යේසුස් යන නාමයට **'සියලු නාමවලට වඩා උසස් නාමය** දී ඇති අතර, ඔබ ඒ නාමයට ගෞරවය සහ මහිමය ගෙන දෙන ආකාරයට ජීවත්වනවාද?

## 3. <u>යේසුස්වහන්සේව ලබාගැනීම</u> (පිලි 3:8)

යේසුස්වහන්සේව ලබාගැනීම උදෙසා, අප බොහෝ දෙනෙකුට නොයෙක් දේවල් අතහැරීමට සිදුවේ. පාවුල් මෙම අතහැරීම සැලකූ අන්දම දෙස බලමු.

**පිලිප්පි 3:7-8:- "[7]එසේවී නුමුත් මට ලාභව තිබුණු යම් යම් දේම ක්‍රිස්තුස්වහන්සේ නිසා අලාභයයි සිතීමට පැමිණියෙමි. [8]...ඒවා කුණුයයි සලකමි. එසේ කරන්නේ <u>මම ක්‍රිස්තුස්වහන්සේ ලබාගන්නා පිණිසත්,</u> ....."**

පාවුල්තුමා පවසන මේ වචන වලින් පෙනී යන්නේ, ක්‍රිස්තුස්වහන්සේව **ලබාගැනීම** උදෙසා, ඕනෑම දෙයක් කැපකිරීමට ඔහු සූදානම්ව සිටි බවයි. ඔහු යේසුස්වහන්සේව පිළිගැනීම නොහොත් **'කිතුනුවෙක් වීම'** නිසා ඔහුට බොහෝ දේ නැතිවන්ට ඇත. ඒවායින් සමහරක් නම්,

- ඔහුගේ හිත මිතුරන් නැතිවීම/ ඈත්වීම
- සමාජයේ තිබුනු පිළිගැනීම නැතිවීම
- ලෝකාකාර දියුණුව නැතිවීම
- ආර්ථික දියුණුව නැතිවීම
- ආර්ථික ලාභ නොමැතිවීම
- පහසුවූ සැපදායික ජීවිතයක් අතහැරීම

දේව දරුව, ඔබ උදෙසා ජීවිතය පිදුවාවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා, ඔබ මෙවැනි දේ අතහැරීමට සූදානම්ද?

කිතුනු අප, බොහෝ විට මෙවැනි දේ අතහැරීමට මැලි වන අතර, පාවුල්තුමා එවැනි දේ සඳහන් කරන්නේවත් නැත. ඔහු සඳහන් කරන්නාවූ දේ, **පිලිප්පි 3:5-6** හි ලියැවී තිබේ. ඒවායින් සමහරක් වන්නේ,

(a) **'ව්‍යවස්ථාවෙන් පැමිණෙන ධර්මිෂ්ඨකම ගැන නම්, නිර්දෝෂව සිටියෙමි' (පිලි 3:6).** මෙම වචන වලින් පෙනීයන්නේ, ඔහු **'මෝසෙස්ගේ ව්‍යවස්ථාව'** අකුරටම ඉටු කළ කෙනෙක් බවයි. එනම් ඔහු, තමා අයිතිව සිටි යුදෙව් ආගමේ සියලු ඉගැන්වීම් වලට 100% කීකරුව ජීවත්වීමට උත්සාහ කළ කෙනෙක් බවයි.

(b) **'ජ්වලිතකම ගැන නම්, සභාවට පීඩා කෙළෙමි ' (පිලිප්පි 3:6)** මෙම වචන වලින් පෙනීයන්නේ කිතුනුවෙක් වීමට පෙර යුදෙව් ආගමිකයෙක්ව සිටියාවූ පාවුල්, තම ආගම **ආරක්ෂා කිරීම උදෙසා ගත්තාවූ දැඩි උත්සාහයයි.**

**'ව්‍යවස්ථාව ගැන නම් ඵරිසියෙක්මි.' (පිලිප්පි 3:5)** යේසුස්වහන්සේගේ කාලයේ යුදෙව් ආගම පිළිබඳ බොහෝ කැපවී සේවය කළාවූ ඵරිසිවරු බොහෝ සිටියහ. විචාරකයෝ පවසන්නේ **' ඵරිසියෙක් '** යන්නෙහි අර්ථය වන්නේ **'වෙන්කරන ලද්දාවුන් '** යන්නයි. ඵරිසිවරුන් **කැසිඩිම්** (Chasidm) ලෙසද හඳුන්වනු ලැබූ අතර, එහි අර්ථය වන්නේ **'දෙවියන්වහන්සේට විශ්වාසවන්ත වූවන්'** යන්නයි.

එබැවින් ඵරිසිවරු, **දෙවියන්වහන්සේ උදෙසා වෙන්කරනු ලැබුවාවූ, උන්වහන්සේටද යුදෙව් ආගමටද විශ්වාසවන්තවූ කණ්ඩායමක්වූ අතර,** පාවුල්තුමා කැපී පෙනෙන ඵරිසියෙක්ද වියී

මාගේ ප්‍රේමවන්ත සහෝදරයා සහෝදරී, කිතුනු නම දරන්නාවූ ඔබ, පාවුල් මෙන් ඔබගේ ආගමට සහ එහි ඉගැන්වීම්වලට,

- **100% කීකරුව ජීවත්වීමට උත්සාහ කරනවාද?**
- **ඒවා ආරක්ෂා කිරීමට සහ ප්‍රචලිත කිරීමට උනන්දු වනවාද?**
- **සැමවිටම දෙවියන්වහන්සේට විශ්වාසවන්තව ජීවත්වනවාද?**

අපගේ දෙවි සමිඳුන් අපව කැඳවන්නේ, අප දේව දරුවන් වීමට ප්‍රථමයෙන්, අපගේ ජීවිතයේ වැදගත් ස්ථානයක් ගත්තාවූ **'ලෝකයේ දේ '** තිබේනම් ඒවා අතහැරීමටත්, උන්වහන්සේගේ දේවලට ඇලුම් වී උන්වහන්සේට කීකරුවී ජීවත්වීමටත්ය.

අප මෙසේ කරන විට, අප නොදැනුවත්වම
- **අප යේසුස්වහන්සේට ලංවනු ඇත.**
- **උන්වහන්සේ අපට ආශීර්වාද කරනු ඇත.**
- **<u>අප උන්වහන්සේව ලබා ගන්නවා ඇත</u>.**

**4. <u>යේසුස්වහන්සේ ගෞරවයට පැමිණාවීම</u> (පිලි 1:20)**

**පිලි 1:20 :- "....ක්‍රිස්තුස්වහන්සේ ගෞරවයට පැමිණේ යයි මාගේ තද බලාපොරොත්තුවද....."**

පාවුල්තුමාගේ ජීවිතයේ, තවත් ඉතා වැදගත් අරමුණක් සහ බලාපොරොත්තුවක් වූයේ, ක්‍රිස්තුස්වහන්සේව ගෞරවයට පැමිණාවීමයි.

අප විසින්ද එසේ කිරීම උදෙසා, දේව වචනයේ සඳහන් වන්නාවූ මාර්ග කිහිපයක් දෙස අවධානය යොමුකරමු.

(a) **මතෙව් 5:16 :- "එසේම මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේට ගෞරව කරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබළාවා."**

මෙහි සඳහන් මාර්ගය වන්නේ, **<u>යහපත් ක්‍රියා කිරීමයි.</u>**

දේව දරුවෙනි, යහපත් ක්‍රියා කිරීම උදෙසා දෙවියන්වහන්සේ ඔබට අවස්ථාවක් ලබා දෙන අතර, **එය මග නොහරින්න. අවංක හදවතකින්, යේසුස්වහන්සේ කළාමෙන්, යහපත් ක්‍රියාවල යෙදෙන්න.**

(b) **යොහන් 15:8 :- '' මාගේ පියාණන්වහන්සේට ගෞරව ලැබෙන්නේ නුඹලා විසින් බොහෝ ඵල දැරීමෙන්ය ;....''**

දෙවියන්වහන්සේට/යේසුස්වහන්සේට නොහොත් ත්‍රිඑක දෙවියන්වහන්සේ වෙත ගෞරවය ගෙනදීමේ තවත් මාර්ගයක් වන්නේ, දේව දරුවන් විසින් **<u>ඵල දරනු ලැබීමේ</u>** මාර්ගයයි. එබැවින් අප සැම යේසුස්වහන්සේ තුළ පවතිමින් බොහෝ ඵල දරමින්, ත්‍රිඑක දෙවියන්වහන්සේට ගෞරවය ගෙනදෙමු.

**යොහන් 15:4 :- ''මා තුළ පැවතියල්ලා, මමත් නුඹලා තුළ පවතින්නෙමි. අත්ත මිදිවැලෙහි නොපවතී නම් තනියම ඵල දරන්ට බැරුවාක්මෙන්, නුඹලා මා තුළෙහි නොපවතිවූ නම් ඵල දරන්ට නුඹලාට බැරිය.''**

(c) **යොහන් 16:14 :- ''උන්වහන්සේ** (ශුද්ධාත්මයාණන් වහන්සේ) **මා ගෞරවයට පමුණුවනසේක. මක්නිසාද උන්වහන්සේ මා සන්තක දෙයින් රැගෙන නුඹලාට ප්‍රකාශකරනසේක.''**

යේසුස්වහන්සේට ගෞරවය ගෙන දීමේ තවත් මාර්ගයක් වන්නේ, **'ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාළිගාව වන්නාවූ අපගේ ශරීර' (1කොරි 6:19)** උන්වහන්සේගේ පාලනයට යටත් කිරීමයි. එවිට යේසුස්වහන්සේව ගෞරවයට පැමිණවීම උදෙසා ක්‍රියාකරන්නාවූ ශුද්ධාත්මයාණන්-වහන්සේ, අප තුළින් බලවත් ක්‍රියා කරමින් ත්‍රිඑක දෙවියන්වහන්සේට ප්‍රශංසාව ගෙනදෙනසේක.
(කරුණාකර **ක්‍රියා 4:9, 10, 21** කියවා බලන්න)

**5. <u>ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටීම</u> (පිලි 3:9)**

**2 කොරි 5:17 :- ''එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය; මෙන්න සියල්ලම අලුත් වී තිබේ.''**

පාවුල්තුමා තුළ තිබුනාවූ අරමුණු අතරින්, අප හතරවෙනියට සඳහන් කලේ, **'ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටීමයි'** මෙයට හේතුව වන්නේ, මෙම අරමුණු නොහොත් ඉලක්ක කිතුනු ජීවිතයේ බොහෝ විට අපට යැමට/ඇතුල්වීමට හෝ

අත්දැකීමට ලැබෙන අනුපිළිවෙල අනුව ඒවා ඔබ ඉදිරියේ තැබීමට අප තැත්කරන නිසයි.

එබැවින් පාවුල්තුමා පිලිප්පි පොතේ සඳහන් කර ඇත්තාවූ අරමුණු හතක් මෙම අධ්‍යයනයේදී අප සඳහන් කරන අතර, පියවරෙන් පියවර ඒවාට ඇතුල්වන මෙන් ඔබගෙන් ඉල්ලා සිටීමට කැමැත්තෙමි.

<u>**1 නි පියවර**</u> **:-**
ඔබට ප්‍රේම කරමින්, ඔබ උදෙසා කුරුසියෙහි දිවිපිදූ යේසුස්වහන්සේව නිසිලෙස හඳුනාගෙන, ඔබගේ ජීවිතය උන්වහන්සේට කැපකරන්න.

ඉහත සඳහන් පියවර ගැනීම තුළින් ඔබ දේව දරුවෙක් බවට පත්වන අතර, අපව මෙසේ දෙවියන්වහන්සේගේ පවුලට ඇතුලත් කරනු ලබන්නේ නොහොත් '**බව්තිස්ම කරනු ලබන්නේ** ' ශුද්ධාත්මයාණන්වහන්සේ විසිනි. **(1 කොරි 12:13)**

<u>**2 නි පියවර**</u> **:-**
1 නි පියවර ගත් අප බොහෝ විට සිටින්නේ '**ආත්මික බිළිදුන්** ' මෙන් වන අතර, දෙවියන්වහන්සේ අපව කැඳවන්නේ, '**ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණවූ උස මහතේ ප්‍රමාණයට වැඩීමටයි.**' **(එපීස 4:12)**

මෙසේ වර්ධනය වීම උදෙසා '**ක්‍රිස්තුස්වහන්සේව ලබාගැනීම**' අප ගත යුතු 2 නි පියවරයි. මෙය උදෙසා අප තුළ තිබුනාවූ ' **ලෝකයේ දේවලට දෙන්නාවූ වටිනාකම්** ' බොහෝ විට වෙනස්විය යුතුවේ. මෙසේ අප ආත්මික දේවලට මුල් තැන දෙමින් ක්‍රියාකරන විට, අප ඉබේම ක්‍රිස්තුස්වහන්සේට ලංවී උන්වහන්සේව ලබාගනු ඇත.

<u>**3 වන පියවර**</u> **:-**
අපගේ මෙම ආත්මික ගමනේ තෙවැනි පියවර වන්නේ, ක්‍රිස්තුස්වහන්සේව ගෞරවයට පැමිණවීමයි. මෙය අපගේ ජීවිතයේ සෑම අංශයකින්ම සිදුවිය යුතුවේ.

**1 කොරි 10:31 :- '' එහෙයින් නුඹලා කතත් බොතත් වෙන යමක් කරතත්, <u>සියල්ල දෙවියන්වහන්සේගේ ගෞරවය පිණිස කරපල්ලා</u>.''**

**<u>4 වන පියවර</u> :-**

මේ පියවර එනම් **'ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටීම'** පිළිබඳව **2 කොරි 5:17** වෙත අපගේ අවධානය යොමුකරමු. එහි සඳහන් ආකාරයට, එසේ සිටින සෑම කෙනෙක්ම,

(a) **'අලුත් මැව්ල්ලකි'**

අප සෑම පාපය කරණකොටගෙන ආත්මික මරණයට පත්ව සිටියෙමු. **(එපීස 2:1)** නමුත් දෙවියන්වහන්සේ යේසුස් වහන්සේගේ කුරුසි පූජාව තුළින් අපව (ආත්මිකව) ජීවත් කළසේක. **(එපීස 2:2-5)** අපව අලුතෙන් ඉපදවූසේක. **(යොහන් 3:3-6)**

(b) **'පරණ දේ පහව ගියේය.'**

**එපීස 4:22 :- " නුඹලාගේ ජීවිතයේ පළමු හැසිරීම ලෙස රැවටිල්ලේ තෘෂ්ණාවල් අනුව දූෂ්‍යවන්නාවූ <u>පරණ මනුෂ්‍යයා පහකර දමා</u>, "**

(c) **'මෙන්න සියල්ලම අලුත් වී තිබේ.'**

**එපීස 4:23,24 :- " [23]නුඹලා නුඹලාගේ චිත්තාත්මයෙන් අලුත්කරනු ලැබ, [24] සැබෑවේ ධර්මිෂ්ඨකමින්ද ශුද්ධකමින්ද දෙවියන්වහන්සේට සමානව මවනලද්දාවූ <u>අලුත් මනුෂ්‍යයා පැළඳගන්නා ලෙසය</u>."**

අප සෑමදෙන අනිවාර්යයෙන්ම පරණ මනුෂ්‍යයා පහකර දමා අලුත් මනුෂ්‍යයා පැළඳ ගනිමු. මාංසයේ ක්‍රියා **(ගලාති 5:19-21)** පහකර දමා ආත්මයාණන්-වහන්සේගේ ඵල වර්ධනය කරගනිමු. **(ගලාති 5:22,23)**

**6. <u>උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලය දැනගැනීම</u> (පිලි 3:10,11)**

කුරුසිපත් කරනු ලැබුවාවූ අපගේ ස්වාමීවූ යේසුස්-ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවට කිසි සැකයක් නොමැතිවේ. එදා උන්වහන්සේව කුරුසිපත් කළාවූ රෝම හේවායෝ, යුදෙව්වරුන්ගේ ඉල්ලීම මත

පිලාත්ගෙන් නියෝග ලබා ගත්තේ, යේසුස්වහන්සේගේ සහ උන්වහන්සේ සමඟ කුරුසිපත් කරනු ලැබූ සොරුන් දෙදෙනාගෙත් කකුල් කඩා සබත් දවසට පෙර ඔවුන්ගේ මරණය සිදුවීම උදෙසා ක්‍රියාකරන්ටයි. රෝම භේවායෝ ප්‍රථමයෙන් සොරුන් දෙදෙනාගේ කකුල් කඩා දැමූ අතර, යේසුස්වහන්සේගේ කුරුසිය වෙත පැමිණි ඔවුන් දුටුවේ, උන්වහන්සේ ඒ වන විටත් මරණයට පත්ව සිටි බවයි.

**යොහන් 19:33:- "නුමුත් ඔව්හු යේසුස්වහන්සේ ළඟට ආ කල, උන්වහන්සේ මැරී සිටි බව දැක, උන්වහන්සේගේ කෙණ්ඩා නොබින්දෝය."** (කරුණාකර **යොහන් 19:31-36** කියවා බලන්න)

ඉන්පසු යේසුස්වහන්සේගේ දේහය අරිමාතියේ යෝසෙප්ගේ සොහොනේ තැන්පත් කරන ලදී. **(යොහන් 19:38-42)** මෙසේ තැන්පත් කරනු ලැබූ යේසුස්වහන්සේ **මරණයෙන් නැගුටුණුසේක.**

එබැවින් උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලය (පාවුල්තුමා දැනගැනීමට අපේක්ෂා කලාවූ බලය) දේව දරුවන් වන්නාවූ අප සැමද අත්දකින්නට යන්නෙමු.

**රෝම 6:3-5 :- "[3] ක්‍රිස්තුස්යේසුස්වහන්සේ තුළට බව්තිස්ම ලැබුවාවූ අප සියල්ලන් උන්වහන්සේගේ මරණයට බව්තිස්ම ලැබූ බව නුඹලා නොදැන සිටිනහුද? [4] එබැවින් ක්‍රිස්තුස්වහන්සේ පියාණන්වහන්සේගේ මහිමය කරණකොටගෙන මළවුන්ගෙන් නැගුටුවනු ලැබුවා සේම, ....[5].....අපි උන්වහන්සේට සම්බන්ධවී සිටිමු නම්, උන්වහන්සේගේ නැගිටීමේ සමානත්වයෙනුත් සම්බන්ධ වන්නෙමුව."**

**7. <u>ක්‍රිස්තුස්වහන්සේ සමඟ විසීම</u> (පිලි 1:23)**

**එළිදරව් 22:3-5 :- "[3].... එහි දෙවියන්වහන්සේගේද බැටළු පැටවාණන්ගේද සිංහාසනය වන්නේය. උන්වහන්සේගේ මෙහෙකරුවෝ උන්වහන්සේට මෙහෙකරන්නෝය, [4] ඔව්හු උන්වහන්සේගේ මුහුණ දකින්නෝය. උන්වහන්සේගේ නාමයද ඔවුන්ගේ නළල්වල තිබෙන්නේය. [5].....ඔව්හු සදාකාලේටම රජකම් කරන්නෝය."**

දේව දරුවෙනි, **'ක්‍රිස්තුස්වහන්සේ සමඟ විසීම'** පාවුල්තුමාද අප සැමද ලබන්නට යන්නෙමු.

## 8. <u>ක්‍රිස්තුස්වහන්සේගේ දවසේදී පාරට්ටුවක් ඇතිවීම</u> (පිලි 2:16)

**දානියෙල් 12:3 :- ''..... බොහෝ දෙනෙකු ධර්මිෂ්ඨකමට හරවාගන්නෝ තාරකාවන් මෙන්ද සදාකාලේටම බැබළෙන්නෝය.''**

දේව දරුව, යේසුස්වහන්සේගේ නියෝගයට කීකරු වෙමින්, ශුභාරංචිය පැතිරවීම උදෙසා විශ්වාසවන්තව සේවය කරන්නාවූ ඔබ සැමට මෙම පොරොන්දුව අදාල වේ. අයිති වේ !!!

පාවුල්තුමා මෙන් අප සැම, දේව දරුකමට ඇතුල්වීම පමණින් සෑහීමට පත්නොවී, **අපගේ ජීවිතාන්තය දක්වා ක්‍රිස්තුස්වහන්සේව වඩවඩා දැනගැනීමට මහත් පිපාසයක් ඇතිව, ශුභාරංචිය ප්‍රකාශ කිරීම උදෙසා නිරන්තරයෙන් විශ්වාසවන්තව ජීවත්වෙමු.**

**එසේ කිරීම උදෙසා දෙවි සමිඳුන්**

**ඔබට ශක්තිය සහ බලය**

**දෙනසේක්වා !!!**

# තිර අරමුණක් ඇතිව ජීවත්වීම



## පිලිප්පි අධ්‍යයනය 10

# තිර අරමුණක් ඇතිව ජීවත්වීම

**පිලිප්පි 3:12-21**

**<u>හැඳින්වීම</u>:-**

පාවුල්තුමාගේ මුළු ජීවිතයේ සහ සේවයේ ප්‍රධානතම අරමුණක් ඔහු **පිලිප්පි 3:13,14** හි සඳහන් කරයි.

**පිලිප්පි 3:13,14 :- "[13] මම තවමත් අල්ලාගත්තෙමියි නොසිතමි. නුමුත් එකක් කරමි. එනම්, පස්සෙන් තිබෙන දේ මතක නැතිකොට, ඉස්සරහට තිබෙන ඒවා දෙසම බලාගන යමින්, [14]ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ උතුම් කැඳවීමේ දිනුම පිණිස දිනුම්පළ කරා දුවමි."**

පාවුල්තුමා තුළ තිබුනාවූ මෙම දැඩි අධිෂ්ඨානය පැහැදිලි කිරීම උදෙසා ඔහු භාවිතා කරන්නේ එවකට ග්‍රීසියේ පැවති මල්ලව ක්‍රීඩාවෙන් උපුටා ගන්නා ලද චිත්‍රයකි.

අප කවුරුත් හොඳ හැටි **'ඔලිම්පික් තරඟාවලිය'**(Olympic Games) ගැන අසා ඇති අතර මෙය ආරම්භ කරන ලද්දේ ක්‍රි.පූ. 8 වන සියවසේ ග්‍රීසියේදීය. මේ අතර ක්‍රි.පූ. 6 වන සියවසේදී දෙවසරකට වරක් කොරින්තියෙහි (Isthmian Games) පවත්වන ලදී.

**1 කොරින්ති පොත** මීට පෙර අධ්‍යයනය කළාවූ අප දුටුවේ, එම ලිපියේදී පාවුල්තුමා කිතුනු ජීවිතය **'දිවීමේ තරඟයකට'** සමාන කළ බවයි.

**1 කොරි 9:24,25 :-" [24] දුවන ස්ථානයෙහි සියල්ලන්ම දුවන නුමුත් තෑග්ග ලබන්නේ එක්කෙනෙක්ම බව නොදනිවුද? <u>එසේම නුඹලාත් ලබා ගන්නා පිණිස දුවපල්ලා.</u> [25] දිනන පිණිස වීර්යකරන්නාවූ සියල්ලෝම සියල්ලෙහි පමණ දැන හැසිරෙති. ඔවුන් එසේ කරන්නේ දිරන්නාවූ ඔටුන්නක් ලබාගන්නා පිණිසය; <u>අප වනාහි නොදිරන එකක් ලබාගන්නා පිණිසය</u>."**

මෙසේ ජීවිත ගමන දිවීමේ තරඟයකට සමාන කරන පාවුල්, එම තරඟයෙන් ජයගැනීමට ඔහු තුළ තිබුනාවූ දැඩි අධිෂ්ඨානය, පහත සඳහන් අයුරින් විස්තර කරයි.

**1 කොරි 9:26,27 :- " [26] <u>එබැවින් මා දුවන්නේ සැකයෙන් මෙන් නොවේය</u> ; පහර දෙන්නේ හුළඟට පහර දෙන්නාක්මෙන් නොවේය. [27] නුමුත් <u>මාගේ ශරීරය දමනයකර වාල්කමට පමුණුවමි.</u> <u>එසේ කරන්නේ අනුන්ට දේශනාකළාට පසු කොයි ලෙසකින්වත් මාම එපාකරනු නොලබන පිණිසය</u>."**

දේව දරුවෙනි, අප සැමද අපගේ ජීවිත ගමන ජයග්‍රාහිකව සම්පූර්ණ කිරීමට ඇප කැප වෙමු. දෙවිසමිඳුන්, අපට ලබාදීමට බලාසිටින්නාවූ **'නොදිරන්නාවූ ඔටුන්න '** ලබා ගැනීම උදෙසා, **"ඇදහිල්ලේ කර්තෘවරයාද සම්පූර්ණ කරන්නාදවූ යේසුස්වහන්සේ දෙසම බලමින්, අප ඉදිරියෙහි තබා තිබෙන දිවීම ඉවසිල්ලෙන්** (නොහොත් ස්ථිරකමෙන්) **දුවමු." (හෙබ්‍රෙව් 12:1)**

<u>**අධ්‍යයනය**</u> **:-**

**1. <u>පස්සෙන් තිබෙන දේ මතකනැතිකොට දිනුම්පළ කරා දුවමු.</u>**

(a) **<u>අප මීට පෙර කළාවූ පාප අමතක කර දැමීම</u>**

(i) මාගේ ප්‍රේමවන්ත සහෝදර සහෝදරියනි, මෙම සත්‍යතාවන් තේරුම් ගන්න.
(ii) අප සැම මෙලොවට බිහිවුනේ, අප තුළ පව්කාර ස්වභාවයක් ඇතුවය.
(iii) එබැවින් අප අතීතයේදී බොහෝ පව්වල යෙදී සිටියෙමු.
(iv) වර්තමානයේදීත් අප විසින් බොහෝ පව් සිදුවේ. අනාගතයේදීත්, අපගේ ජීවිතාන්තය දක්වා අප විසින් දැන දැන හෝ නොදැන නොයෙක් පව් කෙරෙනු ඇත.

**යක්ෂයා සැමවිටම බලාගෙන සිටින්නේ, අපගේ අතීත පව්, අපගේ මතකයට ගෙනෙමින්, ඒවා ගැන අපට චෝදනා නගමින්, අපව අධෛර්යයට පත්කරමින්, අපව පරාජය කිරීමටය.**

දේව දරුවෙනි, අප විසින් කළ යුත්තේ, අපගේ පව් ගැන පසුතැවිලි වී, දෙවියන්වහන්සේට අපගේ පව් කියාදී ඒවා අතහැර දැමීමයි.

**හිතෝපදේශ 28:13 :- "<u>තමාගේ වරද</u> සඟවන්නා සඵල නොවන්නේය. එහෙත් ඒවා <u>කියාදී අත්හරින්නාට කරුණාව ලැබේ</u>."**

අප මෙසේ ක්‍රියා කළ විට, අපේ පව්වලට කමා කිරීමට දෙවියන්වහන්සේ පොරොන්දු වී ඇතිසේක.

**1 යොහන් 1:9 :- "අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක."**

දෙවියන්වහන්සේ ඒ පව් ගැන අපට කමා කරනවා පමණක් නොව, **<u>උන්වහන්සේ ඒවා අමතක කර දමනසේක</u>.**

**ගීතාවලිය 103:12 :- "නැගෙනහිර බස්නාහිරෙන් දුරව තිබෙන්නාක්මෙන්, <u>උන්වහන්සේ අපේ වරද අපෙන් දුරුකළසේක</u>."**

**යෙසායා 44:22 :- "<u> මම නුඹේ අපරාධ</u> වලාපටලයක් මෙන්ද <u>නුඹේ පාප</u> වලාකුළක් මෙන්ද <u>මකාදැමුවෙමි</u>. මා වෙතට හැරී වරෙන්න ; මක්නිසාද මම නුඹ මිදුවෙමි."**

**මීකා 7:19 :- "උන්වහන්සේ නැවත අපට අනුකම්පා කරනසේක ; අපේ අපරාධ පාගාදමනසේක. <u>ඔබවහන්සේ ඔවුන්ගේ සියලුම පාප මුහුදේ ගැඹුරට හෙළනසේක.</u>"**

**හෙබ්‍රෙව් 10:17:- "උන්වහන්සේ කථාකොට: <u>ඔවුන්ගේ පාපවල් සහ අධර්මිෂ්ඨකම් තවත් සිහි නොකරන්නෙමියි කියනසේක</u>."**

අප විසින් පසුතැවිල්ලෙන් දෙවියන්වහන්සේට කියාදුන් සියලු පව් වලට උන්වහන්සේ කමාවී අමතක කරනසේක. උන්වහන්සේ අමතක කර ඇත්තාවූ අතීත පව් මතකයේ තබාගනිමින්, යක්ෂයාට සහයෝගය නොදෙන්ට තීරණය කරමු.

## (b) අපගේ අතීත අසාර්ථක ප්‍රයත්න අමතක කර දැමීම

අපගේ ජීවිතවල සමහර ප්‍රයත්න අසාර්ථක වීමට හේතු වන්නේ, අපගේම වරදක් නිසා විය හැක. සමහරවිට අප විභාගයකින් සමත්වීමට හෝ සම්මුඛ පරීක්ෂණයකින් සමත්වීමට අපොහොසත් වූයේ අපගේම නොසැලකිල්ල වැනි දෙයක් නිසා විය හැක. මෙවැනි අත්දැකීම් අමතක කිරීම සමහරවිට ඉතා අපහසු වේ.

මෙනමුත් අප නිතර නිතරම ඒවා ගැන සිතමින්, අපටම චෝදනා නගමින් ජීවත්වන්නේ නම්, එය තුළින් සිදුවන්නේ අපගේ හදවතේ සමාදානය නැතිවීමයි. **අපගේ ආත්ම විශ්වාසය පලුදු වීමයි. අපගේ ඉදිරි ගමනට එය බාධාවක් බවට පත්වීමයි.**

මෙවැනි පුද්ගලයින් සමහරවිට ඔබට මුණගැසී ඇතැයි සිතමි. ඔවුන් නිතරම පවසන්නේ, **'අනේ මම එදා මෙසේ නොකලා නම් මට අද මීට වඩා බොහෝ ඉදිරියෙන් සිටින්ට තිබුනා'** වැනි වචන වේ.

දේව දරුව, එම අසාර්ථක ප්‍රයත්න අමතක කරමින්, **'ඔබ අලුත් මැවිල්ලක් බවද, පරණ දේ පහව ගිය බවද විශ්වාස කරමින්' (2 කොරි 5:17)** ඉදිරියට ගමන් කරන්න.

## (c) අපගේ අතීත ඉතා සාර්ථක අත්දැකීම් අමතක කර දැමීම

සමහර කිතුනුවන් පුරුදුව සිටින්නේ, ඔවුන්ගේ අතීත ජයග්‍රහණයන් ගැන නිතරම කථා කිරීමටයි. මේ සම්බන්ධයෙන් මීට බොහෝ සේ අදාල වන්නාවූ කරුණු දෙකක් ඔබ ඉදිරියේ තැබීමට කැමැත්තෙමි.

(i) අපගේ අතීත සාර්ථක අත්දැකීම්, අප වර්තමානයේ මුහුන දෙන අවස්ථාවෙන් අපට ජය ගෙන දෙන්ට යන බව සිතීම, නිවැරදි නොවන නිගමනයක් විය හැක.

(ii) ඉහත සඳහන් අයුරින් කථාකිරීම, නොදැනුවත්වම **අප තුළ උඩඟුකම ඇතිකළ හැක.**

**(d) අතීතයේ අපට සතුට ගෙනදුන්නාවූ වැරදි දේ අමතක කර දැමීම**

අපගෙන් බොහෝ දෙනෙක් අතීතයේදී අපගේ මාංසයේ තෘෂ්ණාවල හැසිරෙමින්, වැරදි දේ මඟින් සතුට ලබා ගැනීමට උත්සාහ කරන්නට ඇත.

**එපීස 2:2,3 :- " [2] පෙර කාලයේ නුඹලා මේ ලෝකයේ ව්‍යවහාරය ලෙසත්, අකීකරුකමේ පුත්‍රයන් තුළ දැන් ක්‍රියාකරන්නාවූ ආත්මය වන ආකාශයේ බලයේ අධිපතියාගේ කැමැත්තේ හැටියටත්, ඒවායින් හැසුරුණාහුය. [3] ඔවුන් අතරේ අප සියල්ලෝද වරක් අපේ මාංසයේ තෘෂ්ණාවල හැසිරෙමින්, මාංසයටත් සිතටත් කැමති දේ කරමින්, ස්වභාවයෙන් අනික් අය මෙන් උදහසේ දරුවෝව සිටියෙමුව."**

මෙසේ අප සැම පෙර කාලයේ සිටියේ **'උදහසේ දරුවන් '** ලෙස වන අතර, යක්ෂයා නිතරම උත්සාහ කරන්නේ, ඒ පැරණි ජීවිතය කරා අප ඇද දැමීමටය.

මිසරයේ වහල්කමින් මුදන ලද්දාවූ ඉශ්‍රායෙල් පුත්‍රයන්, නැවත නැවතත් යක්ෂයාගේ මෙම උපක්‍රමයට අසුවී, දෙවියන්වහන්සේට විරුද්ධව කොඳුළෝය. (කරුණාකර **ගණන් කථාව 11:5,6 ; 20:5 ; 21:5** කියවා බලන්න)

දේව දරුවෙනි, අතීතතයේ අප විසින් යම්කිසි සතුටක්/ තෘප්තියක් ලබා ගත්තාවූ වැරදි දේ අමතක කොට, **'යෙහෝවා යයිරේ' දෙවියන්වහන්සේගේ සැපයීම තුළ තෘප්තිමත් වෙමු.**

**(e) අපගේ අතීත කණගාටු සහිත අත්දැකීම් අමතක කරමු**

(i) ඔබ ගත්තාවූ වැරදි තීරණයක් නිසා, අති විශාල ආර්ථික අලාභයක් ඔබට සිදුවී තිබෙනවාද?

(ii) ඔබ බොහෝසේ විශ්වාස කළාවූ කෙනෙක්, ඔහු විසින් ඔබට දෙන ලද පොරොන්දු කඩා, ඔබගේ බලාපොරොත්තු සුනු විසුනු කර තිබෙනවාද?

දේව දරුවෙනි, මේ සැම දෙයක්ම අමතක කරමු.

ඉහත සඳහන් (i) වැනි දේ නිසා අපගේ සිත්වල කලකිරීම ඇතිවීමට ඉඩ නොහරිමු.

ඉහත සඳහන් (ii) වැනි දේ නිසා අපගේ සිත්වල තිත්තකම සහ වෛරය ඇතිවීමට ඉඩ නොහරිමු.

(f) **අන් අයගේ පාප සහ ඔවුන්ගේ වැරදි අමතක කරමු.**

දේව දරුවෙනි, අප සභාවේ අප සමග නමස්කාර කරන්නන්ගේ ජීවිතවල නොඅනුමානව දුර්වලකම් සහ වැරදි ක්‍රියා කිරීම් අපට පෙනෙන අවස්ථා ඇතිවිය හැක. මෙවැනි අවස්ථාවක අප විසින් ක්‍රියා කළ යුත්තේ කෙසේද කියා සිතා බලන්න.

පහත සඳහන් අයුරින් ක්‍රියා කරන ලෙස ඉතා ආදරයෙන්ද ගෞරවයෙන්ද යටහත්කමින්ද ඔබගෙන් ඉල්ලා සිටීමට කැමැත්තෙමි.

(i) ඔබ එවැනි වරදක්/ දුර්වලකමක් දුටුවේ නම්, එදා පටන් එම සහෝදරයා ගැන යාච්ඤා කරන්න. ඔහුව එම දුර්වලකමෙන් මුදවාගන්න ලෙස දෙවි සමිඳුන්ට මුලු හදවතින් යදින්න.

(ii) ඔහුගේ ක්‍රියාකිරීමේ කිසි වෙනසක් ඔබ නොදකින්නේ නම්, ඔහුට තනිවම ඒ ගැන ආදරයෙන්ද, යටහත්වද, ඉවසීමෙන්ද කථාකිරීමට අවස්ථාවක් දෙවිසමිඳුන්ගෙන් ඉල්ලා සිටින්න.

(iii) දෙවි සමිඳුන්ගේ මඟපෙන්වීම අනුව, යාච්ඤාවෙන් යුක්තව එම සහෝදරයාට කතාකරන්න.

**ගලාති 6:1 :- "සහෝදරයෙනි, මනුෂ්‍යයෙක් යම් වරදකට අසුවුණොත්, ආත්මිකවූ නුඹලා මෘදුකමේ ආත්මයෙන් යුක්තව එබඳු කෙනෙකු හරවා ගනිල්ලා. නුඹත් පරීක්ෂාවට නොපැමිණෙන පිණිස බලාගනින්න."**

**ගලාති 6:1** අනුව ක්‍රියාකර, එම සහෝදරයා දිනාගත් අප, එම සිදුවීම අමතක කර දමමු. ඒ ගැන අන් අයට නොපවසමු.

**දෙවියන්වහන්සේ අපගේ පව්වලට සමාවී, ඒවා අමතක කර දමන්නාසේම, අප අන් අයගේ වරද නිවැරදි කිරීමට ඔවුන්ට උපකාරවී, එය අමතක කර දමමු.**

## 2. <u>තිර අරමුණු ඇතිව ජීවිත ගමනේ යෙදෙමු</u>

කිතුනු ජීවිත ගමන නොහොත් අපගේ දිවීම සාර්ථක කරගැනීම උදෙසා, අපගේ ප්‍රථම පියවර වූයේ අතීතයේ බොහෝ සිදුවීම් අමතක කර දැමීමයි. අප විසින් ගතයුතු දෙවැනි පියවර වන්නේ, ඉතා පැහැදිලිවූ තිරවූ අරමුණු ඇතිකර ගැනීමයි.

මා දැන් අදහස් කරන්නේ **පිලිප්පි 3:12-31** දක්වා සඳහන් වන්නාවූ අරමුණු තුනක් ඔබ ඉදිරියේ තැබීමටයි.

### (a) සම්පූර්ණත්වය කරා යෑම ඉලක්ක කරගැනීම

මෙය ඔබට පැහැදිලිව තේරුම් කරදීම උදෙසා, **පිලිප්පි 3:9-11** ඔබගේ මතකයට නැංවීමට කැමැත්තෙමි.

**පිලිප්පි 3:9-11 :- " [9]...ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරණකොටගෙන, ඇදහිල්ල නිසා දෙවියන්වහන්සේගෙන් පැමිණෙන ධර්මිෂ්ඨකම ඇතුව ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින පිණිසත්, [10] යම් අන්දමකින් මළවුන්ගෙන් නැගිටීමට පැමිණෙන ලෙස, [11] උන්වහන්සේ සහ උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලයත් උන්වහන්සේගේ දුක්වල පංගුකාරකමත් දැනගන්නා පිණිසත්ය."**

මෙම පද තුනෙහි පාවුල් තුමා තුළ තිබුනාවූ අරමුණු කීපයක් සඳහන් වේ. ඒවා නම්,

(i) ඇදහිල්ල කරණකොටගෙන දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ලබා ගැනීම.
(ii) ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටීම (ජීවත්වීම)
(iii) මළවුන්ගෙන් නැගිටීමට පැමිණීම.
(iv) යේසුස්වහන්සේගේ නැවත නැගිටීමේ බලය දැනගැනීම.
(v) යේසුස්වහන්සේගේ දුක්වල පංගුකාරකම දැනගැනීම.

ඉහත සඳහන් තම අරමුණු පහක් පාවුල්තුමා **පිලිප්පි 3:9-11** හි ලියා තිබෙන අතර, ඊලඟ පදයේ එනම් **පිලිප්පි 3:12** හි ඔහු ප්‍රකාශ කරන්නේ, ඔහු එවකට එම අරමුණු සම්පූර්ණ කරගැනීමට අපොහොසත්ව සිටි බවයි.

**පිලිප්පි 3:12 :- "මා දැනටම ලබාගෙන සිටිනවාවත් දැනටම සම්පූර්ණවී සිටිනවාවත් නොවේ......"**

දේව දරුව, මෙය තේරුම් ගන්න. පාවුල්තුමා මේ සෑම අරමුණක් පිළිබඳවම සිටියේ අපට වඩා බොහෝ සේ ඉදිරියෙනි. නමුත් ඔහු තමා සිටි ස්ථානය ගැන සෑහීමකට පත් නොවී සිටි බව පෙනේ. එයට හේතුව වූයේ, ඔහුගේ **ඉලක්කය වූයේ සම්පූර්ණත්වයට පැමිණීම නිසාය.**

❖ මෙහි **'සම්පූර්ණවී සිටීම'** යනුවෙන් අදහස් කරනු ලබන්නේ, අප සෑම **කිසිම වරදක් නොකරන්නාවූ, 'පව් රහිත' අංග සම්පූර්ණ මනුෂ්‍යයෙක් වීම නොවේ.** මෙම පදයෙන් අදහස් කරනු ලබන්නේ, අප සෑම **'ආත්මික මේරීමට' පැමිණිය යුතු බවයි.**

මේ අතර **'ආත්මික මේරීම'** අප වයසින් වැඩිවීම සමඟ ඉබේම සිදුවන දෙයක් නොවන බව අප විසින් තේරුම් ගත යුතුවේ. එබැවින් මා ඔබට යෝජනා කරන්නේ, ඔබගේ ජීවිතයේ **'ආත්මික වර්ධනය'** ඇතිවීම උදෙසා,
(i) දේව වචනය නමැති ආත්මික ආහාර දිනපතාම වළඳන්න.
(ii) ඔබගේ ජීවිතයේ සෑම වැදගත් තීරණයකදී දේව පාමුල බොහෝ කාලය ගත කරන්න. දෙවි සමිඳුන්ගේ පැහැදිලි මඟපෙන්වීමක් ලැබෙන තෙක් රැඳී සිටිමින්, උන්වහන්සේගෙන් ලැබෙන මඟපෙන්වීමට කීකරුව ක්‍රියා කරන්න.

(iii) දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා උන්වහන්සේගේ මිදිවත්තේ සේවයේ යෙදෙන්න කියායි.

(b) **<u>යේසුස්වහන්සේ ඔබව කැඳවාගත්තේ කුමක් උදෙසාද කියා වටහාගෙන එය ඉටුකිරීමට කැපවීම.</u>**

**පිලිප්පි 3:12 :- "....නුමුත් යමක් පිණිස ක්‍රිස්තුස් යේසුස්වහන්සේ මා අල්ලාගත්සේක්ද, ඒක අල්ලාගන්ට වීර්යකරමින් මමත් දුවන්නෙමි."**

මාගේ ප්‍රේමවන්ත සහෝදර සහෝදරියෙනි, දෙවි ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ දරුවන් ලෙස අප තෝරා, කැඳවා, පත්කර ඇති අතර, **උන්වහන්සේ අප සැමදෙනාම කැඳවා ඇත්තේ උන්වහන්සේගේ සේවය උදෙසායි.** මෙසේ අපව කැඳවා ඇත්තාවූ දෙවි සමිඳුන්ට අප සැමදෙනා ගැනම පොදු අරමුණක් සේම, සුවිශේෂ සැලැස්මක්ද ඇතිසේක.

(i) **අප සැමදෙනා ගැනම දෙවියන්වහන්සේගේ පොදු අරමුණ**

සෑම දේව දරුවෙක් ගැනම දෙවියන්වහන්සේගේ පොදු අරමුණ **රෝම 8:29,30** හි සඳහන් වේ.

**රෝම 8:29,30 :- "[29]මක්නිසාද උන්වහන්සේ පූර්වයෙන් ඇඳිනගත්තවුන් තමන්වහන්සේගේ පුත්‍රයා බොහෝ සහෝදරයන් අතරේ කුළුඳුලා වන පිණිස ඒ පුත්‍රයාගේ ස්වරූපයට සමාන වෙන්ට පූර්වයෙන් නියමකළසේක. [30] පූර්වයෙන් නියමකළවුන් උන්වහන්සේ කැඳවාගත්සේක. කැඳවාගත්තවුවන් උන්වහන්සේ ධර්මිෂ්ඨකළසේක. ධර්මිෂ්ඨකළ අය උන්වහන්සේ මහිමයට පැමිණවූසේක."**

මෙම පද දෙක තුළ අප දකින්නේ දේව දරුවන් වන්නාවූ සැමදෙනා ගැනම දෙවියන්වහන්සේගේ පොදු අරමුණයි. එම පොදු අරමුණ පහත සඳහන් පියවර වලින් සමන්විත වේ.

පියවර 1 :- දෙවියන්වහන්සේ පූර්වයෙන් ඔවුන්ව අඳුනාගැනීම **(රෝම 8:29)**

පියවර 2 :- පූර්වයෙන් අඳුනාගත්තවුන් යේසුස් වහන්සේගේ

පියවර 3 :- ස්වරූපට සමානවෙන්ට දෙවියන්වහන්සේ පූර්වයෙන් නියම කිරීම. **(රෝම 8:29)**

පියවර 4 :- පූර්වයෙන් නියමකළවුන් උන්වහන්සේ කැඳවාගැනීම **(රෝම 8:30)**

පියවර 5 :- දෙවියන්වහන්සේ ඔවුන්ව ධර්මිෂ්ඨකිරීම **(රෝම 8:30)**

දෙවියන්වහන්සේ ඔවුන්ව මහිමයට පැමිණවීම **(රෝම 8:30)**

## (ii) අප එකිනෙකා ගැන උන්වහන්සේගේ සුවිශේෂ සැලැස්ම

දෙවියන්වහන්සේට අප ගැන සුවිශේෂ සැලැස්මක් ඇති බව පෙන්නුම් කිරීම උදෙසා, පාවුල්තුමාගේ කැඳවීමේදී යේසුස්වහන්සේ විසින් පාවුල්ට සහ පාවුල් ගැන ප්‍රකාශ කරන ලද වදන් දෙකක් වෙත ඔබගේ අවධානය යොමුකිරීමට කැමැත්තෙමි.

**ක්‍රියා 9:5,6 :- "[5] උන්වහන්සේදඃ මම වනාහි නුඹ පීඩා කරන යේසුස්ය. [6] නුමුත් නැගිට නුවරට ඇතුල් වෙයන්න, <u>නුඹ විසින් කටයුතු දේ නුඹට කියනු ලබන්නේ යයි කීසේක</u>."**

**ක්‍රියා 9:15,16 :- " [15] ස්වාමීන්වහන්සේ ඔහුට කථාකොටඃ පලයන්න, මක්නිසාද <u>ඔහු මාගේ නාමය අන්‍යජාතීන්ද රජුන්ද ඉශ්‍රායෙල් පුත්‍රයන්ද ඉදිරියට ගෙනයන්ට මා විසින් තෝරාගන්නා ලද භාජනයක්ය.</u> [16] ඔහු මාගේ නාමය නිසා කොපමණ දේ විඳින්ට ඕනෑද කියා ඔහුට දක්වන්නෙමියි කීසේක."**

මේ අයුරින් පාවුල් වැනි බලවත් දේව දාසයන් පිළිබඳව දෙවියන්වහන්සේට විශේෂ සැලැස්මක් තිබුනු නමුත්, මෙය අපට අදාල නොවන බව සමහර කිතුනුවන්ට සිතන්ට පුලුවන. මෙය වැරදි මතයක් වන අතර, දේව වචනය පෙන්වා දෙන්නේ සෑම දේව දරුවෙක් උදෙසා දෙවියන්වහන්සේ සැලැස්මක් කලින් සූදානම් කර ඇති බවයි .

**එපීස 2:10 :- ''මක්නිසාද අප වනාහි යහපත් ක්‍රියා කරන පිණිස ක්‍රිස්තුස්යේසුස්වහන්සේ තුළ මවනු ලැබ දෙවියන්වහන්සේගේ කර්මාන්තයව සිටිමුව. ඒ යහපත් ක්‍රියාවල අප හැසිරෙන පිණිස දෙවියන්වහන්සේ ඒවා කලින් සූදානම් කළසේක.''**

දේව දරුවෙනි, අප සැමදෙනා අප උදෙසා දෙවියන් වහන්සේගේ පොදු අරමුණටද සුවිශේෂ සැලැස්මටද අනුකූලවූ ජීවිත ගතකිරීමට කැපවෙමු.

(c) **අප විසින් විනාශවන්නාවූ මනුෂ්‍යයින්ට මුදවා ගැනීම උදෙසා මහත් කැපවීමෙන් ක්‍රියාකළ යුතුවේ**

පාවුල්තුමා, මනුෂ්‍යයන්ව විනාශයෙන් මුදවා ගැනීම උදෙසා මහත් හැඟීමකින් ක්‍රියා කිරීම, **පිලිප්පි 3:18,19** හි අපි දකිමු.

**පිලිප්පි 3:18,19 :- ''18 මක්නිසාද, මා නුඹලාට බොහෝ වරක් කී ලෙසත්, දැනුත් අඬමින් කියන ලෙසත්, බොහෝ දෙනෙක් ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසියට සතුරෝව හැසිරෙති. 19 ඔවුන්ගේ කෙළවර විනාශයය, ඔවුන්ගේ දෙවියෝ බඩය, .... ඔවුන් සලකන්නේ ලෝක දේවල්ය.''**

මෙම වචන අනුව, පාවුල්තුමා හඬමින් නැවත නැවතත් එපීසයේ ඇදහිලිවන්තයන්ව, යක්ෂයාගේ උගුල් වලින් බේරා ගැනීමට දරන උත්සාහය අපට පෙනේ.

දේව දරුවෙනි, අප අවට විනාශයට යන්නාවූ මනුෂ්‍යයන් බොහෝසේ සිටින අතර, අප විසින් අඬමින් ඔවුන් ගැන දෙවියන්වහන්සේට කන්නලව් කිරීම කළ යුතුවේ. අපට අවස්ථාවක් ලැබුනු විට ශුභාරංචිය ඔවුන්ට ප්‍රකාශ කළ යුතුවේ. ඔවුන් ඉදිරියේ ආදර්ශමත් කිතුනු ජීවිත අප විසින් ගතකිරීම අනිවාර්‍යය වේ.

## 3. අප මෙසේ ජීවත් විය යුත්තේ මන්ද?

**පිලිප්පි 3:14** හි සඳහන් ආකාරයට **'දෙවියන්වහන්සේගේ උතුම් කැඳවීමේ දිනුම පිණිස දිනුම්පළ කරා'** දිව යුත්තේ මන්ද? යන ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් හේතු කිහිපයක් ඔබ ඉදිරියේ තැබීමට අදහස් කරමි.

## (i) අපගේ නාගරිකත්වය ස්වර්ගයෙහි නිසා (පිලි 3:20)

පාවුල්තුමා මෙහි **'අපගේ නාගරිකත්වය ස්වර්ගයෙහි '** වන බව ප්‍රකාශ කරන අතර, **' අපගේ '** යනුවෙන් අදහස්කරනු ලබන්නේ කවුරුන්ද? යන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරක් සැපයීම ඉතා වැදගත් වේ.

නිසැකවම **' අපගේ '** යනුවෙන් අදහස් කරනු ලබන්නේ, **අලුතෙන්** (ආත්මිකව) **උපන්නාවූ, (යොහන් 3:3,5) දේවදරුකම ලැබූ, (යොහන් 1:12) ක්‍රිස්තුස්වහන්සේ තුල සිටින්නාවූ (2 කොරි 5:17)** අය වෙති. එබැවින් ඔබ මේ ගණයට අයිතිවන අය බව තහවුරු කරගන්නා මෙන්, ඉතා ඕනෑකමින් ඔබගෙන් ඉල්ලා සිටීමට කැමැත්තෙමි.

## (i) අපගේ නාගරිකත්වය ස්වර්ගයෙහි නිසා - (පිලි 3:20)

මේ සම්බන්ධයෙන් යේසුස්වහන්සේ තම ගෝලයන් උදෙසා කළාවූ යාච්ඤාවේ වදන් සමහරක් ඔබ ඉදිරියේ පහත සඳහන් කරමි.

**යොහන් 17:14 :- "....මා ලෝකයාට අයිති නැති ලෙසම, ඔවුනුත් ලෝකයාට අයිති නැති නිසා ලෝකයා ඔවුන්ට වෛර වුණෝය."**

**යොහන් 17:16:- " මා ලෝකයෙන් නොවන්නාක් මෙන්ම ඔව්හුද ලෝකයෙන් නොවෙති."**

දේව දරුව, **ඔබගේ නම ස්වර්ගයෙහි ලියැවී තිබේ. (ලූක් 10:20)** දේව දරුවෙනි, ස්වර්ගයෙහි පුරවැසියන් වන අපි, කෙටි කාලයකට මෙලොව ජීවත්වන අතර, යේසුස්වහන්සේ අනුශාසනා කළාක් මෙන්, **'ස්වර්ගයේ වස්තු රැස්කරමු.' (මතෙව් 6:20,21)**

(ii) **යේසුස්වහන්සේ නැවත පැමිණ, අපව ස්වර්ගයට ගෙන යෑමට සැදීපැහැදී සිටින නිසා (යොහන් 14:2,3)**

**යොහන් 14:2,3 :- "[2].....මාගේ පියාණන්වහන්සේගේ ගෘහයෙහි බොහෝ වාසස්ථාන ඇත්තේය ;.... මක්නිසාද නුඹලාට ස්ථානයක් පිළියෙල කරන පිණිස යමි. [3] මම ගොස් නුඹලාට ස්ථානයක් පිළියෙල කරම් නම්, මා සිටින තැන නුඹලාත් සිටින පිණිස මම නැවත ඇවිත් නුඹලා මා ළඟට ගන්නෙමි."**

(iii) **ස්වර්ගයේ විසීම උදෙසා දෙවියන්වහන්සේ අපට තේජසේ ශරීර ලැබෙන්ට සලස්වන නිසා (පිලි 3:21)**

**පිලිප්පි 3:21 :- "......උන්වහන්සේ අපේ පහත්කමේ ශරීර තමන්වහන්සේගේ තේජසේ ශරීරයට සමානවන පිණිස ඒවා වෙනස්කරනවා ඇත."**

අපගේ ශරීර කෙතරම් දුබලද, විවිධ හේතූන් නිසා කෙතරම් වේදනා විඳිනවාද කියා අප සැම නිතර අත්දකින්නෙමු. නමුත් අපගේ දෙවියන්වහන්සේ අපගේ **'පහත්කමේ ශරීර'** තේජස් භාවයට වෙනස් කරන සේක.

**1 කොරි 15:52,53 :- "[52] ඇසි පිය හෙළන ක්ෂණයකින්, අප සියල්ලෝම වෙනස්කරනු ලබන්නෙමුව. මක්නිසාද හොරණෑව පිඹිනු ලබන්නේය, එකල මළාහු නොදිරන ස්වභාවයෙන් යුක්තව නැගුටුවනු ලබන්නෝය, අපිද වෙනස්කරනු ලබන්නෙමුව, [53] මක්නිසාද දිරන සුලුවූ මේක නොදිරන බවට පැමිණෙන්ට ඕනෑය, මරණීයවූ මේක අමරණ භාවයට පැමිණෙන්ට ඕනෑය."**

(iv) **දිනුම්පළ කරා දුවන අයට තිළින ලැබෙන්ට යන නිසා (පිලි 3:14)**

මෙසේ අප තිළිණ ලබන්ට යන බව, **පිලි 3:14** හි සෘජුවම සඳහන් කර නොමැති නමුත්, **'දෙවියන්වහන්සේගේ උතුම් කැඳවීමේ දිනුම පිණිස' (පිලි 3:14)** තුළින් එය පෙන්නුම් කරයි. තවද **2 කොරි 5:10** පෙන්වා දෙන්නේ, අප සැම ක්‍රිස්තුස්වහන්සේගේ විනිශ්චාසනය ඉදිරියෙහි ප්‍රකාශවෙන්ට

අවශ්‍ය වන අතර, **1 කොරි 3:11-15 දක්වා** පෙන්නුම් කරන්නේ, අප අපගේ කිතුනු ජීවිත යේසුස් ක්‍රිස්තුස්වහන්සේ යන අත්තිවාරම මත ගොඩනගන ආකාරය අනුව, **අප තිළින නොහොත් විපාක ලබන්ට යන බවයි.**

(v)**අප සදාකාලේටම රජකම් කරන්ට යන නිසා (එළිදරව් 22:5)**

**එළිදරව් 22:5:- " එහි රාත්‍රියක් තවත් නොවන්නේය. පහන් ආලෝකයවත් සූර්යාලෝකයවත් ඔවුන්ට ඕනෑ නැත;මක්නිසාද ස්වාමීවූ දෙවියන්වහන්සේ ඔවුන්ට ආලෝකය දෙනසේක. ඔව්හු සදාකාලේටම රජකම් කරන්නෝය."**

මාගේ ප්‍රේමවන්ත සහෝදර සහෝදරියනි, කිතුනු ජීවිත ගමන දිවීමේ තරඟයකට සමාන කිරීම, නව ගිවිසුමේ නොයෙක් තැන්වල සඳහන් වී ඇත. ඒවායින් එකක් දෙස බලමු.

**2 තිමෝති 4:7,8:- " [7] මම යහපත් යුද්ධයෙහි යුද්ධ කළෙමි, මම දිවීම කෙළවර කළෙමි, මම ඇදහිල්ල රක්ෂාකළෙමි. [8]මෙතැන් පටන් ධර්මිෂ්ඨකමේ ඔටුන්න මට තබා තිබේ, එය ධර්මිෂ්ඨ විනිශ්චයකාරවූ ස්වාමීන්වහන්සේ ඒ දවසේදී මට දෙනවා ඇත. මට පමණක් නොවේ, උන්වහන්සේගේ ප්‍රකාශවීමට ආශාව සිටින්නාවූ සියල්ලන්ටද දෙනවා ඇත.**

**'සියලු බරද පහසුවෙන් අප අසුකරන පාපයද අහක දමා, ඇදහිල්ලේ කතෘවරයාද සම්පූර්ණකරන්නාදවූ යේසුස්වහන්සේ දෙසම බලමින්, අප ඉදිරියෙහි තබා තිබෙන දිවීම ඉවසිල්ලෙන් දුවමු. (හෙබ්‍රෙව් 12:1)**

අප ඉදිරියේ ඇත්තාවූ මේ ඉමහත් පොරොන්දු ලබාගැනීම උදෙසා, අප සැමදෙන,මේ අධ්‍යයනය තුළින් අප ඉගෙනගත් ආකාරයට, පාවුල්තුමා මෙන් අප සැමද, ඇදහිල්ලෙන්, ඉවසිල්ලෙන් සහ විශ්වාසවන්තව, අප ඉදිරියේ තිබෙන්නාවූ දිවීම සම්පූර්ණ කරමු.

**එසේ කිරීමට දෙවියන්වහන්සේ**

**ඔබ සැමට පිහිටවනසේක්වා!!!**

# දෙවියන්වහන්සේගේ සමාදානය
# අත්දැකීම



## පිලිප්පි අධ්‍යයනය 11

# දෙවියන්වහන්සේගේ සමාදානය අත්දැකීම

## පිලිප්පි 4:1-9

**<u>හැඳින්වීම</u>:-**

වර්තමාන ලෝකය දෙස විමසිල්ලෙන් බලන අපට පෙනීයන්නේ, දේව වචනය අනුව අපගේ ලෝකය ඉතා සීග්‍රයෙන් විනාශය කරා ලංවෙමින් පවතින බවයි. මා මෙසේ ප්‍රකාශකරන්නේ මන්ද කියා ඔබට පෙන්වාදීම උදෙසා **ලූක් 21:5-33 දක්වා** සඳහන් වන්නාවූ **'අන්තිම කාලයේ '** එක් ලකුණක් වෙත ඔබගේ අවධානය මොහොතකට යොමුකිරීමට කැමැත්තෙමි.

**ලූක් 21:25 :- ''.....<u>මුහුදෙන් රැළ ගැසීමෙත් ඝෝෂාව නිසා</u> වන වියවුලින් පොළොවේ ජාතීන්ට දුක්වේදනාද වන්නේය.''**

යේසුස්වහන්සේ ප්‍රකාශ කළාවූ මේ වචන, බොහෝ කිතුනුවන් එක් වතාවක් හෝ කියවා ඇති අතර, ඔවුන් අතරෙන් කී දෙනෙක්, එම වචන වෙත අවධානයක් යොමුකරන්නට ඇත්ද? කියා සිතා බලන්න. මෙනමුත් 2004 වසරේ, දෙසැම්බර් මාසයේ 26 වැනිදා ලංකාවට පැමිණි **'සුනාමියෙන් '** පසු බොහෝ කිතුනුවන් මෙම සිදුවීම සහ **ලූක් 21:25** හි සඳහන් වචන අතර සම්බන්ධකමක් තිබිය හැකි බව තේරුම් ගත්හ.

එපමණක් නොව, මුහුද අසබඩ වෙසෙන ජනතාව වෙත **'ඉන්දියානු සාගරයේ පතුලේ භූමි කම්පාවක් සිදුවී තිබේ.'** වැනි පුවතක් අද ගෙන එන්නේ, අපට සිතා ගත නොහැකි තරම් සිත් කැළඹීමක් සහ භයක් වන අතර, මෙය ගැන යේසුස්වහන්සේ **ලූක් 21:26** හි සඳහන් කළසේක.

**ලූක් 21:26:- ''.....ලෝකයට පැමිණෙන්නාවූ දේ බලාපොරොත්තුව සිටීමෙනුත් මනුෂ්‍යයන්ගේ සිත් ක්ලාන්ත වන්නේය.''**

ලෝකාන්තිමය ලංවෙමින් තිබෙන මේ කාලයේ, එනම් වර්තමානයේ වෙසෙන මනුෂ්‍යයාට, අනපේක්ෂිත අනාගතයක්

නිසා, ආර්ථික පිරිහීම් නිසා, පරිසර දූෂණය නිසා, **'ඩෙංගු'** වැනි රෝගවල අධික වර්ධනය නිසා, සහ වෙනත් බොහෝ දුෂ්කරතාවයන් නිසා, **'සිත් සමාදානය'** බොහෝසේ අඩුවී තිබෙන බව අපට නිරීක්ෂණය කළ හැකිවේ.

මේ අතර **පිලිප්පි 4:7** අපට පෙන්වා දෙන්නේ, කිතුනු අපට ඕනෑම ස්ථානයක, ඕනෑම අවස්ථාවක, **'දෙවියන්වහන්සේගේ සමාදානය'** අත්දකිමින් ජීවත්විය හැකි බවයි.

දේව දරුවෙනි, අප සැම මෙම පොරොන්දුව අපගේම කර ගනිමින්, **'නොකැළඹී, කරදර නොවී'** ජීවත්වෙමු. සැම මනුෂ්‍යයෙකුටම, මෙම ජීවිත ගමනේ විවිධ ප්‍රශ්න සහ ගැටළු වලට මුහුණදීමට සිදුවන අතර, දේව දරුවන් වන අපට, **'ප්‍රශ්න ඇති නමුත් කරදර නොමැති බව'** තේරුම් ගනිමු.

**<u>අධ්‍යයනය :-</u>**

**<u>දෙවියන්වහන්සේගේ සමාදානය අත්දැකීම</u>**

**1. <u>ස්වාමීන්වහන්සේ තුළ සිටින අය අතර සම්බන්ධකම් (පිලි4:1-3)</u>**

(a) **පිලි 4:1 :- "එහෙයින් මාගේ ප්‍රේමවන්තවූ, මා ඉතා ඇලුම් වෙන්නාවූ සහෝදරයෙනි, මාගේ ප්‍රීතියත් ඔටුන්නත්වූ මාගේ ප්‍රේමවන්තයෙනි, මෙසේ ස්වාමීන්වහන්සේ තුළ ස්ථිරව සිටපල්ලා."**

පාවුල්තුමා මෙසේ අමතන්නේ පිලිප්පි සභාවේ ඇදහිලිවන්තයන්ට වන අතර, ඔහු ඔවුන් සැමදෙනා තමා විසින් සලකනු ලැබූ අන්දම තේරුම් කිරීම උදෙසා විස්තර හයක් යොදා ගනියි. ඒවා නම්.

(i) **මාගේ ප්‍රේමවන්තවූ**
(ii) **මා ඉතා ඇලුම්වෙන්නාවූ**
(iii) **(මාගේ) සහෝදරයෙනි**
(iv) **මාගේ ප්‍රීතිය වන්නාවූ (ප්‍රේමවන්තයෙනි)**
(v) **මාගේ ඔටුන්න වන්නාවූ (ප්‍රේමවන්තයෙනි)**
(vi) **(මාගේ) ප්‍රේමවන්තයෙනි**

මෙතරම් ආදරයකින්, බැඳීමකින්, ප්‍රේමයකින් පාවුල්තුමා පිලිප්පියේ ඇදහිලිවන්තයන්ව සලකන අතර, අප නමස්කාර කරන්නාවූ සභාවන්හි ඇදහිලිවන්තයන් අතර ඇති සම්බන්ධකම් වල ඇති අඩුපාඩු ඔබ සැමට පෙනේ යයි සිතමි.

පාවුල්තුමා මෙලෙස සභාවේ සැම අමතමින්, ඔවුන්ගෙන් ඉල්ලා සිටින්නේ, **'ස්වාමීන්වහන්සේ තුළ ස්ථිරව '** සිටින ලෙසයි. දේව දරුවෙනි, අප සැම අප තුළ ඇති නොයෙක් අඩුපාඩු වලින් ජයගෙන, සභාව තුළ ප්‍රේමයෙන් එකට බැඳී සිටීමට උත්සාහ කරමු.

**රෝම 12:10 :- "සහෝදර ප්‍රේමයෙන් එකිනෙකාට ස්නේහ වෙයල්ලා ; ගෞරවයෙන් තම තමාට වඩා අනික් අය උතුම් කොට සලකාපල්ලා ;"**

**1 තෙසලෝනික 4:9 :- "එහෙත් සහෝදර ප්‍රේමය ගැන නම් නුඹලාට ලියන්ට වුවමනා නැත. මක්නිසාද එකිනෙකාට ප්‍රේමකරන්ට නුඹලාම දෙවියන්වහන්සේගෙන් ඉගෙනගෙන සිටින්නහුය."**

(b) **පිලි 4:2:- "ස්වාමීන්වහන්සේ තුළ එක්සිත්වෙනමෙන් එවෝදියාගෙන් ඉල්ලමි, සින්තිකීගෙන්ද ඉල්ලමි."**

මෙම පදයෙන් අපට පෙනීයන්නේ, පාවුල් සභාවේ ඇදහිලිවන්තයින් සැමදෙනාට මහත් ආදරයකින් සහ සහෝදර ප්‍රේමයෙන් බැඳී සිටි නමුත්, පිලිප්පි සභාවට අයිතිවූද, **'පාවුල් සහ ඔහුගේ අනික් හවුල් සේවකයන් සමඟ ශුභාරංචි සේවයේ යෙදුනු එවෝදියා සහ සින්තිකී යන ස්ත්‍රීන් දෙදෙනා' (පිලි 4:2,3)** අතර අසමගියක් ඇතිවී තිබුනු බවයි.

මෙවැනි කණගාටු සහිත තත්වයන් පිලිප්පි සභාවේ මෙන්ම අපගේ ප්‍රාදේශීය සභාවන් වලද අපට බොහෝවිට දකින්ට ලැබෙන බැවින් මෙවැනි දේවලට හේතුව කුමක්ද කියා විමසා බැලීම වැදගත් යයි සිතමි.

- **එවෝදියා සහ සින්තිකී අතර තිබුනාවූ අසමගිය**

-ඔවුන් දෙදෙනාම **'ගැළවීම ලබා තිබුනාවූ'** සහෝදරියන් වූහ. මෙය **'ඔවුන්ගේ නාම ජීවන-පොතෙහි තිබේ' (පිලි 4:3)** යන වචන වලින් සනාථ වේ.
-ඔවුන් දෙදෙනාම සභාවේ ශුභාරංචි සේවයේ යෙදුනාවූ ස්ත්‍රීන් විය.

ඉහත සඳහන් කරුණු දෙක නිවැරදි බව අප දන්නා අතර, ඔවුන්ගේ අසමගියට තුඩුදුන් හේතු කවරේද කියා අප නොදනිමු. මෙනමුත් මෙවැනි අසමගිය ඇතිවීමට බොහෝවිට මූලික හේතුවක් වන්නේ, දේව දරුවන් තුළ ඇත්තාවූ වැරදි ආකල්ප කියා නිගමනය කිරීම නිවැරදියයි සිතමි. එබැවින් **'දේව සේවය'** ගැන නිවැරදි අදහස් කිහිපයක් ඔබ ඉදිරියේ තබමි.

- සෑම දේව දරුවෙක්ම දෙවියන්වහන්සේ කැඳවන්නේ, උන්වහන්සේගේ සේවයට වන අතර, සැමවිටම එම සේවය තුළින් සිදුවිය යුත්තේ, **උන්වහන්සේගේ නාමය ගෞරවයට සහ මහිමයට පත්කිරීමයි.**

එබැවින් සේවයේ යෙදෙන අප සැමවිටම කළයුත්තේ, අප වෙත අවධානය/ප්‍රශංසාව/පිළිගැනීම වැනි දේ, මනුෂ්‍යයන් යොමුකළහොත්, එවැනි දේ ගැන **අපට නොව දෙවි සමිඳුන්ට තුති ප්‍රශංසා පුදන ලෙස,** ඔවුන්ගෙන් අවංකවද යටහත්වද ඉල්ලීමයි.

- දෙවියන්වහන්සේ අපට දුන්නාවූ සේවය අප විසින් යාච්ඤාවෙන්ද, ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟපෙන්වීම අනුවද, විශ්වාසවන්තවද කළ යුතු අතර, අපගේ සේවයේ **ඵල ලබා දෙන්නේ දෙවියන්වහන්සේය.** අප කිසිකෙනෙකුට, අපගේ උත්සාහයෙන් පමණක් කිසිවිටක ඵල ලබා ගත නොහැකි වේ. එබැවින් ඔබගේ හැකියාව/කැපවීම/දක්ෂකම නිසා, ඔබ යහපත් ඵල ලබන බවට සිතුවිලි ඔබ තුළ ඇතිවේනම්, **ප්‍රවේසම් වන්න. මෙම සිතුවිලි සතුරා ඔබ වෙත ගෙනෙන පරීක්ෂාවක් විය හැකි බව තේරුම් ගන්න.**

- **දෙවියන්වහන්සේ උදෙසා අප කරන්නාවූ සේවය, කිසිවිටක අන් දේව දරුවන් කරන්නාවූ සේවය සහ අපට දෙවියන්වහන්සේ ලබා දුන්නාවූ සේවය අතර තරඟයක් නොවේ. එය දේව දරුවන් විසින් එකඟතාවෙන් සහ සහයෝගයෙන් කරන්නාවූ සේවයක්/ සේවාවන් විය යුතුවේ.**

දේව දරුවෙනි, දෙවියන්වහන්සේ ඔබව කැඳවා ඇත්තේ, උන්වහන්සේ ඔබට ලබා දුන් සේවය, ඇදහිල්ලෙන්ද විශ්වාසවන්තවද ඉටු කිරීමටයි. උන්වහන්සේ ඔබව කැඳවා ඇත්තේ, ඔබ කරන්නාවූ සේවය උන්වහන්සේගේ කැමැත්ත අනුව ඉටුකිරීමටයි.

මේ අතර වෙන කෙනෙකුගේ සේවය විවේචනය කිරීමට, අවතක්සේරු කිරීමට, ඊර්ෂ්‍යා කිරීමට ඔබව පොළඹවන්නේ යක්ෂයායි. **යක්ෂයාට විරුද්ධව සිට, ඌව පලවා හරින්න.**

මාගේ ප්‍රේමවන්ත සහෝදර සහෝදරියෙනි, ඉහත සඳහන් කරුණු, අප සැමදෙන අවිවාදයෙන් පිළිගන්නා නමුත්, වර්තමානයේ තරඟකාරීකම, හෙලා දැකීම, බරපතල විවේචන, ඊර්ෂ්‍යාව, අසමගිය සහ වෛරය පවා සභාවන් තුළ ඇතිවන්නේ මන්ද? එයට විසඳුම කුමක්ද? වැනි ප්‍රශ්න ගැන ඔබ ගැඹුරට මෙනෙහි කර නොමැති බව සිතමි.

එබැවින් මෙය ගැන, මාගේ එක සිතුවිල්ලක් ඔබ ඉදිරියේ තබන්නේ, එමගින් අප සභාවන් තුළ මෙම තත්වය අවම කරගැනීමට, එය ඉවහල් වේය යන බලාපොරොත්තුවෙනි. මාගේ අදහස නම්,

- වර්තමාන අධ්‍යාපනය ඉතා බාල වයසේදීම කුඩා ළමුන්ට උගන්වන්නේ, අධික තරඟකාරීකමයි. පස්වන ශ්‍රේණිය උදෙසා පැවැත්වෙන් **'ශිෂ්‍යත්ව විභාගය'** අපට මෙය එමට පෙන්වාදෙයි.
- මේ අතර දෙවියන්වහන්සේගේ වචනය අපට උගන්වන්නේ **'සහයෝගයේ සහ ප්‍රේමයේ මාර්ගයයි.'**
- එබැවින් කිතුනු සභාව විසින් කළ යුත්තේ, අපගේ සබත් පාසැල් තුළින්, කුඩා වය සේ පටන් දරුවන්ට **'සහයෝගයෙන් එකට ක්‍රියාකිරීමට ඉගැන්වීමයි.'**

දේව දරුවෙනි, අපගේ සභාවල්වල තරඟකාරීකම ගොඩනගන්නාවූ දේ අවම කරමින් කුඩා දරු දැරියන්ට අපගේ සබත් පාසැල්වලදී,

- **එකිනෙකාට උපකාර වීමට ,**
- **එකිනෙකා අගය කිරීමට ,**
- **එක්සත්ව, එක්සිත්ව, සහයෝගයෙන් ක්‍රියා කිරීමට,**
- **නැති බැරි අයට දීමට,**
- **දුර්වල අය ශක්තිමත් කිරීමට,**
- **සැමදෙනාට ගෞරව කිරීමට,**

උගන්වමින්, මේ සියල්ල ගැන, සභාවේ වැඩිහිටි සැමදෙන ආදර්ශමත් ජීවිත ගත කිරීමට යාච්ඤාවෙන් කැපවෙමු.

## 2. ස්වාමීන්වහන්සේ තුළ සිටින අයගේ ප්‍රීතිය (පිලි 4:4)

**පිලිප්පි 4:4:-" ස්වාමීන්වහන්සේ තුළ නිතරම ප්‍රීති වෙයල්ලා. ප්‍රිති වෙයල්ලා යයි නැවතත් කියමි."**

මෙම පදය සෑම කිතුනුවෙක්ම පාහේ නිතරම අසන්නාවූ පදයක් වන අතර, **'ප්‍රීතිවෙමු සමිඳුන් තුළ, නැවතත් ප්‍රීතිවෙමු'** යන කෙටි ගීතිකාව, ඉතා උද්යෝගයෙන් ගැයීමට අප බොහෝ දෙනෙක් පුරුදුව සිටිමු.

මේ අතර පාවුල්තුමා මෙසේ **පිලිප්පි 4:4** හි සඳහන් කරන්නාවූ වචනවල අරුත වඩා අර්ථවත්ව හඳුනා ගැනීම පිණිස, ඊට ප්‍රථමයෙන් ඔහු සඳහන් කර ඇති වචන දෙසද බැලීම ප්‍රායෝගික වේ යයි සිතමි.

මෙය උදෙසා **පිලිප්පි 4:3** දෙස බලන අතර, අප දකින්නේ එහි අන්තිම වචන වන්නේ, **'ඔවුන්ගේ නාම ජීවන පොතෙහි තිබේ.'** යන බවයි. මේ අතර මෙහි **'ඔවුන්ගේ නාම'** ලෙස සඳහන් කරන නම් ලැයිස්තුවට එවෝදියා සහ සින්තිකීගේ නම් ඇතුළත් වන බව අප මීට ප්‍රථමයෙන්ද සඳහන් කෙළෙමු.

දේව දරුවෙනි, අප අද කියැවීමට පුරුදු සෑම බයිබලයකම, දේව වචනය **'පද අනුව'** වෙන් කිරීම අප දකින නමුත්, මෙම පද වෙන්කිරීම පසුකාලයේ යොදාගන්නා ලද ඒවා මිස

**'පරිච්ඡේද සහ පද වලට වෙන්කිරීම'** මුල් ලියැවිලිවල නොතිබුනි.

එබැවින් **පිලි 4:3,4** ලෙස අප කියවන වචන මුල් ලියැවිලි වල ලියා තිබෙන්නේ, **'ඔවුන්ගේ නාම ජීවන පොතෙහි තිබේ. ස්වාමීන්වහන්සේ තුළ ප්‍රීති වෙයල්ලා .....'** ලෙස පද වෙන්කිරීමක් නොමැතිවයි.

එමනිසා පාවුල්තුමා, එදා පිලිප්පියේ සභාවටද, අද අපටද අනුශාසනා කරන්නේ, පහත සඳහන් ලෙස සේවයේ යෙදීමට වන බව නිවැරදි විය හැකියයි සිතමි.

- **කිතුනුවාගේ ප්‍රීතියේ උල්පත වන්නේ ස්වාමීන්වහන්සේ වන අතර, අපගේ ප්‍රීතිය රඳා පවතින්නේ උන්වහන්සේ තුළයි.**
- **උන්වහන්සේ තුළ අපට බොහෝ ආශිර්වාද ලැබෙන අතර, උන්වහන්සේ තුළ සිටින්නවුන්ගේ නම් ජීවන-පොතෙහි ලියා තිබේ**
- **එබැවින් නිතරම උන්වහන්සේට තුති පුදමින් ප්‍රීතියෙන් යුක්තව ජීවත්වෙන්න.**
- දෙවියන්වහන්සේගේ සේවයේ අප යෙදෙන අතර, අප තුළ තෘප්තියක්/සතුටක් ඇති වන නමුත්, **ස්වාමීන්වහන්සේ තුළ ඇත්තාවූ ප්‍රීතිය ඊට වඩා අනර්ඝ වේ.**
- එම සේවය අපගේ ප්‍රීතියේ මාර්ගය බවට පත්වීම ඉතා අනතුරු සහිත වේ. එසේ වන්නේ, අන් අයගේ සේවය පරදවා යෑමට පැමිණෙන පරීක්ෂාව හෙයිනි.

එබැවින් දෙවියන්වහන්සේ අපට ලබාදී ඇති සේවය තුළ අප යම්කිසි තෘප්තියක්/සතුටක් ලැබීම කිසිසේත් වැරදි නොවන නමුත්, **ස්වාමීන්වහන්සේ තුළ ප්‍රීතිවීමට අපගේ ජීවිතවල ඊට වඩා ප්‍රමුඛතාවයක් දිය යුතුවේ.**

දේව දරුවෙනි, මෙය තේරුම් ගන්න. අපගේ සේවය තුළින් ලැබෙන්නාවූ සතුට දිනෙන් දින වෙනස්වේ. සමහර දිනවල අප අධෛර්යයට / පසුබටවීමට / කලකිරීමට පවා පත්විය හැක. **නමුත් ස්වාමීන්වහන්සේ තුළ ඇත්තාවූ ප්‍රීතිය තිරවේ. නොවෙනස් වේ. උන්වහන්සේ නොවෙනස්වන බැවින්ද, උන්වහන්සේ කිසිදිනක අපව අත්නොහරින බැවින්ද,**

**උන්වහන්සේ තුළ ඇත්තාවූ ප්‍රීතිය සදාකාලිකවේ. !!!**

❖ ඉහත සඳහන් ඉගැන්වීමේ වැදගත්කම නිසා, එයට අදාලවන්නාවූ, යේසුස්වහන්සේගේ ප්‍රකාශනයක් ඔබ ඉදිරියේ තබමි.

**ලූක් 10:20 :- " එසේ වුවත් ආත්මයන් නුඹලාට යටත්වන නිසා නොව <u>නුඹලාගේ නාම ස්වර්ගයෙහි ලියා තිබෙන නිසා ප්‍රීතිවෙයල්ලා යයි කීසේක</u>."**

**ලූක් 10:1-20** දක්වා සඳහන් වන්නේ, යේසුස්වහන්සේ තමන්වහන්සේගේ ගෝලයන් 70 දෙනෙක් ශුභාරංචි සේවය උදෙසා පිටත්කර යැවීමත්, ඔවුන් ඉන්පසු යේසුස්වහන්සේ වෙත පැමිණ ඔවුන්ගේ අත්දැකීම් බෙදාගැනීමත් වේ. මෙසේ යේසුස්වහන්සේ වෙත පැමිණි 70 දෙනා ප්‍රකාශ කළදේ දෙස බලමු.

**ලූක් 10:17 :- " ඉන්පසු සැත්තෑදෙනා ප්‍රීතියෙන් හැරී ඇවිත් : ස්වාමිනී, ඔබගේ නාමය නිසා යක්ෂයෝ පවා අපට යටත්වෙතියි කීවෝය."**

මෙසේ ඔවුන් ලබා තිබුනාවූ දේව බලය ගැන මෙම ගෝලයන් අතිශයින් ප්‍රීතිවුණු අතර, යේසුස්වහන්සේ ඔවුන්ට පවසන්නේ, එය ගැන නොව, **'නුඹලාගේ නාම ස්වර්ගයෙහි ලියා තිබෙන නිසා ප්‍රීතිවෙයල්ලා'** කියායි.

මාගේ ප්‍රේමවන්ත සහෝදර සහෝදරියෙනි, දේව දරුවන් වන්නාවූ අපගෙන් බොහෝ දෙනෙක් **'දේව බලයෙන් යුක්තව'** සේවය කිරීමට ආසා කරන්නෙමු. මෙය ඉතා හොඳ දෙයකි. මෙනමුත් අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේ අපට **ලූක් 10:20** මඟින් උගන්වන්නේ, **'දේව බලය ලැබීමට වඩා, යේසුස්වහන්සේ තුළ ජීවත්වීමට ඔබගේ ජීවිතයේ ප්‍රමුඛත්වය දෙන්න'** කියායි.

ස්වර්ගයෙහි නැතහොත් ජීවන-පොතෙහි නම් ලියැවී තිබෙන්නේ, දෙවියන්වහන්සේගේ පවුලට අයිතිවන්නාවූ අයගේය. එනම් දේව දරුකම ලබා ඇත්තාවූ, සදාකාල ජීවනය ලබා ඇත්තාවූ, අලුතෙන් ඉපිද ඇත්තාවූ, ගැළවීම ලබා ඇත්තාවූ,

ස්වර්ගයෙහි පුරවැසිකම ලබා ඇත්තාවූ, ස්වාමීන්වහන්සේ තුළ සිටින්නාවූ අප සැමගේය.

එබැවින් දේව දරුවන් වන අප සැම උන්වහන්සේගේ බලයෙන් යුක්තව ශුභාරංචි සේවයේ යෙදෙන්ට කැපවෙන අතර, **ස්වාමීන්වහන්සේ තුළ ස්ථිරව රැඳී සිටින්ට, ඊටත් වඩා කැපවෙමු. (පිලි 4:1) එසේ සිටිමින් නිතරම ස්වාමීන්වහන්සේ තුළ ප්‍රීතිය අත්දකිමු.**

## 3. ස්වාමීන්වහන්සේ තුළ අප ලබන සමාදානය (පිලි 4:6,7)

**පිලි 4:6,7 :- "[6]නුඹලා කිසිවක් ගැන කණගාටු නොසිතා, සියල්ලෙහිදී ස්තූතිදීම සමග යාච්ඤාවෙන්ද කන්නලව්වෙන්ද නුඹලාගේ ඉල්ලීම් දෙවියන්වහන්සේට දන්වාපල්ලා. [7] එවිට කිසි නුවණකින් දැනගත නොහැකිවූ දෙවියන්වහන්සේගේ සමාදානය ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ නුඹලාගේ සිත්ද (a) සිතිවිලිද ආරක්ෂා කරනවා ඇත."**

### නුඹලා කිසිවක් ගැන කණගාටු නොවී

සිංහල පරිවර්තනයේ '**කණගාටු නොවී**' ලෙස සඳහන් කර ඇති වචන ඉංග්‍රීසි පරිවර්තනයේ සඳහන් වන්නේ, ' do not be anxious ' (NIV) කියායි. එහි අර්ථය වන්නේ '**කරදර නොවී**' යන්නයි.

එබැවින් දෙවියන්වහන්සේගේ සමාදානය අත්දැකීම උදෙසා අප විසින් ගත යුතු ප්‍රථම පියවර වන්නේ, **කිසිවක් ගැන කරදර නොවීමයි.**

❖ **බොහෝ මනුෂ්‍යයන් කරදර වන්නාවූ දේවල් සමහරක් වන්නේ,**
- දරුවන්ගේ අධ්‍යාපනය
- දරුවන් කිරීමට යන්නාවූ රැකියාවන්
- දරුවන් ඇතුල්වීමට යන්නාවූ විවාහයන්
- තමාගේ රැකියාවේ උසස්වීම්
- තමාගේ සහ පවුලේ අයගේ සෞඛ්‍යය
- වාහනයක් ගැනීම
- තමාගේ ණයවලින් නිදහස්වීම, සහ වෙනත් ඒ ආකාර දේවලුයි

නමුත් දෙවියන්වහන්සේ කිතුනුවූ අපට පවසන්නේ,

කිසිවක් ගැන කරදර නොවන්න කියාය.

**ඇත්තවශයෙන්ම, කිතුනුවෙකුගේ ජීවිතයේ කරදරවීම,**

(i) **<u>නිෂ්ඵල දෙයකි</u> (මතෙව් 6:25-27)**

කරුණාකර මෙසේ නොයෙක් දේ ගැන කරදරවීම සම්බන්ධයෙන් **මතෙව් 6:25-27** දක්වා සඳහන් අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වදාල වදන් කියවන්න. මෙනෙහි කරන්න.

මාගේ ප්‍රිය දේව දරුව, මෙය තේරුම් ගන්න. කරදරවීම නිෂ්ඵල වනවා පමණක් නොව, එය අප වෙත අහිතකර විපාක ගෙනදෙයි. එය අපගේ ශරීර සෞඛ්‍යයට, මානසික තත්ත්වයට සහ ආත්මික ජීවිතයට ඉතා සෘණාත්මකව බලපායි.

නිදසුනක් වශයෙන් කරදරවීම, අප අනුභව කරන කෑම දිරවීමට, අපගේ රුධිර පීඩනයට, සුව නින්දට සහ වෙනත් <u>විවිධ අංශවලට</u> ඉතා අහිතකර වේ.

(ii) **<u>අනවශ්‍ය දෙයකි</u> (මතෙව් 6:28-32)**

කිතුනුවන් වන්නාවූ අපට, සියලු බලය ඇත්තාවූ අපට බොහෝ සේ ප්‍රේමකරන්නාවූ ස්වර්ගයේ වැඩසිටින්නාවූ පියෙක් ඇත. උන්වහන්සේ අපගේ සියලුම අවශ්‍යතා දන්නාසේක. **(මතෙව් 6:32)** උන්වහන්සේ සැම කල්හිම අප සමඟ සිටීමට පොරොන්දුවී ඇතිසේක. **(මතෙව් 28:20)** කිසි අන්දමකින් අපව අත්නොහරින බව කියා ඇතිසේක. **(හෙබ්‍රෙව් 13:5)** එබැවින් කරදරවීම අපට ~~අනවශ්‍ය දෙයකි~~.

(iii) **නුසුදුසු දෙයකි - (1 පේත්‍රුස් 5:7)**

**1 පේත්‍රුස් 5:7 :- "උන්වහන්සේ නුඹලා ගැන සලකන බැවින් නුඹලාගේ හැම කරදර උන්වහන්සේ පිට තබාපල්ලා ."**

දේව වචනයේ, අපගේ සැම කරදර දෙවියන්වහන්සේ වෙත තැබීමට මෙසේ අනුශාසනා කර තිබියදී, අප නොයෙක් දේ ගැන කණගාටු / කරදර වෙනවානම්, එයින් පෙන්නුම්

කරන්නේ, **අපගේ ඇදහිල්ල දුර්වල බවයි.**

දේව වචනයේ, වැඩි දුරටත් පෙන්වා දෙන්නේ, **'ඇදහිල්ල නැතුව දෙවියන්වහන්සේව ප්‍රසන්න කිරීමට නොහැකි බවයි' (හෙබ්‍රෙව් 11:6)** එබැවින් කරදරවීම, ජයග්‍රාහික ජීවිතයක් ගතකිරීමට බාධාවකි. එය අපට නොගැලපෙන, නුසුදුසු දෙයකි..........

(b) **'සියල්ලේදී ස්තූතිදීම'** (ස්තූති දෙන්න)

මෙම වචන කියවන අපගේ මනසේ නැගී එන ප්‍රශ්නයක් වන්නේ, **ඇත්තෙන්ම සියල්ලේදී දෙවියන්වහන්සේට අවංකව ස්තූති දීමට අපට හැකිද?** යන ප්‍රශ්නයයි.

එම ප්‍රශ්නයට පිලිතුරු දීමට ඔබට උපකාර කිරීම පිණිස, ඔබ ඉදිරියෙහි ප්‍රශ්න දෙකක් තබමි. එම ප්‍රශ්න නම්,

(i) **දෙවියන්වහන්සේ ඉඩ හැරියොත් මිස, ඔබගේ ජීවිතයේ 'ඉබේම සිදුවන' දේවල් ඇති විය හැකිද?** යන ප්‍රශ්නය සහ

(ii) **රෝම 8:28 හි සඳහන් දේව පොරොන්දුව ඔබ විශ්වාස කරනවාද?** යන ප්‍රශ්නයයි.

**රෝම 8:28 :- ''තවද දෙවියන්වහන්සේට ප්‍රේමකරන්නන්ට, එනම් උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබූවන්ට, සියලු දේම යහපත පිණිස එකට ක්‍රියාකරන බව අපි දනිමුව.''**

දේව දරුවෙනි, මෙම පොරොන්දුව - එනම් බොරු නොකියන්නාවූ දෙවියන්වහන්සේගේ පොරොන්දු සියල්ල විශ්වාස කරමින්, සියල්ලේදී දෙවි සමිඳුන්ට තුති පුදමු..................................................

(c) **යාච්ඤාවෙන්ද කන්නලව්වෙන්ද නුඹලාගේ ඉල්ලීම් දෙවියන්වහන්සේට දන්වාපල්ලා.'**

(i) **යාච්ඤාවෙන්ද :-** යාච්ඤාව යනු දෙවියන්වහන්සේ සමඟ කථාකිරීමයි. නමුත් අපට ප්‍රශ්නයක් ඇති වූ විට අප බොහෝ විට කරන්නේ, **'සැමදෙනාට'** අපගේ

අවම කිරීමට උත්සාහ කරමින්, දෙවියන්වහන්සේ සමග අපගේ ප්‍රශ්නය ගැන කථාකරමු.

(ii) **කන්නලව්වෙන්ද:-** මෙයින් අදහස් වන්නේ, මහත් හැඟීම් බරින් යුතුව, මුලු හදවතින් ඉතා ඕනෑකමින් දෙවියන්වහන්සේට ආයාචනා කිරීමයි.

(iii) **නුඹලාගේ ඉල්ලීම් දෙවියන්වහන්සේට දන්වාපල්ලා :-** යාච්ඤාව ගැන ඉතා වැදගත් කරුණක් ඔබට පෙන්වාදීමට කැමැත්තෙමි. එනම්, ඔබ උන්වහන්සේට කීවත් නොකීවත් දෙවියන්වහන්සේ ඔබගේ **සියලුම අවශ්‍යතාවයන්** දන්නා සේක. ඔබගේ හදවත දන්නාසේක, යන සත්‍යයයි.

මෙනමුත් උන්වහන්සේගෙන් අප (හෝ අප වෙනුවෙන් අන් කෙනෙක්) අපගේ ඉල්ලීම **දෙවියන්වහන්සේට නොදැන්වුව හොත්** උන්වහන්සේ (සාමාන්‍යයෙන්) මැදිහත් නොවනසේක.

එබැවින් අප අපගේ ඉල්ලීම් **පැහැදිලිව, විස්තරාත්මකව, සියලු කරුණු සහිතව උන්වහන්සේට දන්වාදෙමු.**

(d) **'එවිට කිසි නුවණකින් දැනගත නොහැකිවූ දෙවියන් වහන්සේගේ සමාදානය ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ නුඹලාගේ සිත්ද සිතිවිලිද ආරක්ෂා කරනවා ඇත.'**

(i) **'කිසි නුවණකින් දැනගත නොහැකිවූ' :-** දෙවියන්වහන්සේ ප්‍රශ්න, ගැටලු මධ්‍යයෙහි **තම දරුවන්ට ලබාදෙන්නාවූ සමාදානය,** මනුෂ්‍යයන්ට තේරුම්ගත නොහැකිවේ. තර්කානුකූලව කිසි කෙනෙකුට විස්තර කිරීමට ඉතා අපහසු වේ. **නමුත් දේව දරුවන් වන අපට අත්දැකීමට හැකිවේ.**

(ii) **'දෙවියන්වහන්සේගේ සමාදානය'** - දේව දරුව, ඔබට සහ මට මෙසේ ඇතුල්වීමට හැකිවන්නේ **දෙවියන් වහන්සේගේ සමාදානයටයි !** මෙය ගැන මොහොතකට මෙනෙහි කර බලන්න. අපගේ දෙවියන්වහන්සේ සර්වබලධාරී වන සේක. උන්වහන්සේට නොහැකි

දෙයක් නැත. **(මතෙව් 19:26; ලූක් 1:37)**

මුලු විශ්වය මවා පාලනය කරන්නේ, උන්වහන්සේය. එබැවින් උන්වහන්සේ කිසිදෙයක් ගැන කණගාටුවන්නේවත්, කරදරවන්නේවත්, කැළඹෙන්නේවත්, භයවන්නේවත් නොමැත. එනම් උන්වහන්සේට ඇත්තාවූ, උන්වහන්සේගේ සමාදානය කිසිවිටක කිසි අන්දමකින් නොඅඩුවනසේක නොවෙනස්වන සේක. **දෙවියන්වහන්සේ අපට ලබාදෙන්නේ, මෙවැනි සමාදානයකි.**

(iii) **'ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ' :-** දෙවියන්වහන්සේගේ සමාදානය අපට ලබාගත හැක්කේ ක්‍රිස්තුස්වහන්සේ තුළින් වන අතර, උන්වහන්සේ තුළින් අපට **දෙවියන්වහන්සේගේ සමාදානයද, දෙවියන්වහන්සේ සමඟ සමාදානයද ලැබේ.**

**රෝම 5:1 :- ''....අපේ ස්වාමීවූ යේසුස්ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන <u>දෙවියන්වහන්සේ හා සමඟ සමාදානය ඇතුව</u> සිටිමු.**

**කොලොස්සි 1:20 :- ''....උන්වහන්සේ කරණකොටගෙන <u>තමන්ට සමගිකරගැනීමටත්</u> පියාණන්වහන්සේ ප්‍රසන්න වූසේක.''**

**යොහන් 14:27 :- ''නුඹලා වෙත සමාදානය තබා යමි ; <u>මාගේ සමාදානය නුඹලාට දෙමි</u>....''**

**කොලොස්සි 3:15 :- ''<u>ක්‍රිස්තුස්වහන්සේගේ සමාදානය නුඹලාගේ සිත්වල ආණ්ඩුකෙරේවා</u>.....''**

**යොහන් 14:27** හි සහ **කොලොස්සි 3:15** හි සඳහන් වන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සමාදානය වන අතර, මෙය සහ දෙවියන්වහන්සේගේ සමාදානය අතර වෙනසක් නොමැතිවේ.

**'සිත්ද සිතිවිලිද' :-** සිංහල පරිවර්තනයේ **' සිත්ද සිතිවිලිද '** ලෙස සඳහන් කර ඇත්තාවූ වචන ඉංග්‍රීසි පරිවර්තනයේ සඳහන් වන්නේ, ' Hearts and minds ' (NIV) ලෙසයි. එනම් **'හදවත්ද සිත්ද'** ලෙසයි.

(iv) එබැවින් මෙම වචනවලින් අදහස් කරනු ලබන්නේ, අප **පිලි 4:6** අනුව ක්‍රියාකළ විට, දෙවියන්වහන්සේගේ සමාදානය අපගේ හදවත්, සිත් (සහ සිතිවිලි) මුරකාරයෙක්සේ ආරක්ෂාකරමින්, **අසහනය, බිය සහ කරදර** අපගේ සිත්වලට ඇතුල්වීම වලක්වන බවයි.

**යෙසායා 26:3 :- "ඔබ කෙරෙහි සිත තබා සිටින තැනැත්තා ඔබ කෙරෙහි විශ්වාස කරන බැවින්, ඔබ ඔහු ශාන්ත සාමාදනයෙන්** (Perfect peace - NIV) **ආරක්ෂා කරන සේක."**

(v) **'ආරක්ෂාකරනවා ඇත.':-** මෙම ප්‍රකාශනය, දෙවියන්වහන්සේ විසින් දෙන ලබන්නාවූ **ස්ථිර පොරොන්දුවකි, සහතිකයකි.** එබැවින් බොරු නොකියන්නාවූ දෙවියන්වහන්සේ නිසැකවම මෙය අපගේ ජීවිතවල ඉටුකරනසේක.


දේව දරුව, මොහොතක් මෙය මෙනෙහිකර බලන්න. අවස්ථාව කුමක් වුවත් ඔබ ඉදිරියේ තිබෙන අභියෝගය කෙතරම් බරපතල වුවත්, එය මධ්‍යයේ සම්පූර්ණ සිත් සමාදානය සහිතව මනුෂ්‍යයෙකුට ක්‍රියාකිරීමට හැකිනම්, මීට වඩා අනර්ඝ ආශිර්වාදයක් මෙලොව ලබන්ට හැකිද? කියා සිතා බලන්න.

අද දවසේ දෙවියන්වහන්සේ ඔබට කථාකරමින් කියන්නේ, **'මාගේ දරුව, යේසුස්වහන්සේ තුළ ඔබට ඉහත සඳහන් ආශිර්වාදය ලබාදීම මාගේ කැමැත්ත' වන බවයි. අප සැම පිලිප්පි 4:6** හි සඳහන් අයුරින් ක්‍රියා-කරමින්, **පිලිප්පි 4:7** හි සඳහන් **දෙවියන්වහන්සේගේ සමාදානය ඇතිව ජීවත්වෙමු.**

**එසේ කිරීමට දෙවිස්වාමීන්වහන්සේ ඔබ සැමට**

**පිහිටවනසේක්වා !!**

# ක්‍රිස්තුස්වහන්සේ තුළ මට සියල්ල පුළුවන



## පිලිප්පි අධ්‍යයනය 12

# ක්‍රිස්තුස්වහන්සේ තුළ මට සියල්ල පුළුවන

## පිලිප්පි 4:13-17

**<u>හැඳින්වීම</u>:-**

පාවුල්තුමා විසින් පිලිප්පිවරුන්ට ලියන ලද ලිපියේ **4:13** හි සඳහන් වන වචන, සැබවින්ම ජයාන්විත කිතුනු ජීවිතයක් ගත-කිරීමේ රහස හඳුනාගත් මනුෂ්‍යයෙකුගේ වචන ලෙස විස්තර කිරීම, නිවැරදි යැයි සිතමි.

**පිලිප්පි 4:13 :- "මා බලවත් කරන්නාවූ තැනන්වහන්සේ තුළ මට මට සියලු දේ කරන්ට පුළුවන."**

මෙම වචන කිසිසේත් '**උඩඟුකමින් පුරසාරම් දොඩන්නෙකුගේ** ' වචන නොවේ. තමාගේ හැකියාව, දක්‍ෂතාවය, උගත්කම, උතුම්කම, බලය වැනිදේ මත විශ්වාසය තැබුවාවූ මනුෂ්‍යයෙකුගේ වචන නොවේ. **ඒවා මැවුම්කාරවූ <u>සර්වබලධාරීවූ දෙවියන්වහන්සේ කෙරෙහි තම ඇදහිල්ලද සියලු බලාපොරොත්තුවද තැබුවාවූ මනුෂ්‍යයෙකුගේ වචන වේ.</u>**

පාවුල්තුමාගේ මෙම වචන වලින් ඔහු ප්‍රකාශ කරන්නේ, ඔහුගේ ජීවිතයේ

- මොන බාධා ආවත්,
- කෙතරම් අභියෝග වලට මුහුණදෙන්ට සිදුවූවත්,
- බරපතල විරෝධවාදිකම් පැමිණියත්,
- ආර්ථික, මානසික, ශාරීරික, ආත්මික ප්‍රශ්න කෙතරම් ඇති වූවත්,

මේ සෑම අවස්ථාවකදීම ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔහුට ජය තිබෙන බවයි.

(**පිලිප්පි 4:13** සමහර ඉංග්‍රීසි පරිවර්තනයන්හි පහත සඳහන් ලෙස ලියැවී තිබේ)

Phi. 4:13:- "I can do all things through Christ which strengtheneth me" - KJV

ඒ අනුව අපට පෙනීයන්නේ, පාවුල්ව බලවත් කළ තැනන්වහන්සේ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ වූ බවයි.

මාගේ ප්‍රේමවන්ත සහෝදර සහෝදරියනි, මැවුම්කාර දෙවියන්වහන්සේ අප සැවොම කැඳවා තිබෙන්නේ ජයාන්විත කිතුනු ජීවිත ගතකිරීමටයි. මෙසේ ජීවත්වීමට අපගේම ශක්තියෙන් දුර්වලවූ අපට නොහැකිවන අවස්ථා බොහෝසේ ඇතිවිය හැකි නමුත්, අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ අප සැමට ජයාන්විත කිතුනු ජීවිත ගතකිරීමට හැකිවේ.

එසේ ජීවත්වීම උදෙසා, මෙම අධ්‍යයනය ඔබට මහත් පිටුවහලක් වේයයි යාච්ඤාකරමි.

**<u>අධ්‍යයනය</u> :-**

**<u>ක්‍රිස්තුස්වහන්සේ තුළ මට සියල්ල පුළුවන</u>**

**1. <u>ජයාන්විත කිතුනු ජීවිතයක ආදර්ශයක්</u>**

**පිලිප්පි 4:13** ලිවූ පාවුල්තුමා, ජයාන්විත කිතුනු ජීවිතයක් ගතකළාවූ මනුෂ්‍යයෙකු ලෙස කදිම නිදසුනකි.

- මෙය පෙන්වාදීම පිණිස **රෝම 35,37 වෙත** ඔබගේ අවධානය යොමුකිරීමට කැමැත්තෙමි.

**රෝම 8:35,37 :- "[35]ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන්කරන්නේ කවුද? විපතවත්, සිත් වේදනාවවත්, පීඩාවවත්, දුර්භික්ෂයවත්, නිර්වස්ත්‍රකමවත්, උපද්‍රවයවත් කඩුවවත් අප වෙන්කරන්නේද?...... [37] නුමුත් අපට ප්‍රේමකළාවූ තැනන්වහන්සේ කරණකොටගෙන <u>අපි මේ සියල්ලේදී අතිශයින්ම ජයගන්නෝවමුව</u>."**

පාවුල්තුමා මෙහි තිරවශයෙන්ම ප්‍රකාශකරන්නේ, **රෝම 8:35** හි සඳහන් සියළුම ප්‍රශ්න මැද ක්‍රිස්තුස්වහන්සේ තුළින් ඔහුට අතිශයින්ම ජය අත්වන බවයි.

- පාවුල්තුමා විසින් ලියනලද්දාවූ තවත් පදයක් දෙස බලමු.

**2 කොරින්ති 2:14 :- "තවද ක්‍රිස්තුස්වහන්සේ තුළ නිතරම අප ජයට පමුණුවන්නාවූ, සියලු තැන්වල අප ලවා උන්වහන්සේව දැනගැනීම නැමති සුවඳ පතුරුවන්නාවූ දෙවියන්වහන්සේට ස්තූති වේවා."**

**රෝම 8:37** හි ක්‍රිස්තුස්වහන්සේ තුළ **'සියල්ලේදී අතිශයින් ජය '** පාවුල් ලැබූ බව සඳහන් වන අතර, **2 කොරි 2:14** හි සඳහන් වහන්නේ, මෙය **'නිතරම සිදුවූ බවයි.'** මෙම පද දෙක එකට ගත්විට අපට එබැවින් පෙනීයන්නේ, **<u>පාවුල්තුමා, සැම ප්‍රශ්නයකදීම, සැමවිටම අතිශයින් ජය ලැබූ බවයි</u>.**

මේ අතර පාවුල් මේ පදවල සඳහන් කරන්නේ **අපි හෝ අප කියා මිස මම** කියා නොවේ. එනම් මේ ජය අප සැමදෙනාටම අයිතිව තිබෙන බවත්, එය අප භුක්ති විඳීම දෙවියන්වහන්සේගේ කැමැත්ත වන බවත් යන්නයි.

❖ දේව දරුව මෙය තේරුම්ගන්න. පාවුල්තුමාට මෙවැනි ජයාන්විත ජීවිතයක් ගතකිරීමට හැකිවූ සේම, අපටද එසේම කළ හැකිවේ. මෙසේ ජීවත්වීමේ රහස පාවුල් හඳුනාගෙන තිබුනු අතර, ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟපෙන්වීම අනුව ඔහු ලිවූ ඉහත සඳහන් පද මගින් එම රහස අපටද හෙලිදරව් වී තිබේ.

මෙනමුත් බොහෝ කිතුනුවන් ප්‍රකාශ කරන්නාවූ අදහසක් වන්නේ, **'පාවුල්තුමා සුවිශේෂවූ ඉතා දීමනාලත්/අති දක්ෂ මනුෂ්‍යයෙක්වූ නිසා, ඔහුට මෙවැනි ජයාන්විත ජීවිතයක් ගත කිරීමට හැකිවූ නමුත්, මා වැනි සාමාන්‍ය මනුෂ්‍යයෙකුට එසේ කළ නොහැකියි'** යන්නයි. දේවදරුව, මෙම අදහස නිවැරදි නොවේ. මා එසේ ප්‍රකාශකිරීමට හේතු ඉතා සරළව ඔබ ඉදිරියේ තැබීමට කැමැත්තෙමි.

(i) පාවුල්තුමාගේ **'රහස'** වූයේ, **'ක්‍රිස්තුස්වහන්සේ තුළ'** ඔහුට ජය ලබා ගත හැකි බවයි .

(ii) බොහෝ විට මේ රහස ඉගෙනගැනීමට අසීරු/ අමාරු වන්නේ **'දක්ෂ කෙනෙකුටයි'.** එයට හේතුව වන්නේ තමාගේ දක්ෂකම නිසා, තමාටම ජයගැනීමට හැකිබව එවැනි කෙනෙක් සිතීමට පුරුදුවීමයි.

(iii) එබැවින් පාවුල්තුමා ඉගෙනගත් රහස වඩා පහසුවෙන් ඉගෙනගැනීමට වැඩියෙන් අවස්ථාව ඇත්තේ **'අදක්ෂ කෙනෙකුටයි.'**

(iv) සැමවිටම සැමදෙයකදීම ජයගැනීමට කිසිම දක්ෂයෙකුටවත් කිසිම අදක්ෂයෙකුටවත් තමාගේ හැකියාවෙන් නොහැකිවේ. **මෙසේ කළ හැක්කේ ක්‍රිස්තුස්වහන්සේ තුළ පමණි.**

(v) එබැවින් අදක්ෂවූ ඔබට සහ මට, මේ රහස ඉගැන්වීමට පාවුල්ට වඩා පහසුවේ !!!

## 2. <u>ජයාන්විත කිතුනු ජීවිතයක ප්‍රකාශවන ලකුණු/ ගුණාංග</u>

ක්‍රිස්තුස්වහන්සේ තුළ අපට හිමිවන්නාවූ ජයාන්විත කිතුනු ජීවිතයට සීමාවන් නොමැතිවේ. පාවුල්තුමා විසින් එයගැන භාවිතාකරන ලද්දාවූ වචන, එනම් **සියල්ලේදී, අතිශයින්, නිතරම** යන වචන පෙන්වාදෙන්නේ, අප මුහුණදෙන්නාවූ අවස්ථාව කෙතරම් දුෂ්කර, ව්‍යාකූල, හිරිහැරකාරී, වේදනාත්මක වුවත් ක්‍රිස්තුස්වහන්සේ තුළ අපට ජයග්‍රහනය ඇති බවයි.

**2 තිමෝති 4:17,18 :- "[17]......<u>ස්වාමීන්වහන්සේ මා ළඟ සිට මා ශක්තිමත්කළසේක</u>. මම සිංහයාගේ කටින් මුදනු ලැබීමි. [18] <u>ස්වාමීන්වහන්සේ හැම නපුරු වැඩවලින් මා මුදා ආරක්ෂාකොට</u> තමන්වහන්සේගේ ස්වර්ගීය රාජ්‍යයට මා පමුණුවනසේක........"**

අපි දැන් **පිලිප්පි 4:4-22** ඇසුරින්, යේසුස්වහන්සේ තුළ ජයාන්විත කිතුනුවන්ට ඇත්තාවූ පුදුමාකාර ගුණාංග තේරුම්ගනිමු.

(i) **<u>නිතරම ප්‍රීතියෙන් සිටීම (පිලිප්පි 4:4)</u>**

**පිලිප්පි 4:4:- "ස්වාමීන්වහන්සේ තුළ නිතරම ප්‍රීතිවෙයල්ලා. ප්‍රීතිවෙයල්ලා යයි නැවතත් කියමි."**

අපගෙන් බහුතරයක් අපගේ ප්‍රයත්නයන් සඵලවන විට බොහෝ සේ ප්‍රීතිමත් වන අතර, ඒවා අසාර්ථක වන විට දුකට සහ කනස්සල්ලට පත්වේ. නමුත් මෙම පදය පෙන්වාදෙන්නේ, කිතුනු අපට සෑම අවස්ථාවකදීම ප්‍රීතියෙන් සිටිය හැකි බවයි, ප්‍රීතියෙන් සිටිය යුතු බවයි.

## නිදසුනක් වශයෙන්

### (a) මරණ තර්ජන මැද ස්තුති ප්‍රශංසා පිදීම

සාවුල් රජතුමා දාවිත්ව මරාදැමීමට අදහස් කරන බව යොනාතාන් විසින් දාවිත්ට දන්වා සිටිවිට, දාවිත් තම ජීවිතය ගලවාගැනීම පිණිස පලාගොස් ගාත්හි රජවූ ආඛීෂ් වෙතට පැමිණුණේය. **(1 සාමුවෙල් 21:10)** එවිට ආඛීෂ්ගේ සේවකයෝ දාවිත්ව හඳුනාගෙන , ඔහු කවුද කියා ආඛීෂ්ට දන්වූවෝය. **(1 සාමුවෙල් 21:11)** දාවිත් මෙය ගැන දැනගත්විට තමාගේ ජීවිතය ආරක්‍ෂා කරගැනීම පිණිස, **'පිස්සු වැටුණාක්මෙන් හඟවමින්, වාසල් දොර පහුරුගෑවේය, තමාගේ කෙළ රැවුල පිට වැටෙන්ටත් හැරියේය.' (1 සාමුවෙල් 21:12,13)** මෙහි ප්‍රතිඵලයක් වූයේ ආඛීෂ් රජතුමා, දාවිත් පිස්සෙක් යයි සිතා, ඔහුව නිරුපද්‍රිතව තම නිවසින් පලවා හැරීමයි.

දේවදරුව මෙම අවස්ථාව ගැන මොහොතකට මෙනෙහිකර බලන්න. මෙම සිද්ධියට ප්‍රථමයෙන්, සාමුවෙල් විසින් දාවිත්ව රජතුමා ලෙස ආලේපකරන ලදී. එබැවින් දෙවියන්වහන්සේ තමාව ඉශ්‍රායෙල් දේශයේ රජතුමා ලෙස පත්කිරීමට තීරණය කර ඇති බව දාවිත් දැන සිටියේය.

මෙනමුත් මෙවිට දාවිත් මුහුණදුන් අවස්ථාව වූයේ, තම ජීවිතය ගලවාගැනීම උදෙසා, සාවුල්ගෙන් පලාගොස්, ආඛීෂ් ඉදිරියේ පිස්සෙක් මෙන් ක්‍රියා කිරීමයි.

දේව දරුව. මෙවැනි අවස්ථාවක් ඉදිරියේ දාවිත් කළේ කුමක්ද කියා ඔබ දන්නවාද? **ඔහු ගීතාවලියේ 34 වන ගීතිකාව ලිව්වේය !!**

**පිලිප්පි 4:4** හි සඳහන් ප්‍රීතිවීම තේරුම් ගැනීම උදෙසා **ගීතා 34:1-4** කියවා බලමු.

**ගීතා 34:1-4 :- "[1] <u>සෑම කල්හිම ස්වාමීන්ට ප්‍රශංසා කරමි. උන්වහන්සේගේ වර්ණනාව මාගේ මුඛයෙහි නිතරම පවත්නේය.</u> [2]මාගේ ආත්මය ස්වාමීන්ගේ ගුණ වර්ණනා කරන්නේය. යටත්සිත් ඇත්තෝ <u>ඒ අසා සන්තෝෂවන්නෝය.</u> [3] මා සමඟ ස්වාමීන් වර්ණනාකරව්, අපි එක්ව උන්වහන්සේගේ නාමය උසස් කරමු.[4] ස්වාමීන් සෙවීමි, උන්වහන්සේ මට උත්තරදී මාගේ සියලු භයින් මා මිදූසේක."**

(b) **යේසුස්වහන්සේගේ නාමය උදෙසා නින්දා විඳීමේදී සන්තෝෂවීම - ක්‍රියා 5:41**

**ක්‍රියා 5:41:- "ඔව්හු ඒ නාමය නිසා නින්දා විඳින්ට තුමු වටින්නෝ යයි ගණන්ගනු ලැබූ බැවින් සන්තෝෂව, සභාව ඉදිරියෙන් පිටත්ව ගොස්....."**

යේසුස්වහන්සේගේ ප්‍රේරිතයන් උන්වහන්සේ ගැන දේශනාකිරීම නැවැත්වීම උදෙසා, යුදෙව් නායකයෝ ඔවුන් මන්ත්‍රනසභාව වෙත කැඳවා ඔවුන්ට තළා යේසුස්වහන්සේගේ නාමයෙන් කථා නොකරන්ට අණකොට ඔවුන්ව යන්ට හැරිය බව **ක්‍රියා 5:40** හි සඳහන් වන අතර, ප්‍රේරිතයන් එම අවස්ථාවේදී දක්වූ ප්‍රතිචාරය **ක්‍රියා 5:41** හි සඳහන් වේ. ඔවුන්ගේ ප්‍රතිචාරය වූයේ, ඔවුන් ලැබූ තැළුම්කෑම සහ තර්ජන ගැන සන්තෝෂවෙමින් තව දුරටත් දේශනාකිරීමේ යෙදීමයි. **(ක්‍රියා 5:42)**

(c) **ඇදහිල්ල සෝදිසි කරනු ලැබීමේදී ප්‍රීතිවීම - යාකොබ් 1:2,3**

අපගේ පියාණන්වන අපගේ දෙවියන්වහන්සේ අපගේ ඇදහිල්ල ශක්තිමත්කිරීම උදෙසා, අපගේ ඇදහිල්ල සෝදිසි කරනසේක. දෙවියන්වහන්සේ මෙලෙස අපගේ ඇදහිල්ල වර්ධනය කිරීමේ යෙදී සිටින අතර, උන්වහන්සේගේ ක්‍රියාකිරීම තේරුම්ගැනීමට අපොහොසත්වී, සමහර කිතුනුවෝ කනස්සල්ලට පත් වෙති. නමුත් ජයාන්විත කිතුනුවා දෙවියන්වහන්සේගේ ක්‍රියාකිරීම තේරුම් ගනිමින් ප්‍රීතිවන්නේය.

**යාකොබ් 1:2,3 :-[2] මාගේ සහෝදරයෙනි, නුඹලාගේ ඇදහිල්ල සෝදිසිකිරීමෙන් ක්ෂාන්තිගුණය උපදින බව දැන [3] අනේකාකාර පරීක්ෂාවලට වැටෙන කල, ඒ සියල්ල ප්‍රීතියක්යයි සිතාපල්ලා''**

(ii)**ඉතා ඉවසිලිවන්තව ක්‍රියාකිරීම- පිලිප්පි 4:5**

**පිලිප්පි 4:5 :- " නුඹලාගේ ඉවසිලිවන්තකම සියලු මනුෂ්‍යයන්ට දැනගන්ට ලැබේවා."**

**පිලිප්පි 4:5** හි ඉංග්‍රීසි පරිවර්තනයේ මෙම වචන සඳහන් කරනු ලබන්නේ, 'Let your gentleness.....' (NIV) ලෙසයි. එබැවින් ජයාන්විත කිතුනුවකුගේ ජීවිතයේ තිබිය යුතු (**පිලිප්පි 4:5** හි සඳහන්වන) ගුණාංගය නම් ඉවසිලිවන්තකම, යහටහත්කම සහ මෘදුකමයි.

දේව දරුවෙනි, ජයාන්විත කිතුනුවන් ලෙස අප සැම ක්‍රිස්තුස්වහන්සේ දක්වුවාවූ, ඉවසිලිවන්තකම යටහත්කම සහ මෘදුකම පැළඳගනිමු.

**කොලොස්සි 3:12 :- ''එබැවින් දෙවියන්වහන්සේගේ ශුද්ධවූ ප්‍රේමවන්තවූ තෝරාගත්තවුන් මෙන් දයාබර හිතක්ද ගුණවන්තකමක්ද යටහත්කමද මෘදුකමද ඉවසිලිවන්තකමද පැළඳගෙන, එකිනෙකා ගැන ඉවසමින්,''**

**එපීස 4:1,2 :- ''[1] එබැවින් නුඹලා කැඳවනු ලැබූ කැඳවීමට ඔබිනලෙස, [2] සියලු ආකාර යටහත්කමින්ද මොළොක් ගුණයෙන්ද ඉවසිලිවන්තකමෙන්ද හැසිර, එකිනෙකා ගැන ප්‍රේමයෙන් ඉවසා.''**

(iii)**කිසිවක් ගැන කරදර නොවීම - පිලිප්පි 4:6**

**පිලිප්පි 4:6:- ''නුඹලා කිසිවක් ගැන කණගාටු නොසිතා,......''**

සිංහල පරිවර්ථනයේ '**කණගාටු නොසිතා** ' ලෙස සඳහන් කර ඇති වචන ඉංග්‍රීසි පරිවර්ථනයේ සඳහන් වන්නේ, 'do not be anxious' (NIV) කියායි. එහි අර්ථය වන්නේ, ' **කරදර නොවී** ' යන්නයි.

ජයාන්විත කිතුනු ජීවිතයක තිබිය යුතු අතිශයින් වටින්නාවූ ගුණාංගයක් වන්නේ, කිසිවක් ගැන කරදර නොවීමයි. රෝගී වුවත්, අසරණ වුවත්, හිමි සියල්ල නැතිවුවත්, බොහෝ බාධක පැමිණියත් මේ සියල්ල ගැන කරදර නොවී, දෙවියන්-වහන්සේගේ විශ්වාසවන්තකම ගැන විශ්වාසය තබමින්, නොසැලී ඇදහිල්ලෙන් සහ බලාපොරොත්තුවෙන් සිටීමයි. එසේ කිරීමට ඔබ සැමට උපකාර කිරීම උදෙසා, **ගීතාවලිය 37:1-11** දක්වා සඳහන් පද කිහිපයක් ඔබ ඉදිරියේ තැබීමට කැමැත්තෙමි.

**ගීතා 37:3,4,5 :- " [3] ස්වාමීන් කෙරෙහි විශ්වාසය තබා යහපත්කම් කරව ; දේශයෙහි වාසයකරමින් විශ්වාසයකම අනුව යව. [4] ස්වාමීන් කෙරෙහි ප්‍රීතිමත්වෙව ; උන්වහන්සේද තාගේ සිතෙහි ආශාවන් ඉෂ්ටකරනසේක. [5] තාගේ මාර්ගය ස්වාමීන්ට භාරදෙව ; උන්වහන්සේ කෙරෙහි විශ්වාසයද තබව, උන්වහන්සේ එය ඉෂ්ටකරනසේක."**

**ගීතා 37:7 :- "ස්වාමීන් කෙරෙහි රඳා, ඉවසිල්ලෙන් උන්වහන්සේ බලා සිටුව, තමාගේ මාර්ගයෙහි දියුණුවන්නාද නපුරු ප්‍රයෝග ඉෂ්ටකරගන්නාද නිසා කලනොකිරෙව."**

**ගීතා 37:9 :- "......නමුත් ස්වාමීන් කෙරෙහි බලාසිටින්නෝ දේශය උරුමකරගන්නෝය."**

**ගීතා 37:11 :- "නුමුත් මොළොක් ගුණ ඇත්තෝ දේශය උරුමකරගන්නෝය ; ඔව්හු මහත් සමාදානයෙන් ප්‍රීතිමත් වන්නෝය."**

දේව දරුවෙනි, මේ පද තුළ දෙවියන්වහන්සේ අපට ලබාදී ඇති සැම පොරොන්දුවක්ම විශ්වාස කරමින්, උන්වහන්සේ අපට දීමට බලාසිටින්නාවූ **මහත් සමාදානයෙන් ප්‍රීතිමත්වමු.**

(iv)**සියල්ලේදී ස්තූතිදීම සමඟ යාච්ඤා කිරීම-පිලිප්පි 4:6**

**පිලිප්පි 4:6 :- "........සියල්ලෙහිදී ස්තූතිදීම සමඟ යාච්ඤාවෙන්ද කන්නලව්වෙන්ද නුඹලාගේ ඉල්ලීම් දෙවියන්-වහන්සේට දන්වාපල්ලා."**

ජයාන්විත කිතුනු ජීවිතයක තිබිය යුතු මේ ගුණාංගය බොහෝ කිතුනුවන් පෙන්නුම්කරන්නේ ඉතා සීමිත ප්‍රමාණයකටය. මා මෙසේ ප්‍රකාශ කරන්නේ මන්ද කියා පැහැදිලි කිරීමට අදහස්කරමි.

(a)සෑම කිතුනුවෙක්ම පාහේ තමාගේ ජීවිතයේ විශාල ප්‍රශ්නයක් ඇතිවූ අවස්ථාවක, නැතහොත් තමාට හෝ තමාගේ පවුලේ කිට්ටුම නෑදෑයෙකුට භයානක රෝගයක් වැලඳූ විට යාච්ඤා කිරීමට පෙළඹෙන අතර, ඔහු කිසි අන්දමකට **පිලිප්පි 4:6** අනුව යාච්ඤා කරන්නාවූ කෙනෙක් ලෙස පිළිගත නොහැකි බව තේරුම් ගැනීම දුෂ්කර කාරියක් නොවේ.

**පිලිප්පි 4:6** මගින් දෙවියන්වහන්සේ අපට අනුශාසනා කරන්නේ, '**සියල්ලෙහිදී**' යාච්ඤා කිරීමටයි. එනම් අවස්ථාව කුමක් වුවත්, අප ඉදිරියේ තිබෙන ප්‍රශ්නය හෝ ගතයුතු තීරණය විශාල වුවත් කුඩාවුවත් අප එය යාච්ඤාවෙන් දෙවියන්වහන්සේ වෙත ගෙන යා යුතු බවයි.

දේව දරුවෙනි, අපගේ ජීවිතවල සෑම අවස්ථාවකදීම අප යාච්ඤාවෙන් දෙවිසමිඳුන්ගේ කැමැත්ත සොයා ඒ අනුව ක්‍රියාකිරීම, අපගේ ජීවිතයේ පුරුද්දක් බවට පත්කර ගනිමු.

(b)ඉහත සඳහන් ආකාරයට සෑම කිතුනුවෙක්ම විශාල ප්‍රශ්න මැද්දේ දෙවියන්වහන්සේට මොරගසන අතර, '**ස්තූතිදීම සමඟ**' එසේ කරන අය ඉතා දුර්ලභ වන බව මාගේ අදහසයි. තම ප්‍රශ්නය ගැන කිතුනුවන් දෙවියන්වහන්සේට කන්නලව් කරන අතර, ඒ සමඟම ඔවුන්ගේ යටිහිතේ නැගෙන ප්‍රශ්න වන්නේ, '**ඇයි ස්වාමීනි, මාගේ ජීවිතයේ මෙසේ වීමට ඔබවහන්සේ ඉඩ හැරියේ මන්ද ?** වැනි ප්‍රශ්නයයි.

දේව දරුවෙනි, ප්‍රශ්නයක් මැද අප දෙවියන්වහන්සේට කන්නලව් කරන අතර, ඊට ප්‍රථමයෙන් අප විසින් කළ යුත්තේ, '**අනේ දෙව් ස්වාමීනි, මෙවැනි ප්‍රශ්නවලින් ඔබවහන්සේ මාව මෙතෙක් කල් ආරක්ෂා කළ නිසා, ඔබවහන්සේට ස්තූති වේවා. මාගේ තත්ත්වය මීට වඩා බරපතල නොවන නිසා ඔබවහන්සේට ස්තූතිවේවා. ඔබවහන්සේ මා ලඟ සිටිනනිසා ස්තූතිවේවා** වැනි යාච්ඤා ඔප්පු කිරීම වේ.

අප සැමදෙන, ජයාන්විත කිතුනු දේව දරුවන් මෙන්, **'සියල්ලේදී ස්තුතිදීම සමඟ යාච්ඤාවෙන්'** දෙවි සමිඳුන් හට අපගේ ඉල්ලීම් ඉදිරිපත් කරමු. අප එසේ කරන විට **'කිසි නුවණකින් දැනගත නොහැකිවූ දෙවියන්වහන්සේගේ සමාදානය' (පිලිප්පි 4:7)** අප අත්දකිනු ඇත.

(v) **<u>යහපත් දේ ගැන මෙනෙහි කිරීම - පිලිප්පි 4:8</u>**

**පිලිප්පි 4:8 :- "ඉතින් සහෝදරයෙනි, යම් පමණ දේ සැබෑද, යම් පමණ දේ ගරුකටයුතුද, යම් පමණ දේ සාධාරණද, යම් පමණ දේ පිරිසිදුද, යම් පමණ දේ ආදරණීයද, යම් පමණ දේ යහපත් කීර්තියක් ඇතිව තිබේද, යම් ගුණයක්, යම් ප්‍රශංසාවක් ඇද්ද, <u>ඒ දේවල් මෙනෙහිකරපල්ලා</u>."**

අප කවුරුත් හොඳ හැටි දන්නා කාරණයක් වන්නේ, අප සුපරීක්ෂාවෙන් නොසිටියහොත්, අප නොදැනුවත්වම අපගේ සිතට බොහෝවිට පැමිණෙන්නේ, ඉහත සඳහන් දේවල් නොව, ඒවාට ප්‍රතිවිරුද්ධ දේවල්ය. මෙසේ සිදුවීම පුදුමයක් නොවන්නේ, මනුෂ්‍යයාගේ සිත (දේව වචනය පැහැදිලිව ප්‍රකාශකරන ලෙස) **'දුෂ්ඨවම තිබෙන නිසාය .'**

**යෙරමියා 17:9 :- "සියල්ලට වඩා සිත රැවටිලිකාරව තිබේ, ඒක දුෂ්ඨවම තිබේ. ඒක කාට දැනගන්ට පුළුවන්ද ?"**

**මතෙව් 15:19,20 :- "[19] මක්නිසාද නපුරුසිතිවිලි, මිනීමැරුම්, කාමමිථ්‍යාචාරකම්, වේශ්‍යාකම්, සොරකම්, බොරු සාක්ෂිකීම්, සහ අපහාසකිරීම් සිතින් නික්මෙන්නේය. [20] මනුෂ්‍යයා අපවිත්‍ර වන්නේ මේ දේවලින්ය."**

දේව දරුවෙනි, ජයාන්විත කිතුනු ජීවිතයක ඉතාමත්ම වැදගත් ගුණාංගයක් වන්නේ දෙවියන්වහන්සේගේ පාලනයට කැපවුනු සිතක් සහ දිවකි. මෙය ජයග්‍රහනය අත්පත් කරගැනීම උදෙසා, අප සැම **පිලිප්පි 4:8** හි සඳහන් දේ ගැන නිතරම සිතන්ට සහ මෙනෙහිකරන්ට පුරුදුවෙමු. අප එසේ කරන විට, අප නොදැනුවත්වම දෙවි සමිඳුන් අපව,

- සැබෑවූ
- ගරු කටයුතුවූ
- සාධාරණවූ
- පිරිසිදු වූ
- ආදරණීය වූ
- යහපත් වූ මනුෂ්‍යයන් බවට පරිවර්තනය කරනු ඇත.

(vi) **දෙවියන්වහන්සේ උගන්වන දෙයට කීකරුවීම - පිලිප්පි 4:9**

**පිලිප්පි 4:9 :- "නුඹලා ඉගෙනගත්තාවූ, පිළිගත්තාවූ මා තුළ තිබෙන බව ඇසුවාවූ, දුටුවාවූ දේවලුත් කරපල්ලා. එවිට සමාදානයේ දෙවියන්වහන්සේ නුඹලා සමඟ සිටිනවා ඇත."**

සාමාන්‍යයෙන් ඉරුදින දේව නමස්කාරයට සහභාගීවීමට පුරුදු කිතුනුවෙක්, වසරකට **'දේව පණිවුඩ'** 50 ක් පමණ අසනු ඇත. මෙසේ සවන්දෙන කිතුනුවන්ගෙන් කීදෙනෙක් ඒවා අනුව ජීවත්වීමට අවංකව උත්සාහ කරන්නේද කියා දන්නේ දෙවිසමිඳුන් පමණි.

දේව දරුව, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනයෙන් ඔබට උගන්වන **සැමදෙයට කීකරුවෙමින් ජීවත්වීමට කැපවෙන්න.**

(vii) **ලද දෙයින් සතුටුවන්නාවූ ජීවිතයක් - පිලිප්පි 4:11**

**පිලිප්පි 4:11,12 :- "[11] මක්නිසාද මම මොන ස්වභාවයක සිටීම් නුමුත්, ඊට සතුටුවෙන්ට මම ඉගෙනගෙන සිටිමි. [12] පහත්ව සිටින්ට දනිමි, පූර්ණව සිටින්ටත් දනිමි. සෑම සියලු කාරණාවලදී තෘප්තියට පැමිණ සිටින්ට සහ ක්ෂුධාවෙන් සිටින්ටත්, පූර්ණව සිටින්ට සහ හිඟව සිටින්ටත් පුළුවන් රහස ඉගෙනගෙන සිටිමි."**

මෙම අධ්‍යයනය කියවමින් සිටින්නාවූ ඔබව දෙවියන්වහන්සේ පූර්වයෙන් හඳුනාගෙන, යේසුස්වහන්සේගේ ස්වරූපයට සමානවන්ට පූර්වයෙන් නියමකළ සේක. **(රෝම 8:29)** උන්වහන්සේ ඔබව කැඳවා, ඔබව ධර්මිෂ්ඨකළසේක. **(රෝම 8:30)** උන්වහන්සේ ඔබගේ ජීවිතය උදෙසා අනර්ඝ සැලැස්මක් සූදානම්කර තිබෙන සේක. **(එපීස 2:10)**

මීට වඩා ඔබට සරිලන, මීට වඩා අනර්ඝ, මීට වඩා උතුම් සැලැස්මක් ඔබ උදෙසා සැකසීමට කිසිවකුට නොහැකිවේ.

එබැවින් ඔබගේ ජීවිතයේ, ඔබ විසින් කළ හැකි වඩාත්ම ප්‍රඥාවන්තදේ වන්නේ, දෙවියන්වහන්සේ ඔබ උදෙසා සූදානම්කර තිබෙන්නාවූ සැලැස්ම හඳුනාගෙන, ඒ අනුව ඔබගේ ජීවිතය ඉදිරියට ගෙනයෑමයි. ඔබ මෙසේ කළවිට දෙවියන්වහන්සේ ඔබට තෘප්තියද **(පිලි 4:12)** සමාදානයද **(පිලි 4:7)** දෙමින්, **'උන්වහන්සේ තුළ ඔබව බලවත් කරමින්, උන්වහන්සේ තුළ සියලුදේ කරන්ට' (පිලි 4:13)** ඔබට හැකියාව දෙනසේක.

දේව දරුව, දෙවියන්වහන්සේ ඔබව තබා ඇති ස්ථානය ගැන සහ සේවය ගැන සෑහීමට පත්වෙමින්, ජීවිතාන්තය දක්වා උන්වහන්සේගේ කැමැත්ත අනුව ඔබගේ ජීවිතය ගොඩනගන්න.

## 3. ජයාන්විත කිතුනු ජීවිතය සහ ක්‍රිස්තුස්වහන්සේ

### (i) ජයාන්විත කිතුනු ජීවිතයක් අපට හිමිවන්නේ යේසුස්වහන්සේ පාපයේ සහ මරණයේ බලය බින්ද නිසයි.

**1 කොරි 15:55-57:- " 55 එම්බා මරණය තාගේ ජය කොයිද? එම්බා මරණය තාගේ කටුව කොයිද? 56 මරණයේ කටුව නම් පාපයය, පාපයේ බලය නම් ව්‍යවස්ථාවය. 57 නුමුත් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන අපට ජය දෙන්නාවූ දෙවියන්වහන්සේට ස්තුතිවේවා."**

**රෝම 4:25:- "උන්වහන්සේ වනාහි අපේ වරද නිසා පාවාදෙනු ලැබ, අප ධර්මිෂ්ඨකොට ගණන්ගනු ලැබීම සඳහා නැගුටුවනු ලැබූසේක."**

කිතුනු අපට නොහොත් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නාවූ අපට ජයාන්විත ජීවිතයක් හිමිව තිබෙන්නේ,

අපගේ කිසිම වටිනාකමක්, හොඳක්, සුදුසුකමක් නිසා නොවේ. එය දෙවියන්වහන්සේ අපට දෙන්නාවූ දීමනාවකි නොහොත් තෑග්ගකි. එය ක්‍රියාවලින් ලබාගත නොහැකි අතර, එය ලබාගත හැකි එකම මාර්ගය වන්නේ ඇදහිල්ල පමණි.

(ii) **<u>ක්‍රිස්තුස්වහන්සේගෙන් වෙන්ව ජයාන්විත ජීවිතයක් ගතකිරීමට කිසිවෙකුට නොහැකිවේ.</u>**

කිතුනු සභාව දෙස විමසිලිමත්ව බලන විට යහපත් ජීවිත ගතකිරීම උදෙසා මහත් පරිත්‍යාගශීලීව ක්‍රියාකරන, මහත් කැපවීම්කරන අය අපට පෙනෙන්ට පුළුවන.

කිතුනු ජීවිතය දිවීමේ තරඟයකට සමාන කරන පාවුල්තුමා, **1 කොරි 9:27** හි සඳහන් කරන්නේ, එම තරඟයෙන් ජයගැනීම උදෙසා, **'මාගේ ශරීරය දමනය කර වාල්කමට පමුණුවමි '** කියායි. ඔහු තුළ තිබුනාවූ අධිෂ්ඨානයට සහ කැපවීමට අප ඔහුට ගෞරව කරන අතර, ඔහුගේම වචනවලින් ඔහු තවත් අවස්ථාවක ප්‍රකාශ කරන්නේ, **'මක්නිසාද මා තුළ එනම් මාගේ මාංසය තුළ කිසි යහපතක් වාසය නොකරන බව දනිමි. මක්නිසාද කැමැත්ත මට ඇත්තේය, නුමුත් යහපත් දෙය කිරීම මට නැත්තේය. මක්නිසාද මම කැමති යහපත නොකර අකමැති නපුර කරමි.' (රෝම 7:18,19)** මෙම වචන තහවුරු කරන්නේ, අප කෙතරම් උත්සාහ කළත්, ක්‍රිස්තුස්වහන්සේගෙන් වෙන්ව කිසිම මනුෂ්‍යයෙකුට ජයාන්විත ජීවිතයක් ගතකිරීමට නොහැකි බවයි.

**යොහන් 15:5:- "යමෙක් මා තුළෙහි පවතින්නේද, මම ඔහු තුළෙහි පවතිම්ද, ඒ තැනැත්තේ බොහෝ එල දරයි. <u>මක්නිසාද මාගෙන් වෙන්ව කිසිවක් කරන්ට නුඹලාට බැරිය.</u>"**

(iii) **<u>ජයාන්විත ජීවිතයක් ගතකළාවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ, උන්වහන්සේට කැපවුනු/භාරවුනු ජීවිත තුළ එම ජයාන්විත ජීවිතය ඇතිකළ හැකිවේ.</u>**

එබැවින් ජයාන්විත කිතුනු ජීවිතයක් ඇතිවිය හැක්කේ එකම මාර්ගයකින් පමණි. එම මාර්ගය නම්, දේව දරුවෙක් යේසුස්වහන්සේට තමාගේ ජීවිතයේ පාලනය සම්පූර්ණයෙන්ම භාරකරමින්, උන්වහන්සේට

උන්වහන්සේගේ ජයග්‍රාහික ජීවිතය ඔහු තුළ ඉපදවීමට ඉඩහැරීමේ මාර්ගයයි .

දේව දරුවෙනි, අප සැමට ජයාන්විත කිතුනු ජීවිත ගතකිරීමට හැකියාව තිබෙන අතර, එම හැකියාව අපට ඇත්තේ **ක්‍රිස්තුස්වහන්සේ තුළ පමණි.**

එම ජයාන්විත ජීවිතයට ඇතුල්වීම උදෙසා, ක්‍රිස්තුස්-වහන්සේට ඔබගේ ජීවිතය භාරකර, උන්වහන්සේ තුළ ජීවත්වෙන්න. උන්වහන්සේට ඔබ තුළ ජීවත්වීමට සම්පූර්ණයෙන්ම ඉඩහරිමින්, **ඔබගේ ජීවිතයේ පාලනය උන්වහන්සේට භාරදෙන්න.**

අප නැවතත් **පිලිප්පි 4:13** වෙත අපගේ අවධානය මොහොතකට යොමුකරමු.

**පිලි 4:13 :- "මා බලවත්කරන්නාවූ තැනන්වහන්සේ තුළ මට සියලු දේ කරන්ට පුළුවන."**

මෙම පදයේ '**මට සියලු දේ කරන්ට පුළුවන කියන්නාවූ වචන**' වල අරුත ' **මම සිටින ඕනෑම අවස්ථාවක පාලනය මට අයිතිවේ.**' ලෙස තේරුම් ගැනීමට හැක.

දේව දරුව, ඔබගේ **ජීවිතයේ පාලනය ක්‍රිස්තුස්වහන්සේට භාරදෙන්න.** එවිට ඔබගේ ජීවිතයේ සෑම අවස්ථාවක **පාලනය ඔබ සතු වනු ඇත.**

**මෙම ජයාන්විත කිතුනු ජීවිතය ගතකිරීමට**

**දෙවි සමිඳුන් ඔබට පිහිටවනසේක්වා!!!**